


16 වැනි වෙළුම 01 වැනි කලාපය / 2020 ජූලි

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි

# 2020 මහ මැතිවරණය සහ ඉන් පසු...



ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු / නීතිඥ එස්. ජී. පුංචිහේවා / නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන / ආචාර්ය අසංග වැලිකල
නීතිඥ දුමිඳු මධුෂාන් / ආචාර්ය ප්‍රදීප් පීරිස් / මහාචාර්ය මිල්ටන් රාජරත්න / භවානි ෆොන්සේකා / මහාචාර්ය නවරත්න බණ්ඩාර
රොහාන් එදිරිසිංහ / මංජුල ගජනායක / අගමැති මහින්ද රාජපක්ෂ / රනිල් වික්‍රමසිංහ / සජිත් ප්‍රේමදාස / අනුර කුමාර දිසානායක / විමල් වීරවංශ
ජීවන් තොණ්ඩමන් / ආචාර්ය පූජ්‍ය බද්දේගම සමිත හිමි / දිනේෂ් ගුණවර්ධන / නීතිඥ උදය ගම්මන්පිල / වාසුදේව නානායක්කාර
නීතිඥ ශිරාල් ලක්තිලක /සී.වී. විග්නේෂ්වරන් / පාඨලී චම්පික රණවක / නීතිඥ දයාසිරි ජයසේකර / මහාචාර්ය ජී.එල්. පීරිස් / ඩග්ලස් දේවානන්ද /
ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් / නීතිඥ එම්.ඒ. සුමන්තිරන් / මයිල්වානහම් තිලකරාජා / රවුෆ් හකීම්

සංස්කරණය : ලයනල් ගුරුගේ

# පුරවැසියා වෙබ් අඩවිය

**පුරවැසි ජනජීවිතයට අදාළ,**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළු සියලුම නීති, අණපනත් සහ රෙගුලාසි
- පුරවැසියාට අදාළ ඉහළ අධිකරණයෙන් විනිශ්චිත නඩු තීන්දු සහ අනෙකුත් වැදගත් නඩු තීන්දු
- රාජ්‍ය හා පොදු ආයතනයන්හි ආකෘති පත්‍ර
- පුරවැසි ක්‍රියාකාරීත්වයේ නවීන තොරතුරු
- මූලික අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම්
- පුරවැසි ක්‍රියාකාරීත්වයෙන් ලබාගත් ජයග්‍රහණ පිළිබඳ විස්තර
- පුරවැසි සභා - පිළිබඳ තොරතුරු

---

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව ත්‍රෛභාෂාවෙන්
පුරවැසියා වෙනුවෙන්ම

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

වෙතින්

**www.citizenslanka.org**

---






සංස්කරණය **ලයනල් ගුරුගේ**

ISSN 955-1800-0061

16 වැනි වෙළුම 01 වැනි කලාපය 2020 ජූලි

දුරකථනය 94-1-2370801/4
ෆැක්ස් 94-1-2370802
ඊ-මේල් cpa@cpalanka.org
වෙබ් www.cpalanka.org

සහාය **ළහිරු කිතලගම, තරිඳු උඩුවරගෙදර, රේඛා නිලුක්ෂි හේරත්**

පරිගණක පිටු සැලසුම / පිට කවරය **වාක්‍යා රූ දු.ඇ. 011-2708377**

මුද්‍රණය

"සාම විමර්ශී" යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සාම හා ගැටුම් විශ්ලේෂණ ඒකකයේ සහ ප්‍රජා සහභාගිත්ව ඒකකයේ ප්‍රකාශනයකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතු ව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක ව විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

"සාම විමර්ශී" ප්‍රකාශනය, ශ්‍රී ලංකාවේ ගැටුම් විසඳා ගැනීමට බෙහෙවින් අදාළ වන ප්‍රශ්න පිළිබඳ ව, අපගේ සාම හා ගැටුම් විශ්ලේෂණ වැඩසටහන හා පොදු මහජනතාව ද අතර අන්තර් ක්‍රියාකාරිත්වයක් ඇතිකරවීමේ එක් මගකි. මෙහි අන්තර්ගත අදහස් මගින් අවශ්‍යයෙන් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ අදහස් පිළිබිඹු නො වේ.

වැඩිදුරට විස්තර සඳහා පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

සංස්කාරක, "සාම විමර්ශී"
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය,
6/5, ලේයාර්ඩ්ස් පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව.
දුරකථනය 94-11-2081384/06 ෆැක්ස් 94-11-4714460
ඊ-මේල් cpa@cpalanka.org වෙබ් www.cpalanka.org

# ජනපතිතුමනි, පසුපසට නොව ඉදිරියට යන්න !

නිදහසින් පසුව වසර 72කටත් වැඩි කාලයක් ඉක්ම ගොස් ඇති බව දේශපාලන කරළියේ සංවාදවලදී නිතර නිතර සිහිපත් කෙරෙනු ඇසේ. ඉන් බොහොමයක් අභිමානවත් සිහිපත් කිරීම් නොව, නිදහසින් පසුව ජයගත යුතුව තිබූ අභියෝග මේ දක්වාම ජය ගැනීමට නොහැකි වීම පිළිබඳව කෙරෙන විවේචනාත්මක සිහි කැඳවීම්ය. අප රටක් ලෙස ආපස්සට ගමන් කරද්දී ලෝකයේ සෙසු ජාතීන් අත් කරගත් ජයග්‍රහණ පිළිබඳ සැසඳීම්ය.

දශක හතකටත් අධික කාලයක් තිස්සේ රටක් ලෙස අපට විසඳාගත නොහැකි වූ ප්‍රමුඛතම අභියෝගය නම් මේ රට මාතෘභූමිය කොටගත් සියලු ජනවර්ග හා ආගම්වලට අයත්, විවිධ භාෂා කතා කරන හා සුවිශේෂ අනන්‍යතා සහිත ජනයා ඒකරාශී කරන 'ශ්‍රී ලාංකීය ජාතිය' ගොඩනඟා ගැනීමයි. ඒ සඳහා මූලික පදනම විය යුතු, සියලු දෙනාගේ අයිතිවාසිකම් සුරැකෙන, සමානාත්මතාව පදනම් කොට ගත් පාලන ක්‍රමයක් ගොඩනඟා ගැනීම මේ වන තුරුම යථාර්ථයක් බවට පත් කර ගැනීමට නොහැකි වී තිබේ. ඒ වෙනුවට, විවිධ ජනවාර්ගික හා ආගමික ප්‍රජාවන් අතර බෙදුම් රේඛා තව තවත් පුළුල් කෙරෙමින් පවතින අතර එකිනෙකා කෙරෙහි බියෙන්, සැකයෙන් හා ස්වකීය ඉරණම කෙරෙහි දැඩි මානසික ආතතියකින් යුතුව ජීවත්වන රෝගී ජනසමාජයක් නිර්මාණය වී ඇත. වඩාත් ඛේදජනක කරුණ නම්, ප්‍රජාතන්ත්‍රවාදය පදනම් කරගත් සාධාරණ සමාජයක් දෙසට තැබූ සීමිත ඉදිරි පියවර පවා නැවත ආපසු හරවන වාතාවරණයක් උද්ගතව තිබීමයි.

ඒකාධිපති ලක්ෂණ සහිත විධායක ජනාධිපති ධුරයේ බලතල යම් පමණකට සීමා කිරීම ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ශක්තිමත් කෙරෙන සාධනීය පියවරවලට මුල් වූ, සියලු පක්ෂවල පොදු එකඟතාවයෙන් සම්මත කර ගත් 19වන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමට අවශ්‍ය 2/3ක බලයක් ලබා ගැනීම ජනාධිපතිවරයාගේ අභිප්‍රාය වී තිබේ. ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධයෙන් පාලක පක්ෂයේ ප්‍රධාන සටන්පාඨය වී ඇත්තේ එයයි.

**නිදහසින් පසු විධායක අගමැතිවරයකු සහිත පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ ඩී. එස්. සේනානායක, සර් ජෝන් කොතලාවල, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, විජයානන්ද දහනායක, ඩඩ්ලි සේනානායක, සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක යන නායකයෝ රට පාලනය කළෝය. 1978 ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කළ විධායක ජනාධිපති ධුරයේ ප්‍රමුඛ කොටගත් පාලන ක්‍රමය අද දක්වා පවතී. ඒ යටතේ ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස, ඩී.බී. විජේතුංග, චන්ද්‍රිකා කුමාරතුංග, මහින්ද රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන යන විධායක ජනාධිපතිවරු රට පාලනය කර ඇත. ඔවුන් සියලු දෙනාටම හිමි විය යුතු ස්ථානය ඉතිහාසය විසින් සනිටුහන් කර ඇත. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට හිමි විය යුතු තැන අනාගතයේ සනිටුහන් කරනු ඇත. එබැවින් වර්තමානයේ තමන් කරන කටයුතු ලාංකීය සමාජය ඉදිරියට ගෙනයනවාද නොයනවාද යන්න පිළිබඳව අතිශයින් ම විචක්ෂණව කටයුතු කිරීම මේ මොහොතේ ජනාධිපතිවරයාගේ කාර්යභාරයයි.**

සර්ව බලධාරී පාලකයකු පිළිබඳව මෑත ඉතිහාසයේ බරපතළම අත්හදාබැලීම කළ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා, වඩාත්ම විවේචනයට හා මේ රට අත් වූ හානිකර ඉරණම සම්බන්ධයෙන් වඩාත්ම චෝදනාවට ලක් වන නායකයාය. නූතන ජනසමාජය මුහුණ දෙන ගැටලු කිසිවකට සර්වබලධාරියකු සතුව විසඳුම් නොමැති බවත් සියලු දෙනාගේ පොදු සම්මුතිය තුළ ගැටලු විසඳාගැනීම ලොව මෙතෙක් අත්හදාබලා ඇති සාර්ථකම ක්‍රමය බවත් යළි ඔප්පු කිරීමේ අවශ්‍යතාවක් නැත.

විධායක ජනාධිපතිධුරයේ කර වටා එතුණු වැඩවසම් සළු පිළි ප්‍රතික්ෂේප කිරීමෙන්ද රාජ්‍ය නායකයාගේ මුහුණ වෙනුවට රාජ්‍යයේ නිල ලාංඡනය යළි ප්‍රතිස්ථාපනය කිරීමෙන්ද වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙන්වා ඇති ආදර්ශය විශිෂ්ටය. ඔහු පියවර තැබිය යුත්තේ ඉන් පසුපසට නොව, ඉදිරියටය. එනම් ගර්භිත ඒකාධිපතිවාදය දෙසට නොව ශ්‍රී ලාංකීය ජාතියක් ලෙස සියලු ජනයා ඒකරාශී කළ හැකි ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ දෙසටය. ඒ පියවර තැබීමට ඔහුට ශක්තිය හා ධෛර්යය ලැබේවායි පතමු. ●

# Contents




2020 මහ මැතිවරණය **4**

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු





කොරෝනා පණිවුඩය : සාධාරණ වෙයල්ලා ! **8**

නීතිඥ එස්. ජී. පුංචිහේවා







සහ්‍යත්ව රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ආගමනය **18**

ආචාර්ය අසංග වැලිකල





පාරිභෝගික අයිතිවාසිකම් විෂයෙහි බලගැන්වුණු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය **29**

නීතිඥ දුමිඳු මධුෂාන්





ඔත්පල වූ ලාංකේය ප්‍රජාතන්ත්‍රවාදයට ආඥාදායකත්වය ඔසුවක් නොවේ **34**

ආචාර්ය ප්‍රදීප් පීරිස්, සකිනා මොයිනුඩීන්, එම් ක්‍රිෂ්ණමූර්ති | *Dr. Pradeep Peiris, Sakina Moinudeen and M. Krishnamoorthy*

ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය සොයා යෑම : අභියෝග සහ ජයග්‍රහණ **12**

නීතිඥ කිෂාලි පින්ටෝ




**ඉහළ-මැදි ආදායමේ සිට පහළ-මැදි ආදායමට හෙළා යහපාලනය රට දුප්පත් කළා 38**
මහාචාර්ය මිල්ටන් රාජරත්න





**වසංගතයක් මධ්‍යයේ පාර්ලිමේන්තු මැතිවරණය : ශ්‍රී ලංකාවේ යුක්තියට සහ ප්‍රතිසංධානයට ඇති බලපෑම 42**
භවානි ෆොන්සේකා

**බලය බෙදාහැරීම එකම විසඳුම නොවෙයි 49**
මහාචාර්ය නවරත්න බණ්ඩාර

**ප්‍රජාතන්ත්‍රවාදී ආයතන කෙරෙහි බිඳවැටුණු මහජන විශ්වාසය යළි ගොඩනැගීම 54**
රොහාන් එදිරිසිංහ

**නියාමනය නොවන මැතිවරණ පිරිවැය රටවැසියන්ගේ ජීවන බර වැඩිවීමටද හේතුවකි 60**
මංජුල ගජනායක

**අර්බුදයට මුහුණ දීමට හැකියාව ඇත්තේ එජාපයට පමණයි 67**
රනිල් වික්‍රමසිංහ

**ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සෑම යෝජනාවක්ම නියමිත කාලයේදී ඉටු කරනවා 69**
සජිත් ප්‍රේමදාස

**ඕනෑම මොහොතක රට බාරගන්න සූදානම් 71**
අනුර කුමාර දිසානායක

**ජාතික රාජ්‍යය රැකීම අපේ ප්‍රතිපත්තියයි 72**
විමල් වීරවංශ

**ආගම හෝ ජාතිය මුල් කරගෙන දේශපාලනය නොකළ යුතුයි 74**
ආචාර්ය පූජ්‍ය බද්දේගම සමිත හිමි





**වැඩබිමක් වී තිබූ රට යහපාලන ආණ්ඩුව මුඩු බිමක් කළා 65**
අගමැති මහින්ද රාජපක්ෂ

**එදා නුගේගොඩ රැල්ල ආරම්භ කළේ ඒකීය රාජ්‍යය රැකගන්නයි 77**
දිනේෂ් ගුණවර්ධන

**එම්.සී.සී. එදත් අදත් බිල්ලෙක් 79**
උදය ගම්මන්පිල

**තුනෙන් දෙකක් ගන්න විප්ලවයක් කරන්න වෙනවා 81**
වාසුදේව නානායක්කාර

**යහපාලන ආණ්ඩුව පැවතුණේ දින 100යි 83**
ශිරාල් ලක්තිලක

**පවුල් පාලනය සහ රාජ්‍ය මර්දනය යොදවා අපව පරාජය කළ නොහැකියි 86**
පාඨලී චම්පික රණවක

**19වන සංශෝධනය අනිවාර්යයෙන්ම ඉවත් විය යුතුයි 87**
දයාසිරි ජයසේකර

**ජාත්‍යන්තර මැදිහත්වීමක් හැර වෙන විකල්පයක් නැහැ 88**
සී. වී. විග්නේෂ්වරන්

**දෙමළ ජනතාවට මේ ආණ්ඩුව විශ්වාසයි 90**
ඩග්ලස් දේවානන්දා

**ජාතීන් දෙකක් එක් රටක් 92**
ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම්

**දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් සුරකින සිංහල ජනතාව පිළිගන්නා විසඳුමක් 94**
එම්.ඒ. සුමන්දිරන්

**උතුරු නැගෙනහිර පළාත්වලින් පරිබාහිරව ජීවත් වන දෙමළ ජනතාවගේ දේශපාලනමය අභිලාශයන් ළඟා කර ගැනීම 97**
මයිල්වාහනම් තිලකරාජා

**මුස්ලිම් නියෝජනය අවම කිරීමට කුලී හමුදාවට කොන්ත්‍රාත් දී තිබේ 99**
රවුෆ් හකීම්

"

**මාර්තු දෙවැනි දා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව මෙම ක්‍රියා පිළිවෙළ ක්‍රියාත්මක නොවිය. සැබෑ ලෙසම කිවහොත් ක්‍රියාත්මක වීමට ඉඩ නොදෙනු ලැබීය. ශ්‍රේෂ්ඨාධිකරණය මේ සම්බන්ධයෙන් විධායකයේ ක්‍රියාමාර්ගය අනුමත කළ අතර සත්‍ය වශයෙන්ම ජූනි දෙවැනිදා සිට මීළඟ පාර්ලිමේන්තුව රැස්වන තෙක් මහජන මුදල් එක්රැස් කිරීම සහ වියදම් කිරීම භාර අධිකාරියක් නොපවතී.**





http://www.adaderana.lk/

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ

# 2020 මහ මැතිවරණය




**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**
විධායක අධ්‍යක්ෂ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය


මැතිවරණ සටනෙහිදී පරදුවට තැබෙන ප්‍රශ්නයන් සැලකිල්ලට ගත් කල අගෝස්තු 5 මහ මැතිවරණයෙහිදී මතුවන අභියෝගයන් බොහෝය. එමෙන්ම 2019 නොවැම්බර් ජනාධිපතිවරණයෙහිදී මතු වූ ඒවාම යයි හෝ ඊටත් වඩා යම් පමණකට වැඩි තත්ත්වයක් යයි කීවද වරදක් නැත. එය එසේ වන්නේ අවශ්‍යයෙන්ම එම මැතිවරණයන් අතර කාලයෙහි කොරෝනා වෛරසය මගින් ඇති කරනු ලැබූ බණ්ඩනය නිසාම නොවේ.

2019 නොවැම්බර් මැතිවරණය මූලික වශයෙන්ම පුළුල්ම මහජන සංජානනය අනුව ඊට පෙර පැවති සිරිසේන - වික්‍රමසිංහ රෙජීමයට පැහැදිලි ලෙසම වෙනස් ලෙස, අවශ්‍ය කාර්යය කරවාගත හැකි පුද්ගලයකු තෝරා පත් කර ගැනීම පිළිබඳව වූවක් විය. වැඩිදුරටත් එය ජාතික චින්තන මතවාදය මත පදනම් වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සහ ආණ්ඩුකරණ ආකෘතියක් වෙනුවෙන් පෙරමුණෙහි සිටින පුද්ගලයා තෝරා ගැනීම පිළිබඳව වූවක් ද විය. එබැවින් එය





https://www.army.lk/ https://srilankamirror.com/

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ

යුද හමුදාපති ෂවේන්ද්‍ර සිල්වා

පැහැදිලි සහ තීරණාත්මක නායකත්වය ; නීතිය හා සාමය සහ ස්ථාවරත්වය සඳහා වූ ඡන්දයක් ද විය. මෙය ජනාධිපතිවරණයේදී මිලියන 1.5 ක බහුතර ඡන්දයකින් සපුරාගනු ලැබිනි. එම මැතිවරණය පිළිබඳව කිවයුතුව ඇත්තේ. විරුද්ධ පක්‍ෂය විසින් තම නොහැකියාව මත රාජපක්‍ෂ මහතාට පිරිනැමූවක් මෙන්ම රාජපක්ෂ මහතා විසින් ද සිය ප්‍රබල සිත් ඇදගැනීමේ ශක්තිය සහ ආකර්ශනය තුළින් දිනාගත්තක් වූ බවයි. එබැවින් රාජපක්‍ෂ මහතාට පාර්ලිමේන්තුවේ අවහිරයකින් තොරව ඔහු සුදුසු යයි සිතන අයුරින් ආණ්ඩු කිරීමට නිල පැවරුමක් ඇත. කෝවිඩ් කාලයේදී ඔහු තම මිලිටරිමය ආවේගයන්ට ඵලදායක ලෙස පාලන නිදහස දෙමින් විනයගරුක, ගුණගරුක සහ නීතියට අවනත සමාජයක් බිහිකිරීම මෙන්ම නැගෙනහිර පළාතේ පුරා විද්‍යාත්මක උරුමය තහවුරු කිරීම පිණිසද කාර්ය සාධක බලකායයන් පිහිටුවීමට ක්‍රියා කළේය. එපමණක් නොව කෝවිඩ් වෛරසය සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හමුදාවන් හී සේවය කරන අය සහ පෙර හමුදාවන්හී සේවය කළ අය අතෙහි පවතී. මෙය හමුදා මානසිකත්වයකි. සරදමකට වාගේ වෛරසයෙන් දැඩි ලෙසම බැට කෑ එක් පිරිසක් වන්නේ නාවික හමුදාවයි. මෙය සිදුවූයේ කෙසේ දැයි කිසිවෙක් නොඅසති; සත්තකින්ම රෙජීමය මෙය කියන්නේ ද නැත.

මෙම තත්වය අපට සිහිපත් කර දෙන්නේ පාර්ලිමේන්තුවේ සහ මහ මැතිවරණයේ වැදගත්කමයි. ඕනෑම ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක හෝ තමන් එසේ යැයි බොරුවට කියා සිටින රාජ්‍යයක පවා රාජ්‍යයේ මූලික බලකනු ක්‍රියාත්මකව පැවතිය යුතුය. ඒවා නම් විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණයයි. බල සමතුලිත තාවය පිළිබඳව වූ වොටෙල්ගේ අර්ථකථනයේ ප්‍රභේදනයකට අනුව එම එක් බල කණුවකට අනෙක් බල කනුවක් පාලනය කෙරෙන නීති පැණවිය නොහැකි විය යුතුය. වැඩි දුරටත්, මෙම බලකණු තුනේ මූලික ක්‍රියාකාරිත්වයන්, විධායකය ව්‍යවස්ථාදායකය විසින් වාද විවාද කොට සම්මත කරනු ලැබූ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම දැරිය යුතුය - මේවා පළමු කොට විධායකය විසින් යෝජනා කළ නීතීන් වේ. පාර්ලිමේන්තුව අවශ්‍යයෙන්ම සාකච්ඡා පිණිස වූ ව්‍යුහයක් සහ විවාද පිණිස වූ සභා ශාලාවකි. එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව්‍යුහයක් නොවන නමුත් තමන් එකඟත්වය පලකරන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සඳහා වන සම්පත් වෙන් කර දීම සහ ඒ සම්බන්ධයෙන් වගවීම භාරවන ව්‍යුහයකි. අධිකරණය නීතියේ ආධිපත්‍යය නගාසිටුවන සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කාර්ය රාමුව තුළ විධායකයේ ක්‍රියාකාරකම් අර්ථකථනය කරන භූමිකාවක නියැලෙයි.

මාර්තු දෙවැනි දා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව මෙම ක්‍රියා පිළිවෙල ක්‍රියාත්මක නොවිය. සැබෑ ලෙසම කිවහොත් ක්‍රියාත්මක වීමට ඉඩ නොදෙනු ලැබීය. ශ්‍රේෂ්ඨාධිකරණය මේ සම්බන්ධයෙන් විධායකයේ ක්‍රියාමාර්ගය අනුමත කළ අතර සත්‍ය වශයෙන්ම ජූනි දෙවැනිදා සිට මීලඟ පාර්ලිමේන්තුව රැස්වන තෙක් මහජන මුදල් එක්රැස් කිරීම සහ වියදම් කිරීම භාර අධිකාරියක් නොපවතී. “මහජන නියෝජිතත්වයක් නොමැති තැන බදු අයකිරීමක් ද නැත” යන පූජනීයත්වයට පත්වූ එසේත් නැතිනම් ඇතැම් විට වැඩියෙන් පාවිච්චි කිරීමෙන් වටිනාකම හීනවූ කියමනෙහි පණිවුඩය ඉවතට වීසිකර දමනු ලැබ ඇත. කෝවිඩ් වෛරසය පැතිරීම

කළමනාකරණය කිරීම සාපේක්ෂව ගත් කල සාර්ථකත්වයක් සේ දකිනු ලබන අතරම ආර්ථික කාල බෝම්බය ද "ටික්" "ටික්" හඬ නගමින් පවතී. නීතිඥයන් අත්අඩංගුවට ගන්නා නමුත් ඔවුන් උසාවියට ඉදිරිපත් නොකරණ, අතිශයින් භයංකර අපරාධවලට රටේ ඉහළම අධිකරණයෙන් දඬුවම් නියම කරනු ලැබූ හිටපු හමුදා නිලධාරීන් හට සමාව ලබාදෙන, ප්‍රධාන විධායකයක් හා වැඩි වැඩියෙන් බහුතරවාදී වන අධිකාරිවාදී රෙජීමයක් තහවුරු වෙමින් පවතී.

තක්සේරුකරණ ඒජන්සි මගින් ආර්ථික වශයෙන් අප රට B මට්ටමට පහත හෙළනු ලැබ ඇති අතර අප කලින් සිටි පහළ - මධ්‍යම ආදායම් මට්ටමට ආපසු වැටී ඇත. ණය ආපසු ගෙවීම් වශයෙන් ඉදිරි වසර 05 ක කාලය තුළ ආසන්න ලෙස, වසරකට ඇමරිකානු ඩොලර් බිලියන 04ක් බැගින් ගෙවිය යුතුව පවතින බව ඇස්තමේන්තු කොට ඇත. ඇතැම් ඇස්තමේන්තු මීටත් වඩා වැඩි වේ. ණය සහනයන් පිළිබඳව සාකච්ඡා කිරීමට ජාත්‍යන්තර ණය දෙන්නන් නව පාර්ලිමේන්තුවක් තේරී පත්වන තුරු බලා සිටින්නේ යැයි අනුමාන කෙරේ. සුළු හා මධ්‍යම පරිමාන ව්‍යාපාරයන් හට සහන වශයෙන් යම් මුදල් ප්‍රමාණයන් ලබාදෙමින් තිබේ. චීනය විසින් සැලකියුතු තරම් විශාල මුදල් ප්‍රමාණයක් පිළිබඳ පොරොන්දුවක් ලබා දී ඇත. ජපානය විසින් ණය සහන පිළිබඳව සාකච්ඡාවන් අත්හිටුවා ඇත. හාස්‍යජනක ලෙස පෙනී යන, සිතා මතාම නොමග යවනු ලැබූ ඇමරිකානු ඩොලර් මිලියන 480ක් සහිත මිලේනියම් චැලන්ජ් ප්‍රදානය පිළිබඳව වූ මතභේදකාරීත්වය තවදුරටත් හානි පමුණුවන්නක් වෙයි. ඇඟලුම් අංශයේ, සංචාරක ව්‍යාපාරයේ, විදේශ ශ්‍රමිකයන්ගේ සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරයන්ගේ බිඳවැටීමෙන් උද්ගත වන රැකියා වියුක්තියෙහි විනාශකාරීත්වය තදින් පහර දෙන්නට පටන්ගත් විට කුමක් සිදුවනු ඇතිද?

රෙජීමයට මහ මැතිවරණය සෑම විටම රාජ වංශය ශක්තිමත් කර ගැනීම පිණිස පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලය සහතික කර ගැනීම පිළිබඳව වූවක් විය. ජනාධිපතිවරයාට, මහා මැතිවරණය විශේෂයෙන්ම, ඔහුගේ කැමැත්ත පරිදි වන ආණ්ඩුක්‍රමයක් සහ ආණ්ඩුකරණයක් නිර්මාණය කර ගැනීම පිණිස මහජනතාව ගෙන් ලැබුණු ජන වරම මැතිවරණයකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල ලෙස අනුමත කරගැනීම පිළිබඳව වූවක් වෙයි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලබාදෙන බාධක රහිත උපායමාර්ගික හැසිරවීම් සඳහා ඇති ඉඩකඩට ඔහු පැහැදිලි ලෙසම කැමති බව පෙනී යන අතර, තුනෙන් දෙකේ බලය සෘජුවම ලැබී හෝ නොලැබී, ඔහු එම ව්‍යවස්ථාව වෙත ඉක්මනින් ගමන් කිරීමට කටයුතු කළහොත් එය පුදුමයක් නොවනු ඇත. එහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ සීමා කිරීම් සහ ඔහු සහ ඔහුගේ ආධාරකරුවන් වියදම් අධික හා අනුචිත දෙයක් සේ දකින 13 වන සංශෝධනය ද නොමැතිව කටයුතු කළ හැකි වනු ඇත.

මේවා මෙසේ සිදුවනු ඇත්තේ ආර්ථික



https://www.deccanherald.com/

**තක්සේරුකරණ ඒජන්සි මගින් ආර්ථික වශයෙන් අප රට B මට්ටමට පහත හෙළනු ලැබ ඇති අතර අප කලින් සිටි පහළ වැටී ඇත. ණය ආපසු ගෙවීම් වශයෙන් ඉදිරි වසර 05 ක කාලය තුළ ආසන්න ලෙස, වසරකට ඇමරිකානු ඩොලර් බිලියන 04ක් බැගින් ගෙවිය යුතුව පවතින බව ඇස්තමේන්තු කොට ඇත. ඇතැම් ඇස්තමේන්තු මීටත් වඩා වැඩි වේ. ණය සහනයන් පිළිබඳව සාකච්ඡා කිරීමට ජාත්‍යන්තර ණය දෙන්නන් නව පාර්ලිමේන්තුවක් තේරී පත්වන තුරු බලා සිටින්නේ යැයි අනුමාන කෙරේ.**



www.colombotelegraph.com/

**ශ්‍රී ලංකාවේ දේශපාලන ආර්ථික හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වර්ධනයන් හී සැලසුම සහ ගමන් චක්‍රය පිළිබඳව මූලිකම වගකීම දරන්නේ ශ්‍රී ලාංකිකයන් ම වන බවයි. පංගු පාර්ශව කරුවන් අපම වන අතර තරඟ භූමිය සහ අරගල භූමිය වන්නේ රටයි.**

පෙරමුණෙහි කළකිරීමට පත්ව නැගී එන රැල්ලකට එරෙහිව මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආයුධයක් කරගනිමින්ද විය හැකිය. ජාතික ආරක්ෂාව, ස්ථාවරත්වය සහ නීතිය හා සාමය - දේශප්‍රේමී / දේශද්‍රෝහී බෙදුමෙහි වැරදි පැත්තට වැටෙන දේශීය මෙන්ම ජාත්‍යන්තර අයවලුන්ට එරෙහි වන ආරක්ෂාවක්. නමුත් ජනප්‍රියවාදී සහ අධිකාරීවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක ප්‍රීති ප්‍රමෝදය ඉක්මවා යන කාලයක් කොරෝනා වෛරසයේ ආර්ථික ඵල විපාකයන් පවතිනු ඇත. සියල්ල රඳා පවතිනු ඇත්තේ ජනගහනයේ රාජපක්ෂ හිතවාදී කොටසට කෙතරම් නරක ලෙස මෙමගින් පහර වැදෙනු ඇත්ද යන්න මතය. එය නරක වුවහොත් සහ රෙජීමයෙන් ලැබෙන ප්‍රතිචාරය ගොරහැඩි හා දැඩි වුවහොත් මූලික මිනිස් අයිතිවාසිකම්, මූලික සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීම සඳහා අපි නැවත පැමිණෙන්නෙමු.


ඡන්දදායකයා මෙම මැතිවරණයේදී කුමක් කරන්නේ ද යන්න ගැටලුවක්ව පවතී. ඒ යම් ස්ථිර පක්ෂ කඳවුරකට අයත් නොවන ඡන්දදායකයා සම්බන්ධයෙනි. තවත් පෙනී යන කරුණක් වන්නේ ඉදිරිපත් වන පක්ෂ සහ අපේක්ෂකයන් අතුරින් වූ තේරීම පිළිබඳව කළකිරීමක්ද පවත්නා බවයි. එහි ප්‍රතිඵලය විය හැක්කේ ඡන්දය පාවිච්චි නොකිරීමට තීරණය කිරීමයි. එවැනි තත්වයකදී යම් හෙයකින් ඡන්දය පාවිච්චි කිරීමට තීරණය කළහොත් සිදුවනු ඇත්තේ ඡන්ද පත්‍රිකාව කටුගෑමයි. එමගින් පුද්ගල හෘද සාක්ෂියට සතුටක් ගෙන දෙන අතරම ලැබෙන ජනවරම සමස්ත ජාතික ඡන්ද සංඛ්‍යාවෙන් අඩු ප්‍රතිශතයක් මත පදනම් වීමට ද සලස්වයි. එමෙන්ම ක්‍රියාත්මක ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මූලික අයිතිවාසිකම් සහ යුතුකම්, ආයතන සහ ක්‍රියාදාමයන් සුරක්ෂිත වීමට නම් අනෙක් අය හට අධිකාරිවාදී ලෙස නියෝග දීමට හැකි වන මට්ටමකට එක් පක්ෂයක් විශාල ලෙස බලවත් නොවිය යුතුය. ප්‍රමුඛ සහ ප්‍රබල ලෙස පැවතිය යුතු තත්ත්වය වන්නේ ආයතනික මෙන්ම ක්‍රියාපටිපාටිමය වශයෙන්ද වන සංවරණ හා තුලනයන් පැවතීමයි.

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක වටිනාකම සහ ශක්තිය වනුයේ පාර්ලිමේන්තුව තුළ මෙන්ම ඉන් පිටත ද ශක්තිමත් විපක්ෂයක් පැවතීමයි. අප ඉදිරියේ පවතින්නේ මුස්පේන්තු තත්වයකි. සාමාන්‍ය ජනතාව කියන්නේ යූ.එන්.පී යේ එක් පාර්ශ්වයක් ජනාධිපතිවරයා සමග සිටින අතර අනෙක් පාර්ශ්වය අගමැතිවරයා සමඟ සිටින බවයි. එබැවින් ඡන්දදායකයා හට සැබෑ තේරීමක් නොමැත. විවිධත්වය තුළ එක්සත්කම යන අදහස මත පදනම් වූ ශ්‍රී ලංකාවක් ආරක්ෂා කිරීමට හා එම තත්ත්වය වඩාත් ව්‍යාප්ත කිරීමට දැඩි ලෙස කැපවූ සැබෑ නායකයින් පෙනෙන්නට නැත. මෙම තත්ත්වය 2018 ඔක්තෝම්බර් මස උත්කර්ෂයට පැමිණි සිවිල් සමාජ කොටස නැවත සටනට කැඳවන්නක් සේ දිස්වේ. ඒ ජනතාවගේ එදිනෙදා ජීවිතයට සහ ඔවුන්ගේ රටට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ ප්‍රජාතන්ත්‍රවාදයේ ඇති වටිනාකම පැහැදිලි කරදීමේ සටනකි.

මේ නොවැම්බර් මාසයේදී ඩිමොක්‍රටික් පාක්ෂිකයන් ඇමරිකාවේ ජනාධිපති ධූරය දිනාගනී නම් මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදයට හිතැති ජාත්‍යන්තර වටපිටාවක් තහවුරු වීමේ ඉඩකඩ පවතී.

කෙසේ නමුත් සරල ලෙස ගත් කල ප්‍රධාන කාරණය වන්නේ ශ්‍රී ලංකාවේ දේශපාලන ආර්ථික හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වර්ධනයන් හී සැලසුම සහ ගමන් චක්‍රය පිළිබඳව මූලිකම වගකීම දරන්නේ ශ්‍රී ලාංකිකයන්ම වන බවයි. පංගු පාර්ශ්වකරුවන් අපම වන අතර තරඟ භූමිය සහ අරගල භූමිය වන්නේ අපගේ රටයි.





# කොරෝනා පණිවුඩය:
# "සාධාරණ වෙයල්ලා !"



නීතිඥ
**එස්. ජී. පුංචිහේවා**

මිනිසාට මිනිසාම විපතක් වීම මේ විසි එක්වැනි සියවසේදීත් අපට ඇස්පනාපිටම දකින්නට සිදු වී ඇත. එනම්, වෛරස් රෝග, සුළිසුළං සුනාමි යනාදිය ස්වභාවික විය හැකිය. එහෙත් ඊට ඔරොත්තු දීමේ හැකියාව ගොඩ නගා ගැනීම මිනිසාටම පැවරෙන කාර්යයකි. චීනයේ වාර්ෂිකව සිදු වූ හොවැං හෝ ගංවතුර සහ වැලි කුනාටු දැන් මෙල්ල කරගෙන ඇත.

නපුරුම විපත මිනිසා විසින් මිනිසා සූරාකෑම හෙවත් අද පැවැත්ම අනුව නව ලිබරල්වාදයයි. සෑම සමාජයකම සම්පත් ඉපිදවිය යුතුය. ඒ සම්පත් බෙදී යා යුතුය. සම්පත් යනු පොදු වස්තුවක් ලෙස සැලකිය යුතු කාලය පැමිණ ඇත. සම්පත් ටික දෙනකු විසින් අත්පත් කර ගැනීම ලෝක අපරාධයක් ලෙස නීතිගත විය යුතුය. පුරාණ කාලයේ ලිග්ගල් යට, බඳුන්වල බහා රන් කහවනු වළලා තැබීමෙන් සම්පත් සඟවා තැබීම සිදුවිය. අද සිංගප්පූරුව, ස්විට්සර්ලන්තය, සීෂෙල්ස් වැනි රටවල්හි බැංකුවල සඟවා තැබිය හැකිය. මෙසේ



> **නපුරුම විපත මිනිසා විසින් මිනිසා සූරාකෑම හෙවත් අද පැවැත්ම අනුව නව ලිබරල්වාදය යි. සෑම සමාජයකම සම්පත් ඉපිදවිය යුතුය. ඒ සම්පත් බෙදී යා යුතුය. සම්පත් යනු පොදු වස්තුවක් ලෙස සැලකිය යුතු කාලය පැමිණ ඇත. සම්පත් ටික දෙනකු විසින් අත්පත් කර ගැනීම ලෝක අපරාධයක් ලෙස නීතිගත විය යුතුය.**

සම්පත් අත්පත් කර ගැනීමත්, සඟවා තැබීමත් මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධ ලෙස නොසැලකිය යුත්තේ ඇයි?

කොරෝනා වෛරස කාලයට ඔරොත්තු දීම සඳහා ගැනුණු පියවර නිසා 'සම්පත්' අයිතිකර ගැනීම පිළිබඳ පවතින අදහස් වෙනස් විය යුතු බව ලැබී ඇති ප්‍රමුඛතම පණිවුඩයයි. සම්පත් ඉපිදවීමට මිනිසා ශ්‍රමය යෙදිය යුතුය. එහෙයින් එය ටික දෙනකුට අත්පත් කර ගැනීමේ මාධ්‍යයක් නොවිය යුතුය. මිනිසාගේ ශ්‍රමයෙන් උපදවන අතිරික්ත ධනය සියල්ල පොදු මිනිසාගේ යහපතට යෙදිය යුතුව ඇත. වාතය, වතුර, ඉර එළිය, ඉඩම්, ගහකොළ, ආලෝකය ආදිය මෙන් ශ්‍රමයේ ඵලයද පොදු දේපළක් විය යුතුව ඇත. මනුෂ්‍යයාද, ඔහුගේ මොළය ද, සියලු ඉන්ද්‍රියන්ද විකාශය වූයේ මිනිසාගේ සාමූහික ශ්‍රමය නිසාය. ශ්‍රමයේ ඵලය පොදු සම්පතක් විය යුත්තේ ඒ නිසා ය. එසේ සැලකීම ස්වභාව ධර්මයට වඩා සමීපය.

කොරෝනා පැතිරයාම වැළැක්වීමට අත්‍යවශ්‍ය නීති ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුවට සිදුවිය. ප්‍රධාන එකක් වූයේ හාල්, එළවළු, මාළු ආදිය මැද මිනිසාගේ මැදිහත්වීමෙන් තොරව පාරිභෝගියාට ලැබිය යුතුය යන සංකල්පය භාවිතයට ගැනීමය. නිෂ්පාදනය වන ආහාර ද්‍රව්‍ය නිෂ්පාදකයාගෙන් ගෙන පාරිභෝගිකයා වෙත සැපයීමට මැද මිනිසකු මැදිහත්වීම සිදුවේ. එය පවතින නීතියට විරුද්ධ නැත. අන්තිමේදී එම නිෂ්පාදන වලින් වැඩිම ප්‍රයෝජනය ලබන්නේ මැද මිනිසා හෙවත් වෙළෙන්දාය. එම නිසා හදිසි නීති කාලයේ හාල් නියමිත මිලකට සැපයීමටත්, එළවළු, මාළු පාරිභෝගිකයා වෙත ගෙනගොස් දීමටත් පියවර ගැනිණ. එම සංකල්පය වැදගත් ය. එහෙත් අපේ සමාජ ක්‍රමය තුළ එය මුළුමනින් ක්‍රියාත්මක කිරීම අපහසුය. සමාජවාදී රටවල මූලික භාවිතයක් වන්නේ අතර මැද සූරාකන්නන්ගෙන් නිදහස් වූ භාණ්ඩ පොදු මිනිසාට ලබාදීමය. එය ආණ්ඩුව විසින් කරන්නේ නම් සමූපකාර වැනි ක්‍රමයක් මගින් සැපයීම කළ හැකිය. එවිට සූරා කන්නන්ගෙන් නිදහස්ව පාරිභෝගිකයාට සම්පත් සාධාරණව ලැබෙනු ඇත. එහෙත් මිනිසාගේ තණ්හාව දුරු වන තුරු දූෂණ, වංචා තුරන් නොවනු ඇත. එවැනි තත්වයකට රට පත් කිරීමේ ක්‍රමයක් පැවතිය යුතුය. ආපදාවට මුහුණු දීමට නම් මිනිසා සූරාකනු ලැබීමෙන් නිදහස් කළ යුතුය. එහි තේරුම වන්නේ පෞද්ගලික

"

**කොරෝනා වසංගතයට මුහුණ දීමේදී අතරමැදියන් නැතිව ආහාර ලැබිය යුතු බව පිළිගැනිණ. අඩුපාඩු සහිතව හෝ තාවකාලිකව එය ක්‍රියාත්මක විය. එහි යටි අරුත කුමක් ද? විපතක දී තවත් විපතකින්, එනම් සූරා කෑමෙන් වැළැක්මය. එයින් කියැවෙන්නේ මිනිසුන්ට ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ යුක්තිය සූරාකෑමක් නැතිව සාධාරණව ලැබිය යුතුය යනු පිළිගත යුත්තක් බවය.**



දුරස්ථකරන උපදෙස් පිළිපදින පාරිභෝගියෝ - කොළඹ

https://leads.lk/

දේපළ ක්‍රමයෙන් නිදහස් විය යුතුය යන්නයි. කොරෝනා වසංගතයට මුහුණ දීමේදී අතරමැදියන් නැතිව ආහාර ලැබිය යුතු බව පිළිගැනිණ. අඩුපාඩු සහිතව හෝ තාවකාලිකව එය ක්‍රියාත්මක විය. එහි යටි අරුත කුමක් ද? විපතක දී තවත් විපතකින්, එනම් සූරා කෑමෙන් වැළැක්මය. එයින් කියැවෙන්නේ මිනිසුන්ට ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ යුක්තිය සූරාකෑමක් නැතිව සාධාරණව ලැබිය යුතුය යනු පිළිගත යුත්තක් බවය.

කැරැල්ලකදී, විරෝධතාවකදී පවතින ක්‍රමය විසින් හදාගත් නීතියෙන් එය මර්දනය කැරෙයි. හමුදාවන් සන්නද්ධ කොට යෙදවීම මගින් එය මැඩලීම නීතිය වී ඇත. එහෙත් දරුණු රෝගයකදී ඒ ක්‍රමය ප්‍රමාණවත් නැත. මක්නිසාද? එම රෝග බීජ, වෛරස හමුදාවටත් බෝවිය හැකිය. එවිට එය ධනපතියන්ටත් පාලකයන්ටත් පහසුවෙන්ම පැතිරෙනු ඇත. ඒ නිසා එම රෝග බීජ විනාශ කිරීමේ මූලික සටනට යා යුතුය. ඒ සඳහා මිනිස් මාධ්‍යය ආරක්ෂා කිරීමේ සමාජ වටාපිටාව සකස් කළ යුතුය. එහිදී මිනිසාට හානිකර පැවතුම් වැළැක්විය යුතුය. සහන ක්‍රම පැවැත්විය යුතුය. අප රටේ සිදුවූයේ එයයි.

අත්‍යවශ්‍ය ආහාර පහසුවෙන් සැපයීම සඳහා එම, ද්‍රව්‍ය ගෙන ගොස් මිනිසුන්ට දීම 'අත්‍යවශ්‍ය සේවාවක්' වශයෙන් සලකා ආහාර ද්‍රව්‍ය ගෙවල්වලට ගෙනගොස් දීම යළිත් වෙළෙන්දන් විසින්ම කරන ලදී. ඊට සමගාමීව බැංකු සේවා ලිහිල් කළ යුතු විය. ඉසුසල්වල පෝලිම්වලින් පෙනුණේ ජනතාවගෙන් කොපමණක්, රෝගීන් වී සිටිනවාද යන්නයි. ජනතාව රෝගීන් කිරීමේ සමාජ මෙහෙයුම ඉතා ප්‍රබල බව එයින් දැක්වේ. ***මෙවැනි රෝගවලට ඔරොත්තු දීමට නම් ඔවුන් තුළ ප්‍රතිශක්ති හැකියාව තිබිය යුතු බව වටින් ගොඩින් එළි විය. එම හේතුව නිසා කොත්තමල්ලි, වෙනිවැල්ගැට ඉතා ප්‍රයෝජනවත් ඖෂධ බව පිළිගැනුණේ දේශීය ඖෂධ කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙමිනි. දේශීය ආහාරවල වැදගත්කම ඔප්පු කිරීමට මෙවැනි ආපදාවක්ම පැමිණිය යුතු ද?*** එයින් ඇඟවුණේ අප දිනපතා අනිසි ආහාර වලට පුරුදු වී ඇති බව නොවේද? දේශීය ආහාර සහ ඖෂධ, විපත්වල දී අපට පිහිට වන බව වටහා ගත හැකි වන්නේ ජාතික සෞඛ්‍ය ආපදාවකදීය. එතෙක් නව ලිබරල් ආර්ථිකයේ ක්ෂණික නූඩ්ල්ස්වලට, ඇබ්බැහි වීම අප සිතන්නේ නවීන සංවර්ධනයේ මහඟු ප්‍රතිඵලයක් ලෙසය. අපේ රටේ කොස් පොළොස්, පලා, පලතුරු, අල බතල ආදියට වඩා තට්ටු දෙකේ තුනේ හැම්බර්ගර් කෑමට පුරුදුවීමේ ආනිසංසය කොරෝනා විපතේදීවත් වැටහුණාද යනු සැකයි. අනාගත පරපුරවත් මේ විනාසකාරී පැවැත්මෙන් මුදවා ගැන්මට කොරෝනාව දුන් පණිවුඩය හොඳටම ප්‍රමාණවත්ය.

***නව ලිබරල් ආර්ථික කර්මාන්ත යටතේ අපට කෑමට පුරුදු කරන්නේ වස විසය. දශක කීපයක් එම ජීවන රටාවට ඇබ්බැහිවන ජාතියක් සිතින් ගතින් පිරිහීම ආණ්ඩුකරණයේ අනියම් ප්‍රතිඵලයයි. විදේශ ආහාරවලට මුල්තැන දීම උදෙසා කව්පි, මුංඇට, කුරක්කන් පවා 'වවන' බෝග නොව පිටින් ගෙන්වන බෝග වී ඇත. අපේ රටේ වැවීමේ ආර්ථිකය යට කොට පිටින් ගෙන්වීමේ නව ලිබරල් ආර්ථිකය දියුණු කිරීමට අපි පාර්ලිමේන්තු පත්කරමු.*** එහෙත් මේ කොරෝනා අවස්ථාවේදී ආණ්ඩුවට සිදුවූයේ වෙනස් අවධාරණයකට යොමුවීමටය. එනම් ගොවිතැන් කටයුතුවලට ඇඳිරි නීතිය බලනොපාන බවටත්, ගෙවතු වගාව දියුණු කළ යුතු බවටත් වගබලා ගැනීමය. මේවා අතීතයේ සිටම එසේ විය යුතුය. මෙයින් වැටහුණේ කුමක් ද? දේශීය වගාවන්, ගෙවතු වගාවන් දෙකම අපට විපත්වලදී පිහිට වන බවය. මෙතෙක් කලක් එනම් රටට දේශපාලන නිදහස ලැබුණු 1948 සිටවත්, එම ශක්තිය ගොඩනැගීමට අමතක කළ බව මේ මොහොතේ වත් පෙනී ගොස් තිබිණ. එයින් ගොවිතැන ගැන නව ආකල්ප ගොඩනැගීමට යොමුවීම යහපත් දෙයකි. කෘෂිකර්මය අපට නිදහස්වීම සඳහා වූ ක්ෂේත්‍රයකි. ඒ සඳහා ජනතාවට

www.pulse.lk

ඉඩම්, වතුර, ලබා දීම ඉතා වැදගත්ය. දැනට ඒ දෙකම නව ලිබරලවාදය විසින් අත්පත් කරගෙන ඇත. ***නිරෝධායනය සහ කොරෝනා වැළැක්වීමේ ආණ්ඩුවේ සහ සමාජයේ ක්‍රියාකාරකම් නිසා විපතට පත් අවස්ථාවකදී මිනිසුන්ට පිහිට විය යුතුය යන අදහස් ඇතිවීම සුලබ විය. මෙයින් මූලික වූයේ උගත් ළමයින් සහ වැඩිහිටියන් විවිධ නිර්මාණ කිරීමය. කොරෝනා වැළැක්වීමට අවශ්‍ය විද්‍යා හා තාක්ෂණික මෙවලම් නිපදවීම ඉතා යහපත් ලක්ෂණයකි. සෞඛ්‍ය සහ විද්‍යා උපකරණ නිපදවීම සඳහා කාගේවත් බලකිරීමක් නැතිව තමන්ම පෙළඹීමෙන් ඒවා නිපදවා සමාජයට පරිත්‍යාග කිරීමට යොමුවීම අප සමාජයේ හා අධ්‍යාපනයේ ජයග්‍රහණයකි.*** ඒ සමග වර්ධනය වූ මානුෂික ගුණය සියල්ලට වඩා අගනේ ය. මෙයින් අප තේරුම් ගත යුත්තේ කුමක් ද ? විපතක දී වුවද අවශ්‍ය සමාජ නිදහස පවතින්නේ නම් මිනිසාගේ නිර්මාණ ශක්තිය වඩා ප්‍රබෝධ වන බවය. ඒ නිසා අවශ්‍ය නිදහස සහ ශක්තිය ඇති සමාජයක මිනිසා බොහෝ නිර්මාණ, පොදු යහපත වෙනුවෙන් කිරීමට උනන්දු වනු ඇති බව එයින් ගම්‍ය වේ.

***අප රටේ පාලනය විසින් මුල සිට ඇති කළ යුත්තක් නිරෝධායනය නිසා ඇති විය. එනම් වාහන ගමනාගමනය බෙහෙවින් අඩු වීම නිසා වායුගෝලය සහ පරිසරය පිරිසිදු වීම සිදුවිය. අප නිතර දෙවේලේ ආශ්වාස කළේ මිනිසා සහ නව ලිබරල්වාදය විසින් දූෂණය කළ වාතය යි. මෙම අවස්ථාවේ විෂ ධූමය අඩු වීමත්, පරිසරය සෞඛ්‍යමත් වීමත් සිදු වුවද එය හැමදාම සිදු විය යුත්තක් බව අපට මතක් කොට දී ඇත.***

අනික් අතට අහිතකර ආහාර ගැනීම, මත් පැන්, කුඩු පාලනය වීම සමාජ ප්‍රවර්ධනයට සිදු විය යුතු දේය. එම විෂම දේවල් භාවිත නොකළාය කියා මෙම මාස දෙකකට අධික කාලය තුළ කිසිවකුට හානියක් සිදු වී නැත. කුඩු මත්පැන් සහ කඩචෝරු කර්මාන්ත වශයෙන් දියුණු වීම ජන සමාජයට හානිකර බව කොරෝනාව පෙන්වා දී ඇත.

නිරෝධායන නීති රීති නිසා යම් අපහසුතා මිනිසුන්ට ඇති වුවද එම කාලය තුළ මිනීමැරුම්, මංකොල්ල, හොරකම්, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර ආදිය අඩු වී ඇති බව පැහැදිලිය. රට 'යථා තත්වයට' පත්වීම යනු එම අපරාධ යළිත් පෙර තත්වයටම ඇති වීම නොවන බව ප්‍රත්‍යක්ෂය. එසේ නම් කොරෝනාව අපට කියා දෙන්නේ එම යහපත් තත්ත්වය සමාජයේ පවත්වාගත යුතු බවය. අසමාන බව, අසාධාරණය පවතින සමාජයක අපරාධ බහුල වන බව ඔප්පු වී ඇති කරුණකි. එහෙයින් ජනතාවගේත්, ආණ්ඩුවේත් පරම යුතුකම එම අසමානත්වය සහ අසාධාරණය තුරන් වූ සමාජයක් ගොඩනැගීමය.

නිරෝධායන හා හදිසි නීති නිසා සමාජ ජීවිතයේ යම් අලුත් තත්ත්වයක් හට ගැනිණ. එයින් වැඩිකාලයක් නිවෙස්වල ගත කිරීම වැදගත්ය. එයින් කියැවුණේ මිනිසුන්ට වැඩි විවේකයක් අවශ්‍ය බව මිනිසාගේම යහපතට හේතු වන බවය.

***ඉතා වැදගත් දෙයක් වූයේ පාසල් නොගොස් දරුවන් ගෙවල සිට ඉගෙනීමයි. එම කාලය පාසල් නොගියාය කියා ළමයින්ගේ හැකියාවන්හි අඩුවක් නොවන බව අපට දැනෙනු ඇත. ළමයින් පාසල් තුළත් ඉන් පසු උපකාරක පන්ති තුළත් සිර කර තබාගෙන අප මෙතෙක් කල් ඔවුන්ට උගන්වා ඇත්තේ පවතින සමාජ ක්‍රමයේ වහලුන් වීමටය. එය ටික දිනකටවත් නැති වීම ඔවුන්ට අපූරු නිදහසක් වනුයේ නැද්ද?***

මෙම කාලය තුළ පොත් පත් කියවීම වැඩි වීම සහ විද්‍යුත් මාධ්‍යවල ප්‍රයෝජනවත් වැඩ සටහන් නැරඹීම වැඩි විය. මෙය සාමාන්‍ය ජීවිතයේ පැවතිය යුතු තත්වයකි. එම සාමාන්‍ය ජීවිතය යනු විපත්වලට ඔරොත්තු දෙන පැවැත්ම බව අපට කියා දෙන පණිවුඩයයි.

මේ කාලය තුළ අපේ සමාජ ජීවිතයේ යහ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය දෙයක් සිදු විය. එනම් හැම දේකටම මහා උත්සව පැවැත්වීම ඇතුළු ඝෝෂාකාරී දේවල් නැවතීම හැම අතින්ම යහපත් ය. ඝෝෂාකාරී ආගම් ඇදහීම පවා නැවතීමෙන් කිසිවකුට හානියක් සිදු වී නැත.

මේ අතර අප ඉංග්‍රීසි පාලනයේ ඇති වරද දකින මුත් ඔවුන්ගේ කාලයේ ආරම්භ කළ සෞඛ්‍ය පුරුදු සහ නීති රීති අපට පිහිට විය. අත කට සේදීම ආදී පුරුදු අපට සංස්කෘතියෙන්ම පුරුදු වී තිබිණ. මේ සියල්ලෙන් අපට දුන් පණිවුඩය වූයේ අප සිටිය යුතු තැන භාවිතයෙන්ම මතක් කිරීමය. එනම් විපත් කවදත් ඇති විය හැකිය. අප සූදානම්ව සිටිය යුතු බවය.

**මිනිසාගේ ශ්‍රමයෙන් උපදවන අතිරික්ත ධනය සියල්ල පොදු මිනිසාගේ යහපතට යෙදිය යුතුව ඇත. වාතය, වතුර, ඉර එළිය, ඉඩම්, ගහකොළ, ආලෝකය ආදිය මෙන් ශ්‍රමයේ ඵලය ද පොදු දේපළක් විය යුතුව ඇත. මනුෂ්‍යයාද, ඔහුගේ මොළයද, සියලු ඉන්ද්‍රියන්ද විකාශය වූයේ මිනිසාගේ සාමූහික ශ්‍රමය නිසාය. ශ්‍රමයේ ඵලය පොදු සම්පතක් විය යුත්තේ ඒ නිසාය. එසේ සැලකීම ස්වභාව ධර්මයට වඩා සමීප ය.**





# ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය සොයා යාම :

# අභියෝග සහ ජයග්‍රහණ



නීතිඥ
ක්‍රිෂාලි පින්ටෝ ජයවර්ධන

ලෝකය පුරා ආණ්ඩු තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා නීති හඳුන්වාදීම මානසික කම්පනයකින් යුතුව මග හරිමින් සිටින්නේ එම නීති තමන්ට එරෙහිව ක්‍රියාත්මක වනු ඇතැයි සිතමින් බිය වන නිසා ය.

එක්තරා දුරකට එම බිය සාධාරණ ය. එසේ වුව ද, දේශපාලන බලය හසුරුවන උදවිය ඉලක්ක කරගත් සංවේදී මාධ්‍ය ශීර්ෂපාඨ සහ අවධානය දිනාගන්නා සමුළු හැරුණු විට, හොඳ තොරතුරු දැනගැනීමේ නීතියක් නීතිගත කිරීම නිතරම පාහේ ක්‍රියාත්මක වන්නේ ආණ්ඩුවේ වාසිය පිණිස ය. මෙය බොහෝවිට අවතක්සේරුවට ලක්වන කාරණයකි. නිහඬ සහ ඇතැම්විට අවධානයට ලක් නොවන පරිවර්තනයක් සිදුවන්නේ පියවරක් සහ ක්‍රමික පියවරක් වශයෙනි. කිසිදු ආකාරයකින් ප්‍රතිසංස්කරණයකට සැබවින් ම ලක් නොවී, දේශපාලන බලය වෙනස් වන විට බේරී සිටීමට හැකියාව ඇති, ආසියාවේ ඇති විශාල නිලධාරී තන්ත්‍රය ගැන පරීක්ෂාවෙන්

පරීක්ෂාවට යාම සාමාන්‍ය පුරවැසියන් විසින් අරඹනු ඇත.


මෙම අතිවිශාල සත්වයාට මුහුණ දීමේ දී, නීති තමන්ට එරෙහිව ක්‍රියාත්මක වූ ඓතිහාසික පසුබිමක් තුළ ඇත්තෙන් ම පළමු වතාවට තොරතුරු දැනගැනීමේ නීති තමන්ට ආධාර වන බව වෙනත් තත්ත්වයන් තුළ අසරණ වන පුරවැසියන්ට ටිකෙන් ටික අවබෝධ වෙයි. ඇත්තෙන් ම ශ්‍රී ලංකාවේ දී අප දැක ඇති පරිදි, අසාධාරණයන් සහ දූෂණ පවා හෙළිදරව් කිරීමට රජයේ නිලධාරීන් ම මෙම නීති යොදාගෙන ඇත. ශ්‍රී ලංකා තොරතුරු කොමිසමේ දෘෂ්ටි කෝණයෙන් කතා කරන විට අපට පෙනී ගොස් ඇත්තේ අප ඉදිරියට එන ජනතාව තුළින් ම, තොරතුරු දැනගැනීමේ පනත මගින් රටට සිදු වී තිබෙන යහපත පිළිබඳව පිළිගැනීමක් ලැබෙන බව යි.

ශ්‍රී ලංකාවේ 2016 අංක 16 දරන තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක වීම ඇරඹුණු 2017 පෙබරවාරි 3 දා රටේ ඈත නැගෙනහිර කොටසේ දෙමළ ජාතික මවුවරුන් පහළොස් දෙනකුගේ කණ්ඩායමක් පොලිස් ස්ථානවලට අමාරුවෙන් ඇතුළු වී තොරතුරු දැනගැනීමේ පනත ලෙලවමින් ඉල්ලා සිටියේ ආණ්ඩුව සහ දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය අතර 2009 දී පැවති ගැටුමේ අවසන් අවස්ථාවේ දී අතුරුදන් වූ තම දූ පුතුන්ට සිදුවූයේ කුමක්ද යනුවෙනි.

මෙය පොලීසිය මුහුණ දීමට සූදානම් ව නොසිටි අලුත් තත්ත්වයකි. තමන් වෙත එල්ල වූ ප්‍රශ්නවලට මුහුණ දෙමින් සිටි පොලිස් නිලධාරීන් වැඩි දෙනා බහුතර සිංහලන් වූ අතර තමන් වෙත එල්ල වූ පනතේ දෙමළ පිටපත් කියවා ගැනීමේ හැකියාවක් ඔවුන්ට තිබුණේ නැත. තොරතුරු දැනගැනීමේ පනතක් ඊට පෙර වසරේ දී පාර්ලිමේන්තුවෙන් සම්මත වූ බව ඇතැම් නිලධාරීන් යන්තමින් දැන සිටිය ද පනතේ ඇත්ත වශයෙන් ම තිබෙන්නේ කුමක්ද කියා ඔවුන් කිසිවකු දැන සිටියේ නැත. අන්තිමේ දී මවුවරුන්ට සිදු වුයේ පනතේ එක් එක් වගන්තියේ ඇත්තේ කුමක්දැයි විශ්මිතව සිටි පොලිස් නිලධාරීන්ට තමන් දන්නා සිංහලෙන් පැහැදිලි කර දීමටයි.

දැන් බොහෝ රටවල මෙය අසාමාන්‍ය තත්ත්වයක් ලෙස සැලකෙන්නේ නැත. එසේ වුව ද, ශ්‍රී ලංකාවේ 1970 ගණන් සිට දරුණු ජනවාර්ගික ගැටුමකට මුහුණ දෙමින්, ගැටුම් පවතින ප්‍රදේශවල දශක ගණනාවක් ජීවත්වන ජනතාව බලධාරීන්ගෙන් ප්‍රශ්න නොකරන සහ ඔවුන්ට අභියෝග නොකරන පසුබිමක මෙම වර්ධනය ඇත්තෙන්ම සැලකිය යුතු එකකි. රජයේ නියෝජිතයන්ගෙන් වගවීම ඉල්ලා සිටීමට නීතියක් මගින් තමන් බලසතු වී ඇති බව මවුවරුන්ට දැනීම අසාමාන්‍ය ය.

මෙය සාමාන්‍ය ජනයා සතු අවියක් ලෙස තොරතුරු දැනගැනීමේ පනතේ ඇති බලය පෙන්වන එක් උදාහරණයකි. මගේ හිතවතෙක් මාස ගණනකට පෙර 'අවිය' යන යෙදුම භාවිත කිරීම ගැන විරෝධය ප්‍රකාශ කළේ ය. එය යම් ආකාරයකින් ප්‍රතිවිරෝධයක් නොවේ දැයි ඔහු ප්‍රශ්න කළේ ය. එසේ වුව ද, මගේ ප්‍රතිචාරය සරල ය. අවියක් හැමවිට ම විනාශකාරී විය යුතු නැත. ඒ වෙනුවට එය වෙනසක් සඳහා අවියක් හෝ නියෝජිතයෙක් හෝ විය හැකි ය. වඩාත් කැපී පෙනෙන සිදුවීම් පමණක් වාර්තාකරණ, අවධානය දිනා ගන්නා මාධ්‍ය ශීර්ෂපාඨ හැරුණු විට වැඩි වැඩියෙන් සාමාන්‍ය ජනයා තොරතුරු දැනගැනීමේ පනත එවැනි ආකාරයෙන් යොදාගෙන ඇත. රජයේ නිලධාරීන් විසින් වසර ගණනාවක් නොතකා හැර සිටීමෙන් පසුව පිළිතුරු ඉල්ලා සිටීමේ ප්‍රායෝගික හැකියාව ඇති නීතියක් දැන් ඔවුන් සතු ය. තොරතුරු දැනගැනීමේ අයිතිය ශ්‍රී ලංකාවේ දී ඉන්දියාවේ මෙන් තෘණ මූල මටමේ ව්‍යාපාරයක ප්‍රතිඵලයක් නොවුව ද, රට පුරා බොහෝ පුරවැසියන් මෙම පනත යොදාගැනීම අසාමාන්‍ය තත්ත්වයකි. පනතේ



ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ
අයිතිවාසිකම පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 2016 අගෝස්තු මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2016 අගෝස්තු මස 05 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 21.00 යි. තැපැල් ගාස්තුව : රු. 20.00 යි.

**නීති තමන්ට එරෙහිව ක්‍රියාත්මක වූ ඓතිහාසික පසුබිමක් තුළ ඇත්තෙන් ම පළමු වතාවට තොරතුරු දැනගැනීමේ නීති තමන්ට ආධාර වන බව වෙනත් තත්ත්වයන් තුළ අසරණ වන පුරවැසියන්ට ටිකෙන් ටික අවබෝධ වෙයි. ඇත්තෙන් ම ශ්‍රී ලංකාවේ දී අප දැක ඇති පරිදි, අසාධාරණයන් සහ දූෂණ පවා හෙළිදරව් කිරීමට රජයේ නිලධාරීන් ම මෙම නීති යොදාගෙන ඇත. ශ්‍රී ලංකා තොරතුරු කොමිසමේ දෘෂ්ටි කෝණයෙන් කතා කරන විට අපට පෙනී ගොස් ඇත්තේ අප ඉදිරියට එන ජනතාව තුළින් ම, තොරතුරු දැනගැනීමේ පනත මගින් රටට සිදු වී තිබෙන යහපත පිළිබඳව පිළිගැනීමක් ලැබෙන බව යි.**

"

**කලාපයේ වෙනත් තොරතුරු දැනගැනීමේ නීතිවලට වෙනස්ව, ආරක්ෂක හා බුද්ධි ආයතන ද පනතින් ආවරණය වෙයි. යෝග්‍යතාව සඳහා ඉහළ ම සම්මතයන් කැපකිරීමට දැඩි ලෙස සහ සම්මුති විරහිත ලෙස විරුද්ධ වනු ලැබී ය. උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ නීතියෙන් ජාතික ආරක්ෂක ආයතන සහ ප්‍රධාන නඩු පවරන්නාගේ දෙපාර්තමේන්තුව නිදහස් කළ යුතු බවට විශාල පීඩනයක් එල්ල වන විට අපගේ අවධාරණය වුයේ කිසිදු ආයතනයක් නීතියට ඉහළින් නොපැවතිය යුතු බව යි.**



https://www.trinitycollege.lk/

පළමු වසරේ පළමු දවස....

තමන්ගේ සිංහල සහ දෙමළ පිටපත් සමග තොරතුරු දැනගැනීමේ කොමිසම වෙත එන ඔවුහු රාජ්‍ය නිලධාරීන් ඉදිරියේ වාඩි වී තම ප්‍රශ්න විවාද කරති.

## තොරතුරු දැනගැනීමේ නීතිය කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට බල පෑ මුලධර්ම

2016 අගෝස්තු මාසයේ නීතියක් ලෙස සම්මත වූ තොරතුරු දැනගැනීමේ පනත සකස් කළ කෙටුම්පත් කමිටුවට ප්‍රධාන මුලධර්ම තුනක් දන්වනු ලැබී ය.

***පළමුවැන්න විභිවිදහාවය පවත්වාගැනීමේ දී රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන අතර සමානතාවයේ මුලධර්මය යි.***

එබැවින් පනතට ජනාධිපති කාර්යාලයේ සිට පහළට රජයේ ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන පමණක් නොව ආණ්ඩුවේ ආධාරයෙන් පවත්වාගෙන යන සංස්ථා ද, රජය සමග කොන්ත්‍රාත් කරන පෞද්ගලික ආයතන සහ ඔවුන් විසින් ජනතාවට සේවය සලසන ප්‍රමාණයට අනුව රජයේ, විදේශීය ආණ්ඩුවල හෝ ජාත්‍යන්තර ආයතනවල මුල්‍ය ආධාර විශාල ලෙස ලබන රාජ්‍ය නොවන සංවිධාන ද ඇතුළත් කරනු ලැබී ය.

කලාපයේ වෙනත් තොරතුරු දැන ගැනීමේ නීතිවලට වෙනස් ව, ආරක්ෂක හා බුද්ධි ආයතන ද පනතින් ආවරණය වෙයි. යෝග්‍යතාව සඳහා ඉහළ ම සම්මතයන් කැපකිරීමට දැඩි ලෙස සහ සම්මුති විරහිත ලෙස විරුද්ධ වනු ලැබී ය. උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ නීතියෙන් ජාතික ආරක්ෂක ආයතන සහ නීතිපති දෙපාර්තමේන්තුව නිදහස් කළ යුතු බවට විශාල පීඩනයක් එල්ල වන විට අපගේ අවධාරණය වුයේ කිසිදු ආයතනයක් නීතියට ඉහළින් නොපැවතිය යුතු බව යි.

මෙය විශිෂ්ට වර්ධනයක් වීය. ශ්‍රී ලංකාවේ සිවිල් සහ වාර්ගික ගැටුම්වලට හේතු වුයේ තොරතුරු ලබාදීම නීතිය මගින් නිල වශයෙන් ම ප්‍රතික්ෂේප කරනු ලැබීම යි. තොරතුරු ලබා නොදීම සම්මතය වූ අතර තොරතුරු හෙළි කිරීම ව්‍යතිරේකයක් වී ය. මෙම චින්තනයෙන් බැහැරව යමින්, මුලික මුලධර්මය වුයේ, ව්‍යතිරෙකයන් බල පවත්වන විට එය යම්කිසි ආයතනයක වරප්‍රසාදයක් ලෙස නොව විෂය කරුණක් ලෙස සිදුවිය යුතු බව යි. මේ සියලු දේ මහජන සුබසිද්ධිය යන්න මගින් අභිබවා යා හැකි ය.

***දෙවන මුලධර්මය වුයේ තොරතුරු දැනගැනීමේ අයිතිය රාජ්‍ය සේවයේ සතුරකු ලෙස පෙනී යාම සිදු නොවිය යුතු බවට වන පිළිගැනීම යි.***

පනත යටතේ තම රාජකාරි කිරීමේ දී ඇති වන කුමන හෝ ප්‍රතිවිපාකවලින් තොරතුරු නිලධාරීන් (එමෙන් ම වෙනත් නිලධාරීන්) ආරක්ෂා කිරීම පනත මගින් සිදුකොට ඇති (30 සහ 40 කොටස්) අතර වෙනත් නිලධාරියකුගෙන් තොරතුරු නිලධාරී සහය ඉල්ලු අවස්ථාවක එම සහය ලබාදීමට යුක්ති සහගත හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කළ හොත් එය වරදක් ලෙස දක්වා ඇත. ***කෙසේ වෙතත් දැන් බිය වීමට හේතු වී තිබෙන්නේ තමන්ගේ කාර්යයන් ඉටු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස තොරතුරු නිලධාරීන් මාරුකර යැවීම වැඩි වෙමින් පවතින බව තොරතුරු කොමිසමට දැනගන්නට ලැබීම යි.***



සංවර්ධනය දෙස ජනතා ඇස.....

alamy.com

**"මෙලෙස නීතිය උල්ලංඝනය කිරීම් ගැන කොමිසම තම බලවත් අවධානය යොමු කරන අතර ම ප්‍රජාවන් තොරතුරු දැනගැනීමේ පනත භාවිතා කිරීම ගැන රාජ්‍ය නිලධාරීන් කළ බියවැද්දීම් පිළිබඳව ලැබී ඇති වාර්තා කිහිපයක් සම්බන්ධයෙන් උචිත ප්‍රතිචාර ඉදිරි කාලයේ දක්වනු ඇත.**

ඇත්තෙන් ම හේතු වශයෙන් දක්වා ඇත්තේ ඔවුන් තොරතුරු ලබාදුන් බව නොවේ. ඒයට වෙනත් විවිධ හේතු දැක්වීම් සිදුකොට තිබේ. මෙලෙස නීතිය උල්ලංඝනය කිරීම් ගැන කොමිසම තම බලවත් අවධානය යොමු කරන අතර ම ප්‍රජාවන් තොරතුරු දැනගැනීමේ පනත භාවිත කිරීම ගැන රාජ්‍ය නිලධාරීන් කළ බියවැද්දීම් පිළිබඳව ලැබී ඇති වාර්තා කිහිපයක් සම්බන්ධයෙන් උචිත ප්‍රතිචාර ඉදිරි කාලයේ දක්වනු ඇත.

***තෙවන මූලධමය වූයේ නිතර ම පාහේ බලතුලනයෙන් අසමතුලිත බවක් පෙන්නුම් කරන රජය සහ පුරවැසියන් අතර විනිවිදභාවයට හිතවාදී ස්වාධීන කොමිසන් සභාවක් ස්ථාපිත කිරීම යි.***

ආසියාවේ බොහෝ රටවල අධිකරණය මත සම්පූර්ණයෙන් රඳා පැවතීම ප්‍රායෝගික නොවී ඇත්තේ විශාල වියදමක් දැරීමට සිදුවීමත්, නීතිමය ක්‍රියාමාර්ග කල්ගතවීමේ දුර්වලතාවයත්, සහ ඇතැම්විට විනිශ්චය කාරවරුන්ගේ ස්වාධීනත්වය ද දේශපාලන වශයෙන් සම්මුතියට ලක්වීමත් නිසා ය. එබැවින් අතරමැදි ආයතනයක අවශ්‍යතාව දැනෙන්නට තිබිණි.

ශ්‍රී ලංකාවේ කොමිසන් සභාව සමන්විත වන්නේ නීතිඥ සභාව, කර්තෘවරුන් සහ සිවිල්සමාජ සංවිධාන වැනි ස්වාධීන ආයතනවලින් නාමයෝජනා කළ සාමාජිකයන්ගෙනි. පත්කිරීමේ ක්‍රමවේදය මුළුමනින් ම දේශපාලනඥයන්ට ලබා දී නැත. තවත් විශේෂිත කාරණයක් වන්නේ පනත යටතේ සිදු කරන වරදක් සම්බන්ධයෙන් අපරාධ නඩු පැවරීමේ ක්‍රියාමාර්ග ගැනීම පොලිසිය හෝ රජයේ නඩු පැවරුම් නිලධාරියා විසින් නොව කොමිසම විසින් ම සිදු කිරීම යි.

## මේ දක්වා කොමිසමේ ප්‍රායෝගික අත්දැකීම්

ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය මතුවූයේ කැපවීමෙන් යුතු මාධ්‍යවේදීන්ගේ, ශාස්ත්‍රඥයන්ගේ සහ නීති ක්‍රියාකාරීන්ගේ මූලික කණ්ඩායමකිනි. එය මහජනයා පදනම් කරගත් තෘණ මූල මට්ටමේ ව්‍යාපාරයක් වූයේ නැත. මාධ්‍ය නීති ප්‍රතිසංස්කරණවල අත්‍යවශ්‍ය කොටසක් ලෙස තොරතුරු දැනගැනීමේ අයිතිය මාධ්‍ය මගින් නිරන්තරයෙන් ඉදිරිපත් කළේ ය. එහි ප්‍රතිඵලය වූයේ මෙය ප්‍රජාතාන්ත්‍රික හෝ පුළුල් සිවිල් නිදහස සඳහා වූ මෙවලමක් ලෙස පෙනීයනවා වෙනුවට මාධ්‍ය සඳහා වූ මෙවලමක් ලෙස පෙනීයාමයි. එසේ වුව ද, එය පළමු කොටසේ විශාල තෘප්තියකට හේතු වූ අතර ක්‍රියාත්මක කොට අද වසරක් ගතවන විට මාධ්‍ය හෝ සිවිල් සමාජ ක්‍රියාකාරීන් එය භාවිත කළාට වඩා විශාල වශයෙන් සාමාන්‍ය ජනයා එය භාවිත කළේය.

දශක ගණනාවක් තිස්සේ දූෂණයෙන් අවුල් කොට තිබූ ක්‍රමය කෙරෙහි මෙම නීතියේ බලපෑම සම්බන්ධයෙන් මගේ අදහස සඳහා එක් නිදර්ශනයක් යොදා ගනිමි.

රටේ ගුවන් නියමුවන්ගේ ජාතික සංගමය ඇතුළත් ශ්‍රී ලංකා ගුවන් නියමු සංසදය පසුගිය වසරේ අග භාගයේ තොරතුරු දැනගැනීමේ කොමිසමට අභියාචනයක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටියේ ජාතික ගුවන් සේවය වන ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් හි ප්‍රධාන විධායක නිලධාරියාට සහ වෙනත් ඉහළ විධායක නිලධාරීන්ට ලබාදෙන වැටුප් හා අනෙකුත් දීමනා පිළිබඳ විස්තර සමග ගුවන් සමාගමට විශාල පාඩු සිදුවීමට හේතු වන ලෙස කළමනාකරණය ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පිළිබඳව තොරතුරු සැලකිය යුතු ප්‍රමාණයක් ලබාදෙන ලෙස යි.

කලක් ලාභදායකව පැවති ගුවන් සේවය, වසර ගණනාවක් තිස්සේ සිදු වී ඇති දූෂණ, අයහපත් කළමනාකරණය සහ අකාර්යක්ෂමතාවය නිසා විශාල ලෙස පාඩු ලබන තත්ත්වයට පත්ව ඇති නිසා ශ්‍රී ලන්කන් ගුවන් සේවය දැන් පවත්වාගෙන යන්නේ භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදලින් පමණකි.

ගුවන් නියමු සංසදයේ අභියාචනය කොමිසම ඉදිරියේ ලැයිස්තු ගත කිරීමට තිබූ 99 වන අභියාචනය යි. ජාතික ගුවන් සේවය කොමිසම ඉදිරියට පැමිණියේ පොතපතෙහි ඇති සියලු දක්ෂතා ඇති සහ තොරතුරු ලබාදීමට විරුද්ධවීම සඳහා



**"**

**නීති කෙටුම්පත් (ශ්‍රී ලංකාවේ දී නීති කෙටුම්පත් ජනතාවට ලබාගැනීමට සාමාන්‍යයෙන් හැකි වන්නේ ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව පමණකි. ඉන් පසුව පුරවැසියන්ට අධිකරණයේ දී ඒවාට අභියෝග කිරීමට ලබා දී ඇත්තේ සති දෙකක කෙටි කාලයකි. නීතියක් ව්‍යවස්ථා විරෝධී වුව ද සම්මත වූ පසුව එයට අභියෝග කළ නොහැකිය.)**

වැදගත් සහ තාක්ෂණික සියලු නීති තර්ක ඉදිරිපත් කළ නීතිඥයන් සමග වන අතර ශ්‍රී ලන්කන් සමාගමේ ප්‍රතිරෝධය බරපතළ වී ය. කෙසේ වෙතත්, මාස හයක් තිස්සේ කළ තියුණු විභාගයකින් පසුව පිටු 25 කින් සමන්විත නියෝගයක් ලබාදෙමින් කොමිසම ශ්‍රී ලන්කන් සමාගමට නියෝග කළේ, එයාර් බස් එස්. ඒ. එස්. සමග පැවැත්වෙමින් තිබූ සාකච්ඡාවන්ට අදාළව වාණිජ රහස්‍යභාවය සම්බන්ධ කරුණු මත ඇතැම් ලේඛන හැර, අනෙක් තොරතුරු මහජන සුබ සිද්ධිය උදෙසා ලබාදිය යුතු බව යි. ඉල්ලා සිටි තොරතුරු, කොමිසමේ නියෝගයෙන් මසක් ඇතුළත ලබාදීමට ශ්‍රී ලන්කන් සමාගම කටයුතු කළේ ය.

මේ සම්බන්ධයෙන් තවත් බොහෝ උදාහරණ ඇත. කොමිසමේ නියෝග මත නිකුත් කළ තොරතුරු අතර පහත සඳහන් ස්වරූපයේ ඒවා ද වෙයි.

- විදුලි සංදේශ නියාමන කොමිසම මගින් වෙබ් අඩවි අවහිර කිරීම වැනි භාෂණයේ නිදහසට අහිතකර බලපෑම් ඇති කළ නියාමන ආයතනවල තීරණ
- ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සහ ටෙන්ඩර් ප්‍රදානය කිරීම්
- දේශපාලනඥයන්ගේ විදේශ සංචාරවල ප්‍රතිඵල ලෙස දැරීමට සිදු වන වියදම් සම්බන්ධ දත්ත
- විදෙස්ගත ශ්‍රමිකයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල් අතර තිබෙන ගිවිසුම්
- පරීක්ෂණ කොමිසන්වල මේ වනතෙක් රහසිගතව තබාගත් වාර්තා. එකක් නම් රජයේ ඇමතිවරයකු ගුවන් අනතුරකින් සැක කට යුතු ආකාරයෙන් මියයෑම සම්බන්ධයෙනි. තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ එබඳු පළමු වාර්තාව පසුගියදා ප්‍රකාශයට පත් කරන ලද්දේ කොමිසමට ඉදිරිපත් වූ අභියාචනයක ප්‍රතිඵල වශයෙනි. එම වාර්තාව නම් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ පාලන සමයේ වෘත්තීය සමිති ක්‍රියාකාරීන්ගේ උද්ඝෝෂණයක් මැඩ පැවැත්වීමට යෑමේ දී සිය ගණනකට තුවාල සිදු කළ හා එක් තරුණයකු මියගිය සිදුවීමේ දී පොලිසියේ සහ හමුදාවේ ක්‍රියාකාරිත්වය හෙළා දකිමින් විනිසුරුවරයෙක් ලබාදුන් වාර්තාවකි.
- නීති කෙටුම්පත් (ශ්‍රී ලංකාවේ දී නීති කෙටුම්පත් ජනතාවට ලබාගැනීමට සාමාන්‍යයෙන් හැකි වන්නේ ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව පමණකි. ඉන් පසුව පුරවැසියන්ට අධිකරණයේ දී ඒවාට අභියෝග කිරීමට ලබා දී ඇත්තේ සති දෙකක කෙටි කාලයකි. නීතියක් ව්‍යවස්ථා විරෝධී වුව ද සම්මත වූ පසුව එයට අභියෝග කළ නොහැකිය.)
- පාසල්වලට ළමයින් ඇතුළත් කර ගැනීමට සම්බන්ධ තොරතුරු
- පොලීසියට පැමිණිලි කළත් විභාග නොකළ පැමිණිලි
- රාජ්‍ය ආයතනවල උසස්වීම් සහ විනය ක්‍රියා පටිපාටි සහ එවැනි දෑ
- රජයේ නීතිඥයන් යොදා නොගෙන රජයේ මුදලින් පෞද්ගලික නීතිඥයන්ට මුදල් ගෙවීමට සම්බන්ධ තොරතුරු

2019 අවසානය දක්වා කාලය තුළ කොමිසම මගින් ලබා දී ඇති අවසන් නියෝග සංඛ්‍යාව 1,500 කට වැඩි ය. නීතිමය වශයෙන් කරුණු දක්වා ඇති ඒ සියල්ල කොමිසමේ ත්‍රෛභාෂා වෙබ් අඩවියෙහි අන්තර්ජාලයේ ඇත. මෙම අභියාචනා අතරින් බහුතරය ඉදිරිපත් කරන ලද්දේ සාමාන්‍ය පුරවැසියන් විසිනි. ගම්බද ප්‍රදේශවලින් සහ පනත සහ එහි ප්‍රතිපාදන ගැන හොඳින් දැනුවත් පුරවැසියන් විසින් ඒවා ඉදිරිපත් කොට ඇත. ඇත්ත වශයෙන් ම බොහෝ දෙනා මෙම පනත යොදාගෙන ඇත්තේ එසේ නැතහොත් එයට වැයවන මුදල සහ නීතියේ සිදුවන ප්‍රමාදයන් සහිතව අධිකරණයට ගොස් කරගත යුතුව තිබූ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ය.

මෙලෙස තොරතුරු ඉල්ලා සිටීමේ ඉක්මන් ප්‍රතිඵලයක් වන්නේ අවසාන ප්‍රතිඵලය හුදු තොරතුරු ප්‍රකාශ කිරීමෙන් ඔබ්බට යෑම යි. උදාහරණයක් ලෙස සුළු අපරාධයක් ගැන පොලීසියට කළ පැමිණිල්ල සටහන් කරගත් පසුව කළ විභාගය ගැන විමසීම් කළ විට බොහෝවිට සිදුවන්නේ සත්‍ය ලෙස ම විභාගයක් කිරීමට




විරෝධය පෑමේ අයිතිය....

> **පාසල්වලට ළමයින් ඇතුළත් කර ගැනීම ගැන තොරතුරු ඉල්ලීමට හේතු වූයේ විශේෂිත පාසලකට ඇතුළත්වීමට සුදුසුකම් ඇති නමුත් ඇතුළත් කර නොගත්, ක්‍රියාවලියේ දූෂණ යි. කොමිසමට ඉදිරිපත් වූ අභියාචනා ගණනාවක දී එම අක්‍රමිකතා හෙළිදරව් වීම නිසා ළමයින් ඇතුළත් කර ගැනීම සිදුවී ය. උතුරු මැද පළාතේ, පළාත් පරිපාලනයට ලබාදුන් මහජන මුදල් යොදා එම ප්‍රදේශයේ බිඳවැටුණු මාර්ග සහ වැව් ඉදිකිරීම ගැන ගම්වැසියන් ප්‍රශ්න කිරීමෙන් හෙළිදරව් වූයේ එම මුදලින් විශාල කොටසක් වංචා කොට ඇති බව යි. එම නිලධාරීන් සේවයෙන් පහකරනු ලැබූ අතර මුදල් ආපසු අයකර ගනු ලැබී ය.**

පෙළඹීම යි. නැගෙනහිර පළාතේ මවුවරුන් ගැන ඉහතින් සඳහන් කළ උදාහරණය සම්බන්ධයෙන් ද සිදු වූයේ එය යි.

බොහෝ අවස්ථාවල පාසල්වලට ළමයින් ඇතුළත් කර ගැනීම ගැන තොරතුරු ඉල්ලීමට හේතු වූයේ විශේෂිත පාසලකට ඇතුළත් වීමට සුදුසුකම් ඇති නමුත් ඇතුළත් කර නොගත්, ක්‍රියාවලියේ දූෂණ යි. කොමිසමට ඉදිරිපත් වූ අභියාචනා ගණනාවක දී එම අක්‍රමිකතා හෙළිදරවු වීම නිසා ළමයින් ඇතුළත් කර ගැනීම සිදු වීය. උතුරු මැද පළාතේ, පළාත් පරිපාලනයට ලබාදුන් මහජන මුදල් යොදා එම ප්‍රදේශයේ බිඳවැටුණු මාර්ග සහ වැව් ඉදිකිරීම ගැන ගම්වැසියන් ප්‍රශ්න කිරීමෙන් හෙළිදරව් වූයේ එම මුදලින් විශාල කොටසක් වංචා කොට ඇති බව යි. එම නිලධාරීන් සේවයෙන් පහකරනු ලැබූ අතර මුදල් ආපසු අය කර ගනු ලැබී ය.

මෙම අභියාචනා ඉදිරිපත් වන්නේ අදාළ ආයතන විසින් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ අවස්ථා සඳහා වන බැවින් මෙයින් පෙන්නුම් කරන්නේ තොරතුරු ඉල්ලා සිටීමේ අවස්ථා අතරින් සුළු ප්‍රතිශතයකි. උතුරු සහ නැගෙනහිර පළාත්වල දී හමුදාවේ ඉඩම් පරිහරණය සහ අත් අඩංගුවට ගැනීම් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට දෙමළ සහ මුස්ලිම් පුරවැසියන් විසින් පනත යොදාගනු ලැබී ය. දකුණේ දී අවධානය යොමු වූයේ රාජ්‍ය ආයතනවල දූෂණ සහ වැරදි කළමනාකරණය සම්බන්ධයෙනි. එක් අතෙකින් පුරවැසියන් විසින් පනත යොදා ගන්නා ලද්දේ පෞද්ගලික මට්ටමිනි. අනෙක් අතට පොදු යහපතට සහ මහජන සුබසාධනයට බොහෝ දෙනා එය යොදා ගත්හ.

## නිගමන සහ ඉදිරි අභියෝග

නීතිය ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයන් සහ වියදම් නිසා අධිකරණයට යාමෙන් වැළකී තම කාර්යයන් ඉටු කර ගැනීමට ශ්‍රී ලාංකිකයෝ තොරතුරු දැනගැනීමේ පනත යොදාගනිති. එසේ වුව ද, තොරතුරු ඉල්ලීම් ඉදිරිපත් කළ විට රජයේ නිලධාරීන් මහජනයාට තර්ජනය කිරීමේ සිදුවීම් ගැන බිය දනවන රටාවක් ගම්බද පළාත්වලින් වාර්තා වී ය. එක් අවස්ථාවක දී අප වෙත පැමිණි මාධ්‍යවේදියකු කොමිසමට පැමිණිලි කළේ තමන් තොරතුරු දැනගැනීමේ ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කිරීම නිසා හමුදාව තමා ගැන බුද්ධි වාර්තා තබාගැනීම ආරම්භ කොට ඇති බව යි. එම අවස්ථාවේ දී හමුදාවට අවවාද කරන ලද්දේ එබඳු බිය වැද්දීමේ අවස්ථා කිසිවක් සම්බන්ධයෙන් කොමිසමට දැනගන්නට ලැබුනහොත් ප්‍රතිවිපාක බරපතළ විය හැකි බවට ය.

අනෙක් කාරණය වන්නේ ඕනෑම තොරතුරු නීතියක ශක්තිය වන ක්‍රියාශීලී හෙළිදරව් කිරීමේ විධිවිධාන නිසා තොරතුරු හෙළි කිරීමට බල කරනු ලැබීමට පෙර ස්වේච්ඡාවෙන් තොරතුරු ලබාදීමට ආයතන පෙළඹීම යි. පසුගිය වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් රජයේ අධිකාරීන්ගේ පැත්තෙන් වන වාර්තාව සුබ වාදී නොවන්නේ ප්‍රධාන අමාත්‍යංශ මෙම ප්‍රතිපාදන තවමත් නොපිළිපදින නිසා ය.

***රාජ්‍ය හා පෞද්ගලික අංශය පුරා පවතින රහස්‍යභාවයේ සංස්කෘතිය, උදාසීනත්වය සහ දූෂිත භාවිතාවන් වෙනස් කිරීම ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ නීතිය මගින් සිදුවනු ඇත්ද? මුලින් ම ලැබෙන සංඥා හොඳ ය. එසේ වුව ද , අනාගත ආණ්ඩුවක් එයට පමණට වඩා මැදිහත්වීමට පැකිළෙන තරමට ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ නීතිය සමාජීය ව්‍යුහයට කාවැදීම තවමත් සිදු විය යුතුව තිබේ. එබැවින් එය අනාගත දේශපාලන වෙනස්කම් මගින් අවදානමට ලක් විය හැකි ය. එම විභවයක් සහිත ආණ්ඩුවක් තොරතුරු දැනගැනීමේ නීතිය යටපත් කිරීමේ ක්‍රියාවලියක නිරත වුවහොත් නොවැලැක්විය හැකි කම්පනය දරාගැනීමට තරම් ක්‍රියාවලිය ශක්තිමත් ද ?***

***තොරතුරු දැනගැනීමේ අයිතිය වෙනුවෙන් පෙනී සිටින්නන් සහ පුරවැසියන් මේ අවස්ථාවේ දී සිහිපත් කරගත යුතු ප්‍රශ්නය එය යි. මෙහි පදනම් මූලධර්ම යටපත් කිරීමට උත්සාහ දැරීමේ විභවයක් සහිත දේශපාලන ක්‍රියාකාරකම්වලට එරෙහිව මෙම නීතිය ආරක්ෂා කිරීමට හැකිවන්නේ මෙරටේ සිවිල් දේශපාලන කථිකාව තුළට තොරතුරු දැනගැනීමේ අයිතිය ඒ ආකාරයෙන් කා වැද්දීම තුළින් පමණකි.***



# සභ්‍යත්ව රාජ්‍යයේ

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ආගමනය




ආචාර්ය
**අසංග වැලිකල**

ආණ්ඩු පක්ෂයේ මහා මැතිවරණ ව්‍යාපාරය කේන්ද්‍ර වී ඇත්තේ ඊළඟ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් ලබා ගැනීම සඳහා ය. ආණ්ඩු පක්ෂයේ අපේක්ෂාව සෘජුවම ඉටු නොවුවත් ප්‍රබල මැතිවරණ ජයග්‍රහණයකින් පසුව අනිවාර්යෙන් සිදුවන පිල් මාරුවීම් තුළින් එය ඉටු කර ගනු ඇතැයි සිතිය හැකිය. ආණ්ඩුවට තුනෙන් දෙකේ බහුතරයක් අවශ්‍ය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීමේ අවශ්‍යතාවය නිසාය. ආණ්ඩුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදු කරන වෙනස් කිරීම් පිළිබඳව විධිමත් ලියවිල්ලක් ප්‍රකාශයට පත් කර නැති නමුත් අදහස් කරන වෙනස්ම්වල හැඩය සහ ලක්ෂණ පිළිබඳව විශ්වාසී සලකුණු ප්‍රසිද්ධියේ දක්නට ඇත. ජනාධිපති සහ අගමැති වරින් වර කරන ලද ප්‍රකාශවලට අමතරව පැහැදිලිම දර්ශකය වන්නේ යුතුකම සාකච්ඡා මණ්ඩපයේ ප්‍රධානි ගෙවිඳු කුමාරතුංග මහතා 2020 පෙබරවාරි මස ජනාධිපතිට භාර දුන් යෝජනා මාලාවයි. මෙය මහා මැතිවරණයෙන් පසු ඉදිරිපත් වන වෙනස්කම්වල එකම පදනම නොවන

නමුත් ඒ පිළිබඳ අදහස්වල ප්‍රධාන මූලාශ්‍රය සේ විශ්වාස කළ හැකිය.

යුතුකම යෝජනා මාලාවෙන් මූලධර්ම, ප්‍රධාන ආයතනික වෙනස්කම් සහ පාලක පක්ෂයේ දේශපාලන සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ලෝක දැක්මේ දාර්ශනික පදනම මෙන්ම ඊට පදනම් වන පුළුල් සමාජ සහ සංස්කෘතික ව්‍යාපාරය ගෙනහැර දක්වයි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එහෙත් තීරණාත්මක සාධක තුනකින් එළඹෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අදියර, සංශෝධන ක්‍රියාවලිය සහ අන්තර්ගතය යන දෙආකාරයෙන්ම මෙතෙක් අප කිසි දිනක හෝ දැක ඇති සංශෝධනවලින් වෙනස් වනු ඇත. ***පළමු වෙනස වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සිදු කරන පාලනයේ ස්වභාවයයි. මෙම පාලනය මෙහෙයවන සහ ඊට බලපෑම් කරන දේශපාලන, ආගමික,***




**මහින්ද රාජපක්ෂගේ කලින් පැවති පාලනය අපගාමී සහ සම්මිශ්‍රිත එකක් සේ පෙනේ. ජාතික චින්තනයේ න්‍යායාචාර්යන් සිංහල බෞද්ධ ජාතිවාදීන් අතර හිමි කර ගෙන ඇති බුද්ධිමය කීර්තිය කොපමණ වුවත් මින් පෙර කිසි දිනක අද මෙන් රාජ්‍ය බල ව්‍යුහයට මෙතරම් සමීප වූයේ නැත. සිංහල බෞද්ධ ජාතික සංස්කෘතියේ පරිහානිය සහ පරිභවය ගැන ඊනියා අනාවැකි කියන්නන් දැන් සිහසුන පිටුපස බුද්ධිමය බලවේගය වන අතර ඔවුහු සිංහල බෞද්ධ රාජ්‍යයේ පුනරුදය උදා කළ හැකි තත්වයක සිටිති.**

***ව්‍යාපාරික, වෘත්තියමය සහ බුද්ධිමය සුපිරි කොටස් අත්‍යන්තයෙන්ම, සමස්තයෙන්ම සහ කොන්දේසි විරහිතව සිංහල බෞද්ධ ජාතිකවාදීන් ය.*** මෙම සුපිරි කණ්ඩායම එකට එක් කරන මතවාදී, සංස්කෘතික සහ අනෙකුත් සමාජ බැඳීම්වල තියුණු සංගත භාවය, දීර්ඝ වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ඓතිහාසික ප්‍රමුඛත්වයේ පවා නොවූ ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැවත සකස් කිරීමේ බලවේගයක් වශයෙන් සිංහල බෞද්ධ ජාතිකවාදයේ ගුණාත්මක නව පිම්මක් පෙන්නුම් කරයි. මේ හා සසඳන විට මහින්ද රාජපක්ෂගේ කලින් පැවති පාලනය අපගාමී සහ සම්මිශ්‍රිත එකක් සේ පෙනේ. ජාතික චින්තනයේ න්‍යායාචාර්යන් සිංහල බෞද්ධ ජාතිවාදීන් අතර හිමි කර ගෙන ඇති බුද්ධිමය කීර්තිය කොපමණ වුවත් මින් පෙර කිසි දිනක අද මෙන් රාජ්‍ය බල ව්‍යුහයට මෙතරම් සමීප වූයේ නැත. සිංහල බෞද්ධ ජාතික සංස්කෘතියේ පරිහානිය සහ පරිභවය ගැන ඊනියා අනාවැකි කියන්නන් දැන් සිහසුන පිටුපස බුද්ධිමය බලවේගය වන අතර ඔවුහු සිංහල බෞද්ධ රාජ්‍යයේ පුනරුදය උදා කළ හැකි තත්වයක සිටිති.

සිංහල බෞද්ධ ජාතිකවාදයට නියෝජනයක් ලබා දීමට ප්‍රයත්න දැරූ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක සහ ජේ. ආර්. ජයවර්ධන (සහ කාල්පනිකව අධිරාජ්‍ය විරෝධී වූ පැරණි වාමාංශිකයන්) වැනි කලින් සිටි නායකයන් සමග වත්මන් සුපිරි කොටස්වල සමාජ සහ සංස්කෘතික පසුබිම සංසන්දනය කිරීමෙන් මෙම කරුණ අපට පැහැදිලි කළ හැකිය. මෙම නායකයන් තමන් නායකත්වය දීමට උත්සාහ කරන පංතියේ සහ සංස්කෘතියේ සැබෑ නියෝජිතයන් නොවේ. ඔවුහු මැතිවරණ දේශපාලන හේතු මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුවක් තුළ සිංහල බෞද්ධ ජාතිකවාදයට ඉඩ ප්‍රස්ථා ලබා දීමට උත්සාහ කළහ. අපගේ නූතනත්වය බටහිර නූතනත්වය සමග සමාන කිරීමෙන් බරපතළ වැරැද්දක් සිදුව ඇතැයි ද ඉන් අපගේම සංස්කෘතිය පිරිහීමට පත්ව ඇතැයිද මෙම සුපිරි කොටස් සිතති.

බණ්ඩාරනායක සහ ජයවර්ධන මෙන් නව සුපිරි කොටස්වල අරමුණ වන්නේ පැරණි සංස්කෘතියේ සභ්‍යත්වය නූතන රාජ්‍යය සමග බද්ධ කිරීම වුවත් වෙනස වන්නේ සංස්කෘතික යථාර්ථයට නූතනත්වය

www.dw.com _ www.voanews.com _ historica.fandom.com




මහින්ද රාජපක්ෂ සහ ගෝඨාභය රාජපක්ෂ



Xi Jinping



ජේ. ආර්. ජයවර්ධන

නොව, නූතනත්වය සංස්කෘතික යථාර්ථයට ගැළපෙන ආකාරයට සකස් කිරීමේ උත්සාහය යි. කෙතරම් අඩුපාඩු වුවද ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනයේ මෙතෙක් පදනම වූයේ (සභ්‍යත්ව) කාර්යයට (ව්‍යවස්ථාමය) ආකාරය යටපත් කිරීමේ පශ්චාත් යටත් විජිත ජාතිය ගොඩ නැගීමේ ආදර්ශය යි. ඊට පදනම් වන්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය බටහිර අත්දැකීමෙන් උකහා ගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ආකාරයට වඩා සංස්කෘතිකව වඩාත් උසස්යැයි යන රැඩිකල් පිළිගැනීම යි. කලින් පරම්පරාවන්ට වෙනස්ව වත්මන් සුපිරි කොටස් 1956 සංස්කෘතික, සමාජ ආර්ථික සහ දේශපාලන කඩඉමේ අව්‍යාජ ඓතිහාසික ඵලයන් ය. ඒ ආනන්ද විද්‍යාලය, ගජබා රෙජිමේන්තුව, පන්සල්, විශ්ව විද්‍යාල පමණක් නොව වෘත්තීන් සහ ව්‍යාපාර වැනි සංස්කෘතික ආයතන තුළින් දහනම වැනි සියවසේ අග භාගයේ සිට ගොඩ නැගෙමින් පැවති යටත් විජිත විරෝධී සිංහල බෞද්ධ පුනර්ජීවනයේ සභ්‍යයත්වයක වගකීම භාර ගත් සුපිරි කොටසකි.

දෙවැනිව, ***රාජ්‍යය සාර්ථකව ප්‍රති-සංවිධානය වූ කලින් අවස්ථා තුනට එනම් 1943-48, 1970-72 හා 1977-78 සමග පමණක් ගැළපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ව්‍යාපෘතියේ අභ්‍යන්තරික සංසක්ත භාවයක් පවතී. ප්‍රතිශෝධන සිදු කිරීම ග්‍රහණය කර ගෙන ඇති ප්‍රතිශෝධකයන්ගේ දේශපාලන ප්‍රමුඛත්වයේ වඩාත් කැපී පෙනෙන ලක්ෂණය වන්නේ පැහැදිලි දැක්මක් සහ නොසෙල්විය හැකි සේ බලය අත්පත් කර ගෙන සිටීම පමණි.*** ඔවුන්ගේ ප්‍රමුඛත්වය සමහර විට සමාන වන්නේ, නැතිනම් වඩාත් වැදගත් වන්නේ කිසියම් මතවාදී පිළිගැනීමක සාර්ථක වූ ප්‍රතිශෝධන ක්‍රමයක පොදු ලක්ෂණ මත පදනම් වීම ය. ඔවුන්ගේ වැඩසටහනේ සංසක්ත භාවය උකහා ගන්නේ දාර්ශනික අදහස්වල ශක්තිමත් පදනමකිනි. ශක්තිමත් නායකත්වය, සන්නිවේදනයේ කෘතහස්ත භාවයෙන් සහ තොරතුරු පරිසරයේ නායකත්වය හිමි කර ගැනීමට ඇති හැකියාවෙන් තහවුරු වේ. කලින් අවස්ථා තුනේ දී මෙන් මෙම පාලනයට දේශපාලන හෝ මතවාදී විරුද්ධත්වයකින් කිසියම් අර්ථාන්විත දුරකට හෝ බාධාවක් වී නැත.

වත්මන් ප්‍රතිශෝධන ව්‍යාපෘතියේ සංසක්ත භාවය සහ දෘඪ භාවය විෂය මූලික නොව මනෝමූලික බව අවධාරණය කිරීම වැදගත් ය. එනම් සාර්ථකත්වයේ එකම දර්ශකය වන්නේ ඔවුන් ආමන්ත්‍රණය කරන පිරිසට, එනම් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඡන්ද දායකයන් තුළ කුමන හේතුවක් නිසා හෝ කිසිම හේතුවක් නැතිව හැඟීමක් ඇති කිරීම ය. වෙනත් අයට ***යුතුකම යෝජනාවලිය අත්‍යන්තයෙන්ම බොළඳ, අරමුණුවලින් දුෂ්ට සහ සංකල්පීය වශයෙන් කෝඩුකාර හෝ ඒ තුනේම සම්මිශ්‍රණයකැයි පෙනෙනු ඇත. මෙම ලේඛනයේ සමහර කොටස්වලින් කෙරෙන සාකච්ඡාව ජාතිවාදී හැඟීමෙන් ඉතා ඉහළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සාක්ෂරතාවයෙන් ඉතා පහත් පල්හෑල්ලක් සේ පෙනෙනු ඇත.*** එහෙත් පහත සාකච්ඡා වන හේතු නිසා මෙම ප්‍රතිශෝධනවලට විරුද්ධවීම අදාළ විකල්පයක් නොවේ. එසේ වන්නේ

"

**කලින් පරම්පරාවන්ට වෙනස්ව වත්මන් සුපිරි කොටස් 1956 සංස්කෘතික, සමාජ ආර්ථික සහ දේශපාලන කඩඉමේ අව්‍යාජ ඓතිහාසික ඵලයන් ය. ඒ ආනන්ද විද්‍යාලය, ගජබා රෙජිමේන්තුව, පන්සල්, විශ්ව විද්‍යාල පමණක් නොව වෘත්තීන් සහ ව්‍යාපාර වැනි සංස්කෘතික ආයතන තුළින් දහනම වැනි සියවසේ අග භාගයේ සිට ගොඩ නැගෙමින් පැවති යටත් විජිත විරෝධී සිංහල බෞද්ධ පුනර්ජීවනයේ සභ්‍යත්වයක වගකීම භාර ගත් සුපිරි කොටසකි.**

එවැනි විවේචන දාර්ශනික හෝ තුලනාත්මක ස්ථාවරයකින් කෙරෙන නිසාය. එළඹෙන ව්‍යවස්ථා ප්‍රතිශෝධන ප්‍රයත්නයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ දේශපාලනයෙන් ඒවා තුරන් කිරීම ය.

මින් ඉදිරිපත් කෙරෙන අදහස්, වැඩ සටහන, නායකත්වය, උපාය මාර්ගය, සන්නිවේදනයේ සාර්ථක සංකලනයක් නොවන නමුත් ***ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසක් අපේක්ෂා කෙරෙන සිංහල බෞද්ධ ජාතිකවාදී ප්‍රතිපත්තියකට නැඹුරු වූ ඡන්දදායකයන්ගෙන් බහුතරයක පිළිගැනීමට ලක් වෙන නෛසර්ගික ව්‍යුහාත්මක වාසියක් පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසක් සඳහා මෙම යෝජනා ඔවුන්ට ගැඹුරින්, නිරායාසයෙන් සංස්කෘතිකව කම්පනයක් ඇති කරවයි.*** ජනතාවගේ බහුතරයකගේ හදවතට එවැනි සෘජු සම්බන්ධතාවයක් පැවතීමෙන් අදහස් වන්නේ ඔවුන්ගේ මනසට ආයාචනය කිරීමෙන් ප්‍රයෝජනයක් නොමැත යන්නයි. සිංහල-බෞද්ධ සුරපුරක් පිළිබඳ දැක්මකට එකඟ නොවන හෝ අවම වශයෙන් යෝජිත සමහර ප්‍රතිශෝධනවල අවශ්‍යතාවය, කැමැත්ත සහ ප්‍රායෝගිකත්වය පිළිබඳව සැක සංකා ඇති ජනතාවට සාධක දෙකකින් සැනසිය හැකිය. ඉන් සුළුතර කොටස් (හොඳින් හෝ නරකින්) බැහැර කිරීම ගැනත් 2015-19 යහපාලන ප්‍රයත්නය ඛේදාත්මකව අවසන් වීමෙන් ඉතා ඉහළ මට්ටමක ව්‍යාකූලත්වයට සහ කලකිරීමට පත්ව සිටින ජන කොටස් කෙරේ විශ්වාසය රැඳවිය හැකිය.

තුන්වැනි සාධකය ඉතා වැදගත් වන්නේ 1990 ගණන්වල සිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිශෝධන සඳහා ගත් උත්සාහයන්ගෙන් යුගමය වෙනසක් සලකුණු කිරීමෙනි. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනස සිදු වන්නේ කලක් තිස්සේ වෙනස් වෙමින් පවතින භූ දේශපාලන පරිසරයක ය. එහෙත් එය දැන් සුසමාදර්ශකයක් බවට පත්වීමට තරම් වෙනස්ව ඇත. ***ඓතිහාසිකව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනස් කිරීම් භූ දේශපාලන සන්දර්භයකින් සහ බලපෑම්වලින් තීරණය කරනු ලබන්නේ ඉන්දියාවෙන් සහ බටහිරෙනි. දැන් චීනය ඉතාමත් වැදගත් බාහිර සාධකය බවට පත්ව ඇත. සීතල යුද්ධය වූයේ යුරෝපීය ආලෝකනයේ (European Enlightenment) තරගකාරී අරුත් ගැන්වීම් ය. ආසියාව තුළ බටහිර බලපෑමේ පරිහානිය සහ චීන බලයේ නැගීම වඩාත් ගැඹුරු සංස්කෘතිමය මූලධාර්මික ගෝලීය බෙදීමක ආගමනය සනිටුහන් කරයි.*** ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සංවර්ධන ක්ෂේත්‍රයේ වර්ධනය වන චීන භූමිකාව පැහැදිලිවම දැකිය හැකිය. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අනුමිතින් තවම ප්‍රමාණවත්ව අවබෝධ කර ගෙන නැත. පශ්චාත් යටත් විජිත සංවර්ධනය වන ප්‍රජාතන්ත්‍රවාදී රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිශෝධන සංවාදය සංකල්පීය වශයෙන් ආකෘතිගත වූයේ පශ්චාත් දෙවන ලෝක යුද සමයේ අන්තර්ජාතික නෛතික පද්ධතිය සහ ජාතික රාජ්‍ය ගොඩ නැගීමේ දී ප්‍රජාතන්ත්‍රීයව ප්‍රමුඛ වූ සුසමාදර්ශක මතය. ***චීනයේ නැගීමෙන් මෙම සංකල්පීය කාණ්ඩ අස්ථාවර වන්නේ බටහිරට විකල්පයක් වන දේශපාලන සංවිධාන ආදර්ශ ඉදිරිපත් කිරීමට චීනයට එහි ආර්ථික බලය තුළින් හැකි වීම නිසාම නොව එහි නීතිය, දේශපාලනය සහ සංස්කෘතික සංකල්ප සිංහල බෞද්ධ ජාතිවාදීන් විසින් තමන්ගේම උරුමයක් සේ වැළඳ ගැනීම නිසාය.***

වත්මන් පාලනය නොයෙකුත් ප්‍රතිපත්ති හේතු සහ ආර්ථික අවශ්‍යතා නිසා චීන හිතවාදී ය. එහෙත් මතවාදී වශයෙන් චීනය සමඟ ඇති බැඳීම් විදේශ ප්‍රතිපත්ති වුවමනාවන්ගෙන් බෙහෙවින් ඔබ්බට යයි. එහි මතවාදී බැඳීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා චින්තනයේ සමානතා සහ ජාතික රාජ්‍ය පිළිබඳ නූතන අන්තර්ජාතික පිළිගැනීම් යුරෝපය කේන්ද්‍ර කොට ගත් එම නිසාම නිත්‍යානුකූල නොවන පද්ධතියක් සේ විවේචනය කිරීමෙන් සහ ප්‍රතික්ෂේප කිරීමෙන් පැන නගින ඓතිහාසික ආසියානු පොදු බව මත පදනම් සංස්කෘතික බැඳීම් කෙරේ යොමු වේ. යුතුකම යෝජනා පැහැදිලිවම මෙම මතවාදී පිවිසුම සහ වෛද්‍ය ගුණදාස අමරසේකරගේ 'සභ්‍යත්ව රාජ්‍යයක් කරා' යන පොත මත පදනම් වේ. මෙම කෘතිය ස්ථාපිත සිංහල බෞද්ධ ජාතික චින්තනය බටහිර ජාතික රාජ්‍යයට විකල්පයක් වශයෙන් 'චීන ශිෂ්ට රාජ්‍යය' සුසමාදර්ශකයක් ලෙස පිළිගෙන ඊට අනුබද්ධ වේ. මෙම මතවාදී බැඳීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය කෙරේ ඇති කරන බලපෑම් ඇත්තෙන්ම බෙහෙවින් ගැඹුරු ය. ආසියාවේ මතු වෙමින් පවතින 'නව චීන රාජ්‍ය සමය' තුළ මෙම කොම්ප්‍රදෝරු නව සුපිරි කොටස් සභ්‍යත්ව රාජ්‍යයක ආකාරයෙන් බල මණ්ඩලයක් තුළ බල මණ්ඩලයක් වීමට (*imperium in imperio*) අපේක්ෂා කරති.

## ශිෂ්ට රාජ්‍යයේ දර්ශනය

අමරසේකරගේ සභ්‍යත්ව රාජ්‍යය යනු 'ශිෂ්ට රාජ්‍යය' යන්නේ සිංහල යෙදුමයි. ශිෂ්ට රාජ්‍යය යනු මාර්ටින් ජැකීස් චීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සුසමාදර්ශය න්‍යාය ගත කළ ආකාරයයි. ඔවුන් අදහස් කරන ආකාරයෙන්ම චීනය තේරුම් ගැනීමට නම් ජාතික රාජ්‍ය සුසමාදර්ශකයට අනුකූලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනන්‍යතාවය තේරුම් ගැනීමට උත්සාහ කිරීමේ වැරැද්ද නොකළ යුතුය. සුවිශාල ඓතිහාසික කාල පරිච්ඡේදයක් සහ භූමි ප්‍රදේශයක් තුළ පැතිර ඇති චීනය, ජාතියකට වඩා ශිෂ්ටාචාරයක චින්තනයකින් නිර්වචනය වන චීන ස්වභාවයකින් යුතු ය. මෙම ශිෂ්ටාචාරයේ ඉතාමත් සුවිශේෂී වූ සභ්‍යත්වය නිර්වචනය වන්නේ දීර්ඝ කාලයක් තිස්සේ අඛණ්ඩව සිදු වූ පැවැත්ම නිසා පමණක් නොව විශාල වූ භූමි ප්‍රදේශයේ ඇති විවිධත්වය තුළිනි. චීන ස්වභාවය ජාතිකත්වයට වඩා ශිෂ්ටාචාරයක් පිළිබඳ වන්නේ අදාළ කාලය සහ අවකාශයේ පරිමාණය නිසාය. එහි ආර්ථික බලය පෙරට පැමිණෙත්ම ශිෂ්ටාචාර- රාජ්‍ය භාවය සහ සංස්කෘතිකව පිටස්තර වූ අන්තර්ජාතික පද්ධතියක් තුළ තවත් බලවත් ජාතික රාජ්‍යයකි යන්න අතර වන නොගැළපීම වඩ වඩාත් ප්‍රකට වේ.

***චීන ශිෂ්ටාචාර-රාජ්‍යය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය භාවිතාවන් අනුව ජාතික රාජ්‍යයෙන් බෙහෙවින් වෙනස් වූ නිර්මාණයකි. ජාතික රාජ්‍යය සහ ජනතා ස්වෛරීත්වය, ප්‍රජාතන්ත්‍රවාදය, සීමිත ආණ්ඩුව, පුද්ගල අයිතිවාසිකම්, නීතියේ ආධිපත්‍යය, රජය සහ ආගම වෙන් කිරීම, රාජ්‍ය/පුද්ගලික බෙදීම සහ පුද්ගලිකත්වයෙන් තොර නිලධාරි තන්ත්‍රය ඇතුළත් ඒ හා බැඳුණු ඉගැන්වීම් සියල්ල යුරෝපීය ආලෝකනයේ නිර්මාණයන් ය.*** පසුගිය වසර 500ක් තිස්සේ බටහිර බලය

"

**යුතුකම යෝජනා පැහැදිලිවම මෙම මතවාදී පිවිසුම සහ වෛද්‍ය ගුණදාස අමරසේකරගේ 'සභ්‍යත්ව රාජ්‍යයක් කරා' යන පොත මත පදනම් වේ. මෙම කෘතිය ස්ථාපිත සිංහල බෞද්ධ ජාතික චින්තනය බටහිර ජාතික රාජ්‍යයට විකල්පයක් වශයෙන් 'චීන ශිෂ්ටාචාර රාජ්‍යය' සුසමාදර්ශකයක් ලෙස පිළිගෙන ඊට අනුබද්ධ වේ. මෙම මතවාදී බැඳීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය කෙරේ ඇති කරන බලපෑම් ඇත්තෙන්ම බෙහෙවින් ගැඹුරු ය. ආසියාවේ මතු වෙමින් පවතින 'නව චීන රාජ්‍ය සමය' තුළ මෙම කොම්ප්‍රදෝරු නව සුපිරි කොටස් සභ්‍යත්ව රාජ්‍යයක ආකාරයෙන් බල මණ්ඩලයක් තුළ බල මණ්ඩලයක් වීමට (imperium in imperio) අපේක්ෂා කරති.**

ප්‍රමුඛත්වයට පත්වීම නිසා මේවා අන්තර්ජාතික පටිපාටියේ පදනම විය. චීනය ද පසුගිය ශතකය තුළ මෙම පටිපාටියට සහභාගි වුවද ඉතිහාසය, සභ්‍යත්වය සහ සිතීමේ හා පැවැත්මේ ආකාරයන් අනුව අනන්‍යතාවය පිළිබඳ චීන හැඟීම් කෙරේ මෙම ඉගැන්වීම් කිසිවක් බලපෑවේ නැත. චීන ශිෂ්ටාචාර රාජ්‍යයේ සංවිධානමය මූලධර්ම බටහිර ජාතික රාජ්‍යය පිළිබඳ ඒවායින් වෙනස්වනු පමණක් නොව ගැළපෙන්නේ ද නැත. ශිෂ්ටචාර-රාජ්‍යයේ සමාජයීය සුජාත භාවය උකහා ගන්නේ ප්‍රජාතන්ත්‍රීය ලක්ෂණවලින් නොව රාජ්‍යය සහ ශිෂ්ටාචාරය අතර ඇති සමීප සම්බන්ධතාවයෙනි. ශිෂ්ටාචාරයේ සභ්‍යත්වය නිර්වචනය වන්නේ කොන්පියුසියානු හරයන් මෙන්ම ආහාර, භාෂාව සහ පවුල සහ විස්තීර්ණ සමාජ ජාලයන් වටා ඇති සුවිශේෂී භාවිතාවන් වැනි වෙනත් ලක්ෂණවලිනි. ජැකීස් මෙසේ පවසයි:
***"රාජ්‍යය චීන ශිෂ්ටාචාරයේ මූර්තිය, භාරකරු සහ ආරක්ෂකයා ලෙස සැලකේ. චීන සංස්කෘතියේ, ශිෂ්ට රාජ්‍යයේ එක්සත් භාවය, සංගතය, සහ ඒකාග්‍රතාවය පවත්වා ගැනීම ඉහළම ප්‍රමුඛතාවය වන අතර එය චීන රාජ්‍යයේ අති උතුම් කාර්ය සේ සැලකේ."*** වැඩි දුරටත් දීර්ඝ ඉතිහාසය පුරාම හන් ජාතිය අනෙකුත් ජාතීන් සමාග්‍රහණය කර ගත් අතර චීන ශිෂ්ටාචාර රාජ්‍යය ගොඩ නගා ඇත්තේ හන් අනන්‍යතාව වටාය.

අමරසේකරගේ 2016 කෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ චීන ශිෂ්ටාචාර රාජ්‍යයේ ජැකිස් න්‍යායගත කිරීම් තුළට ජාතික චින්තන මතවාදය රිංගවීමෙන් ශ්‍රී ලංකාව තේරුම් ගැනීම සහ එළඹෙන ලෝක පටිපාටියේ ගැළපීම පුරෝකතනය කිරීමයි. අමරසේකර සුපුරුදු ආකාරයට සිංහල බෞද්ධ ශිෂ්ටාචාර රාජ්‍යය චීන රාජ්‍යයට වඩා උසස්යැයි අදහස් කරයි. එය චීන රාජ්‍යයට වඩා පැරණි වීමට අමතරව පැරණි සිංහල බෞද්ධ දේශපාලනය චීන ආදර්ශයට හෝ ශ්‍රී ලංකාවේ දැනට පවතින තත්වයට වඩා ප්‍රජාතන්ත්‍රවාදී ය. එසේ වන්නේ රජුන්ගේ බලතල භූමි ප්‍රදේශ වශයෙන් ග්‍රාම රාජ්‍යයෙන් සහ දශරාජ ධර්ම සම්මතයෙන් සීමා වන නිසාය.

ජැකිස්ගේ චීන ආදර්ශ න්‍යාය අමරසේකර වැනි අයෙකුට ආකර්ෂණීයවීම තේරුම් ගැනීම පහසු ය. ජාතික චින්තනයේ රොමෑන්තික ප්‍රතිගාමී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලෝක දැක්ම චීන ශිෂ්ට රාජ්‍යය සමග පැහැදිලිවම සමානුරූපී වේ. රාජ්‍යභාවය පිළිබඳ එම ආදර්ශ දෙකම ඒක සංස්කෘතික සහ ධුරාවලීගත වේ. ඔවුහු කේන්ද්‍රයේ ස්වෛරීත්වය, සීමිත ප්‍රාදේශීයත්වයේ බදු ගෙවන ආදර්ශයකින් තුලනය කිරීමට අදහස් කරති. ඔවුන් හික්මවන්නේ අයිතිවාසිකම්වලට වඩා යුතුකම්වලිනි. ප්‍රජාතන්ත්‍රීය බහුත්වවාදයට වඩා වරප්‍රසාදිත එකමුතුකමේ සහජීවනයෙනි. ඒ දෙකොටසම රාජ්‍යය සහ සමාජය අතර සම්බන්ධතාවය වෙන් කිරීමක් නොව ඌනපූරකයක් සේ දකිති. ඒ දෙකොටසටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය සමග ගුණාත්මක වූ කිසිවක් නැත. ශ්‍රී ලංකාව ආසියාවේ පැරණිතම ක්‍රියා පටිපාටි ප්‍රජාතන්ත්‍රවාදය යි. එමනිසා ජාතික චින්තන ලිපි ලේඛනවලට සහ සිංහල බෞද්ධ ජාතිකවාදීන්ගේ අලංකාරෝක්තිවලට ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාවය සහ ජනතා ස්වෛරීත්වය වැනි වචන යොදා ගැනීමටත් ජනරජය, ඒකීය රාජ්‍යය, බලතල අඩු ජනාධිපති ක්‍රමය පමණක් නොව මානව අයිතිවාසිකම් වැනි නූතන, එනම් බටහිර ආයතනවල ස්වරූපයන් ගැන විශ්වාසය රැඳවීමට බල කරයි. ඊට අමතරව චීන සහ සිංහල බෞද්ධ ජාතිකවාදී ශිෂ්ටාචාරයේ රාජ්‍ය පුනරුච්චාරණයේ සුජාත භාවය සහ සංගත භාවය මූලික වශයෙන් අත් කර ගන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ස්වයං තීරණයෙන් හෝ අනුමැතියෙන් නොව ඓතිහාසිකව පිළිගත් සංස්කෘතියේ සහ රාජ්‍යයේ සාර්ථකත්වයේ නියමයන් අනුවය. මෙම ධුරාවලිය තුළ සමාග්‍රහණයට සහ සුවිශේෂී සුළුතර සංස්කෘතීන්ට ඉඩ සැලසෙන ප්‍රමාණය ගැන අවශ්‍යයෙන්ම කැපවීමක් නැත. නමුත් ස්ථාපිත ධුරාවලියට අනුකූලව අන්තර්ග්‍රහණයට විරෝධය පාන සුළුතරයේ සහ පුද්ගලයන්ගේ ඉල්ලීම් ඉවසන්නේ නැත.

***ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි තර්ක ක්‍රමය පදනම්ව කෙරෙන විවේචන මෙම ක්‍රමයට අවශ්‍යයෙන්ම වලංගු නොවන්නේ එවැනි තර්ක ක්‍රමයක් අප්‍රමාණික ලෝක සංස්කෘතික දැක්මක් මත පදනම් වන නිසාය. චීන සහ සිංහල බෞද්ධ ශිෂ්ටාචාර රාජ්‍යයන් සුජාතභාවය හිමි කර ගන්නේ බටහිර මිනුම් දඬු අනුව නොව තමන්ගේම සංස්කෘතික සහ ඓතිහාසික අගයන් පදනම් කර ගෙනය. කෙසේ වුවත් රාජ්‍ය සංවිධානයේ මෙම ආදර්ශයෙන් වෙනස් අදහසක් දැක්වීම නිරර්ථක වන්නේ සරලව ඒ තුළ විසම්මුතියට කිසිම අවකාශයක් නැති නිසාය. ශිෂ්ටාචාර රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රයත්නයේ සම්පූර්ණ සාර්ථකත්වය රඳා පවතින්නේ***



චීන සංස්කෘතික උළෙලක්

***ශිෂ්ටාචාරමය සංස්කෘතික ප්‍රජාවට සියලුම දෙනා අවනතවීම මතය. වැඩි දුරටත් බලය පිළිබඳ ඒකාධිකාරිය දරන රාජ්‍යයේ මූලික වගකීම වන්නේ එය පවත්වා ගැනීමයි.***

## ශිෂ්ටාචාර රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ගෙවිඳු කුමාරතුංග ගේ යුතුකම යෝජනා පදනම් වන්නේ ඉහතින් දැක් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදී දාර්ශනික ආදර්ශය මතය. එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනස සඳහා වූ නිශ්චිත යෝජනා ශීර්ෂ පහක් යටතේ කාණ්ඩ කර ඇත: (අ) අපගේ උරුමය වූ ශිෂ්ටාචාර රාජ්‍යය කරා පියවර නැගීම (ආ) ජනතාවගේ සැබෑ නියෝජනය සහ ජනතා ස්වෛරීත්වය (ඇ) ඒකීය ශ්‍රී ලංකාව ස්ථාවර කිරීම (ඈ) විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය අතර බලය තුලනය කිරීම (ඉ) යුතුකම මත පදනම් සමාජයක් යනුවෙනි. මෙම ශීර්ෂ යටතේ කෙරෙන සාකච්ඡාවට නිශ්චිත සංශෝධන හෝ පවතින වැඩ පිළිවෙළ අනුමත කිරීම් ඇතුළත් ය. මෙම සාකච්ඡාවේ සමහර විවාදාත්මක කරුණු සාධක වශයෙන් සහ විශ්ලේෂණාත්මක පදනමකින් බෙහෙවින්ම අගතිගාමී වුවද සීමිත අවකාශය නිසා මම ඒ ගැන සාකච්ඡා කිරීමට අදහස් නොකරමි.

### (අ) අපගේ උරුමය වූ ශිෂ්ටාචාර රාජ්‍යය කරා පියවර නැගීම

විධායක ජනාධිපති ක්‍රමය දිගටම පවත්වා ගනු ඇත. සෘජුවම තෝරා ගන්නා ජනාධිපති, රාජ්‍යයේ සහ ආණ්ඩුවේ ප්‍රධානියා මෙන්ම ආරක්ෂක ඇමති ද වේ. රාජ්‍ය නායකයා දශ රාජ ධර්මය අනුව පාලනය කළ යුතු අතර එය ජනාධිපති දිවුරුමට ඇතුළත් කළ යුතුය. ජනාධිපති පක්ෂ දේශපාලනයෙන් ඉවත් විය යුතුය. එය සහතික කරනු සඳහා විධායක බලය අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට, ව්‍යවස්ථා සභාවට සහ ස්වාධීන කොමිසන් සභාවලට ලබා දේ.

එක් එක් ගමක සෑම නිවැසියෙකුම ඇතුළත් වන සේ සෑම කොට්ඨාශයකම (ගමකම) ජනමූල සභා පිහිටුවනු ඇත. එහි අරමුණ වන්නේ අපගේ ශිෂ්ටාචාරයේ පදනම වන ගම බලගැන්වීම සහ පක්ෂ දේශපාලනය අනුව ඇති වන බෙදීම් තුරන් කිරීම ය. එක් එක් කොට්ඨාශයක යහ පැවැත්ම සහ සංවර්ධනය පිළිබඳ සියලු

**"**

**ජැකීස්ගේ චීන ආදර්ශ න්‍යාය අමරසේකර වැනි අයෙකුට ආකර්ෂණීය වීම තේරුම් ගැනීම පහසු ය. ජාතික චින්තනයේ රොමැන්තික ප්‍රතිගාමී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලෝක දැක්ම චීන ශිෂ්ට රාජ්‍යය සමග පැහැදිලිවම සමානුරූපී වේ. රාජ්‍යභාවය පිළිබඳ එම ආදර්ශ දෙකම ඒක සංස්කෘතික සහ ධූරාවලීගත වේ. ඔවුහු කේන්ද්‍රයේ ස්වෛරීත්වය, සීමිත ප්‍රාදේශීයත්වයේ බදු ගෙවන ආදර්ශයකින් තුලනය කිරීමට අදහස් කරති.**




අම්බලන්ගොඩ රූකඩ

www.youtube.com

කරුණු එහිදී තීරණය කරනු ඇත. පළාත් පාලන ඡන්ද විමසීමකදී කොට්ඨාශයෙන් ජය ගනු ලබන අපේක්ෂකයා ජනමූල සභාවේ සභාපති වන්නේය. ඉන් ජනමූල සභා සහ පළාත් පාලන බලධාරීන් අතර සම්බන්ධීකරණය සිදු වේ. කොට්ඨාශය තුළ සිටින ග්‍රාම නිලධාරි, කෘෂිකර්ම නිලධාරි, සමෘද්ධි නිලධාරි, කාර්මික උපදේශක, සාම විනිසුරු, පොලිස් නිලධාරි, සෞඛ්‍ය නිලධාරි සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් ජනමූල සභාවේ සාමාජිකයන් වනු ඇත. ජනමූල සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීමේ නීතිමය පදනම වන්නේ මෙම නිලධාරීන් නිල බලයෙන් එහි සාමාජිකයන් වීමෙනි.

**(ආ) ජනතාවගේ සැබෑ නියෝජනය සහ ජනතා ස්වෛරීත්වය**

සමානුපාත නියෝජන ක්‍රමය වෙනුවට නව ඡන්ද ක්‍රමයක් හඳුන්වා දෙනු ඇත. මේ සම්බන්ධයෙන් ඇති යෝජනාව පැහැදිලි නැති නමුත් යෝජිත ක්‍රමය අනුව මන්ත්‍රීවරුන්ගෙන් සියයට 75ක් සාමාන්‍ය බහුතර ඡන්දයෙන් මැතිවරණ කොට්ඨාශ අනුව තෝරා පත් කෙරෙන අතර, සියයට 20ක් සමානුපාතය අනුව පරාජිතයන්ගෙන් වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් අයගෙන් පත් වේ. ඉතිරි සියයට 5 මුළු රටෙන්ම සමානුපාතිකව පක්ෂ ලබා ගත් ඡන්ද ප්‍රමාණය අනුව ජාතික ලැයිස්තුවෙන් පත්වේ.

සෘජුවම තේරී පත් වූ මන්ත්‍රීවරයෙකු තමා තේරීපත් වූ පක්ෂයෙන් ඉවත් වූ විට හෝ පක්ෂයෙන් නෙරපූ විට ඔහු තේරී පත් වූ කොට්ඨාශය වෙනුවෙන් අතුරු මැතිවරණයක් පැවැත් විය යුතුය. පත් කරන ලද මන්ත්‍රීවරයෙකු තම පක්ෂයෙන් ඉවත් වූ විට හෝ පක්ෂයෙන් නෙරපූ විට තම පක්ෂයේ මැතිවරණ ප්‍රකාශයට අනුකූලව කටයුතු කළ බව අධිකරණය ඉදිරියේ තහවුරු කිරීමට අපොහොසත් වුවහොත් මන්ත්‍රී ධුරය අහෝසි වේ. මෙය දේශපාලන කරුණු පිළිබඳව අධිකරණ විමර්ශනය අසාමාන්‍ය ලෙස දීර්ඝ කිරීමකි. අධිකරණය දේශපාලනියකරණය වීමකින් තොරව භාවිතයේ දී මෙය ක්‍රියාත්මක කිරීමට ඉතාමත් අපහසු වනු ඇත.

කිසියම් පක්ෂයක මන්ත්‍රීවරුන්ගෙන් සියයට 25කට වැඩි කණ්ඩායමක් ස්වාධීනව කටයුතු කිරීමට ඉල්ලීමක් කරන්නේ නම් එසේ කිරීමට ඉඩ දිය යුතුය. මෙම අවසරය ඉල්ලන්නේ කාගෙන්ද ලබා දෙන්නේ කාටද යන්න පැහැදිලි නැත.

පාර්ලිමේන්තුවේ අඩුම වශයෙන් කාල සීමා දෙකක් සේවය කළ මන්ත්‍රීන්ට පමණක් විශ්‍රාම වැටුප් හිමි වේ.

ජනාධිපතිවරණයෙන් ජය ගන්නා අපේක්ෂකයා ඡන්ද බහුතරයක් පමණක් නොව ඡන්ද කොට්ඨාශ (භූමි ප්‍රදේශ) බහුතරයකින් ද ජයගත යුතුය. ඉන් අදහස් වන්නේ ජනාධිපති වශයෙන් තේරී පත් වන පුද්ගලයා රටේ බහුතර භූමි ප්‍රදේශය ද නියෝජනය කරන බව සහතික කිරීම ය.

පළාත් පාලන ඡන්ද විමසීම්වලදී එල්ලූ ආසන මූලධර්මය (*Overhang*) අහෝසි කරනු ඇත. සමානුපාතික නියෝජනය සඳහා පවත්වන සියලු ඡන්ද විමසීම්වල පරිසාධන මට්ටම සියයට 5ක් වනු ඇත.

පළාත් සභා, සෘජු ඡන්ද විමසීම අහෝසි කිරීමෙන් ප්‍රතිසංවිධානය කරනු ඇත. පළාත් සභාව පළාත තුළ ඇති පළාත් පාලන ආයතන සභාපතිවරුන්ගෙන් සියයට 75කින් ද, පළාත් පාලන ආයතනවල විපක්ෂයෙන් සියයට 20කින් ද පළාත් පාලන ඡන්ද විමසීම්වලදී ලබා ගන්නා ඡන්ද ප්‍රමාණය අනුව සමානුපාතිකව තෝරා ගන්නා පළාත් ලැයිස්තුවකින් පත්වෙන සියයට 5කින් ද සමන්විත වේ. පළාත් සභා පළාතේ සංවර්ධන සම්බන්ධීකරණ ආයතන වනු ඇත.

ජනමත විචාරණයකින් තොරව සම්මත කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන්නේ ද යන්න පනත සම්මත වීමෙන් සති දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයේ දී අභියෝග කිරීමේ මූලික අයිතිවාසිකමක් ඕනෑම පුරවැසියෙකුට ලබා දීමෙන් ජනතා ස්වෛරීත්වය ශක්තිමත් කෙරේ.

**(ඈ) ඒකීය ශ්‍රී ලංකාව ස්ථාවර කිරීම**

පාර්ලිමේන්තුව සතු ව්‍යවස්ථා සම්පාදනයේ උත්තරීතරභාවය ස්ථාපිත කළ යුතුය. පාර්ලිමේන්තුවේ පනත් පළාත් සභා පනත් අබිබවා යනු ඇත. අසමානතා වැළැක්වීමට නීතිය සහ සාමය මධ්‍යම ආණ්ඩුවේ විෂයක් විය යුතුය. ජන සංඛ්‍යාවෙන් දුප්පත්ම සියයට 10 ජීවිතයේ ගුණාත්මක භාවය වැඩි කිරීමට ඕනෑම අවස්ථාවක මැදිහත්වීම ජනරජයේ යුතුකමක් විය යුතුය. ඉඩම්, දරිද්‍රතාව සමනය කිරීම, අධ්‍යාපනය සහ සෞඛ්‍යය, මධ්‍යම රජයේ විෂයන් විය යුතුය. සිංහල, දිවයිනේ එකම දෙශීය භාෂාව වන නිසා එය රාජ්‍ය භාෂාව විය යුතුය. තම මවු බස දෙමළ වන පුරවැසියන්ට දෙමළෙන් අධ්‍යාපනය ලැබීමට සහ එම බසින් රජය සමග ගනුදෙනු කිරීමට ඇති අයිතිය ආරක්ෂා කරන අතර සිංහලයන්ගේද ඒ සමාන අයිතිය ආරක්ෂා කළ යුතුය. නිල වාර්තා පවත්වා ගැනීමේ භාෂාව සිංහල විය යුතු බව සහතික කිරීම රාජ්‍යයේ අනුලංඝනීය වගකීමකි. එම අරමුණෙන් උතුර සහ නැගෙනහිර නිල වාර්තා පවත්වා ගැනීමට සිංහල යොදා ගැනීමට සීමාවන් පනවා ඇති දහහය වැනි සංශෝධනය නිවැරදි කළ යුතුය.

**(ඇ) විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය අතර බලය තුලනය කිරීම**

කැබිනට් මණ්ඩලය අගමැති ඇතුළුව 30කට සීමා කළ යුතුය. ජනාධිපති බහුතරයේ විශ්වාසය හිමි මන්ත්‍රී අගමැති වශයෙන් පත් කළ යුතුය. අනෙකුත් ඇමතින්, අගමැතිගේ අනුමැතිය (හෝ ඔහුගේ නිර්දේශය) අනුව පත් කළ යුතුය. නියෝජ්‍ය අමාත්‍ය සංඛ්‍යාව පනහකට සීමා විය යුතු අතර එම පත්වීම් කළ යුත්තේ ද අගමැති ගේ අනුමැතිය (හෝ නිර්දේශය) අනුව ය. අමාත්‍ය පත්වීම් සිදු කළ යුත්තේ අගමැතිගේ අනුමැතිය හෝ නිර්දේශ මත ද යන්න පැහැදිලි නැත. එහෙත් මතුපිටින් පෙනෙන ආකාරයට ඉන් අදහස් වන්නේ දහනම වැනි සංශෝධනයෙන් හඳුන්වා දුන් 'උපදෙස් මත' යන අවශ්‍යතාවය ඉවත් කිරීම බව පෙනේ.


අමාත්‍යංශ සහ නියෝජ්‍ය අමාත්‍යංශ සංඛ්‍යාව සීමා කිරීම නිරපේක්ෂ කළ යුතුය. එම සීමාව ඉක්මවා යෑමට රාජ්‍ය අමාත්‍ය වැනි වෙනත් ආකාරයේ අමාත්‍යවරුන් පත් කිරීමට හෝ අමාත්‍ය තනතුරු වැඩි කිරීමට ප්‍රතිපාදන නොවිය යුතුය. ඕනෑම ඇමතියෙකු හෝ නියෝජ්‍ය ඇමතියෙකු ඉවත් කිරීමට බලය ජනාධිපතිට තිබිය යුතුය. පාර්ලිමේන්තුව ආරම්භවීමෙන් වසරකට පසුව ඕනෑම අවස්ථාවක එය විසුරුවා හැරීමට ජනාධිපතිට බලය තිබිය යුතුය.


සාමාජිකයන් දහ දෙනකුගෙන් යුත් ව්‍යවස්ථාදායක සභාවට අගමැතිගේ සහ විපක්ෂ නායකගේ නිර්දේශ මත නම් කරන සාමාජිකයන් පස් දෙනා පත් කිරීමේ වෙනසක් නැති වුවද එය පාර්ලිමේන්තු අනුමැතියට යටත් විය යුතුය. එම පස් දෙනාගෙන් තිදෙනකු සිවිල් සමාජයෙන් පත් කරනු වෙනුවට එක් අයකු ජාතික ආගමික නායකයන් විසින් නම් කරන අයකු සහ තවත් අයකු වෘත්තීය විද්වතුන්ගේ සංගම්වලින් නම් කරන කෙනකු ද අනෙකා වෙළඳ මණ්ඩලවලින් නම් කරන අයකු ද විය යුතුය. එමෙන්ම නිල බලයෙන් සාමාජිකයන් වන කතානායක, අගමැති සහ විපක්ෂ නායක එසේම සිටිය යුතු අතර ජනාධිපති සහ අනෙකුත් විපක්ෂයේ පක්ෂ නම් කරන අය ද එසේම සිටිය යුතුය. විපක්ෂ නායකයා පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ බහුතරයෙන් තොරා පත් කර ගත යුතුය. මින් අදහස් වන්නේ විපක්ෂයේ මන්ත්‍රීන්ගෙන් බහුතරය විය යුතුය.


ඉහළ අධිකරණයේ විනිසුරන්, නීතිපති, පොලිස්පති සහ ස්වාධීන කොමිසන් සභාවල සාමාජිකයන් ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපති විසින් පත් කළ යුතුය. පත්වීම් සිදු කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය ප්‍රධාන නිර්ණායකය විය යුතු අතර ඉන් වෙනස් වන්නේ නම් මෙම මූලධර්මයෙන් වෙනස්වීමේ හේතු දැක්විය යුතුය. මෙම නිලධාරීන්ගේ සේවා කාලය ජනාධිපතිගේ සහ පාර්ලිමේන්තුවේ සේවා කාලයට ගැලපෙන ආකාරයට වසර පහක් හෝ හයක් විය යුතුය. සේවා කාලය පිළිබඳ ස්ථිරතාවයක් නොමැතිවීමෙන් පෙනී යන්නේ (දහනම වැනි සංශෝධනයෙන් වසර පහකට අඩුකළ නිල කාලය) වසර හය දක්වා නැවත වැඩි කිරීමේ අදහස විය යුතුය.

අමාත්‍යංශ ලේකම්වරුන් රාජ්‍ය සේවා කොමිසමේ චක්‍රලේඛයක් පදනම් කර ගෙන ජනාධිපති විසින් පත් කළ යුතුය. කිසියම් වෙනසක් වන්නේ නම් එය රාජ්‍ය සේවා

> **"**
>
> **යුතුකම යෝජනා සාරාංශයෙන් නව සුපිරි කොටස්වල චින්තනය පිළිබඳ බොහෝ දුරට නිශ්චිත දර්ශකයක් ලබා දේ. බොහෝ දුරට මෙය මහා මැතිවරණයෙන් පසුව ඉදිරිපත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවල අන්තර්ගතය වනු ඇත. ඇමතිවරුන් පත් කිරීමේ දී අගමැති උපදේශය අවශ්‍යවීම දුර්වල කිරීම, ඇමතිවරුන් ඉවත් කිරීමේ ජනාධිපති බලය ප්‍රතිස්ථාපනය කිරීම, වසරකට පසු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ප්‍රතිස්ථාපනය කිරීම ඇතුළත් දහනමවැනි සංශෝධනයේ සමහර ලක්ෂණ, ඉවත් කිරීමෙන් විධායක ජනාධිපති ක්‍රමය නැවත ශක්තිමත් කර ඇත. අනෙක් අතට අගමැති පාර්ලිමේන්තුවේ විශ්වාසය නොව බහුතරයක් ලබා ගත යුතු බව සඳහන් කිරීමෙන් ජනාධිපතිගේ අභිමතානුසාරී බලය සීමා කරයි. ඉන් සුළුතර ආණ්ඩු පිහිටුවීමේ හැකියාව සහ ජනාධිපතිගේ පක්ෂයට පාර්ලිමේන්තු බහුතරයක් නැති අවස්ථාවක ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරණ සමයේ ව්‍යවස්ථාමය බිඳවැටීම් ඇති වීමේ බරපතළ තත්වය වළක්වයි.**




කොමිසමෙන් අනුමත කළ යුතුය. අමාත්‍යංශ ලේකම් සේවා කාලය ජනාධිපති සහ පාර්ලිමේන්තු සේවා කාලයට සමාන විය යුතුය.

**(ඉ) යුතුකම මත පදනම් වූ සමාජයක්**

මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට යුතුකම් ප්‍රකාශයක් ද ඇතුළත් විය යුතුය.

යුතුකම යෝජනා සාරාංශයෙන් නව සුපිරි කොටස්වල චින්තනය පිළිබඳ බොහෝ දුරට නිශ්චිත දර්ශකයක් ලබා දේ. බොහෝ දුරට මෙය මහ මැතිවරණයෙන් පසුව ඉදිරිපත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවල අන්තර්ගතය වනු ඇත. ඇමතිවරුන් පත් කිරීමේ දී අගමැති උපදේශය අවශ්‍යවීම දුර්වල කිරීම, ඇමතිවරුන් ඉවත් කිරීමේ ජනාධිපති බලය ප්‍රතිස්ථාපනය කිරීම, වසරකට පසු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ප්‍රතිස්ථාපනය කිරීම ඇතුළත් දහනමවැනි සංශෝධනයේ සමහර ලක්ෂණ, ඉවත් කිරීමෙන් විධායක ජනාධිපති ක්‍රමය නැවත ශක්තිමත් කර ඇත. අනෙක් අතට අගමැති පාර්ලිමේන්තුවේ විශ්වාසය නොව බහුතරයක් ලබා ගත යුතු බව සඳහන් කිරීමෙන් ජනාධිපතිගේ අභිමතානුසාරී බලය සීමා කරයි. ඉන් සුළුතර ආණ්ඩු පිහිටුවීමේ හැකියාව සහ ජනාධිපතිගේ පක්ෂයට පාර්ලිමේන්තු බහුතරයක් නැති අවස්ථාවක ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරණ සමයේ ව්‍යවස්ථාමය බිඳවැටීම් ඇති වීමේ බරපතළ තත්වය වළක්වයි.

ජනමූල සභා පිළිබඳ යෝජනාව බොහෝ දුරට කාල්පනික ය. ආණ්ඩුවේ නාස්තිය සහ දූෂණය පිළිබඳ තවත් ස්ථරයක් ඇති කිරීමෙන් සහ දේශපාලනීකරණය තවත් ව්‍යාප්ත කිරීමෙන් විසඳීමට අදහස් කළ ප්‍රශ්න වඩා තවත් ප්‍රශ්න ගණනාවක් මතු කරනු ඇත. ඒවා පූජකයන් සහ ප්‍රාදේශීය දේශපාලකයන් ඇතුළත් ප්‍රජාවේ කරදරකාරයින්ට, පුද්ගලික ජීවිතය පුළුල් ආක්‍රමණයකට අවස්ථාවක් වන අතර සමහර ප්‍රදේශවල විසිරී සිටින වාර්ගික සහ ආගමික සුළුතර කොටස්වල ජීවිතයට සහ දේපොළවලට හානියක් වීමට පවා ඉඩකඩ ඇත.

පළාත් සභා සම්බන්ධයෙන් යුතුකම කණ්ඩායමේ යෝජනාවලට පදනම් වූ ඔවුන්ගේ විශ්වාසයට ගැලපෙන ආකාරයට සරලව පළාත් සභා අහෝසි කිරීම නිර්දේශ කළේ නම් වඩාත් හොඳ තත්ත්වයක් විය හැකිව තිබිණ. බලය බෙදා හැරීමේ රාමුවට යොජනා කර ඇති අනෙක් වෙනස්කම් පැහැදිලි අරමුණක් නැතිව සහ සීමිත බලය බෙදා හැරීම සහ භාෂා ප්‍රතිපත්තියේ මූලික සාධකය ඉවත් කිරීමෙන් සම්පත් නාස්ති කරන ආයතන ගණනාවක් පවත්වා ගැනීමෙන් දහතුන් වැනි සංශෝධනය පිළිබඳ ප්‍රශ්න වඩාත් ගැඹුරු කරනු ඇත.

සමස්තයක් වශයෙන් මෙම මූලධර්ම මත පදනම්ව සැලසුම් කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඒ තුළින්ම පිහිටුවන නීතියේ ආධිපත්‍යය සමග ගැලපෙන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම දුෂ්කර වනු ඇත. ඒ මෙම සැලසුම් කිරීමේ ස්වභාවයේ 'මසුත් නොවන මාළුත් නොවන' තත්ත්වයක් පවතින නිසා සහ ඉන් ඇති කරන බලපෑම් පිළිබඳව

"

**ඵලදායක සන්නිවේදනයක් නොමැතිවීම යන කරුණ රජයේ මෙම පරාජයට හේතුපාදක වූ තවත් හේතුවක් කෙරෙහිද අදාළ වේ. එනම් 2015 දී දෙනු ලැබූ ප්‍රධාන පොරොන්දුව එනම් පසුගිය රෙජීමය කාලයේ සිදු වූ දූෂණයන්ට සම්බන්ධවූවන්හට දඩුවම් පැමිණවීම විෂයයෙහිදී හිස් අලංකාරෝක්තීන්ගෙන් ඔබ්බට වූ කිසිවක් සිදු නොවී තිබීමයි. ඊටත් වඩා මෙම තත්වය පවතින රජයේ දූෂණ මගින් තවත් සංකීර්ණ කරවනු ලැබ තිබේ.**

හෝ සමස්තයක් වශයෙන් එහි සංගත භාවය ගැන අවබෝධයක් නැති නිසා ය. ජාතික චින්තනයෙන් බැහැරව නොවෙනස්ව පදනම්ව ඇති එකම දේ වන්නේ යහ පාලනයෙන් කළ සියලු දේ ඉවත් කිරීම ය. මෙම යෝජනාවලින් දූෂණ ක්‍රියා අඩු කිරීමට අදහස් කළ ද එය සිදුවනු ඇතැයි සිතිය නොහැකිය. ඒ මෙම ක්‍රමයෙන් ජනාධිපති අධිපතිවාදය ශක්තිමත් කිරීමට සහ සංස්කෘතික වශයෙන් නොගැළපෙන්නේය යන හේතුවෙන් තිරස් සහ සිරස් වගවීමේ හරයන් සහ යාන්ත්‍රණ ප්‍රතික්ෂේප කිරීම නිසා, දූෂණ මූලාශ්‍ර ඉවත් කිරීමට සැලසුම් කළ කිසියම් වෙනස් කිරීමකින් අදහස් කළ දේ අබිබවා යෑමෙනි. ජනමූල සභා සහ දශරාජ ධර්මය සංස්කෘතික වශයෙන් වඩාත් පිළිගත හැකි ආකාරයට ක්‍රියාත්මක වනු ඇතැයි ද එම නිසා අතීතයේ මානව අයිතිවාසිකම් සහ නීතියේ ආධිපත්‍යය අසාර්ථක වූ තන් හි බලය සීමා කිරීමේ කාර්යන් වඩාත් ඵලදායි ආකාරයෙන් සිදු වනු ඇතැයි සිතන අය දැඩි සේ බලාපොරොත්තු කඩවීමට ලක් වනු ඇත. ශිෂ්ටාචාර රාජ්‍යයේ පාලනය වර්ගවාදී කිරීමෙන් දූෂණය, හිතුවක්කාර භාවය, වෙනස් කොට සැලකීම සහ අධිකාරීවාදය වඩාත් වැඩි වනු ඇත.

කෙටියෙන් මෙය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සැලසුම් කිරීම පිළිබඳව වැඩි යමක් නොදත් සහ තම දේශීය වූ දේශපාලන මතවාදයෙන් පනවා ගත් පටු කල්පනාව නිසා වෙනත් තැන්වල පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රජාතන්ත්‍රවාදයෙන් කිසිත් ඉගෙන ගැනීමෙන් වැළකී සිටින මිනිසුන් විසින් යෝජනා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රමයකට නිදසුනකි. නමුත් සැලසුම් කිරීමේ සූක්ෂ්මතාව වඩාත් වැදගත් නොවන්නේ ශිෂ්ටාචාර රාජ්‍යයේ රාජ්‍ය පාලන විධි, නීතියේ ආධිපත්‍යය මත නොව සංස්කෘතික ඉගැන්වීම්වලින් අනුබලය ලබන දේශපාලන බලය මත පදනම් වන නිසා ය. ශ්‍රී ලංකාවේ පාලනයේ ශේෂව පවතින වගවීමේ දිරාපත් වූ කොටස්, ආයතනිකව පණ ගැන්වෙන ජාතිවාදී බහුතරවාදයන් විසින් ඉවත දමනු ඇත. යුතුකම යෝජනා පදනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය ගුණාත්මකව වෙනස් වන්නේ මෙම අර්ථයෙනි.

## ශිෂ්ටාචාර රාජ්‍යයට පසුවː ප්‍රශ්න සහ අපේක්ෂා


යුතුකම යෝජනා රැඩිකල්වාදයේ සහ ආචීර්ණවාදයේ සංකලනයක් සේ විස්තර කළ හැකිය. එය රැඩිකල් වන්නේ රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය දර්ශනය ජාතික රාජ්‍යයේ සිට ශිෂ්ටාචාර රාජ්‍යය දක්වා සුසමාදර්ශකව නැවත සකස් කිරීමට අදහස් කිරීමෙනි. එහෙත් එය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පෙළ පාඨ සහ ආයතන වෙනස් කිරීමට අදහස් කරන ආකාරයෙන් ආචීර්ණවාදී ය. මෙය ශ්‍රී ලංකාවේ ජාතික චින්තන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වහාම ඇති කිරීමට අදහස් තරන අයට මුළුමණින්ම තාර්කික උපාය මාර්ගයකි. ඔවුන් කළ යුතු වන්නේ ශ්‍රී ලාංකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදයේ නෛතික සහ දේශපාලන පැතිමානයන් එකතු කොට සිංහල බෞද්ධ ශිෂ්ට රාජ්‍යයේ ජාතික චින්තනයෙන් උකහා ගත් දේශපාලන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අරමුණුවලට බටහිරෙන් උකහා ගත් නෛතික ව්‍යවස්ථාව වඩාත් හොඳින් යොදා ගැනීම ය.

ශ්‍රී ලාංකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය යනු නව ප්‍රජාතන්ත්‍රවාදයක පශ්චාත් යටත් විජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදයකි. ඉන් අදහස් වන්නේ එහි භාවිතය නූතනත්වය සහ සම්ප්‍රදාය අතර ආතතියක රඳා පැවතිම ය. නැතිනම් යටත් විජිත නීති උරුමය සහ පූර්ව යටත් විජිත භාවිතාවන් අතර පරස්පර තාවයකි.


***පශ්චාත් යටත් විජිත ලෝකය පුරා විවිධ රටවල් තමන්ගේම වටපිටාවන් මත රැඳෙමින් සම්ප්‍රදායේ සහ නූතනත්වයේ තරගකාරී වුවමනාවන් අතර වෙනස් වූ සමතුලිතතාවයන් ඇති කර ගත්හ. මෙම ආදර්ශයන් හි පරාසය එක කොනකින් නේරු, මැන්ඩෙලා, නියරේරේ සහ ලී ගේ සිට අනෙක් කොන පොල්පොට්, ඉඩි අමින්, බොකාසා සහ මුගාබේ දක්වා විහිදේ.***

පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දෙකක්, නෛතික සහ දේශපාලන, හරහා භාවිතයට ගැනිණ. නෛතික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලාංකික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනන්‍යතාවයේ නූතන පැතිමානය නියෝජනය කරමින් නීති පොත්වල දැකිය හැකිය. දේශපාලන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උකහා ගන්නේ සංස්කෘතිකව සංගත වූ සහ දේශපාලන වශයෙන් බලවත් සිංහල බෞද්ධ ජාතික ඉතිහාසයෙන් උකහා ගන්නා සාමුහික අනන්‍යතාව, ස්වෛරීත්වය, භූමි ප්‍රදේශය සහ සංස්කෘතිය වටා ගොනු වූ අදහස්වලිනි. ජාතික චින්තනය නිර්වචනය කරන ලක්ෂණය වන්නේ එය සම්ප්‍රදාය සහ නූතනත්වය සමතුලනය කිරීමට අදහස් නොකර සම්ප්‍රදායේ අව්‍යාජත්වය සහ ශ්‍රේෂ්ඨත්වය තහවුරු කිරීම පදනම්ව සහ නූතනත්වය බටහිරකරණය සඳහා කේතයක් සේ බැහැර කිරීමෙන් නූතනත්වය සම්ප්‍රදායට යටපත් කිරීමයි.


ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය මෙතෙක් නෛතික සහ දේශපාලන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනුපිළිවෙළින් ක්‍රියාත්මක වන්නේ කෙසේද, වරින් වර පැවැත්වෙන ඡන්ද හරහා ඡන්දදායකයන් පුළුල් කණ්ඩායම් දෙකක් අතර බලය හුවමාරු වන්නේ කෙසේද යන්න දැක්වෙන විස්තරයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ආයතනවල බරපතළ අසාර්ථකත්වය හෝ වාර්ගික බහුත්ව ප්‍රශ්නය පිළිබඳව සතුටුදායක ආකාරයෙන් කටයුතු කිරීමට නොහැකි වුවත් ***ශ්‍රී ලංකාව 1931 සිට ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් හැර වෙනත් දෙයක් නොවීම තේරුම් ගැනීමට මූලික වන්නේ මෙයයි. යුතුකම යෝජනා හෝ ඒ හා සමාන කිසියම් දෙයක් ඉදිරි මහ මැතිවරණයෙන් පසුව අපේක්ෂා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවල පදනම වන්නේ නම් එම සංශෝධනවල අරමුණ වන්නේ බෙහෙවින්ම දෝෂ සහිත එහෙත් මූලික වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන-නෛතික දායාදය සහමුලින්ම ගලවා ඉවත් කිරීම ය. එහි ප්‍රතිඵල ඉමහත් විය හැකිය. යුද්ධයේ ජයග්‍රාහකයන් වූ මෙම සුපිරි කොටස්වල සිංහල බෞද්ධ ශිෂ්ටාචාර රාජ්‍යය ස්ථාපිත කිරීම තාර්කික ඊළඟ පියවර මෙන්ම ඓතිහාසික ගමන් මාර්ගය නිවැරදි කිරීමක් ද වේ. ඔවුන්ගේ අරමුණ ඉතාමත් සුභවාදී ආකාරයෙන් අවබෝධ කර ගත් විට පවා සදාචාරමය ශිෂ්ටාචාර සභ්‍යත්වයකින් ප්‍රජාතන්ත්‍රවාදී දූෂිත ක්‍රමය ඉවත් කිරීම විය හැකිය. එවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රමයකින් දිගින් දිගට ආර්ථික ඌන සංවර්ධනය, කැරලිකාරිත්වය සහ සිවිල් යුද්ධයක් පැවතිය ද ශ්‍රී ලංකාව***



ජවහර්ලාල් නේරු



නෙල්සන් මැන්ඩෙලා



ජුලියස් නියරේරේ



*Lee Hsien Loong*

***අසමත් රාජ්‍යයක් බවට පත්වීමෙන් වැළැක් වූ කේන්ද්‍රීය බහු පුද්ගල පාලන ක්‍රමයේ පදනම විනාශ කිරීම විය හැකිය.***


ඔවුන්ගේ නව විසඳුම විශ්ව සහ සදාකාලික පිළිගැනීමට ලක්වනු ඇතැයි සිතීම මුළාවක් වනු ඇත. මෙම ශිෂ්ටාචාර රාජ්‍යය සහජ බුද්ධියෙන්ම බහුතරයේ සහාය දිනා ගනු ඇතැයි පිළිගත්තේ නමුත් කුමන තත්වයක් යටතේ හෝ එය පිළිගැනීමට ලක් කිරීමට ප්‍රචණ්ඩත්වය ඇතුළත් බල කිරීම යොදා ගැනීමට ශක්තිය ඇතැයි ද සිතන නමුත් චීනයේ මෙන් නොව ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රජාතන්ත්‍ර සම්ප්‍රදාය තදින් මුල් බැස ඇත. නව සුපිරි කොටස්වල මතවාදය ආයතනික සංශෝධනයේ ප්‍රායෝගික යථාර්ථය සමග ඔවුන්ගේ දාර්ශනික රොමැන්තිකවාදය මුසු කිරීමට සිදු වන්නේ මේ නිසාය. වෙනත් වචනයකින් ජාතික චින්තනය අනුව රාජ්‍ය මතවාදී හරය ප්‍රතිනිර්මාණ කිරීමේ දී ශ්‍රී ලංකා සන්දර්භයේ දී ගනුදෙනුවක් වශයෙන් මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදයට ඉඩ සැලසිය යුතුය. ඊට වෙනස්ව චීන ශිෂ්ටාචාර රාජ්‍යයට, ඉතා මෑතක හොංකොං හි වූ සිදුවීම්වලින් පෙන්නුම් කරන ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ඉඩ සැලසීමක් කළ යුතු නැත. සිංහල බෞද්ධ සභ්‍යත්වයේ ශ්‍රේෂ්ඨත්වය ගැබ්වන රාජ්‍යය සහ සමාජය තදින් ගැට ගසන සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම්වලට වඩා දශරාජ ධර්මයෙන් බලය යෙදවීම නියාමනය කිරීමට ඔවුන්ට පාලනය වෙනස් කිරීමේ (වැඩි අඩු වශයෙන්) ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ යාන්ත්‍රණය නොවෙනස්ව පවත්වා ගැනීමට සිදු වනු ඇත. සදාකාලිකවම ශිෂ්ටාචාර රාජ්‍යයේ සුජාතභාවය අලුත් කරමින් පවත්වා ගැනීමට මැතිවරණ පැවැත්වීම මහත්ම ඵලදායී ආයතනයක් වන නිසා ඔවුන්ගෙන් සමහර අයකුට එය ගැටලුවක් සේ නොපෙනෙනු ඇත.

ආණ්ඩු වෙනස් කිරීමට යොදා ගත් ආවේනික සහ මනාව භාවිත කළ පුරුද්ද ඇතුළත් බහුත්ව දේශපාලනයක මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදයේ ගැඹුරටම මුල් බැස ගත් සම්ප්‍රදාය පිළිබඳ අසීරු කටයුත්ත වන්නේ එහි සුජාත භාවය පිළිබඳව වෙන කිසිවකට තරග කළ නොහැකි වීමය. දිනපතාම වගවීමක් නැති පූජකයින්, ආත්මාඩම්බරයෙන් පිරි දේශපාලකයන් සහ ශිෂ්ඨාචාරයේ තීරකයන්, වසර 2500ක් පැරණි සංස්කෘතියක තේජසින් ජනතාවගේ දෙසවන පුරවන විට කලකිරීමටත් වෙහෙසටත් කලබලයටත් පත්වන ඔවුන්ට තම අසන්තෝෂය පෙන්වීමට හොඳින් ගැළපෙන සහ වෙනසක් සඳහා තහවුරු වූ උපකරණයක සරණ පැතිය හැකිය. ජාතික චින්තනයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දහඅට වැනි සංශෝධනය යටතේ මහින්ද චින්තන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙන් නෛසර්ගිකව තාවකාලික සංසිද්ධියක් වනු ඇත. බුදුන් වහන්සේ දෙසූ ආකාරයට භවයෙන් භවයට පත්වීමකි.


නැතිනම් 2020 අගෝස්තු 5 දින ආණ්ඩුවට තුනෙන් දෙකේ බහුතරය ලබා නොදීම මගින් මෙම මතවාදී දුර්භාග්‍යය කිසි දිනක සිදුවීම වැළැක්විය හැකිය.



පොල්පොට්



ඉඩි අමීන්



රොබට් මුගාබේ




බොකාසා

toppr.com/biography.com/time.com/ nhc.org.za

historycollection.com/ www.pbs.org/ www.biography.com/ newslibre.com

සෑම මනුෂ්‍යයෙකුටම තම මව්භාෂාව යනු හදවතට දැනෙන හා අවබෝධ වන ආත්මීය වශයෙන් බැඳුණු මෙවලමකි. එය භෞතිකව වුවද මනුෂ්‍යයා වෙත ලබා දෙන්නේ ආත්ම විශ්වාසයකි. එසේම, තමන් වහරන තම මව්බස තම අනන්‍යතාව විදහා දක්වන කැඩපතක් ලෙසද හැදින්වීම යෝග්‍ය වේ. එබැවින් තම ආත්මීය, භෞතික හා අනන්‍යතාව නිරූපණය කරන භාෂාව තම විෂය ක්ෂේත්‍රයේ පමණක් නොව අන්‍යන්ගේ ක්‍රියාකලාපයන් තුළද ගෞරවයට හා පිළිගැනීමට ලක්වනු දැකීම ආත්මාභිමානය ඔප්නංවන්නාවූ මූලික සාධකයකි. මෙතුළින් පැනනැගිය හැකි සාධනීය ප්‍රතිඵලද බොහෝ විෂය ක්ෂේත්‍රයන් තුළ පුළුල්ව විහිදේ.




# පාරිභෝගික අයිතිවාසිකම් විෂයෙහි බලගැන්වුණු **රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය**




නීතිඥ **දුමිඳු මධුශාන්**
පර්යේෂක
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය


**භාෂා අයිතිවාසිම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පදනම**

භාෂාව අයිතියක් ලෙස පිළිගැනීම හා බලාත්මක කිරීම එම භාෂාව වහරන, භාවිත කරන ජනතාවට ලබාදෙන ගෞරවයකි. ඇතැම්විට එය ගෞරවයකින් එහා ගිය ආත්මීය වශයෙන් ලබාදෙන සහනයකි. එතුළින් තමන් සමාජය තුළ මෙන්ම රාජ්‍ය යාන්ත්‍රණය තුළද සුරක්ෂිතයැ යි යන හැඟීම සිය අයිතිවාසිකම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමටත්, බලාත්මක කිරීමටත්, උල්ලංඝනයවීම්වලදී ප්‍රතිපූරණය කරගැනීමටත් අවශ්‍ය සවිබලගැන්වීම ලබා දේ. ඒ අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන හා සිව්වන පරිච්ඡේදයන්හි භාෂාව සම්බන්ධ ව්‍යවස්ථාද මූලික අයිතිවාසිකම් ගණයට අයත් වේ. 12(2) ව්‍යවස්ථාව අනුව කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවිය යුත්තේය.

www.yamu.lk




මෙහිදී වෙනස්කමකට හෝ විශේෂයකයට යනු, අඩුවෙන් හෝ වැඩියෙන් සැලකිල්ලක් දැක්වීමයි. එනම්, නීතිය තුළින් දැක්විය යුතු සර්ව සාධාරණත්වය නොදැක්වීමයි. එම වෙනස්කම විධායක හෝ පරිපාලන ක්‍රියාවකින් පුරවැසියෙකුට සිදුවිය යුතුය. එවිට 12(2) ව්‍යවස්ථාවේ පිළිසරණ ලබාගත හැකි වන්නේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිව්වන පරිච්ඡේදයේ 18 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවන් සිංහල හා දෙමළ භාෂා වන අතර ඉංග්‍රීසි භාෂාව සන්ධාන භාෂාව ලෙස සැලකේ. එසේම 19 ව්‍යවස්ථාව ප්‍රකාරව සිංහල භාෂාව හා දෙමළ භාෂාව ශ්‍රී ලංකාවේ ජාතික භාෂා වන්නේය. 22 ව්‍යවස්ථාව ප්‍රකාරව සිංහල හා දෙමළ භාෂා ශ්‍රී ලංකාව මුළුල්ලේම පරිපාලන භාෂා විය යුත්තේය. මෙහිදී අවබෝධකරගත යුතු කාරණය නම්, රජයේ ආයතනවල කටයුතු කිරීමට හා වාර්තා තැබීමට නියමිත භාෂාව පරිපාලන භාෂාව වන බවයි. සිංහල හෝ දෙමළ නොවන වෙනත් භාෂාවක් (ඉංග්‍රීසි) පරිපාලන භාෂාව විය හැකි වුවත් මෙතෙක් එසේ නියම කොට නොමැති අතර උතුරු හා නැගෙනහිර පළාත්වල පරිපාලන භාෂාව දෙමළ වන තර සෙසු පළාත්වල පරිපාලන භාෂාව සිංහල භාෂාව වේ. එසේම පරිපාලන භාෂා වශයෙන් යම් ප්‍රදේශවල රාජ්‍ය භාෂා දෙකම නියම කළ හැකි අතර එවිට සිංහල හා දෙමළ භාෂා දෙකෙන්ම පරිපාලන කටයුතු කළ යුතුය.

ඒ අනුව සමස්තයක් ලෙස ගත්කල රාජ්‍යයේ කටයුතු හා රාජ්‍යය විසින් පුරවැසියා උදෙසා ක්‍රියාත්මක කරන යාන්ත්‍රණයන් සියල්ල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව සිදුවිය යුතුය. මෙම ස්ථාවරය පදනම් කරගනිමින් 2012 වර්ෂයේ සිට මේ දක්වාම රාජ්‍ය යාන්ත්‍රණය තුළ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හා එතුළින් පුරවැසියන්ගේ භාෂා අයිතිවාසිකම උල්ලංඝණයවීම් පදනම් කරගනිමින් වගකිවයුතු බලධාරීන් වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කටයුතු කරන ලදි. ඒ අනුව එලෙස වගකිව යුතු මූලික ආයතන ද්විත්වයක් ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හඳුනාගත් අතර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනයවීම් පිළිබඳව අවස්ථා ගණනාවකදීම මෙම ද්විත්ව ආයතනයන්ට පැමිණිලි රාශියක් ඉදිරිපත් කර තිබේ.

## පුරවැසි භාෂා අයිතිය සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජයග්‍රහණ

මේ අතුරින් ඇතැම් උල්ලංඝනයන් සඳහා ප්‍රතිකර්ම ලබාගැනීමට එම ද්විත්ව ආයතන්හි මැදිහත්වීම ප්‍රමාණවත් වූ නමුත් තවත් අවස්ථාවලදී ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා ගොස් එම අයිතීන් බලාත්මක කරගැනීමට සිදුවූ අවස්ථාද තිබේ. ඊට උදාහරණ ලෙස ජාතික හැඳුනුම්පත සිංහල හා දෙමළ භාෂාවෙන්




**ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා ගොස් එම අයිතීන් බලාත්මක කරගැනීමට සිදු වූ අවස්ථාද තිබේ. ඊට උදාහරණ ලෙස ජාතික හැඳුනුම්පත සිංහල හා දෙමළ භාෂාවෙන් නිකුත් කිරීම, මුදල් නෝට්ටුවල ඇතැම් පාඨ සිංහල හා දෙමළ භාෂාවෙන් මුද්‍රණය කිරීම, නීති අණ පනත් සිංහල හා දෙමළ භාෂාවෙන් නිකුත් කිරීම හා ඖෂධ ඇසුරුම්වල තොරතුරු සිංහල හා දෙමළ භාෂාවෙන් නිකුත් කිරීම වැනි සිදුවීම් ප්‍රමුඛ වේ. මෙම ජයග්‍රහණයන් සමස්ත පුරවැසියන් උදෙසා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දිනාගත් අතර එහි ප්‍රතිඵල සමස්ත පුරවැසියන් එකාවන්ව භුක්තිවිඳිමින් පවතී.**

නිකුත් කිරීම, මුදල් නෝට්ටුවල ඇතැම් පාඨ සිංහල හා දෙමළ භාෂාවෙන් මුද්‍රණය කිරීම, නීති අණ පනත් සිංහල හා දෙමළ භාෂාවෙන් නිකුත් කිරීම හා ඖෂධ ඇසුරුම්වල තොරතුරු සිංහල හා දෙමළ භාෂාවෙන් නිකුත් කිරීම වැනි සිදුවීම් ප්‍රමුඛ වේ. මෙම ජයග්‍රහණයන් සමස්ත පුරවැසියන් උදෙසා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දිනාගත් අතර එහි ප්‍රතිඵල සමස්ත පුරවැසියන් එකාවන්ව භුක්තිවිඳිමින් පවතී.

### පාරිභෝගික භාණ්ඩවල තොරතුරුවලට අදාළව අදාළව භාෂා අයිතිවාසිකම ක්‍රියාත්මක නොවීම අභියෝග කිරීම

2012 සිට 2018 දක්වා කාලය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට සහ රාජ්‍ය භාෂා කොමිසමට පැමිණිලි 150 කට අධික සංඛ්‍යාවක් ගොනු කරන ලද්දේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව පාරිභෝගික භාණ්ඩ පිළිබඳ වැදගත් තොරතුරු ලබා නොදෙන බව සඳහන් කරමිනි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2013 වසරේ සිටම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට පෙන්වා දුන්නේ පාරිභෝගික භාණ්ඩවල අත්‍යවශ්‍ය තොරතුරු එනම්, භාණ්ඩයේ නම, උපරිම සිල්ලර මිල, කල් ඉකුත්වීමේ දිනය, නිෂ්පාදිත දිනය, ශුද්ධ බර/පරිමාව, ආනයනික රට/නිෂ්පාදිත රට හා ඇසුරුම් කළ දිනය ආදී තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් මුද්‍රණය කර ඇති බවයි. එබැවින් පාරිභෝගික භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් හෝ එක් රාජ්‍ය භාෂාවකින් (සිංහල හෝ දෙමළ) පමණක් මුද්‍රණය කිරීම පාරිභෝගිකයාට තොරතුරු ලබා ගැනීමේ අයිතිය උල්ලංඝනය කිරීමකි. 2013 සිට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කරන ලද පැමිණිලි හරහා මෙම තත්ත්වය විසඳීමට සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිගැනීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට බලය සහ වගකීම පැවරී ඇති බව අවධාරණය කරන ලදි.

### තොරතුරු අයිතිය හරහා අනාවරණය කරගැනීම

එම පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් වසර ගණනාවක් තිස්සේ මානව හිමිකම් කොමිසම හා රාජ්‍ය භාෂා කොමිසම පරීක්ෂණ ගණනාවක් පැවැත් වූ නමුත් වර්තමානය වන තුරුම සැලකිය යුතු සාධනීය ප්‍රගතියක් ළඟා කර ගත නොහැකි විය. එබැවින්, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ගොනු කළ පැමිණිලිවල ප්‍රගතිය පිළිබඳ පාරිභෝගික කටුයුතු පිළිබඳ අධිකාරියෙන් විමසා සිටි අතර ඊට ප්‍රතිචාර ලැබිණි.

### පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගනුලැබූ ක්‍රියාමාර්ග

එහි සඳහන් වූයේ 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අප විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි නීති අංශයට යොමු වී නොමැති බවත් අදාළ පැමිණිලි සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිරීක්ෂණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට භාර දී ඇති බවත්ය. එසේම, 2135/53 දරන 2019.08.07 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද විධාන අංක 68 අනුව එම විධානයෙහි උපලේඛනයෙහි සඳහන් භාණ්ඩයන්හි උපරිම සිල්ලර මිල, නිෂ්පාදිත කාණ්ඩ අංකය, කල් ඉකුත්වන දිනය, නිෂ්පාදිත ශුද්ධ බර/පරිමාව, ආනයනික රට/නිෂ්පාදිත රට, නැවත ඇසුරුම් කර ඇත්නම් එසේ ඇසුරුම් කළ දිනය ආදී තොරතුරු සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා තුනෙන් පැහැදිලිව මුද්‍රණය කළ යුතු බවට විධාන කර ඇති බවයි. කෙසේවෙතත්, එකී විධාන අංක 68 පරිච්ඡින්න කරමින් 2156/16 දරන 2019.12.31 දිනැති ගැසට් පත්‍රය පළ කරන ලද විධාන අංක 71 නිකුත් කරන ලද අතර එකී විධානය 2020.09.01 වන දින සිට බලපැවැත්වෙනු ඇත. තවද උක්ත ගැසට් පත්‍රයේ සඳහන් තොරතුරු භාෂා ත්‍රිත්වයෙන්

**"**

**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සිය කර්තව්‍යන් ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කරන නිද්‍රාශීලි පියවර මී අවස්ථා ගණනාවකදීම ප්‍රකට වූ කරුණකි. ඊට කදිම නිදසුනක් වන්නේ පසුගිය වසර කීපය පුරාවටම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම් සම්බන්ධව කොමිෂන් සභාවට ඉදිරිපත් වූ පැමිණිලි කිසිවකට කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මහාධිකරණයේ කිසිදු නඩුවක් නොපැවරීමයි.**

භාණ්ඩ ලේබල්වල මුද්‍රණය කිරීමට සිදුවීම මඟින් ලේබලයේ අවකාශය සීමාවීම්, කුඩා ප්‍රමාණයේ භාණ්ඩ සඳහා මෙම ක්‍රමය අපහසු වීම තාක්ෂණික බාධක, භාෂා ත්‍රිත්වයෙන්ම අන්තර්ගතය හා වෙනත් උපදෙස් පිළිබඳ තොරතුරු මුද්‍රණය කිරීමට සිදුවීම මඟින් මිල ඉහළ යෑම වැනි ප්‍රායෝගික අපහසුතාවයන් පවතින බවට ලංකා වාණිජ මණ්ඩලය (ආහාර පාන අංශය) විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට දන්වා ඇති බවයි. එබැවින් උක්ත ගැසට් පත්‍රයේ සඳහන් පරිදි භාණ්ඩ ලේබල්වල තොරතුරු මුද්‍රණයේදී භාෂාත්‍රයෙන් මුද්‍රණය කළ යුතුද යන්න සම්බන්ධව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙන් 2019.10.16 දිනැති ලිපියෙන් විමසා සිටින ලදද, එකී ලිපිය සඳහා මෙතෙක් පිළිතුරක් ලැබී නොමැති බව සඳහන් කර සිටී.

- **රාජ්‍ය භෂා කොමිෂන් සභාවේ නිද්‍රාශීලි පිළිවෙත**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට යොමු කර අති ලිපිය සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් පිළිතුරු සැපයීම සිදුකර නොමැති වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම විෂයෙහි සෘණාත්මකව බලපෑම් එල්ලකරන අතර ඒ සම්බන්ධ අකාර්යක්ෂමතාව කණගාටුවට කරුණක් වේ. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සිය කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කරන නිද්‍රාශීලි පියවර මෙහි දී පමණක් නොව අවස්ථා ගණනාවකදීම ප්‍රකට වූ කරුණකි. ඊට කදිම නිදසුනක් වන්නේ පසුගිය වසර කීපය පුරාවටම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම් සම්බන්ධව කොමිෂන් සභාවට ඉදිරිපත් වූ පැමිණිලි කිසිවකට කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මහාධිකරණයේ කිසිදු නඩුවක් නොපැවරීමයි. එසේම කොමිෂන් සභාවේ ධූර සඳහා පත්වන නිලධාරීන්ගේ උද්යෝගයේ හීනතාවක්ද ප්‍රකට වන්නේ පවත්නා සම්පත් නිසිපරිදි යොදාගනිමින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සාර්ථකව හා විධිමත්ව ක්‍රියාවට නැංවීමට නිසි වැඩපිළිවෙළක් සකස් නොකිරීමයි. අමාත්‍යවරයෙකු යටතේ පවත්නා කොමිෂන් සභාවක් හෙයින් මෙහි පවත්නා ස්වාධීනත්වය හා පාර්ලිමේන්තුවට වගකියන ස්වභාවයක් නොමැති වීම හේතුවෙන් මෙය ස්වාධීන කොමිෂන් සභාවක් බවට පත් කිරීමේ කාලීන අවශ්‍යතාව දැඩිව පවතී.

කෙසේ නමුත් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනිමින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය නිකුත් කර ඇති 2019.12.31 දිනැති 2156/16 දරන ගැසට් පත්‍රයෙන් සංශෝධිත 2019.08.07 දිනැති 2135/53 දරණ ගැසට් පත්‍රය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2020.06.22 දින දී අගය කරනු ලැබේ. ඉහත සඳහන් ගැසට් පත්‍ර ප්‍රකාරව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සියලුම භාණ්ඩවල නිෂ්පාදිතය පිළිබඳ වැදගත් තොරතුරු සියලුම භාණ්ඩවල ඇසුරුම්, බහාලුම් හෝ එතුම්වල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීමට සියලුම නිෂ්පාදකයන්ට, ආනයනකරුවන්ට, බෙදාහරින්නන්ට හා වෙළඳුන්ට නියම කර තිබේ. මෙම නියමයන් පාරිභෝගික භාණ්ඩ අයත්වන කාණ්ඩ 76කට අදාළ වනු ඇත.

- **විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය උපුටා දක්වන ලද උල්ලංඝනයන් සඳහා විශේෂ අවධානය**

මෙහිදී සඳහන් කළ යුතු සුවිශේෂීම කරුණ වන්නේ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කරන ලද පැමිණිලිවල හඳුනාගෙන ඇති භාණ්ඩවලින් වැඩි ප්‍රමාණයක් ඉහත සඳහන් ගැසට් පත්‍රවල අන්තර්ගත කර තිබීමයි. එහි ප්‍රතිපලයක් වශයෙන්, ගැසට් පත්‍රය බලපැවැත්වෙන දිනය වන 2020.09.01 දින සිට භාෂා තුනෙන්ම මෙම පාරිභෝගික භාණ්ඩ පිළිබඳ අත්‍යවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට සියලුම පාරිභෝගිකයින්ට අවස්ථාව උදාවනු ඇත. ඒ අනුව, පාරිභෝගිකයින්ට අවම වශයෙන් නිෂ්පාදන පිළිබඳ මූලික තොරතුරු ලබා ගැනීමට හැකිවීම අතිශයින් වැදගත් වන්නේ එවැනි භාණ්ඩ ඔවුන්ගේ පරිභෝජනයට හිතකර හා යෝග්‍යවන්නේ දැයි සහතික කර ගැනීම සඳහා ය. පාරිභෝගිකයාට වැටහෙන භාෂාවකින් එවැනි තොරතුරු සැපයීම නිසා, පුද්ගලයන්ට තම මව් බසින් (සිංහල හා දෙමළ) උපදෙස්

ලබා ගැනීමේ අයිතිය ආරක්ෂා වනවා පමණක් නොව, පාරිභෝගිකයින්ගේ ශාරීරික සෞඛ්‍යය හා යහපැවැත්ම කෙරෙහිද එය සෘජුවම බලපානු ඇත.

- **ඖෂධ ඇසුරුම්වල තොරතුරු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුගත කිරීමේ සටන**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ උල්ලංඝණය වීම් සම්බන්ධව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හඬනැගීම හා ඒ පිළිබඳව වගකිවයුතු බලධාරීන් වෙත පැමිණිලි කිරීම පාරිභෝගික අයිතීන් විෂයෙහි පමණක් සීමා නොවූ අතර එය පුළුල් විෂය පරාසයක විහිදී පවතී. මේ හා සම්බන්ධවම තවත් එක් පැමිණිල්ලක් වන්නේ, ඖෂධ ඇසුරුම්වල තොරතුරු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව සඳහන් නොවීම සම්බන්ධව ජාතික ඖෂධ නියාමන අධිකාරියට එරෙහිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට හා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට පැමිණිලි කිරීමයි. ඒ මගින් මෙම කාරණයට වගකිව යුතු වග උත්තරකරුවන් හත් දෙනෙකු සඳහන් කරන ලද අතර එම වග උත්තරකරුවන් හත්දෙනා වන්නේ,

1. සභාපති, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
2. කළමණාකාර අධ්‍යක්ෂ, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව
3. අධ්‍යක්ෂ, ඖෂධ නියාමන අධිකාරිය
4. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය අමාත්‍යංශය
5. අධ්‍යක්ෂ, වෛද්‍ය සැපයීම් අංශය, සෞඛ්‍ය අමාත්‍යංශය
6. සභාපති, දේශීය ඖෂධ නිෂ්පාදකයින්ගේ සංගමය
7. සභාපති, පාරිභෝගික ආරක්ෂක අධිකාරිය

මේ සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් ගත් පියවරයන් ලෙස ආනයනික ඖෂධ ඇසුරුම්වල සඳහන් ඖෂධ භාවිතය පිළිබඳ විස්තර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව සකස් කිරීම පිළිබඳව වන පැමිණිල්ලට අදාළ සාකච්ඡාවක් 2012/03/26 වන දින රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේදී පැවැත්වුණු අතර එහිදී නිර්දේශ කරන ලද්දේ ආනයනික ඖෂධවල සඳහන් කල් ඉකුත් වීමේ දිනය, ගබඩා කිරීම සම්බන්ධ උපදෙස්, භාවිතයෙන් පසු නොකළ යුතු දේවල්/ අතුරු ආබාධ, මාත්‍රාව වැනි රෝගියෙකු විසින් අත්‍යවශ්‍යයෙන්ම දැනගත යුතු කාරණා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව සකස් කළ යුතු බවයි. මෙම තත්ත්වය දේශීය වශයෙන් නිෂ්පාදිත ඖෂධ සඳහාද අදාළ වන බව දක්වන ලදි.

මේ සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සිදුකළ පැමිණිල්ලට අදාළ විභාගයේදී පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය පැමිණිලිකාර පාර්ශවයේ යෝජනාව සුදුසු යැයි පිළිගනිමින් පහත සඳහන් යෝජනාවන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදි. එනම්, පාරිභෝගිකයා විසින් විමසනු ලැබූ විට, තමා ලබා ගන්නා ඖෂධ පිළිබඳව පාරිභෝගිකයාට අවශ්‍ය සියලු විස්තර පාරිභෝගිකයා වැඩි ප්‍රවීණතාවයක් දක්වන භාෂාවෙන් ඖෂධවේදීයාගෙන් අසා දැන ගැනීමට අයිතිවාසිකමක් ඇති බවට, සෑම ඖෂධ වෙළඳ සැලකම රාජ්‍ය භාෂා දෙකෙන් සහ සම්බන්ධීකරණ භාෂාව වන ඉංග්‍රීසි බසින් සඳහන් කරන ලද පුවරුවක් පිහිටුවීම මගින් පාරිභෝගිකයින් දැනුවත් කිරීමයි. එසේම, සියලුම ශ්‍රී ලාංකේය ඖෂධ නිෂ්පාදකයින් රාජ්‍ය භාෂාවන් දෙකෙන්ම තම ඇසුරුම්වල හෝ බහාලුම තුළ එකී ඖෂධය සම්බන්ධ තොරතුරු සටහන් කිරීම. මෙහිදී එම ඖෂධය පිළිබඳ සාමාන්‍යයෙන් රෝගියෙකු දැනගත යුතු විස්තර පමණක් සෑහෙන බවට මෙම අධිකාරිය නිර්දේශ කරන අතර එම තොරතුරු ඖෂධ නියාමන අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව සටහන් කළ යුතු බවටද මෙම අධිකාරිය නිර්දේශ කරන බවට එකඟතාවක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ සහතික වන ලදි.

- **ඖෂධ ඇසුරුම්වල තොරතුරු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුගත නොවීම පිළිබඳ මූලික අයිතිවාසිකම් නඩුකරය**

අනතුරුව එහි නියමන්ට වගඋත්තරකරුවන් අනුගත නොවීම මත ***විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් නඩුකරයක් SCFR/102/16 යටතේ ඉදිරිපත් කර ඇති අතර මෙය තවමත් විභාග වෙමින් පවතී. මෙහි සාධනීය පියවරක් ලෙස, හඳුනාගන්නා ලද ඖෂධවර්ග කීපයක තොරතුරු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව 2020.01.01 දින සිට නිකුත් කිරීමට අදාළව ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් 2019.10.14 දිනැතිව ගැසට් අංක 2145/01 යටතේ කටයුතු කර තිබේ.*** කෙසේ නමුත් ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත්කර ඇති මෙම ගැසට් පත්‍රය ශ්‍රී ලංකා ඖෂධ කර්මාන්ත මණ්ඩලය විසින් අභියාචනාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක්කර රිට් ආඥාවක් අයදුම්කර ඇති අතර මෙය ඉදිරියට සලකා බැලීමට නියමිතය.
මෙම ගැසට්පත්‍ර මගින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සහ පාරිභෝගිකයින්ට තීරණාත්මක තොරතුරු සැපයීමේ වැදගත් ඉදිරි පියවරක් සනිටුහන් කරන අතරම, මෙම ප්‍රගතිශීලි හා සාධනීය තීරණ ක්‍රියාත්මක කරනු ඇති බවට කිසිදු සහතිකයක් නොමැති බවද අවධාරණය කළ යුත්තකි. එවන් පසුබිමක පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා වගකීමෙන් යුතුව කටයුතු කිරීම සියළුම පාර්ශ්වකරුවන්ගෙන් නෛතික හා සාමාජීය යුතුකමක් වේ. මෙම අරමුණු සෑම මට්ටමකින්ම ධනාත්මකව හා විධිමත් ලෙස පවත්වා ගෙන යෑම සහතික කිරීම සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉදිරියටත් අඛණ්ඩව බලපෑම් කරනු ඇත.



පාර්ලිමේන්තු මැතිවරණයේ දිනය ප්‍රකාශයට පත් වී ඇත. මෙම මැතිවරණය කවුරුන් ජයග්‍රහණය කරාවිද යන්න පිළිබඳ කිසිදු සැකයක් නැත. කිසියම් හෝ සැකයක් ඇත් නම් ඒ පොහොට්ටුවේ කුමන දෘෂ්ඨිවාදී කණ්ඩායම රටේ දේශපාලන ඉරණම තීරණය කිරීමේ සටනින් ජයගනීවිද යන්න පිළිබඳ පමණි. ජනපති සහ ඔහුට සහය දක්වන්නන් ආඥාදායක-රූපී පාලනයක් රුචි කරන අතර, සන්ධානයේ අනෙක් පාර්ශ්ව පරණ පුරුදු අනුග්‍රාහක-සේවාදායක සම්බන්ධතා ජාලය මත පදනම් වූ මැතිවරණ රටාවක් ප්‍රිය කරන බව පෙනෙන්නට තිබේ. දශක ගණනාවක් තිස්සේ රටේ දේශපාලන වංශ කථාව දිග හැරුණු අයුරු පිළිබඳව ඇති කලකිරීම නිසා මේ අවස්ථාවේ ආඥාදායක-රූපී පාලනයක් වඩා සුදුසු බව සිතෙන්නට සාධාරණ හේතු තිබිය හැකි වුවත් ඔත්පල වූ ලාංකේය ප්‍රජාතන්ත්‍රවාදයට ආඥාදායකත්වය කිසිසේත් ආදේශකයක් නොවන බව අප තේරුම් ගත යුතුය.

# ඔත්පල වූ ලාංකේය ප්‍රජාතන්ත්‍රවාදයට **ආඥාදායකත්වය ඔසුවක් නොවේ**

ආචාර්ය ප්‍රදීප් පීරිස්, සකිනා මොයිනුඩීන්, එම් ක්‍රිෂ්ණමූර්ති |
*Dr'Pradeep Peiris, Sakina Moinudeen and M. Krishnamoorthy*

## ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය පිළිබඳ ඇති සමාජ කලකිරීම

පසුගිය වසර කිහිපය තුළ ලංකාවේ සිදුකරන ලද බොහෝ සමීක්ෂණ වලින් හෙළි වූයේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන පද්ධතිය පිළිබඳ ඇති මහජන කලකිරීම එන්න එන්නටම වැඩි වන බවයි. නිදසුනක් ලෙස සමාජ විද්‍යාඥයින්ගේ සංගමය විසින් **2012 දී සිදුකරන ලද *The State of Democracy in South Asia* සමීක්ෂණයෙන් හෙළි වූ පරිදි *ලංකාවේ සිංහල ප්‍රජාවෙන් 24.4%ක් ශක්තිමත් පාලකයකු යටතේ පාලනය වීමට ප්‍රිය කරන අතර ඉන් 91.1%ක් එම පාලකයා නිදහස් හා සාධාරණ මැතිවරණයක් තුළින් පත්විය යුතු බව විශ්වාස කරන ලදී. ශක්තිමත් පාලකයකුට ඇති මෙම කැමැත්ත යහපාලන ආණ්ඩුවේ ව්‍යාකූලත්වයෙන් පිරි අවසන් වසර දෙක තුළ වැඩි වී ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ ආයතනය වන Social Indicator මඟින් 2018 දී සිදුකරන ලද***



www.colombotelegraph.com

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ

***සමීක්ෂණයකට අනුව සිංහල ප්‍රජාවෙන් 52.1%ක් ශක්තිමත් පාලකයකුටද 52.7% ක් විශේෂඥයින් විසින් ගෙනයන පාලනයකට ද 80.9% ක් ඡන්දයෙන් තෝරා පත් කරගත් පාලකයකුගේ පාලනයටද කැමැත්ත පළකර තිබුණි. ඒ අනුව පැහැදිලි වන්නේ සිංහල ප්‍රජාවෙන් බහුතරය ඡන්දයෙන් තෝරාපත් කරගන්නා ශක්තිමත් නායකයකු හෝ විශේෂඥයකු ප්‍රිය කරන බවයි. මෙම සමීක්ෂණ දත්තවලට අනුව 'සිංගප්පූරු මාදිලියේ' පාලන ක්‍රමයකට ඇති මෙම කැමැත්ත, පාර්ලිමේන්තුව සහ දේශපාලන පක්ෂ වැනි ආයතන කෙරෙහි ඇති මහජන විශ්වාසය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් ඇති බව පෙනී යයි. Social Indicator විසින් 2011-2018 අතර සිදු කර ඇති සමීක්ෂණ වාර්තා වලට අනුව පාර්ලිමේන්තුව සහ දේශපාලනඥයින් කෙරෙහි සිංහල ප්‍රජාවගේ ඇති විශ්වාසය එන්න එන්නටම අඩු වී ඇති අතර හමුදාව කෙරෙහි ඇති විශ්වාසය දිගින් දිගටම ඉහළ අගයක නොවෙනස්ව පැවතී ඇත.***

## වර්තමාන ආඥාදායක පාලනයට ඇති කැමැත්ත පිටුපස ඇති දේශපාලන-ආර්ථිකය

ආඥාදායක පාලනයකට ඇති කැමැත්ත පිටුපස එයටම ආවේණික වූ දේශපාලන-ආර්ථිකයක් ඇත. මෙවැනි පාලන ක්‍රමයකින් ප්‍රතිලාභ ලබන්නා වූ නව ප්‍රභූ කණ්ඩායම් කිහිපයක් මෙරට සිටී. එක් අතකින් තිස් අවුරුදු යුද්ධය නිසා ඉහළට නැඟ ආ මිලිටරි පන්තියද, අනෙක් අතින් විවෘත ආර්ථිකය විසින් නිෂ්පාදනය කරන ලද වෘත්තීයවේදීන්ගෙන් වෛද්‍යවරු, ඉංජිනේරුවන්, ගණකාධිකාරීවරු, කළමණාකරුවන් වැනි අයගෙන් සැදුම්ලත් පන්තියද ඒ අතර ප්‍රධාන වේ. යුද්ධය ප්‍රතිඵලයක් ලෙස සිංහල සමාජය තුළ උඩු දුවා ඇති ජාතිකවාදී චින්තනය තුළ මෙම සමාජ පන්ති සඳහා ඉහළ සමාජ තත්වයක් ලැබිණි. මෙම පන්ති දෙකේම පිරිස් වැඩි කොටම කොළඹින් පිටත සිංහල-බෞද්ධ පසුබිම්වලින් පැවතෙන්නන් වේ. එමෙන්ම මෙම සමාජ කණ්ඩායම් තුළ සිංහල-බෞද්ධ ජාතිකවාදයට සහ නව ලිබරල්වාදී වටිනාකම් වලට දැඩි පක්ෂපාතීත්වයක් ඇත. 2010 න් පසු යුගය තුළ මෙම කණ්ඩායම පිළිබඳ පැහැදිලි වූ එක් කරුණක් නම් ඔවුන් තව දුරටත් ධනය හා සමාජ තත්වයෙන් සෑහීමට පත් නොවන බවත්ය. දේශපාලන බලය සම්බන්ධයෙන් උනන්දුවක් ඇති කරගෙන සිටින බවත්ය. නමුත් සාම්ප්‍රදායික දේශපාලනඥයින්ට මෙන් තමුන්ගේම මැතිවරණ කොට්ඨාශයක්, පවුල් පසුබිමක් හෝ අනුග්‍රාහක-සේවාදායක සම්බන්ධතා ජාලයක් මෙම කණ්ඩායමට නැත. මේ නිසා වත්මන් ජනපති ප්‍රිය කරන්නාවූ ආඥාදායක-රූපී ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමවේදයක් ඔවුන්ට කදිමට ගැළපෙන්නේය.

එතුළ වෘත්තීයවේදීන්ට හා විශේෂඥයන්ට ලැබෙන්නා වූ වැදගත්කම නිසා තරඟකාරී දේශපාලනයට දැඩි අපහසුවකින් තොරව ප්‍රවේශ විය හැකි හෙයිනි.


### වත්මන් දේශපාලනික තත්වය ආඥාදායක ප්‍රජාතන්ත්‍රවාදයකට ඉනිමං බඳී

***වත්මනේ අනෙක් දේශපාලනඥයන් මෙන් නොව ජනපති ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරණයට පෙර සිටම තමා කෙබඳු ආණ්ඩු ක්‍රමයකට කැමතිද යන්න පිළිබඳ ඉතා විනිවිද භාවයෙන් යුක්තව කතා කළේය. ඇත්තෙන්ම ඔහුගේ මැතිවරණ ව්‍යාපාරය ඔහු ගොඩනැඟුවේම මේ පදනම මතය. එහිදී ඔහු මූලිකවම ආමන්ත්‍රණය කළේ සංවර්ධනය සහ ආරක්ෂාව තහවුරු කළ හැකි, ඒ සඳහා නීති රෙගුලාසි අවශ්‍ය ලෙස නැමීමට හෝ කඩා දැමීමට වුවද පසුබට නොවන ආකාරයේ දැඩි පාලනයක් ගෙන යන නායකයෙකු අවශ්‍යව සිටි ඡන්දදායකයින්ට ය. සාම්ප්‍රදායික දේශපාලන ජාලයෙන් පිටත පසුබිමක් සහිත, රටට අවශ්‍ය දැඩි පාලනයක් බව අවංකවම විශ්වාස කරන පාලකයකු මෙම සමාජ පන්තියට හරියටම අවශ්‍ය වූ ආකාරයේ කෙනෙකි.*** එම නිසා ජනපතිගේ විශ්වාසයන් සහ මෙම සමාජ පන්තියේ දේශපාලන දැක්ම අතර සෑහෙන තරමේ සමානකමක් තිබේ. විශේෂයෙන්ම මින් පෙර තිබූ වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී යැයි කියාගත් ආණ්ඩුවල අසාර්ථකභාවය දෙස බැලීමේදී රටට අවශ්‍ය සංවර්ධනය සහ ආරක්ෂාව ලබාදිය හැකි ආකාරයේ හැකියාවන් පවතින්නේ මිලිටරි සහ වෘත්තීයවේදී පුහුණුවක් ලැබූවන්ට පමණක් බවට වන ජනපතිගේ විශ්වාසයට යම් ආකාර සුජාත භාවයක් ලැබෙන බවද පිළිගත යුතුය.

එසේම ජාත්‍යන්තර වශයෙන් ගත්තද ආඥාදායක ස්වරූපයේ පාලන ක්‍රමයකට දරුණු ප්‍රතිරෝධයක් බලාපොරොත්තු විය නොහැක. අප දැනටමත් දන්නා පරිදි මෙතෙක් කාලයක් නමට හෝ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයේ තිබූ බටහිර බොහෝ රටවල දැන් එළිපිටම වර්ගවාදය වපුරන නායකයන් පත් කරගෙන තිබේ. කොරෝනා වසංගතය නිසාද ඇත්තෙන්ම ආඥාදායක පාලනයක් පවත්වාගෙන යෑම පහසු වී ඇත්තේ හදිසි තත්වයට මුවා වී බොහෝ තීරණ ගතහැකි නිසාවෙනි. මෙවැනි තත්වයක් තුළ පාලන තන්ත්‍රය තව තවත් ආඥාදායක අතට තල්ලු වීම නැවැත්විය හැක්කේ සියලු ආකාරයේ ජනතාව එකට එකතු වී ප්‍රතිරෝධය දැක්වුවහොත් පමණි. 70 වසරක ප්‍රජාතන්ත්‍රවාදී පාලනයෙන් රටට වූ සෙතක් නැති වීම පිළිබඳ කලකිරීමක් දැනීම ස්වභාවිකය. නමුත් එනිසා ආඥාදායක ස්වරූපයේ පාලනයකට සහය දැක්වීම 'මුණත් එක්ක තරහට නහය කපාගත්තා' වාගේ වැඩකි. ඒ මන්දැයි දැන් විමසා බැලීම වටියි.

### ආඥාදායක පාලනය පිළිබඳ ඇති මිථ්‍යා ප්‍රබන්ධ

***ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මිථ්‍යා විශ්වාස ඇත්තාක් මෙන්ම ආඥාදායකත්වය පිළිබඳවද මිථ්‍යා විශ්වාස ඇත. ජාතිකවාදයට මෙන්ම ආඥාදායකත්වය ද පවතින්නේ භීතිය සහ එනිසාම උපදින ආරක්ෂාවේ අවශ්‍යතාවය මත පදනම්වය. පාස්කු ප්‍රහාරයෙන් පසු අපේ රටේ සිදුවූයේ ද මෙයයි. සිංහල ජාතිකවාදීන් විසින් එම***





අන්තවාදයේ වින්දිතයෝ... www.nytimes.com

**ප්‍රහාරයේ වගකීම ප්‍රජාතන්ත්‍රවාදය මත පැටවූ අතර ඊට පිළියම දැඩි පාලනයක් බව සමාජගත කරන ලදි. කෙසේ වුවත් වත්මන් ලෝකය තුළ ආඥාදායක පාලන ක්‍රම වුවද ත්‍රස්ත ප්‍රහාරවලට ගොදුරු වන බවට මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම එවැනි තර්ජන සාර්ථක ලෙස කළමනාකාරණය කරගත් බවටද ඕනෑ තරම් උදාහරණ තිබේ. එහිදී මතක තබාගත යුතු කරුණක් වන්නේ අතීතයට වඩා අද බොහෝ රාජ්‍යයන්ට තර්ජන එල්ල වන්නේ අභ්‍යන්තරයෙන් මිස බාහිරින් නොවන බවයි. මෙසේ වන්නේ රට තුළ වෙනස් කොට සැලකීම් සහ බහිෂ්කරණයට ලක්වන කණ්ඩායම් රාජ්‍යයට එරෙහිව කැරලි ගැසීම නිසාය. එවැනි තත්වයක් තුළ සංවාදයට ඉඩක් නොතබන විශේෂඥයන් විසින් මෙහෙයවනු ලබන දේශපාලන පද්ධතියක් ඇත්තෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට වඩා අස්ථායී සමාජයක් ඇති කිරීමට ඇති ඉඩකඩ වැඩිය.**

ආඥාදායකරූපී පාලන ක්‍රමයන් හි සාර්ථකත්වය පෙන්වීමට භාවිත කරන සුප්‍රසිද්ධම උදාහරණ දෙකකි, චීනය සහ සිංගප්පූරුව. 1980 දශකයේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා විසින් මහජන සහයෝගය දිනාගැනීම සඳහා භාවිත කළේ 'සිංගප්පූරු සිහිනය' යන පාඨයයි. වත්මන් ආඥාදායක අභිලාෂ සුජාතකරණය සඳහාද මෙවැනිම සංවර්ධන තේමා භාවිතා කිරීම දැකගත හැකිය. ආඥාදායක පාලනයක් යටතේ සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීම වඩා පහසු බව සැබෑය. ඒ බහුතර කැමැත්ත විමසමින් සිටීමට වැය වන කාලය ඉතිරි වන බැවිනි. නමුත් මෙසේ කැමැත්ත විමසීම සිදු නොකෙරෙන නිසාම මහා පරිමාණ දූෂණ වංචා සහ පවුල්වාදය නැඟ ඒමද සිදුවීමට ඉඩ ප්‍රස්ථාව වැඩි බව අප පිළිගත යුතුය. ප්‍රජාතන්ත්‍රවාදි පාලනයේ වැදගත්කම වන්නේ ජනමාධ්‍ය සහ මහජන මතය විමසීම වැනි ක්‍රම භාවිතයෙන් මේවා පිළිබඳ සංවාදයක් හෝ ඇති කළ හැකි වීමයි. නමුත් ආඥාදායක පාලන ක්‍රමවල සාමකාමීව මෙම ප්‍රශ්න විසඳාගත හැකි අවස්ථා අඩුය. එබැවින් ආඥාදායකරූපි පාලන ක්‍රමයක් හරහා රට සංවර්ධනය වන බවට සහතිකයක් දියහැකි නොවේ. ආඥාදායක ක්‍රම පිළිබඳ ඇති තවත් මිථ්‍යාවක් වන්නේ එමඟින් සමාජයට විනය හඳුන්වා දියහැකි බවයි. නමුත් හමුදා නිලධාරීන් ගණනාවකගෙන් සමන්විත ජනාධිපති කාර්ය සාධන බලකායක් තිබියදී පවා රටේ නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විවිධ අයට විවිධ සැලකිලි ලැබෙන්නේ නම් බලාපොරොත්තු වන විනය ක්‍රියාත්මක වනවාද යන්න ගැටලුවකි. මෑතකදී පැවැත්වුණු තොණ්ඩමන් මහතාගේ අවමංගල්‍යය මීට කදිම නිදසුනකි.

ලංකාවේ ඔත්පල වූ ප්‍රජාතන්ත්‍රවාදයට පිළියමක් ලෙස ආඥාදායකත්වය සුදුසු යැයි අපට හැඟෙන්නේ අපේ සමාජ බුද්ධියේ ඇති නොමේරූ බව නිසාය. අපේ ඉපැරණි වැඩවසම් ඉතිහාසය පිළිබඳ අප තුළ ඇති සාංකාවත් නිසාය. ප්‍රජාතන්ත්‍රවාදය කිසිදා සර්වසම්පූර්ණ විය නොහැකි බව අපි දනිමු. එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදි රාජ්‍යන් තුළ අදක්ෂ අකාර්යක්ෂම සහ දූෂිත පාලකයන් බිහි වී ඇත්තා මෙන්ම රටවල් යුද්ධයට ඇද දමන පිස්සන් සහ විහිළුකාරයන් බලයට පැමිණ ඇති බවත් රහසක් නොවේ. නමුත් පාලකයා පිළිබඳ නොසතුටක් ඇති විට ඇය/ ඔහු සාමකාමීව බලයෙන් ඉවත් කළ හැකි එකම ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි. එම නිසා ඔත්පල වූ ප්‍රජාතන්ත්‍රවාදයට පිළියම ආඥාදායකත්වය නොවන බවත්, කළ යුත්තේ පුරවැසියා සහ රාජ්‍යය අතර පවතින සම්මුතියෙහි කොන්දේසි පුරවැසියාට වාසි සහගත ලෙස වෙනස් කර ගැනීමට මහන්සි වීම බවත් අප සිහි තබා ගත යුතුය.



මෛත්‍රීපාල සිරිසේන සහ රනිල් වික්‍රමසිංහ

# ඉහළ-මැදි ආදායමේ සිට පහළ-මැදි ආදායමට හෙළා යහපාලනය රට දුප්පත් කළා


මහාචාර්ය
**මිල්ටන් රාජරත්න**

මෙම ලිපිය මගින් 2015-2019 අතර අවුරුදු පහක කාලය අවසන් වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ඉහළ-මැදි ආදායම් ශ්‍රේණියේ සිට පහළ-මැදි ආදායම් ශ්‍රේණිය දක්වා දුප්පත් වූ ආකාරය විමසා බැලේ. ඒ සඳහා ලෝක බැංකුව හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළ කරන ලද දත්ත භාවිතයට ගනු ලබන අතර වෙසෙසින්ම මෙම විමසීම පදනම් වන්නේ සමස්ත ආර්ථික වර්ධනය පිළිබඳ දත්ත මත පමණි. ආර්ථික වර්ධන වේගය ජනගහන වර්ධන වේගයට වැඩි වන විට ඒක පුද්ගල ආදායමේ වර්ධනයක් පෙන්නුම් කරන බැවින් රටක් දුප්පත් වන්නේ කෙසේදැයි යමෙකුට තර්ක කළ හැකි නමුදු මෙම ලිපියෙහි අරමුණ වන්නේ ජාත්‍යන්තර මිනුමට අනුව ශ්‍රී ලංකාව දුප්පත් වූ හැටි විභාග කිරීමය.

ලෝක බැංකුව විසින් ඒක පුද්ගල ආදායම පදනම් කරගෙන සෑම වසරකම ලෝකයේ රටවල් ආදායම් මට්ටම් හතරකට ශ්‍රේණි ගත කරනු ලබයි.


2020 ජූලි පළමුවෙනිදා සිට අදාළ වන පරිදි ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 1,036ට වඩා අඩු රටවල් පහළ ආදායම් ශ්‍රේණියට ද, 1,036-4,045 දක්වා රටවල් පහළ-මැදි ආදායම් ශ්‍රේණියට ද, 4,046-12,535 දක්වා රටවල් ඉහළ-මැදි ආදායම් ශ්‍රේණියට ද 12,535ට වඩා වැඩි රටවල් ඉහළ ආදායම් ශ්‍රේණියට ද ඇතුළත් කරනු ලැබ තිබේ. ඒ අනුව සුඩානය, ඇල්ජීරියාව සහ ශ්‍රී ලංකාව යන රටවල් තුන පෙර වර්ෂයට වඩා දුප්පත් වූ රටවල් ලෙස වර්ග කොට තිබේ.

ශ්‍රී ලංකාව 2018 දී ඒක පුද්ගල ආදායම වූ ඩොලර් 4,079 සිට 2019 දී ඒක පුද්ගල ආදායම වූ ඩොලර් 3,852 දක්වා ඩොලර් 227කින් දුප්පත් වී ඇත. එහි ප්‍රතිඵලය ලෙස ශ්‍රී ලංකාව ඉහළ-මැදි ආදායම් මට්ටමේ සිට පහළ-මැදි ආදායම් මට්ටමට පහත හෙළා ඇත. දකුණු ආසියාවේ රටවල් අතුරින් ඉහළ-මැදි ආදායම් කාණ්ඩයට ඇතුළත් වී තිබුණේ මාලදිවයින හා ශ්‍රී ලංකාව පමණි. ශ්‍රී ලංකාව ඉහළ-මැදි ආදායම් කාණ්ඩයට ඇතුළත් වුයේ 2017 දීය. එහෙත් ආර්ථික වර්ධන වේගය අඛණ්ඩව පිරිහී යෑම නිසා 2018 දී ඩොලර් 4,079ක් වූ ඒක පුද්ගල ආදායම 2019 වන විට ඩොලර් 3,852 දක්වා කඩා වැටුණේය. ඒ අනුව ඉහළ-මැදි ආදායම් කාණ්ඩයේ සිට පහළට ඇද වැටුණේය. මාලදිවයින හැරුණු විට දකුණු ආසියාවේ අනෙකුත් රටවල් මෙන් දැන් ශ්‍රී ලංකාව ද දිළිඳු රටක් ලෙස ලෝක පිළිගැනීමට පාත්‍ර වී තිබේ.





ලිබරල් ධනවාදය ඔස්සේ ආර්ථිකය මෙහෙයවූ එක්සත් ජාතික පක්ෂය බලයේ සිටි කාලවල ආර්ථික වර්ධන වේගය ඉහළ අගයක් ගැනීම නිසා එය ආර්ථික වර්ධනයේ මැජික්කරුවෙකු ලෙස ප්‍රසිද්ධ විය. එබැවින් ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් හා සංවර්ධනයක් උදෙසා 2015 දී ඔවුන් බලයට පත්කර ගනු ලැබීය. ඒ අනුව 2014 දී පැවති 5%ක ආර්ථික වර්ධන වේගය වෙනුවට 2015 පටන් 7%-8%ක ආර්ථික වර්ධනයක් ලබාගැනීමට අපේක්ෂා කරන ලදි. එහෙත් සිදු වූයේ අනිකකි. එම ආණ්ඩුවට 2015 දී 5%ක ආර්ථික වර්ධනයක් ආරක්ෂා කරගත හැකි වුව ද ඉන් පසු අංක-1 ප්‍රස්තාරයේ දැක්වෙන පරිදි සෑම වසරකම වර්ධන වේගය ශීඝ්‍ර ලෙස පිරිහී ගියේය.


2015-2019 පස් අවුරුදු කාලය තුළ අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් ආර්ථික සංවර්ධන කමිටුවක් පිහිටුවා ගෙන තිබුණු අතර එමගින් සංවර්ධන ප්‍රතිපත්ති හත-අටක්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය. ඊට අමතරව ජනාධිපතිවරයාගේ සභාපතිත්වයෙන් ජාතික ආර්ථික සභාවක් (National Economic Council) පිහිටුවා ගත්තේය. ඒ කිසිදු ආයතනයකට හෝ ප්‍රතිපත්තියකට ධනාත්මක ප්‍රතිචාරයක් නොදක්වාම ආර්ථිකය පසුබැස්සේය. මෙම පසු බැස්ම කොතෙක් ද යත් වර්ධන වේගය 5% සිට 2.3% දක්වා පහළ බැසීමකි. මේ වනාහි වසර 18කට පෙර එල්ටීටී සංවිධානය කටුනායක ගුවන්තොටට දරුණු ප්‍රහාරයක් එල්ල කොට ආර්ථික ව්‍යසනයක් කරන ලද වර්ෂයෙන් පසු වාර්තා වූ අඩුම වර්ධන වේගයයි. පාස්කු ප්‍රහාරය සිදුවූ 2019 දී සංචාරක කර්මාන්තයට අහිතකර බලපෑමක් එල්ලවුණා හැරුණු විට 2015-2019 කාලය තුළ අප රටේ යුද්ධ, කැරලි කෝලාහල, නියං උවදුරු, වසංගත වැනි පීඩා ගෙන දුන්නේ නැත. අනික් අතට ආර්ථිකය මෙහෙයවීමේ ආයතන දෙකක් රජය විසින් පිහිටුවා තිබුණි. එම කාලය තුළ සිදුවූ ආර්ථික පිරිහීම අනුව පෙනෙන්නේ එම ආයතන දෙක "කතා සාප්පු"වලට සීමාවී තිබූ බවයි.




ආර්ථික වර්ධන වේගය ශීඝ්‍රයෙන් අඩුවත්ම එය දළ දේශීය නිෂ්පාදිතයේ කඩා වැටීමට බලපෑවේය. වර්තන මිල අනුව රුපියල්වලින් ගණනය කිරීමෙන් දේශීය නිෂ්පාදිතයේ වර්ධනයක් නිරීක්ෂණය කළ හැකි බව සැබෑ වුවද එමගින් සිත සනසා ගැනීමට විනා ජාත්‍යන්තර සංසන්දනාත්මක ආර්ථික විග්‍රහයකට ප්‍රමාණවත් පදනමක් සකසන්නේ නැත. එබැවින් ඩොලර් වටිනාකම අනුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය බිලියන 88.4 සිට 84.0 දක්වා කඩා වැටී ඇති බව අංක-2 ප්‍රස්තාරයෙන් පෙන්වා දේ. මේ කෙරෙහි වෙසෙසින්ම බලපෑවේ රජයේ විනිමය කළමනාකරණය දුර්වල වීම නිසා රුපියලේ අගය පිරිහීමයි.

දේශීය නිෂ්පාදිතයේ කඩා වැටීමට අනුරූප ලෙස ඒක පුද්ගල ආදායමේ කඩාවැටීම අංක-3 ප්‍රස්තාරයෙන් පෙන්නුම් කරයි. මේ වනාහී 2016 පැවති ඒක පුද්ගල ආදායමටත් වඩා 2019 අවසාන වන විට ආදායම් මට්ටම පහළ යෑමකි. මෙය අප රට අවුරුදු තුනකින් පසුබැස්සවීමට සමානය. 2018 සංඛ්‍යා හා සසඳන විට මෙය ඒක පුද්ගල ආදායමේ ඩොලර් 227ක පිරිහීමකි. ලෝක බැංකුව විසින් ඉහළ-මැදි ආදායම් ශ්‍රේණියේ සිට පහළ-මැදි ආදායම් ශ්‍රේණිය දක්වා ශ්‍රී ලංකාව පහත දැමීමට උපස්ථම්භක වූයේ ඒක පුද්ගල ආදායමේ





මෙම පිරිහීමයි. ඇතැම් අර්ථ ශාස්ත්‍රඥයින් සිත සැනසීම පිණිස රුපියල් ආදායම ඉහළ ගොස් ඇති බව පෙන්වා දීමට පෙළඹේ. ජනගහන වර්ධන වේගයට වඩා ආර්ථික වර්ධන වේගය වැඩි නම් දේශීය මුදලින් මනින ලද ඒක පුද්ගල ආදායම ඉහළ මට්ටමක පවතින බව සැබෑය. එහෙත් එයින් ලෝක ආර්ථිකය හා ශ්‍රී ලංකාව සැසඳීමට පිටිවහලක් නොලැබේ.

ප්‍රස්තාර අංක-4 මගින් 2015-2019 කාලයේ සත්‍ය දළ දේශීය නිෂ්පාදිතය සමග 5%ක ස්ථායී වර්ධන වේගයක් අනුව ලබාගත හැකිව තිබූ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු සංසන්දනය කෙරේ. මෙහි උපකල්පනය කරනු ලබන වර්ධන වේගය 5% ලෙස ගෙන ඇත්තේ ආසන්න වර්ෂ ලෙස ගත හැකි 2014 සහ 2015 දී 5%ක ආර්ථික වර්ධන වේගයක් පැවතීමත් පසුගිය දශක හතක කාලය තුළ (දශක තුනක යුද්ධයකට ද ජේවීපී කැරලිවලට ද වෙනත් උවදුරුවලට ද මුහුණදෙමින්) 5%ක පමණ සාමාන්‍ය ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකාව සමත් වී තිබීමත් නිසාය.

තවද, 2015 දී බලයට පත්වූ ආණ්ඩුව ආර්ථිකය නංවාලීමට සැලසුම්, ප්‍රතිපත්ති, විදේශ සබඳතා, විදේශ ආයෝජන, ව්‍යාපාරික විශ්වාසය, ජාතන්තර සහයෝගය යනාදිය නව ආණ්ඩුව සතු බැව් ප්‍රකාශ කළ බැවින් අවම වශයෙන් 2014 දී පැවති 5%ක ආර්ථික වර්ධන වේගයවත් පවත්වා ගැනීමට අසමත් නොවිය යුතු බව උපකල්පනය කරනු ලැබේ. 2015 දී 5%ක වර්ධන වේගයක් පවත්වා ගත හැකි වුවත් ඉන්පසු එහි ශීඝ්‍ර පිරිහීම විසින් (විනිමය අනුපාතයේ පිරිහීමේ බලපෑම ඇතුළත්ව) සත්‍ය දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් බිලියන 84 දක්වා පහත හෙළනු ලැබීය. ඒ අනුව අහිමි වූ සත්‍ය දේශීය ආදායම 2018ට සාපේක්ෂව ඩොලර් බිලියන 4.4 කි. අනික් අතට 5%ක අවම ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගැනීමට සමත්



රනිල් වික්‍රමසිංහ රවි කරුණානායක මංගල සමරවීර




**2016 පටන් සෑම වසරකම පැවති ආණ්ඩුවේ ආර්ථික කළමනාකරණ අසමත්කම ගැන විවරණ මෙන්ම දැඩි විවේචන ද ඉදිරිපත් කරනු ලැබීය. ආර්ථිකය ප්‍රපාතයට තල්ලුවන බව පෙන්වා දුන්නේය. එය සැබෑ කරමින් යහපාලන ආණ්ඩුව ආර්ථිකය "රිවර්ස් ගියරයේ" දමා පලා ගොස් ඇත. වත්මන් ආණ්ඩුවට ආර්ථිකය "ෆෝවර්ඩ් ගියරයේ" දැමීමේත් ඉනික්බිතිව "හයි ගියරයක" දමා පැදවීමේත් වගකීම පැවරී තිබේ. එහෙත් වසරකට ආසන්න කාලයක් ගෙවී ගොස් ඇතත් රියදුරු අසුන්වල නිසි රියදුරන් හිඳුවා තිබේද යන්න රජයෙන් ප්‍රශ්න කළ යුතුව ඇත.**

වුයේ නම් 2019 වන විට දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් බිලියන 98 දක්වා ඉහළ නංවා ගත හැකිව තිබුණි. එහෙත් ආණ්ඩුවේ අසමත්කම නිසා 2016 දී ඩොලර් බිලියන 2.2කින් පටන්ගත් මෙම ආදායම් හානිය 2019 දී ඩොලර් බිලියන 14ක හානියක් දක්වා වර්ධනය වූ බව ඇස්තමේන්තු කළ හැකිය.

අංක-5 ප්‍රස්තාරයෙන් පෙන්නුම් කරන්නේ 5%ක ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගැනීමට අපොහොසත් වීම නිසා අහිමි වූ ඇස්තමේන්තුගත දේශීය ආදායමයි. 2015න් පසු ඇස්තමේන්තුගත දේශීය ආදායම 2016 සිට 2019 දක්වා කාලය තුළ නොකඩවා ශීඝ්‍රයෙන් පිරිහී ගිය අතර එමගින් වූ ආදායම් හානියේ එකතුව ඩොලර් බිලියන 22.6කට සමාන වේ. මෙය ඒක පුද්ගල ආදායමට කළ බලපෑමක් ලෙස ගණනය කළහොත් ඩොලර් 5,000ක ඒක පුද්ගල ආදායම් මට්ටම ඉක්මවා යාමට තිබූ අවස්ථාව අහිමිකර ගැනීමක් ලෙස සඳහන් කළ හැකිය. ඒක පුද්ගල ආදායම මානව සංවර්ධන දර්ශකයේ එක් ප්‍රපංචයක් වන බැවින් 2020 දී ශ්‍රී ලංකාව මානව සංවර්ධනය පිරිහුණු රටක් බවට පත්වේ. පසුගිය වසර පහ තුළ 5%ක වර්ධන වේගයක් පවත්වා ගැනීමට නොහැකි වීම නිසා හානි වූ ඩොලර් බිලියන 22.6 වර්තමාන දේශීය නිෂ්පාදිතයෙන් 27% කට සමාන වේ. මෙය සුළුපටු හානියක් නොවේ. එය පියවා ගැනීමට 8% ආර්ථික වර්ධන වේගයක්වත් ඉදිරි අවුරුදු පහ තුළ පවත්වා ගත යුතුය. එය අසීරු ඉලක්කයකි. එබැවින් පසුගිය වසර පහ තුළ අහිමි වූ ආදායම ප්‍රතිෂ්ඨාපනය කරගත හැකි මගක් නැති තරමට එය බරපතළය.

2015-2019 කාලය තුළ නිෂ්පාදන සාධක හැකිළීමක් හෝ සාධක පිළිබඳ පූර්ණ සේවා නියුක්ති තත්ත්වයක් හෝ වෙනත් බාහිර වශයෙන් වූ සංකෝචනාත්මක බලපෑමක් හෝ නොවීය. පාස්කු ප්‍රහාරය නිසා හටගත් පසුබෑම පමණක් මෙහිලා සැලකිය යුතුය. දකුණු ආසියාවේ ඇෆ්ගනිස්තානය හැරුණු විට අන් සියලු රාජ්‍යයන්ගේ වේගවත් ආර්ථික වර්ධනයක් පැවති බැවින් ද සමස්තයක් ලෙස ලෝක ආර්ථිකයේ වර්ධනයක් පැවති බැවින් ද ශ්‍රී ලංකාවේ ආර්ථිකය දුප්පත් වූයේ හුදෙක් යහපාලන ආණ්ඩුවේ අසමත්කම නිසා බව නිගමනය කළ හැකිය. මෙම ලියුම්කරු විසින් 2016 පටන් සෑම වසරකම පැවති ආණ්ඩුවේ ආර්ථික කළමනාකරණ අසමත්කම ගැන විවරණ මෙන්ම දැඩි විවේචන ද ඉදිරිපත් කරනු ලැබීය. ආර්ථිකය ප්‍රපාතයට තල්ලුවන බව පෙන්වා දුන්නේය. එය සැබෑ කරමින් යහපාලන ආණ්ඩුව ආර්ථිකය "රිවර්ස් ගියරයේ" දමා පලා ගොස් ඇත. වත්මන් ආණ්ඩුවට ආර්ථිකය "ෆෝවර්ඩ් ගියරයේ" දැමීමේත් ඉනික්බිතිව "හයි ගියරයක" දමා පැදවීමේත් වගකීම පැවරී තිබේ. එහෙත් වසරකට ආසන්න කාලයක් ගෙවී ගොස් ඇතත් රියදුරු අසුන්වල නිසි රියදුරන් හිඳුවා තිබේද යන්න රජයෙන් ප්‍රශ්න කළ යුතුව ඇත. ■

(උපුටා ගැනීම : රාවය පුවත් පත)

## වසංගතයක් මධ්‍යයේ පාර්ලිමේන්තු මැතිවරණය :

# ශ්‍රී ලංකාවේ යුක්තියට සහ ප්‍රතිසංධානයට ඇති බලපෑම



www.dailynews.lk / www.dailymirror.lk/




**භවානි ෆොන්සේකා**


ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණය අගෝස්තු 5 දා පැවැත්වෙනු ඇති අතර එහි දී පත්වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් මීළඟ පාර්ලිමේන්තුව සමන්විත වනු ඇත. මැතිවරණය පැවැත්වෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 (1) වගන්තියේ ඇති විධිවිධාන අනුව වසර 4.5ක් සම්පූර්ණ වූ පසුව මාර්තු 8 දා අටවැනි පාර්ලිමේන්තුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් විසුරුවා හරිනු ලැබීම නිසා ය. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ප්‍රකාශය මගින් නාමයෝජනා භාරගැනීමටත් ඉන් පසුව 2020 අප්‍රේල් 25 දින මැතිවරණ පැවැත්වීමටත් දින නියම කරනු ලැබී ය. මෙය කොවිඩ් 19 රෝගීන් හමුවීම වැඩි වෙමින් පැවති කාලය වන අතර කොවිඩ් 19 වසංගතයක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මාර්තු 11 දා ප්‍රකාශයට පත් කිරීමත් සමග සමපාත වී ය. නාම යෝජනා භාරගැනීම අවසන් කළ වහාම මැතිවරණ කොමිසන් සභාව මැතිවරණය

කල්දැමීම නිවේදනය කරන ලද්දේ වසංගතය නිසා වැඩි වෙමින් පැවති සෞඛ්‍ය ප්‍රශ්න හේතුවෙනි. වසංගත කාලයක මැතිවරණ පැවැත්වීම ගැන මැතිවරණ නිරීක්ෂකයන් සහ සිවිල් සමාජ සංවිධාන තම නොකැමැත්ත ප්‍රකාශ කරමින් 70 (7) වගන්තියෙන් ප්‍රතිපාදන සලසා ඇති ආකාරයට 8 වන පාර්ලිමේන්තුව නැවත කැඳවන ලෙස ඉල්ලා සිටියේ ද මෙම අවස්ථාවේ දී ය. මෙයට පදනම් වුයේ




මැතිවරණ ප්‍රචාරණය සහ එයට සම්බන්ධ අනෙක් ක්‍රියාකාරකම් මගින් වසංගත තත්ත්වය තවත් උත්සන්න කරනු ඇතැයි වූ බිය යි. එමෙන් ම එය සිදු වුයේ ගමන් බිමන් සහ රැස්වීම් සීමා කිරීම සඳහා සමස්ත දිවයින අගුළුලෑමේ සන්දර්භය තුළ යි.

***මෙම කාලයේ විවාද පැන නැගුණේ විසුරුවා හරින ලද පාර්ලිමේන්තුව නැවත කැඳවිය හැකි ද, නැතහොත් එක ම විකල්පය නව පාර්ලිමේන්තුවක් ද යන්න පිළිබඳව ය. ආණ්ඩුව අවධාරණය කළේ මැතිවරණය අවශ්‍ය බවට සහ මැතිවරණය අවසන් වන තෙක් පාලනය ගෙන යාම විධායකයට කළ හැකි බවට ය. විපක්ෂය සහ සිවිල් සමාජය ඉල්ලා සිටියේ ව්‍යවස්ථාදායකයේ අධීක්ෂණයක් පවත්වා ගැනීම සඳහාත්, අධිකාරවාදයක් වෙත ඇදී යාමේ හැකියාව වැළැක්වීම සඳහාත්, වසංගතය සහ අනෙක් හදිසි ප්‍රශ්නවලට මුහුණදීමට පාර්ලිමේන්තුව නැවත කැඳවිය යුතු බවට ය. අනපේක්ෂිත හදිසි අවස්ථා ඇති වීමේ හැකියාව අපේක්ෂා කළ 1977 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් එවැනි අවස්ථාවක දී පියවර ගැනීම සඳහා අවශ්‍ය බලතල ලබා දී ඇත. 70 (7) වගන්තිය පාර්ලිමේන්තුව අත්‍යවශ්‍ය වන එබඳු අවස්ථාවක් සඳහා ය. ආණ්ඩුකරණයේ ප්‍රධාන අංග තුන, එනම්, විධායකය, ව්‍යවස්ථාදායකය, සහ අධිකරණය ව්‍යවස්ථාදායක ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා අවශ්‍ය ය යන්න ද පිළිගත් කාරණයකි. ව්‍යවස්ථාදායකය නොමැතිව පැවතිය හැකි කාලය මාස තුනක් ලෙස ව්‍යවස්ථාවේ 70 (5) වගන්තියේ දක්වා ඇත්තේ ද මෙම පදනම යටතේ ය.***

ප්‍රශ්නයට රාජපක්ෂ ජනාධිපතිවරයා මැදිහත් කර ගැනීමේ උත්සාහය අසාර්ථක වීමෙන් පසුව මැතිවරණය පැවැත්වෙන අලුත් දිනය ජුනි 20 දා ලෙස මැතිවරණ කොමිසම නිවේදනය කළේ ය. මාස තුනේ නීතිය අනුව ජුනි 2 දාට පෙර පාර්ලිමේන්තුව රැස්විය යුතුව තිබිණි. ඒ අනුව මැතිවරණය පැවැත්වෙන අලුත් දිනය මාස තුනේ නීතියට පිටතින් වූ අතර එය ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වී ය. මෙයින් සිදු වුයේ විධායක බලය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අධීක්ෂණය සහ තුලනය මාස තුනකට වැඩි කලක් සඳහා නොතිබීමත් එමගින් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක ප්‍රජාතන්ත්‍රවාදය බරපතළ බලපෑමකට ලක්වීමත් ය. සිවිල් සමාජ සංවිධාන සහ දේශපාලන පක්ෂ ගණනාවක් ජුනි 20 දා මැතිවරණය පැවැත්වීමට අභියෝග කළේ මාස තුනේ නීතිය පදනම් කොට ගනිමින් ය. පෙත්සම් විභාගයට ගැනීම පිළිබඳ මූලික අවස්ථාවේ දිගු විභාගයකින් පසුව

**"**

**වසංගත කාලයක මැතිවරණ පැවැත්වීම ගැන මැතිවරණ නිරීක්ෂකයන් සහ සිවිල් සමාජ සංවිධාන තම නොකැමැත්ත ප්‍රකාශ කරමින් 70 (7) වගන්තියෙන් ප්‍රතිපාදන සලසා ඇති ආකාරයට 8 වන පාර්ලිමේන්තුව නැවත කැඳවන ලෙස ඉල්ලා සිටියේ ද මෙම අවස්ථාවේ දී ය. මෙයට පදනම් වුයේ මැතිවරණ ප්‍රචාරණය සහ එයට සම්බන්ධ අනෙක් ක්‍රියාකාරකම් මගින් වසංගත තත්ත්වය තවත් උත්සන්න කරනු ඇතැයි වූ බිය යි. එමෙන් ම එය සිදුවූයේ ගමන් බිමන් සහ රැස්වීම් සීමා කිරීම සඳහා සමස්ත දිවයින අගුළුලෑමේ සන්දර්භය තුළ යි.**



> **ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක ප්‍රජාතන්ත්‍රවාදය බරපතළ බලපෑමකට ලක්වීමත් ය. සිවිල් සමාජ සංවිධාන සහ දේශපාලන පක්ෂ ගණනාවක් ජූනි 20 දා මැතිවරණය පැවැත්වීමට අභියෝග කළේ මාස තුනේ නීතිය පදනම් කොට ගනිමින් ය. පෙත්සම් විභාග යට ගැනීම පිළිබඳ මූලික අවස්ථාවේ දිගු විභාගයකින් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් පස් දෙනා පෙත්සම් විභාගයට ගැනීම ප්‍රතික්ෂේප කළ අතර නීතිමය අභියෝගකිරීම එතැනින් අවසන් වී ය.**

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් පස් දෙනා පෙත්සම් විභාගයට ගැනීම ප්‍රතික්ෂේප කළ අතර නීතිමය අභියෝග කිරීම එතැනින් අවසන් වී ය. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවෙන් පසුව මැතිවරණ කොමිසම නිවේදනය කළේ අගෝස්තු 5 දා මැතිවරණය පැවැත්වෙන බව යි. ඒ අනුව, මැතිවරණය පැවැත්වෙනු ඇත්තේ ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 රෝගීන් වාර්තා වීම් මැද සහ සීමාකිරීම් නැවත පැනවීම දක්නට ලැබීමට ඉඩ ඇති දෙවන රැල්ලක අනතුර යටතේ ය.

මැතිවරණය මගින් මීළඟ පාර්ලිමේන්තුවේ සැලකිය යුතු බලයක් රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ලැබෙනු ඇති බවත් එමගින් ඔහුගේ බලය තවදුරටත් ශක්තිමත් වනු ඇති බවත් පෙනෙන්නට තිබේ. විධායකය ශක්තිමත් කිරීමේ විභවයෙන් යුතු, සංවරණ සහ තුලනයන් ඉවත්කරන සහ ස්වාධීන ආයතන තව දුරටත් දුර්වල කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ නීතිමය ප්‍රතිසංස්කරණ රැසක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආධිපත්‍යයෙන් යුතු ව්‍යවස්ථා දායකයකින් ඉදිරිපත් වනු ඇත. මෙහි තේරුම නම්, අධිකාරවාදයට, හමුදාකරණයට සහ වාර්ගික ජාතිකවාදයට යොමු වීමේ මෑත කාලීන ප්‍රවණතා සැලකිල්ලට ගන්නා විට, මෙය ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රජාතන්ත්‍රවාදයට සහ බිඳෙන සුළු සාමයට අනතුරුදායක බව යි. එබඳු සන්දර්භයක් තුළ සැලකිල්ලට ගත යුතු ඇතැම් ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳව කෙටි පරීක්ෂාවක් මෙම ලිපිය මගින් සිදුකරනු ඇත.

## වසංගත සමයේ ආණ්ඩුකරණය සහ එයට සම්බන්ධ කරුණු

වසංගතය විසින් ආණ්ඩුකරණය සම්බන්ධ අභියෝග ගණනාවක් මතුකරනු ලැබී ය. පළමුවෙන් ම අවධානය යොමු වූයේ ශ්‍රී ලංකාවට සාර්ථකව කොවිඩ් 19 මර්දනය කිරීමට හැකි වේද යන්න යි. ශ්‍රී ලංකාවේ විශිෂ්ට මහජන සෞඛ්‍ය සේවය, පිළිගත් සෞඛ්‍ය චර්යා සහ ක්‍රමවේද හඳුන්වා දෙමින් සෞඛ්‍ය ප්‍රශ්නයට සහ අභියෝගයට ඉතා සාර්ථකව මුහුණ දුන්නේ ය. වසංගතයේ සෞඛ්‍යමය පැත්ත කළමනාකරණය කළ ආකාරය ගැන ශ්‍රී ලංකාවට පැසසුම් හිමි විය යුතු නමුත් එමගින් ආණ්ඩුකරණය සහ වෙනත් ප්‍රශ්න සම්බන්ධයෙන් බරපතළ ගැටලු මතු කළේ ය. විශේෂයෙන් ම පෙනීගිය කරුණක් වන්නේ රාජ්‍ය සේවය පසෙකට කරමින් දේශපාලන පත්වීම් ලැබූවන් සහ හමුදාව තීරණ ගැනීමේ කාර්යය සිදුකරන බව, ප්‍රතිචාරය මගින් පෙනී යාමයි. අවශ්‍ය සහන පියවර ගැනීමට ක්‍රියා නොකිරීම ගැන 2020 ජූනි මාසයේ පැවති රැස්වීමක දී ජනාධිපති රාජපක්ෂ මහතා මහ බැංකුවේ නිලධාරීන්ට ප්‍රහාර එල්ල කිරීම වැනි අවස්ථා මගින් පෙන්නුම් කළ පරිදි ස්වාධීන ආයතනවල ප්‍රතිපත්ති සම්පාදනයට විධායකයේ මැදිහත්වීම ද දක්නට ලැබිණි.

වසංගත කාලයේ මතු වූ විවිධ ප්‍රශ්නවලට ප්‍රතිචාර ලෙස ජනාධිපති කාර්ය සාධක බලකා ගණනාවක් සහ ජාතික මධ්‍යස්ථාන පිහිටුවනු ලැබී ය. ඇතැම් කාර්ය සාධක බලකාවලට ලබා දී ඇති බලතලවල නීත්‍යනුකූල බව සහ නීතිය ඉක්මවා යාම ගැන ප්‍රශ්න මතු වී ඇත. කෝවිඩ් 19 ට මුහුණ දීම සඳහා පත්කරන ලද බොහෝ ආයතනවල නායකත්වය දරන්නෝ හෝ වැඩි සාමාජිකත්වය දරන්නෝ හමුදා නිලධාරීහු සහ හිටපු හමුදා නිලධාරීහු වෙති. මෙම ඇතැම් ආයතන සඳහා ලබා දී ඇති බලතල සහ ඒවායේ සංයුතිය මගින් මතුකරන ප්‍රශ්නයක් වන්නේ විධායකයට සම්බන්ධ හිටපු හමුදා සහ වෙනත් පිරිස් ආණ්ඩුකරණයට සූදානම් වනවාද යන්න වන අතර ව්‍යවස්ථාදායක අධීක්ෂණය සහ ශක්තිමත් විපක්ෂයක් නොමැති තත්ත්වයක් තුළ මෙමගින් බරපතළ ප්‍රතිවිපාක ඇති විය හැකි ය. මේ සියල්ල මගින් මතු කරන්නේ රාජ්‍ය සේවය සහ ස්වාධීන ආයතන දේශපාලනීකරණය සහ කොන්කිරීම වැඩි වැඩියෙන් සිදුවෙමින් මතුවන අධිකාරිවාදී භාවිතයන් පිළිබඳ අනතුර යි. ව්‍යවස්ථාදායකයේ අධීක්ෂණය නොමැතිවීමත්, බලය අයුතු ලෙස භාවිත කිරීම වැළැක්වීමට දුර්වල ආයතනවලට හැකියාවක් නැතිකම හෝ උවමනාවක් නැතිකම මගින් මෙම බිය තවදුරටත් තහවුරු කරයි.

## හමුදාකරණය පිළිබඳ ගැටලු සහ එහි බලපෑම්

හමුදාකරණය පශ්චාත් යුද ශ්‍රී ලංකාවට අලුත් ප්‍රශ්නයක් නොවුව ද, සැලකිල්ලට

ගතයුතු ප්‍රශ්නය වන්නේ අයිතීන්ට, ප්‍රතිසන්ධානයට සහ ආණ්ඩුකරණයට බලපෑම් සිදුවීමේ හැකියාවේ මට්ටම යි. ආරක්ෂක අවශ්‍යතා සඳහා ආරක්ෂක ආයතනවලට කාර්යභාරයක් ඇති බව පිළිගන්නා අතර ම, හමුදා සහ හිටපු හමුදා නිලධාරීන් විසින් සිවිල් පරිපාලනයේ කාර්යයන් පවරා ගැනීම මගින් මානව හිමිකම්, ආණ්ඩුකරණය සහ ප්‍රතිසන්ධානයට බරපතළ බලපෑම් සිදුවීමේ හැකියාව ගැන ප්‍රශ්න දිගට ම පවතියි.

2019 දී ගොඨාභය රාජපක්ෂ මහතා බලයට පත්වීමෙන් පසුව හමුදාකරණය නව මට්ටමකට වර්ධනය වී ඇත. රාජපක්ෂ පාලනය යටතේ ආරක්ෂක අමාත්‍යංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ශ්‍රී ලංකා රේගුව සහ තවත් ආයතනවල ප්‍රධාන පරිපාලන තනතුරුවලට හමුදා සහ හිටපු හමුදා නිලධාරීන් පත්කිරීමේ අවස්ථා ගණනාවක් දකින්නට ලැබිණි. ඊට අමතරව, වසංගතයට ප්‍රතිචාර දැක්වීමේ දී දකින්නට ලැබුනේ හමුදාවට හා හිටපු හමුදා නිලධාරීන්ට වැඩි කාර්යභාරයක් පැවරුණු බව යි. සම්බන්ධිතයන් හඳුනාගැනීමේ සහ සොදිසි කිරීමේ ප්‍රධාන කාර්යයක් හමුදාව සහ බුද්ධි අංශ මගින් ඉටුකරනු ලබන බවට ලැබෙන වාර්තා මගින් මතුකරන ප්‍රශ්නය වන්නේ එමගින් සිවිල් නිදහස සීමා වනු ඇද්ද යන්නයි. නිරෝධායන ක්‍රියාවලියේ දී ද හමුදාව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

ඊට අමතරව, මෑතකාලීන ප්‍රශ්නවලට ප්‍රතිචාර ලෙස පත්කරනු ලැබූ කාර්ය සාධක බලකා ගණනාවක සංයුතිය සමන්විත වන්නේ හිටපු සහ වත්මන් හමුදා නිලධාරීන්ගෙන් වන අතර ඇතැම් ඒවායේ ප්‍රධානත්වය දරන්නෝ හිටපු හමුදා නිලධාරීහු වෙති. උදාහරණ වශයෙන් ජූනි 2 දා පත්කරනු ලැබූ කාර්ය සාධක බලකා දෙක වන ආරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක සහ නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන කාර්ය සාධක බලකාය (ගැසට් අංක 2178/18) සහ නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා උරුම කළමනාකරණය සඳහා ජනාධිපති කාර්ය සාධක බලකාය (ගැසට් අංක 2178/17) යන දෙකෙහි ම ප්‍රධානත්වය දරන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා විසින් වන අතර ඒවා සම්පූර්ණයෙන් සිංහල පුද්ගලයින්ගෙන් සමන්විත ය. වසංගත සමයක් තුළ සහ මැතිවරණයකට ගමන් කරන කාලයක මේ දෙකෙහි ම බලය, සංයුතිය සහ ඒවා පත් කළ වෙලාව යන සියල්ල ප්‍රශ්නකාරී වෙයි. ඊටත් වඩා ප්‍රශ්න පැනනැගී තිබෙන්නේ විධායකය විසින් පත්කරනු ලැබ ඇති මෙම ආයතන මගින් අමාත්‍යාංශවල සහ ව්‍යවස්ථාපිත ආයතනවල කාර්යයන් පවරා ගන්නේ ද යන්න යි. ඊට අමතරව ආරක්ෂක අංශවල හිටපු සහ සිටින නිලධාරීන්ට ප්‍රමුඛතාවය සහ උසස්වීම් ලබා දී ඇත්තේ ඒ ඇතැමෙක් සම්බන්ධයෙන් බරපතළ උල්ලංඝනයන් පිළිබඳ චෝදනා ඇති පසුබිමක ය. එයින් ලැබෙන සංඥාව වන්නේ ඇතැමුන්ට වගවීම මගහැර යෑමට සහ වත්මන් තත්ත්වය තුළ උසස්වීම් ලබන්නට පවා හැකි වන බව යි.




සුවසැරිය...



ෆ්ලොයිඩ් ඝාතනයට එරෙහි පෙරටුගාමීන්ගේ උද්ඝෝෂණය

www.menafn.com / www.ucanews.com

"

**වසංගත කාලය තුළ වෙනත් අයිතීන් ද ප්‍රහාරයට ලක් වූ අතර ඒවායේ බලපෑම ද බරපතළ විය හැකි ය. මාධ්‍යවේදීන් ප්‍රහාරයට ලක්වීමත්, නිරෝධායන නීති උල්ලංඝනය කළ බව කියමින් උද්ඝෝෂකයන්ට පහරදීමත් උදාහරන ලෙස දැක්විය හැකි ය. මෙම කාලයේ දී නියමිත ක්‍රියාවලියේ ආරක්ෂාව යන්න නොතකා හරින ලද අතර තම වෘත්තීය කාර්යයන් ඉටුකිරීම නිසා නීතිඥයෝ ද ඉලක්ක බවට පත් වූහ.**

හදිසි තත්ත්වයන්ට සහ ආපදාවන්ට මුහුණ දීම විස්තීර්ණ ක්‍රියාවලියක් විය යුතු බවට සැකයක් නැතත්, එවැනි ප්‍රතිචාරයක දී ප්‍රධානත්වය ගත යුත්තේ සහ සම්පූර්ණයෙන් සම්බන්ධ කර ගත යුත්තේ ඉහළ හැකියාවක් ඇති සහ කාර්යක්ෂම සෞඛ්‍ය සේවය ඇතුළු ශ්‍රී ලංකා පරිපාලන සේවය යි. විශේෂයෙන් ම ව්‍යවස්ථාදායකයේ අධීක්ෂණය නැති සහ අයිතීන් සහ නීතියේ පාලනය හෙමින් හෙමින් ඛාදනය වන සන්දර්භයක් තුළ ඉහළ යන හමුදාකරණය විවිධාකාර ප්‍රශ්න මතු කරයි.

## මානව හිමිකම් සහ මුක්තිය

වසංගතය තුළ සීමාකිරීම් රාශියක් ක්‍රියාවට නගනු දක්නට ලැබුනේ කොවිඩ් 19 පාලනය කිරීම සඳහා ඒවා අවශ්‍ය බව ප්‍රකාශ කරමිනි. හදිසි අවස්ථාවක දී ඇතැම් සීමා කිරීම්වලට අවසර ඇතත්, ක්‍රියාත්මක කළ සීමා කිරීම් නීත්‍යනුකූල ද, අවශ්‍ය ප්‍රමාණයට ද සහ අවශ්‍ය ද යන්න ප්‍රශ්න කළ යුතුව ඇත. උදාහරණයක් ලෙස වසංගතය පාලනය කිරීමට ගමන් බිමන් සීමා කිරීමේ පදනම මත මාර්තු 20 දා සිට ඇඳිරි නීතිය ක්‍රියාත්මක කිරීමට බලධාරීහු කටයුතු කළහ. ගමන් බිමන් සීමා කිරීම ක්‍රියාත්මක කළ මුල් සති කිහිපයේ දී එබඳු සීමා කිරීමකට ඇති නීතිමය පදනම පිළිබඳව ව්‍යකූලතාවක් පැවතිණි. මෙය පොලිස් ඇඳිරි නීතියක් බව සමහරු ප්‍රකාශ කළ අතර වෙනත් අය කීවේ නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ මෙම ඇඳිරි නීතිය පනවා ඇති බව යි. ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කළ නිල ලේඛන හොඳින් පරීක්ෂා කරන විට පෙනී යන්නේ මෙම සීමා කිරීම් සඳහා වන නීතිමය පදනම ප්‍රශ්නකාරී බව යි. මානව හිමිකම් ප්‍රශ්න පිළිබඳව ආණ්ඩුව ට උපදෙස් දීමේ බලය ඇති ජාතික මානව හිමිකම් කොමිසම පසුව මෙබඳු සීමා කිරීම් සඳහා පවතින නීතිමය රාමුව පෙන්වා දෙමින් ඉල්ලා සිටියේ නීතිමය ක්‍රියාමාර්ග නියමාකාර ලෙස ක්‍රියාත්මක කරන ලෙස යි.

වසංගත කාලය තුළ වෙනත් අයිතීන් ද ප්‍රහාරයට ලක් වූ අතර ඒවායේ බලපෑම ද බරපතළ විය හැකි ය. මාධ්‍යවේදීන් ප්‍රහාරයට ලක්වීමත්, නිරෝධායන නීති උල්ලංඝනය කළ බව කියමින් උද්ඝෝෂකයන්ට පහරදීමත් උදාහරන ලෙස දැක්විය හැකි ය. මෙම කාලයේ දී නියමිත ක්‍රියාවලියේ ආරක්ෂාව යන්න නොතකා හරින ලද අතර තම වෘත්තීය කාර්යයන් ඉටුකිරීම



නිසා නීතිඥයෝ ද ඉලක්ක බවට පත් වූහ. සුලුතරයන් සහ ආණ්ඩුව විවේචනය කරන්නන් ඉලක්ක කිරීමට දශක ගණනාවක් තිස්සේ යොදාගත් නීතියක් වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නීතිඥ හිජාස් හිස්බුල්ලා රඳවා තැබීම විශේෂයෙන් සඳහන් කළ යුතු ය. මෙම විශේෂ සිදුවීමේ දී රැඳවුම්කරු මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් නොකිරීම මගින් සහ හිස්බුල්ලා මහතාට තම නීතිඥයන් හමු වීමට ප්‍රමාණවත් අවස්ථා නොදීම මගින් නියමිත ක්‍රියාවලියේ ආරක්ෂාව යන්න නොතකා හැර ඇත.

2020 වසරේ මුල් භාගයේ සිදුවීම් ගණනාවක් මගින් ශ්‍රී ලංකාවේ අපරාධ මුක්තියේ සංස්කෘතිය සම්බන්ධයෙන් ප්‍රශ්න මතුකරයි. සුනිල් රත්නායකට 2020 මාර්තුවේ දුන් ජනාධිපති සමාව මගින් පෙන්නුම් කරන්නේ සාමාන්‍ය පුරවැසියන් ගණනාවක් ඝාතනය කිරීමට වරදකරු වී දඬුවම් ලැබූ සහ පසුව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය මගින් එය තහවුරු කොට තිබීම, විධායක ක්‍රියාවක් මගින් පසෙකට දැමූ ආකාරය යි. සමාව දීමේ ක්‍රියාව මගින් පෙන්නුම් කළේ ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති ක්‍රියාවලියේ බිඳෙනසුලු බව සහ මුක්තියේ සංස්කෘතිය යි. එමෙන් ම සංකේතාත්මක සිදුවීම් ගණනාවක පරීක්ෂණ සහ නඩු විභාග ප්‍රමාද වීම මගින් වින්දිතයන්ට යුක්තිය ඉටු වේ යයි කුමන හෝ බලාපොරොත්තුවක් තබාගත හැකි ද යන ප්‍රශ්නය මතු වෙයි. සංකේතාත්මක නඩු ගණනාවක පරීක්ෂණ වල සහ අධිකරණ ක්‍රියාමාර්ග වල බොහෝ ප්‍රමාදයන් සිදුවන්නේ ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති පද්ධතිය ස්වාධීන සහ අපක්ෂපාත ක්‍රියාවලියක් ලබාදීමට අපොහොසත් වන්නේ ද යන්න පිලිබඳ බිය වැඩි කරමින් ය. දේශපාලන මැදිහත්වීම්, ප්‍රමාදයන් සහ වෙනත් බාධා ආදීයේ ප්‍රතිඵලය වී තිබෙන්නේ චෝදනා ලැබූ වැරදිකරුවන් බොහෝ දෙනකු වගකීමට යටත් නොකිරීම යි. ඇතැම් නඩු දශක ගණනාවක් තිස්සේ ඇදී යමින්, පරීක්ෂණ සහ චෝදනා ගොනු කිරීම වසර ගණන් ප්‍රමාදවෙමින් පැවතීමෙන් ශ්‍රී ලංකාවේ වගවීමේ අසාර්ථකභාවය පිළිබඳව භයානක සංඥා ලබාදෙයි. ස්වාධීන ආයතන ගණනාවක යහපත් ක්‍රියා තිබිය දී, පසුගිය කාලයේ ඇති කළ සීමිත ප්‍රතිසංස්කරණ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු ආපසු හරවනු ඇති බවටත්, එමගින් තවදුරටත් අයිතීන් උල්ලංඝනය කිරීම් පහසු කරනු ඇති බවට සහ මුක්තියේ සංස්කෘතිය තහවුරු වනු ඇති බවටත්, බිය පළ වී තිබේ.

## සුළුතර අයිතීන් සහ ප්‍රතිසංධානය

යුද්ධය අවසන් වී දශකයකට වැඩි කලක් ගත වී තිබුණ ද ශ්‍රී ලංකාවට එහි බිඳෙනසුලු සාමය සහ ප්‍රතිසංධානය පිලිබඳ අභියෝගවලට මුහුණ දීමට සිදු වී තිබේ. 2019 නොවැම්බරයේ දී රාජපක්ෂ ජනාධිපතිවරයා තේරී පත්වීමෙන් පසු වර්ධනයන් ගණනාවකින් පෙන්නුම් කළේ වාර්ගික ජාතිකවාදයේ නැගීම සහ සුළුතරයන් කොන් කිරීම යි. උදාහරණ ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ආණ්ඩුව යටතේ මෙතෙක් කිසිදු මුස්ලිම් ඇමැතිවරයකු හෝ නියෝජ්‍ය ඇමැතිවරයකු පත් කොට නැති අතර මේ දක්වා පත්කොට ඇත්තේ දෙමළ ඇමතිවරුන් දෙදෙනකු පමණකි. ඊට අමතරව 2020 පෙබරවාරි මාසයේ පැවති නිදහස් දින සමරුවේ දී ජාතික ගීය සිංහල සහ දෙමළ භාෂා දෙකෙන් ම ගායනා කරන ලෙස කළ ඉල්ලීම නොතකා හැරි ආණ්ඩුව ජාතික ගීයේ සිංහල පද මාලාව පමණක් ගායනය කිරීම තෝරා ගත්තේ ය. මෙබඳු ක්‍රියා මෙන් ම ආණ්ඩුවේ ඇතැම් ප්‍රකාශ සහ ප්‍රතිපත්ති තීරණ එක් ව ගත් විට ප්‍රශ්න මතුවන්නේ සුළුතරයන් යටපත් කිරීමට සහ ප්‍රතිසංධානය සහ සහජීවනය වර්ධනය කිරීමේ උත්සාහය ඉවත දැමීමට දැනුවත් උත්සහයක් තිබේ ද යන්න පිළිබඳව ය.

"

**හදිසි තත්ත්වයන්ට සහ ආපදාවන්ට මුහුණ දීම විස්තීර්ණ ක්‍රියාවලියක් විය යුතු බවට සැකයක් නැතත්, එවැනි ප්‍රතිචාරයක දී ප්‍රධානත්වය ගත යුත්තේ සහ සම්පූර්ණයෙන් සම්බන්ධ කර ගත යුත්තේ ඉහළ හැකියාවක් ඇති සහ කාර්යක්ෂම සෞඛ්‍ය සේවය ඇතුළු ශ්‍රී ලංකා පරිපාලන සේවය යි. විශේෂයෙන් ම ව්‍යවස්ථාදායකයේ අධීක්ෂණය නැති සහ අයිතීන් සහ නීතියේ පාලනය හෙමින් හෙමින් බාදනය වන සන්දර්භයක් තුළ ඉහළ යන හමුදාකරණය විවිධාකාර ප්‍රශ්න මතු කරයි.**

ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ බෞද්ධ භික්ෂූන් වැඩි වැඩියෙන් ප්‍රසිද්ධ සහ ධ්‍රැවීකරණය කරන කාර්යයක් ඉටුකරන බව කැපී පෙනෙයි. උදාහරණ ලෙස රාජපක්ෂ ජනාධිපතිවරයාට ඔහු ගේ ජනාධිපතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේ දී බෞද්ධ භික්ෂූන් ගණනාවකගේ සහාය ලැබුණු අතර බලයට පත් වූ පසු ව ඔහු ප්‍රතිපත්ති කාරණා සම්බන්ධයෙන් ඔහුට උපදෙස් දීම සඳහා බෞද්ධ උපදේශක මණ්ඩලයක් පිහිටුවා ගත්තේ ය. ඊට අමතරව, නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා උරුම කළමනාකරණ කාර්ය සාධක බලකාය පිහිටුවන විට එයට බෞද්ධ භික්ෂූන් දෙදෙනකු පත් කළ නමුත් නැගෙනහිර පළාත ආගමික සහ වාර්ගික සුළුතරයන්ගෙන් සමන්විත වුව ද, වාර්ගික සහ ආගමික සුළුතරයන්ගේ කිසිදු නියෝජනයක් ඒ තුළ නැත. ඔවුන් කරන උසි ගැන්වීම් සඳහා කිසිදු බෞද්ධ භික්ෂුවක් මේ දක්වා වගවීමට ලක්කොට නැති තත්ත්වය තුළ වාර්ගික ජාතිකවාදයේ නැගීම සහ එය සුළුතර අයිතීන් සහ ප්‍රතිසංධානය කෙරෙහි බලපෑම ඇති වීම ගැන බිය ශක්තිමත් වෙයි.

යුක්තියට සහ ප්‍රතිසංධානයට බලපෑම් එල්ලවන තවත් ප්‍රශ්න රාශියක් කොවිඩ් 19 මගින් පෙරට ගෙනවිත් තිබේ. උදාහරණ ලෙස, වසංගත අවස්ථාවේ ඇතැම් මාධ්‍ය හා වෙනත් අංශවලින් රෝගීන්ගේ වාර්ගික පැතිකඩ පෙන්නුම් කළේ ය. වසංගතය අතර වාරයේ මාධ්‍යවේදීන් සහ නීතිඥයන් අත් අඩංගුවට ගැනීම් වල දී ද, වර්ගවාදී අදහස් සහ වාර්තා කිරීම් දැකගන්නට ලැබිණි. එම ප්‍රජාවේ ආගමික විශ්වාසයන්ට පටහැනි ව මුස්ලිම් ජාතිකයන්ගේ මිනී වළදැමීම තහනම් කරන ලද්දේ ද වසංගතය අතර වාරයේ ය. එය සිදු වුයේ වසංගත කාලයේ මිනී වළ දැමීමට ලෝක සෞඛ්‍ය සංවිධානයේ මග පෙන්වීම් තිබියදී ම ය.

ශ්‍රී ලංකාව තුළ සිදු වී තිබෙන ධ්‍රැවීකරණය 2019 ජනාධිපතිවරණයෙන් පෙන්නුම් කළේ ය. දකුණේ ආධිපත්‍යධාරී බහුතරය වන සිංහල ප්‍රජාව, සිය 2019 ප්‍රචාරක ව්‍යාපාරයේ ප්‍රධාන තෙමා ලෙස විනය, ආරක්ෂාව සහ ආර්ථික සමෘද්ධිය ඉදිරිපත් කළ රාජපක්ෂ ජනාධිපතිවරයාට විශාල ලෙස ඡන්දය දුන් හ. දේශපාලන විසඳුමක් සහ ප්‍රතිසංධානය අපේක්ෂා කළ උතුරු සහ නැගෙනහිර සුළුතර ජනයා ඡන්දය දුන්නේ අපේක්ෂක සජිත් ප්‍රේමදාස මහතාට ය. නොවැම්බරයේ වැඩ භාරගත් අවස්ථාවේ දී රාජපක්ෂ ජනාධිපතිවරයා මේ බව සඳහන් කළේ ය. වසංගතය සහ සෞඛ්‍යය ගැන සැලකිල්ල නිසා පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය මීට පෙර මැතිවරණවල දීට වඩා හෙමින් සිදු වුව ද, ජාතිකවාදය ගැන සාක්ෂි ඇති අතර වාර්ගික සහ ආගමික වශයෙන් ප්‍රජාවන් තවදුරටත් ධ්‍රැවීකරණය වීමේ බිය පවතියි.

ප්‍රතිසංධානය ගැන ප්‍රශ්න මතුකරන වෙනත් දර්ශක ද ඇත. සත්‍ය සෙවීම, යුක්තිය, වන්දි ගෙවීම සහ නැවත සිදු නොවීම සඳහා යාන්ත්‍රණ හතරක් සඳහා අවස්ථාව සලසන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 2015 යෝජනාවෙන් ස්ථාපිත ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ අකමැත්ත ආණ්ඩුව ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත්කොට තිබේ. පසුගිය රජය විසින් ස්ථාපිත කරන ලද අතුරුදන්වූවන් සඳහා කාර්යාලයේ සහ වන්දි ගෙවීමේ කාර්යාලයේ ඉරණම පැහැදිලි නැතත් 2015 න් පසු හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ බොහොමයක් ආපසු හැරවීමට ඉඩ ඇත.

අනාගතය සඳහා සැලකිය යුතු කරුණු

2019 නොවැම්බරයේ ජනාධිපතිවරණයේ සිට දැකගන්නට ලැබුණු ඇතැම් ප්‍රවණතා සහ ශ්‍රී ලංකාවේ අයිතීන් සහ ප්‍රතිසංධානයට එහි බලපෑම මෙම කෙටි ලිපියෙන් සාකච්ඡා කෙරිණි. පාර්ලිමේන්තු මැතිවරණයෙන් ඊළඟ පාර්ලිමේන්තුවේ ආධිපත්‍යධාරී පක්ෂය බවට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පත්වනු ඇති බව පෙනෙන්නට තිබෙන අතර එමගින් රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලනය වඩාත් ශක්තිමත් වනු ඇත. මෙමගින් රාජපක්ෂ පාලනයේ මුල් මාසවල පෙන්නුම් කළ ප්‍රවණතා අනුව ආණ්ඩුකරණයේ සහ වෙනත් ප්‍රශ්නවල දී අධිකාරිවාදී නැඹුරුව පහසු කිරීමත්, හමුදාකරණය සහ ආරක්ෂකකරණය ශක්තිමත් කිරීමත් සිදු වනු ඇත. මී ළඟ පාර්ලිමේන්තුවේ හඳුන්වා දීමට ඉඩ ඇති ව්‍යවස්ථා ප්‍රතිසංස්කරන මගින් ස්වාධීන ආයතන ඇතුළු සංවරණ සහ තුලන දුර්වල කිරීමත්, නීතියේ පාලනය බාදනය වීමත් නිසා මෙම ප්‍රවණතා සුළුතරයන් සහ අයිතීන් සහ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන පුරවැසියන් බරපතළ ලෙස කම්පනයට පත් කරනු ඇත. ශක්තිමත් වන අනතුර වන්නේ සුළුතරයන් කොන්කිරීමේ සහ ඉලක්ක කිරීමේ ලකුණු වැඩිවීම සමග වාර්ගික ජාතිකවාදයේ සහ සිංහල බෞද්ධවාදය වෙතට රාජ්‍ය අනුග්‍රහය හිමි වීමේ නැගීම යි.

බහුතරවාදී බලවේග එලෙස ශක්තිමත්වීම සැබෑ ප්‍රතිසන්ධානයට සහ බලය බෙදා ගැනීමකට අහිතකර බවක් පෙන්නුම් කරයි. ජයග්‍රාහී මහින්ද රාජපක්ෂ ආණ්ඩුව 2010 දී දහඅට වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන විට පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂවලින් දක්නට ලැබුණේ සීමා සහිත විරෝධයකි. සැබෑ නායකත්වයක් හෝ දර්ශනයක් නැති කැබිලි වුණු විපක්ෂය සැලකිල්ලට ගැනීමේ දී පෙනී යන්නේ 2020 හා ඉන් පසුව තත්ත්වය වඩාත් කණගාටුදායක බව යි. එබඳු සන්දර්භයක් තුළ සංක්‍රමනීය යුක්තිය සහ ප්‍රතිසංධානය සහිත සැබෑ ඉදිරි ගමනක් සඳහා ඇති ඉඩකඩ සීමිතය. මෙම බියජනක තත්ත්වය ඇති වී තිබෙන්නේ වසංගතය සහ වර්ධනය වන ආර්ථික අර්බුදයේ ඉතාමත් අනතුරුදායක සන්දර්භය තුළ යි. මෙම පසුබිම තුළ ශ්‍රී ලංකාවට අනාගතය පිළිබඳ අනපේක්ෂිත අභියෝග රාශියකට මුහුණ දීමට සිදුවනු ඇති අතර ශ්‍රී ලංකාවේ අනාගත ගමන් මග තීරණය කිරීමේ වගකීම සියලු පුරවැසියන්ට පැවරෙනු ඇත. එබැවින් ඊළඟ පාර්ලිමේන්තුව සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරාගැනීමේ ඡන්දය ඉතාමත් තීරණාත්මක වෙයි. සිදුවීමට තිබෙන දේ මතක තබාගෙන වගකීමෙන් යුතුව අප සියලු දෙනා ඡන්දය පාවිච්චි කළ යුතු ය.

# බලය බෙදාහැරීම
# එකම විසඳුම නොවෙයි




http://slcgdxb.com/

යුද්ධයෙන් පසු යාල්දේවී යළි යාපනයට...




මහාචාර්ය
**නවරත්න බණ්ඩාර**


**2015 ජනාධිපතිවරණය කියන්නේ ශ්‍රී ලංකාවේ පාලන ක්‍රමය ප්‍රතිසංස්කරණය පිළිබඳ අදහස බලවත් ලෙස පෙරට ආ අවස්ථාවක්. සමස්තයක් ලෙස උතුරේත් දකුණේත් ඒ පිළිබඳ පෙර නොවුණු ආකාරයේ සම්මුතියක් ගොඩනැඟුණා. එම අභිලාෂයන් ඉටු වීම පිළිබඳ ඔබගේ තක්සේරුව කෙබඳුද?**

ඇත්තෙන්ම 2015 ජනාධිපතිවරණය ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ පෙළගැස්මක්. එහි ප්‍රධාන දේශපාලන ඉල්ලීම වශයෙන් කේන්ද්‍ර කරගෙන තිබුණේ විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමයි. විධායක ජනාධිපතිධුරය හේතුවෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ විශාල හැකිළීමක් සිදුව තිබුණා එමනිසා, එය අහෝසි කොට ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම ප්‍රධාන සටන්පාඨය කරගත් විශාල ජන පෙළගැස්මක් උතුර, දකුණ, නැගෙනහිර බස්නාහිර ආදී සියලු ප්‍රදේශවලින් පැනනැඟුණා. 1978 ව්‍යවස්ථාව ගෙන ඒමෙන් පසුව දිගින් දිගටම සිදු වුණේ විධායක ජනාධිපතිධුරය වටා වඩ වඩාත්




රනිල් වික්‍රමසිංහ

මෛත්‍රීපාල සිරිසේන

**2015 ජනාධිපතිවරණයේදී ඇති වූ බල මාරුවෙන් ඉදිරියට ආ පිරිස ඒ සඳහා වන සංශෝධනයක් කල්තබා පිළියෙල කරගෙන තිබුණේ නෑ. උදාහරණ වශයෙන් එදා 1972 ව්‍යවස්ථාව සෑදූ අය 1970 මැතිවරණයට යන කොට තමන් අතේ හදා ගත් කෙටුම්පතක් තිබුණා. 2015 ජනාධිපතිවරණයෙන් පසුව පාර්ලිමේන්තු මැතිවරණයට යන්න තිබූ නිසාත් නව ව්‍යවස්ථාවක් ගෙන ඒම කල්ගත වන අසීරු කටයුත්තක් නිසාත් එදා නායකත්වය තීරණය කළා 19වන සංශෝධනය ගේන්න.**

බලය ඒකරාශී වීමයි. ඊට එරෙහි විරෝධය 1994දී ඉදිරියට ආවත් 2000 වන විට උත්සන්න වූ යුදමය වාතාවරණය තුළ එය යටපත් වුණා. 2009දී යුද්ධය අවසන් කළ පසුව සමාජය අපේක්ෂා කළ පරිදි ප්‍රජාතන්ත්‍රවාදී රාමුව ශක්තිමත් කෙරෙන පියවර ගැනුණෙ නෑ. එම දිසාවට යොමු වූ ප්‍රතිසංස්කරණ ලැබුණෙ නෑ. යුද ජයග්‍රහණයෙන් ලබා ගත් උත්කර්ෂ බලයත් එක්ක තමයි ඉස්සරහට යන්න ගියේ. මෙවැනි තත්ත්වයක් තුළ තමයි 2015දි නැවත ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපේක්ෂාව ඉදිරියට පැමිණ එවැනි පෙළගැස්මක් ඇති වෙන්නේ.

නමුත් 2015 ජනාධිපතිවරණයේදී ඇති වූ බල මාරුවෙන් ඉදිරියට ආ පිරිස ඒ සඳහා වන සංශෝධනයක් කල්තබා පිළියෙල කරගෙන තිබුණෙ නෑ. උදාහරණ වශයෙන් එදා 1972 ව්‍යවස්ථාව සෑදූ අය 1970 මැතිවරණයට යන කොට තමන් අතේ හදා ගත් කෙටුම්පතක් තිබුණා. 2015 ජනාධිපතිවරණයෙන් පසුව පාර්ලිමේන්තු මැතිවරණයට යන්න තිබූ නිසාත් නව ව්‍යවස්ථාවක් ගෙන ඒම කල්ගත වන අසීරු කටයුත්තක් නිසාත් එදා නායකත්වය තීරණය කළා 19වන සංශෝධනය ගේන්න. නමුත් සම්මත වුණේ මුලින් සකස් කළ සංශෝධනය නෙවෙයි. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනමත විචාරණයකට යා යුතු යැයි නිර්දේශ කළ කොටස් ඉවත් කොට නැවත සකස් කළ සංශෝධනය තමා 19වන සංශෝධනය වුණේ. එදා පැවතුණේ පැරණි පාර්ලිමේන්තුව. එය විසින් තමා තුනෙන් දෙකකින් එය සම්මත කළේ.

එම සීමිතකම් තිබියදී පවා 19වන සංශෝධනය මගින් විධායක ජනාධිපතිගේ බලතලවලට සැලකියයුතු සීමාවන් දැම්මා. පාර්ලිමේන්තුවක් පත් වී වසරකින් පසුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවාහැරීමට තිබුණු බලය නැති කළා. ඒ සඳහා වසර හතරහමාරක් සිටිය යුතු වුණා. පාර්ලිමේන්තුව ඉල්ලා සිටිය හොත් මිස එම කාලය තුළ විසිරවිය නොහැකිය. ඒ වගේම පාර්ලිමේන්තුවේ බහුතරයකගේ විශ්වාසය තිබෙන තුරු, පත් කළ අගමැතිවරයකු ඉවත් කිරීමට ජනාධිපතිවරයාට නොහැකියැයි සීමාවක්ද ඇති කළා. ඇමති මණ්ඩලය අගමැතිවරයාගේ අභිමතය පරිදි පත් කළ යුතු අතර පත් කළ ඇමතිවරුන් අගමැතිගේ කැමැත්තකින් තොරව ඉවත් කිරීමට හැකියාවක් නැහැ. ජනාධිපති ආණ්ඩුවේ නායකයා යන තත්ත්වය තවදුරටත් දැරුවත් දැන් ජනාධිපතිට ඇමති ධුරයක් දරන්නත් බැහැ. රටේ විධායක පාලනය ගෙන යන්නේ ඇමති මණ්ඩලය යයි කියල ව්‍යවස්ථාවේ දැක්වෙන විධිවිධානය දැන් ක්‍රියාවට නැගෙනවා. මේ විදියට ජනාධිපතිගේ බලය සීමා වී, අගමැතිවරයා ප්‍රමුඛ ඇමති මණ්ඩලයේත් පාර්ලිමේන්තුවේත් බලය උඩට ආවා.

ඒ වගේම ජනාධිපතිවරයාගේ පමණක් නොව අගමැති ඇතුළු ඇමති මණ්ඩලයේත් බලය සීමා කෙරෙන ස්වාධීන කොමිෂන් සභා ක්‍රමය 19 මගින් ශක්තිමත් කළා. අධිකරණයේ ස්වාධීනත්වය, ස්වාධීන රාජ්‍ය සේවයක් සඳහා පදනම සැකසීම, මැතිවරණ ක්‍රියාදාමය ස්වාධීන කිරීම එමගින් සිදු වුණා. මේ අනුව 2015 ජනාධිපතිවරණයෙන් පසුව, විධායක ජනාධිපති සතුව තිබූ අසීමිත බලය සීමා කොට පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය දෙසට වැදගත් පියවර රැසක් තැබීමට හැකි වූ බව කිව හැකියි.

නමුත් ඉන් ඔබ්බට යමින් පාර්ලිමේන්තු කැබිනට් ක්‍රමයකට යන්නට අවශ්‍ය නව ව්‍යවස්ථාවක් සකස් කිරීමේ ක්‍රියාදාමය සාර්ථකව සිදු වුණේ




youtube.com

**"**

**සමස්තයක් ලෙස, යහපාලන ආණ්ඩුවේ අසාර්ථක බව තමයි මෙම කතිකාව යටපත් කිරීමට හේතුව. ඔවුන් යහපාලනය යනුවෙන් ගොඩනැගූ වැඩසටහන සම්බන්ධව ඉදිරිපත් කළ ප්‍රධානම කාරණා සාර්ථකව ඉටු කළේ නෑ. දූෂණය සහ වංචාව නතර කිරීම, හොරු ඇල්ලීම ආදී කිසිවක් සිදු වුණේ නෑ. ඒ වෙනුවට මහා බැංකු බැඳුම්කරය වැනි මහා පරිමාණ වංචාවන් සිදු වුණා.**

නෑ. ඒ සඳහා යොදාගත් ක්‍රමවේදය ඉතා දිග්ගැසුණු ක්‍රියාදාමයක්. නොකෙරෙන වෙදකමට කෝඳුරු තෙල් හත්පට්ටයකුත් ටිකක් ඕනෑ කිව්ව වගේ දෙයක් තමයි සිද්ධ වුණේ. ආණ්ඩුවේ පාලන කාලය අවසන් වන තුරුත් අවසන් ලියවිල්ලක් සකස් කර ගැනීමට හැකි වුණේ නෑ. අනිත් අතට ජනතාව තුළ මේ ක්‍රියාදාමය ගැන විශ්වාසය ගොඩනැගීමට ආණ්ඩුව අසමත් වුණා. ආණ්ඩුවේ නායකයන් සමස්තයක් ලෙස ඒ සඳහා ජනතාව සමග සංවාදයකට ගියේ නැහැ. එයින් පෙනෙන්නෙ එය ඉදිරියට ගෙන යාම ගැන අධිෂ්ඨානයක් ඔවුන්ට නොතිබුනු බව. සාදන්නට අදහසක් නැති ව්‍යවස්ථාවකට ඔවුන් කල් මරමින් සිටිනවිට එය රට බෙදන ක්‍රියාදාමයක් යනාදී වශයෙන් හඳුන්වමින් විරුද්ධ පක්ෂයට සිය දේශපාලනය කිරීමට හොඳට අවස්ථාව සැලසුණා. බහුතර සිංහල ජනතාව අතර එම මතවාදය තමයි වැඩිපුර සමාජගත වුණේ. පාස්කු ප්‍රහාරයෙන් ජනතාව සම්පූර්ණයෙන් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපේක්ෂා පැත්තකට දැමුවා. අවසානයේ ඉතිරි වුණේ, 19වන සංශෝධනයේ ප්‍රතිඵල පමණයි.

**2020 ජනාධිපතිවරණය ආශ්‍රිත පෙළගැස්ම හා එහි ප්‍රතිඵලය එතෙක් දුර්වල මට්ටමින් හෝ ඉදිරියට ගිය දේශපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ කතිකාවත මුළුමනින්ම ආපසු හරවනසුලු එකක්. මෙසේ වීමට හේතුව කුමක්ද?**

සමස්තයක් ලෙස, යහපාලන ආණ්ඩුවේ අසාර්ථක බව තමයි මෙම කතිකාව යටපත් කිරීමට හේතුව. ඔවුන් යහපාලනය යනුවෙන් ගොඩනැගූ වැඩසටහන සම්බන්ධව ඉදිරිපත් කළ ප්‍රධානම කාරණා සාර්ථකව ඉටු කළේ නෑ. දූෂණය සහ වංචාව නතර කිරීම, හොරු ඇල්ලීම ආදී කිසිවක් සිදු වුණේ නෑ. ඒ වෙනුවට මහා බැංකු බැඳුම්කරය වැනි මහා පරිමාණ වංචාවන් සිදු වුණා. ආණ්ඩුවේම ඇමතිවරු වංචනිකයන් සමග සබඳතා පැවැත්වීම පිළිබඳ චෝදනා නිසා ඉල්ලා අස් වුණා. ඒ සමහරු නැවත ආපසු තනතුරුවලට ආවා. අනිත් පැත්තට ආණ්ඩුවේ ප්‍රධාන නායකයන් අතර මතභේද ප්‍රසිද්ධ වේදිකාවට පැමිණුනා. මේවා ආණ්ඩුවට සාහය දුන් ජනතාව අතර විශ්වාසය පිරිහීමට හේතුවක් වුණා. විශේෂයෙන් පාස්කු ප්‍රහාරය හේතුවෙන් ඇති වූ අනාරක්ෂිත හැඟීම නිසා නැවතත් බලවත් නායකයකු අවශ්‍යයි කියන අදහස ඉස්මතු වුණා. විධායක ජනාධිපතිධුරය නැවත උත්කර්ෂයට නැංවීමක් සිදු වුණා. ජාතික ආරක්ෂාව, ඒකීයභාවය, සමඟිය, මේ සියල්ල පවතින්නේ ජනාධිපති තනතුර මතයි කියන අදහසක් ඇති වුණා. 78 සිටම මෙම ධුරය බලවත් වුණෙත් ඒ ආකාරයට රට ආරක්ෂාව පිළිබඳ අර්බුදවලට මුහුණ දීම නිසයි. ජනාධිපතිධුරයේ බලතල සීමා කොට ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කළ යුතුය යන අදහස යටපත් කරගෙන ජාතික ආරක්ෂාව පිළිබඳ කාරණය යළිත් පෙරට ආවා.

නමුත් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදය නිදහස සහ අයිතිවාසිකම් පිළිබඳ ජනතා අභිලාෂය ආපසු හැරීමක් සිදු වූවායැයි නිගමනය කිරීමට නොහැකිය. සමාජය තුළ එම අපේක්ෂාව ස්වභාවිකවම තිබෙන දෙයක්. රාජ්‍ය ප්‍රතිසංස්කරණයක්, වඩා ප්‍රජාතන්ත්‍රවාදී, මානව හිමිකම් ආරක්ෂා කරන නිදහස් සමාජයක් පිළිබඳ අභිලාශය මේ සමාජය යට තිබෙනවා. එය මේ ආකාරයට වරින් වර යටපත් වුණත් ජනතාව තාවකාලික තත්වයන් නිසා ඒවා පැත්තකින් තියන්න එකඟ වුණත් මෙම අපේක්ෂාව ජලයේ යට කර ගෙන තිබෙන රබර් බෝලයක් වගේ යළි මතු වෙනවා.

**මේ වන විට ශ්‍රී ලංකාවේ ජනවර්ග අතර විභේදනය අන් කවර කලකටත් වඩා බරපතළ ලෙස ඉස්මතුව තිබෙනවා. මේ තත්ත්වය ජයගත යුත්තේ කෙසේද?**

මේ ප්‍රකාශය සමග මට එකඟවෙන්න බෑ. ජනවර්ග අතර විභේදනය සංස්කෘතික වශයෙන් පැවතුණත් එය විරසකයන් ඇති කරන බරපතළ ගැටුම්කාරී තත්ත්වයක නොවෙයි තිබෙන්නේ. මේ රටේ ජනවර්ග අතර අන්‍යොන්‍ය සහජීවනයක් තමයි හැමදාම තිබුණේ. සමාජ ජීවිතයේදී, ව්‍යාපාරික ජීවිතයේදී, වෘත්තීය සහ පරිපාලන ජීවිතයේදී, අධ්‍යාපනයේදී යනාදී සෑම තැනකම සියලු ජනවර්ගවල සාමාජිකයන් එකට වැඩ කරනවා. විරසක සහ ගැටුම් ඇති කරන්නේ දේශපාලන ව්‍යවසායකයින්. ඔවුන් තමයි තම දේශපාලන න්‍යායපත්‍ර අනුව ජාති ආගම් වශයෙන් සමාජය තුළ බෙදීම් ඇති කරන්නේ. ජාතිවාදය සහ ආගම්වාදය ස්වභාවික ප්‍රපංචයන් නෙවෙයි, ඒවා බල අරගල සඳහා හදන දේවල්.

ජාතිය පිළිබඳ හැඟීම නරක දෙයක් නෙවෙයි, හොඳ දෙයක්. තමන්ගෙ ජාතියට ආදරය කරන කෙනාට පුළුවන් අනිත් ජාතීන්ටත් ආදරය කරන්න. ඕකෙ දියුණුම තත්ත්වය තමයි ජාත්‍යන්තරවාදය. නරක පැත්ත තමයි ජාතිවාදය. හාර්වර්ඩ් විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙක් මෙය හැඳින්නුවේ අර්ධ වනචාරී සත්ත්වයෙක් හැටියට. හොඳට හීලෑ කරල ගත්තොත් එය යහපතට යොදාග න්න පුළුවන්. ලෝකයේ ජාතික රාජ්‍ය ගොඩනැගුණේ ජාතිකවාදය මගින්. යුරෝපයේ මෙවැනි ජාතික රාජ්‍ය එක්සත් කරල තමයි යුරෝපා සංගමය හැදුවේ. ඔවුන් ඕක හොඳ අතට පාවිච්චි කළා. හිට්ලර් එය වර්ගවාදී පාලනයක් ගොඩ නගන්න යොදා ගත්තා. ජර්මානු ජාතියේ උත්තරීත්වය පාවිච්චි කරල ඔහු යුදෙව්වරු ලක්ෂ ගණන් මරා දැමුවා. අදත් හිටි ගමන් අර වනචාරී සතා ඉස්මතු වීමත් දකින්න පුළුවන්. රංචු ගැසුනු මිනිස්සු තමන්ගේ ජාතියේ සතුරන් කියා හඳුන්වමින් අනිත් ජාතීන්ට ප්‍රචණ්ඩත්වය යොදනවා. අද බොහෝ රටවල ජාතිවාදය බලය ගැනීම සහ තහවුරු කර ගැනීමට යොදන බව පෙනෙනවා. ඇමරිකාවේ ට්‍රම්ප් බලයට පත් වුණොත් ඇමරිකාවේ සුදු මිනිසුන්ගේ උසස් බව නැවත තහවුරු කරන බව කියලා. නමුත් කළු වර්ණ පුද්ගලයකු ඝාතනය කළ පොලිස් මෘගත්වයට එරෙහිව විශාල විරෝධයක් මතු කිරීමට පෙරමුණ ගත්තෙත් ඒ සමාජයමයි. එය පිටුපස තිබුනේ සුදු මිනිසාගේ උසස් බව පෙන්වමින් ගෙන ගිය පාලනයේ යථාර්ථය ජනතාව හඳුනා ගැනීම. මුළු යුරෝපය සහ ඔස්ට්‍රේලියාව පුරාම එය රැල්ලක් ලෙස පැතිර ගියා.

ඒ නිසා මම කියන්නෙ ජාතීන් සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කාරණා අපි සාධනීය ලෙස දකින්න ඕන කියන එක. ජාතීන් සමගි කිරීම, ජාතීන් තුළ ඇති පංති ප්‍රබේදයන් අතර ඇති පරතරය අඩු කිරීම, ජාතීන් තුළ පවතින ආන්තික කණ්ඩායම් පිළිබඳ අසමානතා දුරු කිරීම, පරිසරය හා සමතුලිත වූ සංවර්ධනයක් කරා යෑම වැනි කාරණාවන් හා බැලෙන ජාතික අනුකලනයක් නැතහොත් ජාතික එක්සත්කම ගොඩනැංවීම පිළිබඳ ප්‍රශ්නය අප ඉදිරියේ තිබෙනවා. එය 48 නිදහස ලබන විටම එය අප හමුවේ තිබුණු අභියෝග යක්. වෙනත් ආකාරයකට කිවහොත් රාජ්‍යය, ජාතිය බවට පත් කර ගැනීමේ අභියෝග යයි. එය ජයගත හැකි වන්නේ සියලු ජාතීන්ට එකට ජීවත් විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමෙන්.

**එය කළ හැක්කේ කෙසේද?**

එයට විවිධ ආකෘති තිබෙන්න පුළුවන්. ඒවා දේශපාලන, පරිපාලන, සමාජ, සංස්කෘතික, ආර්ථික, තාක්ෂණික යන සෑම අංශයක්ම ඇතුළත් වන සාර්ව වැඩපිළිවෙළක් විය යුතුය. අපි බොහෝවිට එය දෙස බලන්න පුරුදු වී ඉන්නෙ දේශපාලන වශයෙන් පමණයි. දේශපාලන පැත්තෙන් අපි බලන්නෙ ආණ්ඩු බලය බෙදා හැරීමේ පැත්තෙන්. බලය බෙදාහැරීම දේශපාලන වශයෙන් තිබෙන එකම ආකෘතිය නොවෙයි. ඕන නම් ඔය සියලු පක්ෂ එකතු වන ජාතික සන්ධාන ආණ්ඩුවක් හදන්න පුළුවන්. ලෙබනනය එවැනි උදාහරණයක්. ලෙබනනයේ ජාතීන් එකතු කරල තියෙන්නෙ ජාතික සමගි ආණ්ඩුවකින්. බලය බෙදාහැරීමට බය නම් හෝ අකමැති නම් අපිටත් ඒ වගේ ආකෘතියකට යන්න පුළුවන්.  සිංහල දෙමළ මුස්ලිම් ජාතික සමඟි ආණ්ඩුවක් හදලා උතුරත් සහභාගී වන ඇමති මණ්ඩලයකින් ඒ ඒ කලාපය සම්බන්ධ ගැටලු විසඳන්න පුළුවන්.

මේක අලුත් අදහසකුත් නෙවෙයි. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මන්ත්‍රීවරු හතර දෙනකුට ඇමතිවරයකු පත් කරගන්න අවස්ථාව සලසා සියලු ජාතීන් සිටි ඇමති මණ්ඩලයක් හැදුවා. 1947සෝල්බරි ක්‍රමය මගින් අපේක්ෂා කළේද ජාතික සමගි ආණ්ඩුවක් සුළුතර අයිතිවාසිකම් ව්‍යවස්ථා රැකවරණ පිළිබඳ රාමුවක් තුළ ඇති කරන්න. සෙනෙට් සභාව, සුළුතර නියෝජනය සහතික කිරීම ආදියෙන් බලාපොරොත්තු වුණේ සියලු ජාතීන් එකට වැඩ කිරීමයි. 47දි සෝල්බරි සාමි දුටු මධ්‍යම පන්තිය තදබල වාර්ගික බෙදීමක හිටියෙ නෑ. ඔවුන් පාලන කටයුතුවලදී සහයෝගයෙන් වැඩ කළා. 1947 පළමුවැනි ආණ්ඩුව ඩී.එස්. හැදුවෙ සියලු ජාතීන් නියෝජනය වන විදියටයි. සියලු ජාතීන් එකතුවෙලා ආවෙ නැත්නම් නිදහස දෙන්නෙ නෑ කියලයි එංගලන්තෙ කිව්වෙ. ඒ නිසා තමයි එක්සත් ජාතික පක්ෂය යනුවෙන් නම පවා ගත්තෙ. ඒ විදියට සියලු ජාතීන්ට අයත් දක්ෂිණාංශික නායකයන් එක්සත්ව පළමු ආණ්ඩුව හැදුවට පස්සෙ තමයි ලංකාවට නිදහස දෙන්නෙ. අද

**ජාතිය පිළිබඳ හැඟීම නරක දෙයක් නෙවෙයි, හොඳ දෙයක්. තමන්ගෙ ජාතියට ආදරය කරන කෙනාට පුළුවන් අනිත් ජාතීන්ටත් ආදරය කරන්න. ඕකෙ දියුණුම තත්ත්වය තමයි ජාත්‍යන්තරවාදය. නරක පැත්ත තමයි ජාතිවාදය. හාර්වර්ඩ් විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙක් මෙය හැඳින්නුවේ අර්ධ වනචාරී සත්ත්වයෙක් හැටියට. හොඳට හීලෑ කරල ගත්තොත් එය යහපතට යොදාගන්න පුළුවන්. ලෝකයේ ජාතික රාජ්‍ය ගොඩනැගුණේ ජාතිකවාදය මගින්. යුරෝපයේ මෙවැනි ජාතික රාජ්‍ය එක්සත් කරල තමයි යුරෝපා සංගමය හැදුවේ.**

අවශ්‍යවන්නෙ සියලු දේශපාලන පක්ෂ අතර මූලික කරුණු සම්බන්ධයෙන් එකඟතා ඇති කර ගැනීම මගින් ඉදිරියට යෑම. එමගින් බොහෝ ගැටලු විසඳගන්න පුළුවන්. අපට අවශ්‍ය සංස්කෘතීන් අතර ගැටුම වෙනුවට සංස්කෘතීන් අතර සංවාදයක් ගොඩ නගා ජාතිය ගොඩ නැගීමේ අභියෝගය ජය ගැනීමයි. වසර හැත්තෑවකට පසුවවත් ඒ ගැන හිතන්න පුළුවන් නම් හොඳයි; තම තමන්ගෙ පටු ලෝකවලින් එළියට ඇවිල්ලා.

**එළැඹෙන මැතිවරණයෙන් පසුව පත් වන නව පාර්ලිමේන්තුව හමුවේ ඇති ප්‍රමුඛ අභියෝග කෙබඳුද?**

ඊළඟ පාර්ලිමේන්තුවේ පක්ෂ බලතුලනය කුමක් වුවත්, එය මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වන්නේ මේ රටේ සියලු ජනයා සමගි කරන ජාතික ප්‍රතිපත්තිවලට එළැඹීමයි. සියලු පක්ෂ නායකයින් ඒ වෙනුවෙන් කැප විය යුතුයි. ජාතිවාදය, ආගම්වාදය, වෛරී ප්‍රකාශ ආදිය පිටුදැකීම සඳහා වැඩපිළිවෙළක් අවශ්‍යයි. ඒ සඳහා පූර්ණ බලැති කොමිෂන් සභාවක් පත් කිරීම සුදුසුයි. මැතිවරණ කොමිසමට වගේ අදාළ කාරණා සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට එයට බලය තිබිය යුතුයි. ඒ වගේම මේ මොහොතේ රට හමුවේ ඇති ආර්ථික අර්බුදයට මුහුණදීම සඳහා සියලු පක්ෂ ප්‍රතිපත්තිමය එකඟතාවක් ඇති කරගෙන, ඒ අනුව කටයුතු කිරීම වැදගත්. රටේ වැඩෙමින් පවතින සමාජ විෂමතා වගේම හිසට වහලක් නැති, බීමට ජලය නැති, අලින් සමග ජීවත්වන මිනිස්සු ගැන වගේම තරුණ ජනයාගේ අභිලාෂ සාක්ෂාත් කිරීම ගැනද විශේෂ අවධානයක් යොමු කළ යුතුය. ජාතිය සමගි කළ හැක්කේ එබඳු සාර්ව වැඩසටහනකින්.

පාර්ලිමේන්තුව ප්‍රතිමල්ලවයන් මුණගැහෙන තැනක් නොව මේවා ගැන ගැඹුරින් කතා කරන සංවාද මණ්ඩපයක් බවට පත් කර ගත යුතුයි. විශේෂයෙන් පසුගිය වකවානුවේ දකින්නට ලැබුණු ආකාරයේ අපකීර්තිමත් ගැටුම් යළි ඇති නොවන පරිදි කටයුතු කොට පාර්ලිමේන්තුවේ ගෞරවය නැවත ස්ථාපිත කිරීමත් ප්‍රමුඛ කාරණයක්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ආචාරධර්ම පද්ධතියක් ඇති කර ගැනීමත් අවශ්‍යයි. මේ සියලු ක්‍රියාමාර්ග ඔස්සේ පාර්ලිමේන්තුවට තිබෙන නරක නාමය ඉවත් කරගෙන, මේ රටේ සියලු ජාතීන් සමගි කරන, සියලු ජාතීන් හා සංස්කෘතීන් අතර සංවාදයකට මුල පුරන තැනක් බවට එය පත් කර ගත යුතුයි.

**සිවිල් සමාජයේ මේ මොහොතේ කාර්යභාරය හා එය මුහුණදෙන අභියෝගය කුමක්ද?**

මිනිසා රාජ්‍යයක් ඇති කර ගත්තේ යහපත් සිවිල් ජීවිතයක් සඳහා. එම නිසා මගේ අදහස වන්නේ සිවිල් සමාජය කියන කොට එය නියෝජනය කරන්නේ විනීත හෙවත් ශිෂ්ට සමාජය යන්නයි. ඒ නිසා සිවිල් සමාජ සංවිධාන යනු වඩා සදාචාරසම්පන්න සමාජයක් වෙනුවෙන් ක්‍රියා කරන සමාජ එකතු. එක් පැත්තකින් දේශපාලන නායකත්වය සමඟත්, අනිත් පැත්තෙන් ජනතාව සමඟත් මේ පිළිබඳව පුළුල් සංවාදයක් ගොඩනැගීම මෙම සිවිල් සමාජයේ කාර්යභාරයක්. අපේ රාජ්‍යය සමග පවතින පුරවැසි සමාජයේ තිබෙන ගැටලුව තමයි පුරවැසිභාවය හා ශිෂ්ටසම්පන්නභාවය හා බැඳුණු උගත්කමක් ගොඩ නැගිය යුතු අධ්‍යාපන ක්‍රමය එය ඉටු නොකිරීම. අධික තරගකාරී, විභාග කේන්ද්‍රීය, සහතික එකතුකරන අධ්‍යාපන ක්‍රමයක් තිබෙන්නේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ගැන මා නිතර කියන දෙයක් නම්, අද සරසවි ප්‍රවේශය ලබන සිසුන් සමහරක් සරසවියට ඇතුළුවන හන්දියේදීම උපාධි සහතිකය ලැබෙනවා නම් එය අරගෙන ආපසු යන්න ලෑස්ති බවයි. විචක්ෂණශීලී, ගවේෂණශීලී, නිදහස් විද්‍යාර්ථියකු බිහි කිරීමේ වැඩපිළිවෙළක් හෝ උවමනාවක් නැහැ. අධ්‍යාපනය කියන්නේ මනුෂ්‍යත්වය ගොඩනැංවීමයි. මානව ශාස්ත්‍රවිෂයයන්ගෙන් වැඩි අවධානය යොමු කෙරෙන්නේ එයටයි. සියලු තාක්ෂණික විෂයධාරා හදාරන සිසුන්ටත් මෙම මානව ශාස්ත්‍ර විෂයයන් පිළිබඳ අවබෝධයක් ලබා දිය යුත්තේ ඒ නිසා. ඒ වගේම මානව ශාස්ත්‍ර විෂයයන් හදාරන සිසුන්ට තාක්ෂණික විෂයයන් ගැනත් අවබෝධයක් දිය යුතුයි. සියලු ආගම් හා සංස්කෘතීන් පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් සියලු දෙනාට ලබා දිය යුතුයි. මේ සියලු තත්ත්වයන් යහපත් වෙනසකට ලක් කිරීම සඳහා බලපෑම් කිරීමේ වගකීම සිවිල් සමාජයට පැවරෙනවා.

සංවාද සටහන
**ජයසිරි ජයසේකර**

"

**ඊළඟ පාර්ලිමේන්තුවේ පක්ෂ බලතුලනය කුමක් වුවත්, එය මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වන්නේ මේ රටේ සියලු ජනයා සමගි කරන ජාතික ප්‍රතිපත්තිවලට එළැඹීමයි. සියලු පක්ෂ නායකයින් ඒ වෙනුවෙන් කැප විය යුතුයි. ජාතිවාදය, ආගම්වාදය, වෛරී ප්‍රකාශ ආදිය පිටුදැකීම සඳහා වැඩපිළිවෙළක් අවශ්‍යයි. ඒ සඳහා පූර්ණ බලැති කොමිෂන් සභාවක් පත් කිරීම සුදුසුයි. මැතිවරණ කොමිසමට වගේ අදාළ කාරණා සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට එයට බලය තිබිය යුතුයි.**



# ප්‍රජාතන්ත්‍රවාදී ආයතන කෙරෙහි බිඳවැටුණු මහජන විශ්වාසය යළි ගොඩනැගීම



රොහාන් එදිරිසිංහ

## පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයේ විකාශය

නිදහස ලැබීමේ සිට ශ්‍රී ලංකාවේ පැවතියේ පළමුවැන්නාට තනතුර හිමි වීමේ ක්‍රමය හෙවත් සාමාන්‍ය බහුතර ඡන්ද ක්‍රමය යි. විශේෂයෙන් ම, දේශපාලන පක්ෂ ලබාගන්නා ඡන්ද ප්‍රමාණයත්, සාමාන්‍ය බහුතර ඡන්ද ක්‍රමය යටතේ ඔවුන්ට පාර්ලිමේන්තුවේ හිමි වන ආසන සංඛ්‍යාවත් අතර ගැළපීමක් නොමැති වීම නිසා අසූ ගණන් මුල දී මෙය සමානුපාතික නියෝජන ක්‍රමයකට වෙනස් කරනු ලැබී ය. කෙසේ වෙතත්, අවසානයේ ශ්‍රී ලංකාවේ මෑත කාලීන දේශපාලන වර්ධනයන්ට හේතු වූයේ හඳුන්වාදෙනු ලැබූ විශේෂිත වර්ගයේ සමානුපාතික නියෝජනය යි. මේ වසර මුල දී පාර්ලිමේන්තුව විසුරුවා හරින තෙක් පැවති පාර්ලිමේන්තුව ජනතා මනස තුළ කෙතරම් අප්‍රසාදයට පත්ව තිබුණේ ද යත් ව්‍යවස්ථාපිත තත්ත්වය ලෙස පාර්ලිමේන්තුව නැවත කැඳවිය යුතුව තිබුණත්, පාර්ලිමේන්තුව නැවත කැඳවීම



**"**

**මේ වසර මුල දී පාර්ලිමේන්තුව විසුරුවා හරින තෙක් පැවති පාර්ලිමේන්තුව ජනතා මනස තුළ කෙතරම් අප්‍රසාදයට පත්ව තිබුණේ ද යත් ව්‍යවස්ථාපිත තත්ත්වය ලෙස පාර්ලිමේන්තුව නැවත කැඳවිය යුතුව තිබුණත්, පාර්ලිමේන්තුව නැවත කැඳවීම ඔවුන්ට අවශ්‍ය නොවී ය. එපමණක් නොව, පාර්ලිමේන්තුව නැවත කැඳවීමට මහජනයාට අවශ්‍ය නැති බව කියමින් පුවත්පත් හි ලිපි ගණනාවක් ද පසුගිය සති කිහිපයේ පළ වී ය. පාර්ලිමේන්තුවට වෙනුවට හමුදාවට බලය ලැබෙන ආණ්ඩු ක්‍රමයකට විවෘතව සහය පළකරමින් වන මහජන මතය, ප්‍රවෘත්ති වාර්තා මගින් තවදුරටත් පෙන්නුම් කළේ ය.**

ඔවුන්ට අවශ්‍ය නොවී ය. එපමණක් නොව, පාර්ලිමේන්තුව නැවත කැඳවීමට මහජනයාට අවශ්‍ය නැති බව කියමින් පුවත්පත් හි ලිපි ගණනාවක් ද පසුගිය සති කිහිපයේ පළ වී ය. පාර්ලිමේන්තුවට වෙනුවට හමුදාවට බලය ලැබෙන ආණ්ඩු ක්‍රමයකට විවෘතව සහය පළකරමින් වන මහජන මතය, ප්‍රවෘත්ති වාර්තා මගින් තවදුරටත් පෙන්නුම් කළේ ය. මෙය බරපතළ කාරණයකි. හමුදා පාලනයක් ගැන කතාකරන උදවිය ඔවුන්ගේ මතයේ ප්‍රතිවිපාක පිළිබඳව බැරෑරුම් ලෙස සිතා තිබේද යන්න සහ ඔවුන් තම අදහස ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ පාලනය පිළිබඳ මූලික ලක්ෂණ සමග ගළපා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව මම පුදුම වෙමි. කෙසේ වෙතත්, එබඳු මත ප්‍රතික්ෂේප කිරීම අපට කළ නොහැකි ය. අප ප්‍රශ්න කළ යුත්තේ පාර්ලිමේන්තුව සහ දේශපාලනඥයන් මෙතරම් අප්‍රසාදයට පත් වූයේ ඇයි ද යන ප්‍රශ්නය යි. පාර්ලිමේන්තුව මෙතරම් අප්‍රසාදයට පත් වීමට එක් හේතුවක් ලෙස මා සිතන්නේ මෙම මැතිවරණ ක්‍රමය, 1940 ගණන්වල සිට 1977 දක්වා පත් වූ මන්ත්‍රීවරුන්ට වඩා ඉතාම වෙනස් ආකාරයේ පිරිසක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස පත් වීමට දායක වීම බව යි.

## 1977 සිට මහජන නියෝජිතයින් පිළිබඳව මහජන විශ්වාසය පහත වැටීම

***මැතිවරණ ක්‍රමයේ පවතින මූලික ප්‍රශ්නයක් වන්නේ එමගින් මහජනයාගේ නියෝජිතයින් ලෙස නොව තම දේශපාලන පක්ෂවල තානාපතිවරුන් ලෙස සිතීමට සහ පාර්ලිමේන්තුවේ ක්‍රියා කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දිරිගැන්වීම යි. මෙයට හේතුව වන්නේ තම තමන්ගේ පක්ෂ නාමයෝජනා මගින් පත් වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් දේශපාලන පක්ෂවලට වැඩි කළ බලතල ප්‍රමාණයක් මැතිවරණ ක්‍රමය මගින් ලබා දී තිබීම යි.*** සරලව කිවහොත් හැත්තෑ ගණන්වල හඳුන්වා දුන් මැතිවරණ ක්‍රමය මගින් එක් ප්‍රශ්නයක් පිළිගත හැකි ලෙස විසඳනු ලැබී ය. එනම් ඡන්ද ප්‍රමාණය සහ ආසන සංඛ්‍යාව අතර විකෘතිය පිළිබඳ ප්‍රශ්නය යි. එසේ වුව ද, එමගින් අලුත් ප්‍රශ්න නිර්මාණය වීම නිසා, අවාසනාවට එය ද වැරදි නැති ක්‍රමයක් නොවී ය.

***දෙවැනි කාරණය ලෙස තම ඡන්දදායකයන් කෙරෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වගවීමක් නැතිවීම මහජන නියෝජිතයන් කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටීමට හේතු වී ය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තමන් පත් කළ ජනතාවට වගවනවා වෙනුවට ඔවුන් කල්පනා කළේ තමන් තම පක්ෂ නායකයාට වගවීමෙන් සම්පූර්ණයෙන් ම බැඳී සිටින බව යි. එහි ප්‍රතිඵලය වුයේ පර්ලිමේන්තුවේ ඉතාමත් වැදගත් කාර්යයක් යටපත් වීම යි.*** විචාරක සභාවක් ලෙස සලකනු ලැබූ පාර්ලිමේන්තුව විධායකය කෙරෙහි මුර බල්ලකු ලෙස ක්‍රියා කළ යුතු බවටත්, ඔවුන්ගේ අවසාන වගකීම තිබිය යුත්තේ තම පක්ෂයට හෝ පක්ෂ නායකයාට නොව ජනතාවට බවත් විශ්වාස කෙරින. ඇත්ත වශයෙන් ම නිදහසේ සිට අපගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නීති සම්පාදනය පරීක්ෂාකර බැලීමේත්, ප්‍රශ්න මතු කිරීමේත්, විධායකය ඉතාම ඵලදායි ලෙස පාලනය කිරීමේත් ඉතිහාසයක් අපට තිබෙන්නේ ඔවුන් තම ඡන්දදායකයන්ට - එනම් ජනතාවට වගකීමෙන් බැඳී සිටි නිසා ය. ***උදාහරණ ලෙස පාර්ලිමේන්තුවේ දී බර්නාඩ් සොයිසා කීවේ හෝ කළේ මොනවාදැයි මැද කොළඹ ජනතාව දැන සිටි අතර ඩඩ්ලි සේනානායක කීවේ හෝ කළේ මොනවාදැයි දැදිගම ජනයා දැන සිටියහ. ඒ ආකාරයෙන් ම අත්තනගල්ල ජනයාට තම මන්ත්‍රීවරිය වන සිරිමාවෝ බණ්ඩාරනායක සමග හොඳ සම්බන්ධයක් තිබිණි. එසේ වුව ද, වර්තමානයේ හඳුන්වා දෙනු ලැබ ඇති විශේෂිත සමානුපාතික මැතිවරණ ක්‍රමය අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සහ විශේෂිත භූගෝලීය ප්‍රදේශයක් අතර සම්බන්ධතාවයක් නොමැතිවීම නිසා ජනතාවට වගකීමට හෝ වග වීමට පීඩනයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දැනෙන්නේ නැත.*** ඔවුන්ට පෙනෙන්නේ ,තමන්ට නැවත නාමයෝජනා ලබාගැනීමට හෝ ඔවුන්ගේ දේශපාලන දිවියේ ඉදිරියට යාමට ඇති හොඳම මඟ තම නායකයා සතුටු කිරීම බව සහ එනිසා ම නීති සම්පාදනය පරීක්ෂාකර බැලීම හෝ පාර්ලිමේන්තුව තුළ ස්වාධීන තීන්දු ලබාදීම මගින් ඇත්තට ම සිදුවිය හැක්කේ

තම දේශපාලන ඉදිරි ගමනට අවාසි වීම බව යි.

**ප්‍රජාතන්ත්‍රවාදය තුළ පාර්ලිමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ තොරතුරු සහිත සාකච්ඡා සහ අදහස් හුවමාරුව ඇතිකරන විචාරක සභාවක් හා විවාද මණ්ඩපයක් ලෙස ක්‍රියාත්මක වීම යි. එනම් රාජ්‍ය ප්‍රතිපත්ති සහ ප්‍රශ්න සාකච්ඡා කරන සහ විවාද කරන මණ්ඩපයකි. මෙම තත්ත්වය අද බොහෝ දුරට වෙනස් වී ඇත්තේ පක්ෂ විසින් මන්ත්‍රීවරුන් තදින් පාලනය කිරීම නිසා ය. කුමන හෝ විශේෂිත නීති කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට පෙර ම ඡන්දය ප්‍රකාශ වන ආකාරය දැන් කල්තබා ප්‍රකාශ කිරීමට හැකි තත්ත්වයක් තිබෙන්නේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැමවිටම පාහේ ඡන්දය පාවිච්චි කරන්නේ ඔවුන්ගේ පක්ෂ නියම කරන ආකාරයට වීම නිසා ය.** 1982ට පෙර පාර්ලිමේන්තුවේ මෙම තත්ත්වය දක්නට තිබුණේ ඉතා අඩුවෙනි. පාර්ලිමේන්තුව එහි සිදුවන සියලු දේ කල්තබා කිව හැකි ස්ථානයක් බවට පිරිහීම හා එහි සිදුවන විවාද වැඩකට නැති තත්ත්වයට පත්වීමත්, අප විසින් හඳුන්වා දෙනු ලැබූ මැතිවරණ ක්‍රමයත් අතර සම්බන්ධයක් හඳුනාගත හැකි ය. ප්‍රශ්නය වී ඇත්තේ පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය හෝ පක්ෂ අතර ප්‍රජාතන්ත්‍රවාදය නැති සහ එනිසා ම නිදහස් චින්තනය අධෛර්යමත් කරන තත්ත්වයත් සමග අප හඳුන්වා දුන් විශේෂ වර්ගයේ සමානුපාතික මැතිවරණ ක්‍රමයෙහි ය.

එබැවින් පාර්ලිමේන්තුව ආයතනයක් ලෙස පිරිහීමට පත් වීම සහ මැතිවරණ ක්‍රමය අතර සම්බන්ධය සැලකිල්ලට ගත විට විසඳුම වන්නේ අප අපගේ මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතු වීම යි. **දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වය පාලනය වන නීති ද හඳුන්වාදිය යුතු වන අතර පක්ෂවල ක්‍රියාකාරීත්වයට අවම ප්‍රමිතියක් සහතික කළ යුතු ව ඇත. එබඳු නීතියක් මගින් පක්ෂ අතර සහ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම මගින් නායකයන්ගේ බලය සීමා කළ යුතු අතර දැනුවත් ස්වාධීන මනසකින් යුතු උදවිය දේශපාලනයට පැමිණීම දිරිමත් කළ යුතු ය.** දේශපාලන පක්ෂ පාලනය කරන නීති සහ අවම ප්‍රමිතීන් හඳුන්වා දීම ප්‍රජාතන්ත්‍රවාදී ලෝකය තුළ වැඩි වැඩියෙන් දක්නට ලැබෙන තත්ත්වයකි.

## ජාත්‍යන්තර තලයේ රටවලින් උගත් පාඩම්

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අප කතා කරන ඇතැම් ප්‍රශ්න වෙනත් රටවලට ද අභියෝග වූ බව මම පිළිගනිමි. විධායකය ව්‍යවස්ථාදායකය මත ආධිපත්‍ය දැරීමේ ප්‍රවනතාව සහ ව්‍යවස්ථාදායකයේ බලය සහ බලපෑම දුර්වල වීම ජාත්‍යන්තර ප්‍රවණතාවක් ලෙස පෙනෙන්නට තිබේ. එසේ වුව ද, තියුණු විවාද සහ පරීක්ෂාකාරී විචාර සිදුවන මණ්ඩප ලෙස පාර්ලිමේන්තු ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන උදාහරණ අපට තවමත් දක්නට ලැබෙයි.

**පසුගිය වසරේ එක්සත් රාජධානියේ බ්‍රෙක්සිට් විවාදය අපට දකින්නට ලැබුණු අතර එරටෙහි ව්‍යවස්ථා නිර්මාණය තුළ පාර්ලිමේන්තුව කෙතරම් බලගතු ද යන්න අපට දැකගත හැකි වී ය. තෙරේසා මේට සහ පසුව බොරිස් ජොන්සන්ට පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීමට විශාල වෙහෙසක් දැරීමට සිදු වූයේ සහ මැතිසබයේ විවාද වූ විවිධ යෝජනාවල දී දැඩි තරඟයකට මුහුණ දීමට සිදු වූයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ස්වාධීන තීන්දු ගන්නා තත්ත්වයක් පැවතීම නිසා ය. ඔවුන් ස්වාධීන ලෙස තීන්දු ගත්තා පමණක් නොව තමන් ඡන්ද දායකයන් සහ ඡන්ද කොට්ඨාස නියෝජනය කරන බව තේරුම් ගත් ඔවුහු එනිසා ම විවිධ යෝජනාවලදී ගතයුතු ස්ථාවරය තීරණය කිරීමේ දී තම ඡන්ද කොට්ඨාසවල මතය විමසීමට ද ක්‍රියා කළෝ ය.**

දකුණු ආසියාව සැලකිල්ලට ගන්නේ



දියණිය පෙර පාසල් ගෙන යන බ්‍රිතාන්‍ය අගමැති


ආරක්ෂකයින් පිරිවරාගෙන ගමන් කරන ලංකාවේ දේශපාලනඥයෙක්

නම් සාමාන්‍ය බහුතර මැතිවරණ ක්‍රමය අතහැරීම හා ප්‍රවනතාව සහ විලාසිතාමය වී තිබෙන සමානුපාත ඡන්ද ක්‍රමයට යොමු වීම ඉන්දියාව තරයේ ම ප්‍රතික්ෂේප කළේ ය. ඉන්දියාවේ ද ලෝක් සභාවේ විවාද සැලකිය යුතු වැදගත්කමක් දරයි. ජර්මනිය සහ කොන්ග්‍රසයේ සාමාජිකයන්ට තවමත් සැලකිය යුතු බලයක් හිමිව ඇති ඇමෙරිකා එක්සත් ජනපදය වැනි රටවල පවා බුන්ඩස්ටාගයේ සහ කොන්ග්‍රසයේ අනුමැතිය සැලකිය යුතු වැදගත් කමක් දරයි. ඇතැම් විට තමන්ගේ පක්ෂ ස්ථාවරයට එරෙහිව ඡන්දය ප්‍රකාශ කරන ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් පාක්ෂිකයන් සිටින්නේ එක්කෝ තමන්ගේ ස්වාධීන විනිශ්චයෙන් හෝ හෘද සාක්ෂියෙන් එයට පෙළඹවීම නිසා නැතහොත් මහජනයාගේ බලකිරීම නිසා ය. මන්ත්‍රීවරුන්ට දැනෙන්නේ තමන් දේශපාලන නායකයන්ට නොව ප්‍රධාන වශයෙන් ජනතාවට වග කිව යුතු බව යි.

එම නිසා, යටත්විජිතවාදී පාලනයට පෙර සිට පවා මෙරටෙහි නියෝජිත පාලන ක්‍රමයක් පැවති බවට ශ්‍රී ලංකාවට ආඩම්බර විය හැකි වුව, මහජන විශ්වාසය නොමැති වීමත් එමගින් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සහ මහජන නියෝජිතයන් පිරිහීමට ලක්වීමත් බරපතළ ලෙස සැලකිල්ලට ගත යුතු ප්‍රශ්නයකි.


## පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳ ගෞරවය නැවත ගොඩනැගීම

සාමාන්‍ය බහුතර නියෝජන ක්‍රමයේ යහපත් ලක්ෂණ සහ සමානුපාතික නියෝජනයේ මූලික මූලධර්ම සම්බන්ධ කරන මිශ්‍ර ක්‍රමයකට මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම හැරුණු කොට මා කියන්නේ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වය පාලනය කරන නීති හඳුන්වා දීම දැන් අවශ්‍ය වී තිබිය හැකි බව යි. ***එබඳු නීතියකින් පාලනය කළ යුතු තවත් කාරණයක් නම් දේශපාලන පක්ෂ මුදල් එකතු කරන සහ වියදම් කරන ආකාරය යි. ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු බොහෝ රටවල පක්ෂ සහ ප්‍රචාරක වියදම් සඳහා පාලනයක් පවතියි. ශ්‍රී ලංකාවේ ශක්තිමත් සහ වර්ණවත් දේශපාලන පක්ෂ ක්‍රමයක් නොමැති වීමට එක් ප්‍රධාන හේතුවක් වී ඇත්තේ දේශපාලන පක්ෂ මුදල් උපයන්නේ කෙසේද යන්න පිළිබඳව පරීක්ෂාවක් හෝ මැතිවරණ ප්‍රචාරක වියදම් නිරීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් ශ්‍රී ලංකාව තුළ නොමැති වීම යි. පක්ෂ මුදල් ගැන යම් ආකාර නීති හඳුන්වා දීමට අතීතයේ දී උත්සාහයන් තිබිණි.*** ප්‍රමාණවත් දේශපාලන සහයෝගයක් නොතිබීම නිසා ඒ සියල්ල අසාර්ථක විය. එබඳු උත්සාහයන්ට දේශපාලන පක්ෂ විරුද්ධ විය. කෙසේ වෙතත්, ප්‍රචාරක වියදම් සහ වැඩි මහජන පරීක්ෂාවක් සඳහා නීතියක අවශ්‍යතාවය වැඩි වෙමින් පවතියි. කිසිදු නීතියක් නොවීම නිසා දේශපාලන පක්ෂ යොමු වී තිබෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වීමට නියම සුදුසුකම් සහ හැකියාව ඇති දැනුවත් පුද්ගලයින් වෙනුවට විශාල මුදල් ප්‍රමාණයක් සපයාගැනීමට සහ පරිත්‍යාග කිරීමට හැකියාව ඇති සාමාජිකයන්ට සහ අපේක්ෂකයින්ට අනුග්‍රහ දැක්වීමට ය.

දෙවනුව, ***පාර්ලිමේන්තු ක්‍රමයේ පිරිහීම ජනාධිපති ක්‍රමය හඳුන්වා දීමත් සමඟ සමපාත වෙයි . එහි සම්බන්ධයක් ඇත. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු විධායකයක් පැවති කාලයේ විධායකය පාලනය කිරීමට පාර්ලිමේන්තුවට තිබූ හැකියාව ඉතාමත් වැඩි ය. විධායක ජනාධිපති පාර්ලිමේන්තුවෙන් ඉවත් කරනු ලැබූ අතර බලගතු විධායක ජනාධිපතිවරයකු වූ ප්‍රේමදාස ජනාධිපතිතුමා යටතේ සිටි තේරීපත් නොවූ උපදේශකයෝ බොහෝවිට කැබිනට් ඇමතිවරුන්ට වඩා බලගතු වූ හ.*** **දැන් අපට එබඳු ම ප්‍රවනතාවක් දැකගත හැකි ය.**

විධායක ජනාධිපති ක්‍රමය මගින් විධායකයට වැඩි බලතල ලබා දී ඇති අතර එමගින් පාර්ලිමේන්තුවට මෙන් ම ජනතාවට ද විධායකයේ වගවීම අඩු කොට තිබේ. නවසිය හැත්තෑ ගණන් මුල දී ***ඩඩ්ලි සේනානායක මහතා විධායක ජනාධිපති ක්‍රමයට විරුද්ධ වන විට ඒ මහතා කීවේ විධායක ජනාධිපති ක්‍රමය මගින් පාර්ලිමේන්තුව සහ අධිකරණය වැනි අනෙකුත් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන යටපත් කරනු ඇති බව යි. රටේ දේශපාලනයේ ප්‍රධාන අවධානය යොමු වන ස්ථානය වන පාර්ලිමේන්තුවේ විචාරක සභාවක් ලෙස ඇති වැදගත්කම විධායක ජනාධිපති ක්‍රමය මගින් පැහැදිලිව ම යටපත් කොට ඇත.***

තව ද, ***දේශපාලන පක්ෂ අතර ප්‍රජාතන්ත්‍රවාදය සහතික කරන නීති***




**"සමානුපාත ඡන්ද ක්‍රමයට යොමු වීම ඉන්දියාව තරයේ ම ප්‍රතික්ෂේප කළේ ය. ඉන්දියාවේ ද ලෝක් සභාවේ විවාද සැලකිය යුතු වැදගත්කමක් දරයි. ජර්මනිය සහ කොන්ග්‍රසයේ සාමාජිකයන්ට තවමත් සැලකිය යුතු බලයක් හිමිව ඇති ඇමෙරිකා එක්සත් ජනපදය වැනි රටවල පවා බුන්ඩස්ටාගයේ සහ කොන්ග්‍රසයේ අනුමැතිය සැලකිය යුතු වැදගත් කමක් දරයි. ඇතැම් විට තමන්ගේ පක්ෂ ස්ථාවරයට එරෙහිව ඡන්දය ප්‍රකාශ කරන ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් පාක්ෂිකයන් සිටින්නේ එක්කෝ තමන්ගේ ස්වාධීන විනිශ්චයෙන් හෝ හෘද සාක්ෂියෙන් එයට පෙළඹවීම නිසා නැතහොත් මහජනයාගේ බලකිරීම නිසා ය.**



සිරිමාවෝ බණ්ඩාරනායක සහ ඉන්දිරා ගාන්ධි

***හඳුන්වාදීම සහ ස්ත්‍රීන් සහ තරුණයන් ඇතුළත්කර ගැනීම වැඩි වන ආකාරයට වැඩි කාන්තා සහභාගීත්වයක් වර්ධනය කිරීම පිරිහුණු මහජන විශ්වාසයට පිළියම් යෙදීමට අවශ්‍ය සාධක වෙයි.*** පාර්ලිමේන්තුවේ වැඩි අතුළු කර ගැනීමක් සහ විවිධත්වයක් පවත්වා ගැනීම මගින් එය වඩාත් නියෝජනාත්මක ආයතනයක් බවට පත් වනු ඇති අතර එමගින් ම එය ආයතනයක් ලෙස වඩාත් ඵලදායි වනු ඇතැයි අපේක්ෂා කළ හැකි ය. උදාහරණයක් ලෙස නේපාල පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය ශ්‍රී ලංකාවට වඩා ඉතා වැඩි ය. එය පාර්ලිමේන්තුවේ පමණක් නොව පළාත් පාලන සභා සහ සියලු ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සම්බන්ධ තත්ත්වය යි. ඇත්ත වශයෙන් ම, ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් ගත් කල ශ්‍රී ලංකාව කලාපයේ ඇති ඉතාමත් පසුගාමී රාජ්‍යයන්ගෙන් එකකි. එබඳු වෙනස්කම් මගින් අනුග්‍රහ දේශපාලනය පිළිබඳ වත්මන් දේශපාලන සංස්කෘතිය වෙනස් කළ හැකි වනු ඇතැයි අපේක්ෂා කළ හැකි ය. එනම් ඔවුන් කෙතරම් කාර්යක්ෂම ලෙස තමන්ට අනුග්‍රහ ලබාගන්නේ ද, ඔවුන්ගේ වාහන කෙතරම් විශාල විය යුතු ද, ආරක්ෂක භටයන් කොපමණ සිටිය යුතු ද, කියා තීරණය කරන විනිසුරුවරුන් බවට දේශපාලනඥයන් පත්ව ඇති තත්ත්වය වෙනස් විය හැකි ය. අපගේ දේශපාලන සංස්කෘතියේ ඇති වන එබඳු වෙනස්කම් මගින් රටේ දේශපාලන ආයතන කෙරෙහි වැඩි මහජන විශ්වාසයක් ගොඩ නැගීමේ පදනම බිහි වනු ඇතැයි අපේක්ෂා කළ හැකි ය.

ඊට අමතරව, ***තම හෘද සාක්ෂියට අනුව ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබාදිය යුතු ය. ඔහුගේ / ඇගේ හෘද සාක්ෂිය සහ පක්ෂ නායකයාගේ දැක්ම අතර ගැටුමක් ඇති අවස්ථාවල දී මෙය ඉතාමත් වැදගත් ය. මෙය වැරදි ලෙස යොදා ගැනීමේ ඉඩකඩ ඇතත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හෘද සාක්ෂියේ නිදහස සහතික කළ හැකි සහ හැමදෙනාම ඉතා සංවේදී වන වැරදි ලෙස භාවිතයන් අවම වන ක්‍රමයක් සංවර්ධනය කර ගැනීම වැදගත් වෙයි. උදාහරණ වශයෙන් කිසිදු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට විපක්ෂයේ සිට ආණ්ඩුවේ පැත්තට පැති මාරු කළ නොහැකි වන ලෙසත්, විපක්ෂයෙන් හෝ ස්වාධීන නාමයෝජනාවක් මගින් පත් වූ කිසිදු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ආණ්ඩුවේ විධායකයේ කිසිදු තනතුරක් හෝ ඇමතිධුරයක් ලබාගත නොහැකි වන ලෙසත් වන ක්‍රමයක් අපට තිබිය හැකි ය.*** එබඳු සීමා කිරීම් හඳුන්වා දෙමින්, තමන්ගේ පාර්ලිමේන්තු අසුන අහිමි නොවන ලෙස ඇතැම් කරුණුවල දී තම පක්ෂයට වෙනස් ව කටයුතු කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඉඩදීම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වඩාත් ස්වාධීන වන සංස්කෘතියක් නිර්මාණය වීමට ආධාරකාරී වනු ඇත. අපගේ තේරී පත් වූ ආයතන කෙරෙහි මහජන විශ්වාසය නැවත ගොඩ නැගීමට එය ඉතා වැදගත් ය.

"

**නේපාල පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය ශ්‍රී ලංකාවට වඩා ඉතා වැඩි ය. එය පාර්ලිමේන්තුවේ පමණක් නොව පළාත් පාලන සභා සහ සියලු ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සම්බන්ධ තත්ත්වය යි. ඇත්ත වශයෙන් ම, ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් ගත් කල ශ්‍රී ලංකාව කලාපයේ ඇති ඉතාමත් පසුගාමී රාජ්‍යයන්ගෙන් එකකි.**

## ජනාධිපති කාර්ය සාධක බලකා සහ පාර්ලිමේන්තුවේ කමිටු ක්‍රමය අතර ගැටුම

කාර්ය සාධක බලකා සහ පාර්ලිමේන්තු ක්‍රමය අතර ළැදියාවන්ගේ ගැටුමක් ඇතිවීම ස්වභාවික ය. කාර්ය සාධක බලකාවල ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් ඇත. එසේ වුව ද, අප දැන් ජීවත්වන්නේ ව්‍යවස්ථානුකූලභාවයට හෝ නීතියේ පාලනයට ගරු කිරීම අඩු කාලයක ය. ***ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රටෙහි පාර්ලිමේන්තුව නැතිව මාස තුනකට වඩා තිබිය නොහැකි ය. එමනිසා, කොවිඩ් 19 වසංගතය පැතිරීම හේතුවෙන් මැතිවරණ කල් දැමූ විට, කුමක් වුවත් 2015 දී තෝරා පත් කර ගන්නා ලද සහ 2020 සැප්තැම්බර් දක්වා පවත්වාගෙන යා හැකිව තිබූ පාර්ලිමේන්තුව නැවත කැඳවිය යුතුව තිබිණි. පාර්ලිමේන්තුවේ ක්‍රියා කෙනෙකු පිළිගත්තත් නැතත් ව්‍යවස්ථාමය තත්ත්වය එය යි. පාර්ලිමේන්තුවක් නැතිව පාලනය කෙරෙන රටක ප්‍රජාතන්ත්‍රවාදය පවතින බව කිව නොහැකි ය. අවාසනාවකට, ව්‍යවස්ථාව රැකීමට තිබෙන බවට පිළිගැනීම ඇති ආයතනය වන ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ මෙම ප්‍රශ්නය විසඳාගැනීමට උත්සාහ කළ විට දී, එම මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගයට ගැනීමට ඉඩ දීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අතර එමගින් ගම්‍ය වූයේ වැඩිදුරටත් පරීක්ෂා කළයුතු බැලූ බැල්මට පෙනෙන ප්‍රශ්නයක් වත් මෙහි නැති බව යි. 1950ස් ගණන්වල භාෂා සහ පුරවැසි ප්‍රශ්නවලදී දුන් බලාපොරොත්තු සුන් කළ තීන්දු සහ ජනාධිපති ජයවර්ධන විසින් 1982 දී යෝජනා කළ ව්‍යවස්ථා විරෝධී ජන මත විචාරණයට ඉඩදීමේ තීරණය මෙන් ම මෙය ද ශ්‍රේෂ්ඨාධිකරණයේ පැත්තෙන් සිය වගකීම් පැහැර හරිනු ලැබූ අවස්ථාවකි.***

කලින් මා සඳහන් කළ ආකාරයට අමාත්‍ය මණ්ඩලය සහ පාර්ලිමේන්තුවද යටපත් කරන ජනාධිපති කාර්ය සාධක බලකා ස්ථාපිත කිරීම ව්‍යවස්ථා විරෝධී වෙයි. කෙසේ වෙතත්, වර්තමාන සාකච්ඡාවේ දී වැඩියෙන් ම සැලකිල්ලට ගත යුතු වන්නේ මෙම වර්ධනයන් ගැන මහජනයාගේ වැඩි අවධානයක් හෝ කරදරවීමක් නොමැති බව යි. මෙයට හේතුව නම් ***කැබිනට් මණ්ඩලයෙන් මෙහෙයවන පාලනයකට වඩා හමුදා නායකත්වයෙන් යුතු කාර්ය සාධක බලකාවලට බොහෝ දෙනා සහය දෙන තරමට මෙරටේ දේශපාලනඥයන් සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටී තිබීම යි. දැඩි ලෙස අවධානයට ලක්විය යුතු මෙය ආපසු හැරවීම බරපතළ අවශ්‍යතාවකි. පසුගිය වසර විස්සක හෝ ඊට වැඩි කාලයක් තුළ අපගේ දේශපාලනඥයන් මහජන විශ්වාසය අහිමි කරගෙන ඇති අතර නිදහස් සහ ව්‍යවස්ථාපිත ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික මූලධර්මයක් සහ ලක්ෂණයක් වන මහජන විශ්වාසය අහිමි කර ගැනීමට දායක වී ඇති බව තේරුම් ගැනීම වැදගත් ය.***

# සූකිරි



ලොව හොඳම සූකිරි හදන
කොම්පැනියෙ තාත්තා වැඩ කරන බව
අම්මා ය කියා ඇත්තේ අපට

තාත්තා නම් කිසි දාක
වචනයක්වත් කියා නැත ඒ ගැන
මල්ලීත් මාත් අසන පැනවලට
අම්මා ය දෙන්නේ උත්තර රස කර කර

ඒ රස තවත් වැඩි කර
අපි ගිහින් තවරමු මිතුරු කන්වලට

අම්මා සූකිරි ගැන අසන හැම විට
තාත්තාගේ මූණ තිත්ත වන හැඩ
අප දැක ඇති වාර අපමණ

තාත්තා පඩි ගත්ත දවසට
ඔහු හදන සූකිරි කන්නට
මඟ බලාගෙන ඉන්න අප හට
රැගෙන එයි බාල සූකිරි කඩයකින්

තාත්තා හදන ඉස්තරම් සූකිරි ගැන
රසවත් ම විස්තර පන්තියේ මිතුරන්ට
අපි ඉතින් කියමු තව තව ගොත ගොත

**ළහිරු කරුණාරත්න**
(ගොළු වෙණ තුරුලු කරගෙන කාව්‍ය සංග්‍රහයෙනි.)

# සිල් ගත් මව් බිම



පසලොස්වක සඳ නැග එයි
කළු දුම් පටලය මැද්දෙන්

ගස්වැල් සුදු හැඳ පේවෙයි
සිල් ගන්නට සහ සුද්දෙන්

විස කටු මදකට සැඟවෙයි
පොරවන සුදු සිල් රෙද්දෙන්

අළු යට ගිනි පුපුරු දිළෙයි
සඳ බැස ගිය පසු බැද්දෙන්

**සුදත් ගාමිණී බණ්ඩාර**
(සිල් ගත් මව්බිම කාව්‍ය කෘතියෙනි)




# නියාමනය නොවන මැතිවරණ පිරිවැය
# රටවැසියන්ගේ ජීවන බර වැඩි වීමටද හේතුවකි



**මංජුල ගජනායක**
ජාතික සම්බන්ධීකාරක
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)

රටෙහි ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා මැතිවරණ විෂයෙහි නිර්මාණය කරගත යුතු සමාජ පසුබිම අධිකරණය මගින් සාක්ෂාත් කර ගැනීමට ඉන්දීය මැතිවරණ කොමිෂන් සභාව මෙතෙක් දරා ඇති තැත ප්‍රශංසනීයය. ඉන්දීය අධිකරණය මෑත කාලීනව ලබා දී ඇති සමහර තීන්දු මගින් පිළිබිඹු වන්නේ එහි අධිකරණ මනස රැඩිකල් භාවයේත් ප්‍රතිසංස්කරණමය භාවිතාවේත් සම්මිශ්‍රණයකින් ක්‍රියාවට නැගෙන බවයි.

මේ එවන් එක් අවස්ථාවක දී ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුවකින් උපුටා ගත් ප්‍රකාශයකි.

“බලය, ධනය හා සමාජ තත්වය ඇති නම් ඉන්දියාවේ වයස අවුරුදු 60ට වැඩි කෙනෙකුට වුවත් ලාබාල රූමත් යුවතියක් කිසිම ගැටලුවකින් තොරව තමන්ගේ පාද පරිචාරිකාව ලෙස සරණ පාවාගැනීමේ හැකියාවක් තිබූ යුගයක් පැවතිණි. එවැනි යුවතියන් එවැනි විවාහවලට කෙතරම් විරුද්ධ වුවද ඔවුන් හට කළ හැකි එකම කාර්යය වූයේ හඬා වැළපීම පමණි. නමුත්, අද තරුණ-තරුණියන් විවාහයට පෙර තම සහකරුගේ හෝ සහකාරිය පිළිබඳ වඩාත් හොඳින් තොරතුරු සොයනු ලබන අතර




**දේශපාලන පක්ෂ යනු රටෙහි පාලන බලය හොබවන මානව සම්පත පෝෂණය කොට හැඩගැස්වීමේ කාර්යය සිදුකරන එක් ප්‍රමුඛතම ව්‍යුහයයි. එබැවින් ඊට ඇති සමාජ වගවීමට සමගාමීව ඔවුන්ගේ සුපිළිපන්න බව පිළිබඳ ඕනෑම පුරවැසියෙකු හට ප්‍රශ්න කරන්නේ කිරීමේ හැකියාව පැවතිය යුතුය. දේශපාලන පක්ෂ වුව යම් නියාමනයකට ලක් විය යුතුවන්නේ එබැවිනි. එහිලා දේශපාලන පක්ෂ දරන වියදම් හා ලබන ආධාර නිවැරදි විගණනයකට ලක් කිරීම හා ඒ පිළිබඳ අනාවරණය කිරීම සමාජ වගකීමකි.**

එහිදී තමන් සෑහීමකට පත් වන්නේ නම් පමණි විවාහය සඳහා කැමැත්ත ප්‍රකාශ කරනු ලබන්නේ. අප මැතිවරණයකදී ජනතා නියෝජිතයන් තෝරාගන්නා විටත්, අපේක්ෂකයන් ගැන එලෙස සොයා බලා තෝරා ගත යුතු බව කවරෙකුට හෝ නොසිතෙන්නේ ද? සුපසන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ, බිම් මට්ටමේ ජනතාව අතර රැඳී සිටින ඡන්දදායකයා පවා තමන් ඡන්දය ප්‍රකාශ කරන අපේක්ෂකයාගේ ජීවන තොරතුරු දැන සිටීම සහ ඒ අනුව තම අනාගත පාලකයන්, නීති සම්පාදකයන් හෝ තම ජාතියේ ඉරණම පිළිබඳ වගකියන තැනැත්තන් තීරණය කිරීම අත්‍යාවශ්‍යය නොවෙන්නේද? (සිවිල් අයිතිවාසිකම් සඳහා වූ වෘත්තීය සමිති එකමුතුව සහ වෙනත් එදිරිව ඉන්දියානු වෘත්තීය සමිති එකමුතුව සහ වෙනත්).

මින් ජනිත වන සරළ අදහස වන්නේ ඡන්දදායකයා තමාගේ තෝරා ගැනීම පිළිබඳ දෙවරක් නොව සිය වරක් සිතිය යුතු බවයි. එවන් සිතිවිල්ලකදී කිසි විටෙකත් බැහැර කළ නොහැකි ප්‍රපංචයක් වන්නේ මුදල්ය.

මුදල් පිළිබඳ එකිනෙකා අතර ඇත්තේ පරස්පර විරෝධී අදහස් සමුදායකි. මුදල් විරහිත ජනසමාජයක් පිළිබඳ සිතීම දුෂ්කරය. වරෙක සැවැත් නුවර දෙව්රම් වෙහෙරේ වැඩ විසූ ගෞතම බුදුන් වහන්සේ මුදල් සර්පයෙකු හා සම කළ සේක. එනයින් වැටහෙන්නේ මැනවින් දමනය නොවුණු තැනැත්තා මුදල් යොදාගනු ඇත්තේ අයහපතට මිස යහපතට නොවන බවයි. එනිසාමදෝ ඇමෙරිකා එක්සත් ජනපද ප්‍රකට දේශපාලන විචාරක ජෙස් එම්. උන්රූහ් (Jesse M' Unruh) මුදල් හැඳින්වූයේ "දේශපාලනයේ මව්කිරි ලෙසිනි."

## මැතිවරණ වියදම්: මොනවාද? කාගේද?

මැතිවරණයක් යනු ප්‍රජාතන්ත්‍රවාදී ජනසමාජයක පුරවැසියා ආශක්ත කරන අපූරු භාවිතාවකි. එය ප්‍රජාතන්ත්‍රවාදයේ මහෝත්සවය යැයි කියන්නේ එබැවිනි. දකුණු ආසියානු වැසියා ආගමට ඔබ්බෙන් උන්මත්වන යමක් වේද එය කලින් කලට පැවැත්වෙන මැතිවරණ වන අතර ශ්‍රී ලාංකිකයා ද තම අභිරුචිය දිගුකලක් පවත්වා ගන්නා එක් ජාතික කර්තව්‍යයක් වන්නේ මැතිවරණයයි. මෙරටට සර්වජන ඡන්ද බලය ලැබෙන සමයේ පැවැත්වූ තරම් සරල මැතිවරණ ක්‍රියාවලියක් අද්වන විට දක්නට ඇත්තේ නැත. වර්ණ ගැන්වූ ඡන්ද පෙට්ටි තුළට දැමූ ඡන්දය අද්වන විට සුරක්ෂිතව සැකසූ කාඩ්බෝඩ් පෙට්ටියක් තුළට දැමීමෙන් යම් සරලත්වයක් දෘශ්‍යමාන විය හැක. එහෙත් සැබැවින්ම සිදුව ඇත්තේ ලෝකය වඩවඩාත් වාණිජකරණයට ලක්වීමට සමගාමීව මැතිවරණ ද මුදල නම් වූ චණ්ඩ මාරුතය හමුවේ අභියෝගයට ලක්වීමයි.

ජනතාවගේ මතය දේශපාලනිකව සංවිධානය කිරීමේ කාර්යය සිදුකරනු ලබන්නේ දේශපාලන පක්ෂ මඟිනි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය අනුදත් ශ්‍රී ලංකාව වැනි රටකට දේශපාලන පක්ෂ වැදගත් වන්නේ එම අර්ථයෙනි. වරෙක පාලන බලයට පත්වන දේශපාලන පක්ෂය තවත් වරෙක පසෙකට විසිවන්නේය. එසේ වුවත් එවන් දේශපාලන පක්ෂ සමාජය දේශපාලනිකව සංවිධානය කිරීම සඳහා දරන ප්‍රයත්නය උදෙසා මුදල් මගින් සිදුකරන බලපෑම තීරණාත්මකය. එබැවින් එය දෙයාකාරව මැනිය හැක්කේය.

දේශපාලන පක්ෂ යනු රටෙහි පාලන බලය හොබවන මානව සම්පත පෝෂණය කොට හැඩගැස්වීමේ කාර්යය සිදුකරන එක් ප්‍රමුඛතම ව්‍යුහයයි. එබැවින් ඊට ඇති සමාජ වගවීමට සමගාමීව ඔවුන්ගේ සුපිළිපන්න බව පිළිබඳ ඕනෑම පුරවැසියෙකු හට ප්‍රශ්න කරන්නේ කිරීමේ හැකියාව පැවතිය යුතුය. දේශපාලන පක්ෂ වුව යම් නියාමනයකට ලක් විය යුතුවන්නේ එබැවිනි. එහිලා දේශපාලන පක්ෂ දරන වියදම් හා ලබන ආධාර නිවැරදි විගණනයකට ලක් කිරීම හා ඒ පිළිබඳ අනාවරණය කිරීම සමාජ වගකීමකි.

**දේශපාලන මූලය:** වසරේ දින 365 පුරා කවර හෝ දේශපාලන ක්‍රියාකාරකමක් වෙනුවෙන් රැස්කරන හා වැය කරන මුදල් මෙනමින් හැඳින්වේ.

**මැතිවරණ ප්‍රචාරක වියදම්:** කවර හෝ මැතිවරණයක් උදෙසා දේශපාලන පක්ෂයක්/අපේක්ෂකයෙක් දරන පිරිවැය හා ලබන මුදල් මෙලෙස හැඳින්වේ.

මෙරටේ නිලවශයෙන් ක්‍රියාත්මක දේශපාලන පක්ෂ සංඛ්‍යාව 70කි. එවැනි පසුබිමක වසර පුරා සිදු වන දේශපාලන ක්‍රියාකාරකම් විමසා ඒ පිළිබඳ පසුවිපරම එතරම් පහසු කාර්යයක් නොවේ. එය සංවර්ධිත රටකට පහසු කාර්යයක් වියහැකි වුවද ශ්‍රී ලංකාව වැනි මැදි ආදායම් ලබන රටකට දරා ගත හැකි වියදමක් නොවේ. එබැවින් වඩාත් ප්‍රයෝගික විකල්පය වන්නේ මැතිවරණ ප්‍රචාරක වියදම් පිළිබඳ කරුණු අනාවරණය කර ගැනීමෙහිලා උත්සාහ ගැනීම යැයි පැවසීම ආධානග්‍රාහී ප්‍රකාශයක් විය නොහැකිය.



**මැතිවරණ ප්‍රචාරක පිරිවැය නියාමනය කළ යුත්තේ මන්ද?**

ඔබ කඹ ඇදීමේ තරඟයකට ඉදිරිපත් වන්නේ යැයි මොහොතකට සිතන්නේනම් එහි පැවතිය යුතු අවම ප්‍රමිතිය කුමක්ද? කිසිවෙකුට වාසියක් ගත නොහැකි අන්දමේ ඒකසමාන බිම් කඩකි. එහෙත් රටක ජනයා මෙහෙයවීමට හා උදාරම් රටක් බිහිකිරීමට පැවැත්වෙන මැතිවරණයක එවන් ආකාරයේ සමබිමක් නොමැති වීම ගැටලුසහගත වන අතරම මහජන නියෝජිතයන් විය හැක්කේ අසීමිත ධනයක් හෝ වත්කමක් ඇත්තෙකුට පමණක් වීමද නොවැළැක්විය හැකිය. කාන්තා අපේක්ෂිකාවන්ට පවා එය අහිතකර ලෙස බලපාන අතර පිරිමින්ට සාපේක්ෂව කාන්තා අපේක්ෂිකාවන් හට මුදල් වැය කිරීමට ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂ පවා දක්වන්නේ පුදුමසහගත මැලිකමකි.

**පසුගිය ජනාධිපතිවරණ සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව දරන ලද සෘජු පිරිවැය :**

| වර්ෂය | වියදම රු. | ඡන්දයට භාවිත කළ නාම ලේඛනය | ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | එක් ඡන්ද දායකයකු සඳහා දරන වියදම රු. | තෝරා ගන්නා මහජන නියෝජිතයින් සංඛ්‍යාව | එක් මහජන නියෝජිතයෙකු තේරීමට යන වියදම රු. |
|---|---|---|---|---|---|---|
| 2005 | 715,937,310 | 2004 | 13,327,160 | 54 | 1 | 715,937,311 |
| 2010 | 1,856,830,997 | 2008 | 14,088,500 | 132 | 1 | 1,856,830,997 |
| 2015 | 2,706,306,830 | 2014 | 15,044,490 | 180 | 1 | 2,706,306,830 |

මැතිවරණ කොමිෂන් සභාවේ දත්ත හා තොරතුරු ඇසුරෙනි


**පසුගිය පාර්ලිමේන්තු මහ මැතිවරණ සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව දරන ලද සෘජු පිරිවැය :**

| වර්ෂය | වියදම රු. | ඡන්දයට භාවිතා කළ නාම ලේඛනය | ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | එක් ඡන්ද දායකයකු සඳහා දරන වියදම රු. | තෝරාග න්නා මහජන නියෝජිතයින් සංඛ්‍යාව | එක් මහජන නියෝජිතයෙකු තේරීමට යන වියදම රු. |
|---|---|---|---|---|---|---|
| 2004 | 865,964,698 | 2002 | 12,899,139 | 67 | 225 | 3,848,732 |
| 2010 | 1,953,845,873 | 2008 | 14,088,500 | 139 | 225 | 8,683,759 |
| 2015 | 2,975,398,622 | 2014 | 15,044,490 | 198 | 225 | 13,223,994 |

මැතිවරණ කොමිෂන් සභාවේ දත්ත හා තොරතුරු ඇසුරෙනි

**නිල හා නිල නොවන මැතිවරණ පිරිවැය**

කවර මැතිවරණයක් සඳහා වුව දරනු ලබන වියදම දෙයාකාරය. එය නිල හා නිල නොවන මැතිවරණ පිරිවැය ලෙස හැඳින්විය හැකිය. මෙහිලා ප්‍රජාතන්ත්‍රවාදී රටක පුරවැසියන් ලෙස වඩාත් වැදගත් වන්නේ මහජන නියෝජිතයෙක් බිහිකරගැනීම සඳහා දරන්නට සිදුවන පිරිවැය කුමක්ද (Production Cost of Public




Representatives) යන්නයි. එවැන්නක් පිළිබඳ නිරීක්ෂණය කිරීමේ වැදගත්කම වන්නේ ධනය හෝ බලය අහිමි එහෙත් දැනුමෙන් හා අත්දැකීමෙන් මනා පරිචයක් ලත් පිරිසක් වෙත ව්‍යවස්ථාදායකයේ දොරටු විවර කිරීම සඳහා එමගින් සහයක් ලැබීමයි. එවැන්නක් සඳහා මග විවර කරගත හැකි එක් මගක් වන්නේ ඊට අදාළ යම් නීතිමය රාමුවක් සකස් කිරීමයි. එවැන්නක් සඳහා පාදක කරගත හැකි මූලික කෙටුම්පතක් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) හා පැෆ්රල් යන සංවිධාන එක්ව වසර 2018 දී පමණ සකස් කිරීමට සමත් විය. ඊට සමගාමීව මැතිවරණ කොමිෂන් සභාවද ජාත්‍යන්තර පරිචයන් හා දේශීය භාවිතාවන්ගෙන් සුසැදි පනත් කෙටුම්පතක් සකස් කොට නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතියද ලබා ගැනීමට සමත් විය. ඒ අනුව පාර්ලිමේන්තුව වෙත තේරීපත්වීමට නියමිත අභිනව ව්‍යස්ථාදායක නියෝජිතයන්ගේ එක් ප්‍රමුඛ වගකීමක් නම් මෙලෙස සකස්ව ඇති පනත් කෙටුම්පතට නව ප්‍රාණයක් ලබා දීමයි.

## මැතිවරණ ප්‍රචාරණ වියදම් ගණනය කිරීම

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)
ඇස්තමේන්තුගත මුළු වියදම (රුපියල් මිලියන)
2019 ඔක්තොම්බර් 13 දින සිට නොවැම්බර් 13 දින දක්වා

| පක්ෂය | මුද්‍රිත මාධ්‍ය | ඉලෙක්ට්‍රොනික් මාධ්‍යය (100%ක වට්ටම) | වෙනත් වියදම් (රැස්වීම් ආදිය) | සමස්ත ඇස්තමේන්තුගත වියදම (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ (SLPP) | 107 | 1126 | 593 | **1,826** |
| නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (NDF) | 216 | 793 | 728 | **1,737** |
| ජාතික ජනබල වේගය (NPP) | 14 | 39 | 116 | **169** |
| ජන සෙත පෙරමුණ (JSP) | 0 | 7 | 0 | **7** |
| ජාතික ජනතා පෙරමුණ (NPM) | 3 | 0 | 0 | **3** |
| ජාතික ජනතා ව්‍යාපාරය - (SLSP) | 1.5 | 2.5 | 0 | **4** |
| **එකතුව** | **341.5** | **1967.5** | **1437** | **-** |
| **අනෙකුත් ජනාධිපති අපේක්ෂක 29 දෙනාගේ ඇස්තමේන්තුගත වියදම** | | | | **50** |
| **සමස්ත ඇස්තමේන්තුගත මැතිවරණ ප්‍රචාරණ වියදම (රුපියල් මිලියන)** | | | | **3,796** |

CENTRE FOR MONITORING ELECTION VIOLENCE
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය


**මැතිවරණ පිරිවැය ඇස්තමේන්තුගත කිරීමේ අභියෝගය:**

මෙරටේ මැතිවරණ ඉතිහාසයේ පළමු වරට මැතිවරණ පිරිවැය පිළිබඳ ඇස්තමේන්තුගත නිරීක්ෂණයක් කිරීමේ භාරදූර වගකීම පවරාගත් සංවිධානය වූයේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයයි. අදාළ විෂය පිළිබඳ අවබෝධයෙන් යුත් ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙක් යටතේ ස්ථාපිත කරන ලද විශේෂ වැඩසටහන් ඒකකයක් සඳහා මනාව පුහුණු කරන ලද කාර්යමණ්ඩලයක් බඳවා ගනිමින් සිදුකරන ලද එකී දීපව්‍යාප්ත නිරීක්ෂණයේ දී අවධානයට ලක් කරන ලද ක්ෂේත්‍ර ගණන හතරක් විය. එනම්,

- මුද්‍රිත මාධ්‍ය (පුවත්පත්)
- විද්‍යුත් මාධ්‍ය (රජයේ හා පෞද්ගලික රූපවාහිනී චැනල්)
- බිම් මට්ටමේ මැතිවරණ ප්‍රචාරණ අංග (ප්‍රචාරක රැලි, වෙනත් ආධාර ප්‍රදාන හා මුදල් නොවන ප්‍රතිපාදන) හා
- සමාජ ජාල මාධ්‍ය (මුහුණු පොත-මූලිකවම *Face Book)*

ඉන් ප්‍රකට වූ මැතිවරණ වියදම රුපියල් මිලියන හාරදහසකට ළංවූ අතර එවැන්නක් ඇසූ කළ ශ්‍රී ලාංකීය පුරවැසියා සංත්‍රාසයටත්, අසීමිත පුදුමයටත් පත්වේ යැයි සිතුවද මෙරටේ පුරවැසියාද ධනය හා බලය ඇති අපේක්ෂකයන් ආසනාරූඪ කිරීමේ කිසිදා නොනිමෙන අභිරුචියකින් පෙළෙන්නේ යැයි නොලියා සිටිය නොහැකිය.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය අනාවරණය කරගත් මැතිවරණ වියදම මැතිවරණයේ සමස්ත වියදම නොවේ. එය සමහර විටෙක 30%ක සීමාවක රැඳුණක් විය හැකිය. එහෙත් එකී ගණනය පවා අප වැනි රටකට දරා ගත නොහැකි බව පහත නිදසුනෙන් වටහා ගත හැකිය.




මින් අදහස් වන්නේ දැයේ දරුවන්ගේ ආරක්ෂාව හා අභිවෘද්ධිය වෙනුවෙන් සමස්ත වර්ෂයක් සඳහා රජය වෙන්කොට ඇති මුදල රුපියල් මිලියන 373ක් බවයි. එහෙත් දින 40ක කාලයක් සඳහා තම මැතිවරණ අපේක්ෂකත්වය වෙනුවෙන් අපේක්ෂකයන් 35 දෙනෙක් එකතුව වැය කොට ඇති මුදල රුපියල් මිලියන 3796කි. එනම් ළමා අභිවෘද්ධිය උදෙසා ප්‍රතිශතාත්මතව මැතිවරණ ප්‍රචාරක වියදමට අනුපාතිකව හොඳම දේ ලැබිය යුතු ළමා පරපුරට වෙන්කොට ඇති මුදලේ ප්‍රතිශතය 9.8%කි.

එක්තරා ප්‍රකට දෙමළ භාෂිත පිරුළක් ඇත්තේය. එනම් "කූරයි ඒරී කෝළි පිඩික්කාදවන් වානම් ඒරී වයිකුණ්ඩම් පෝනානාම්" යනුවෙනි. එහි සිංහල භාෂා අර්ථය "වහලට නැගලා කුකුළා අල්ලන්නැති එකා අහසට නැගලා ස්වර්ගයට ගියාලු" යන්නයි.

**"**

**එක්තරා ප්‍රකට දෙමළ භාෂිත පිරුළක් ඇත්තේය. එනම් "කූරයි ඒරී කෝළි පිඩික්කාදවන් වානම් ඒරී වයිකුණ්ඩම් පෝනානාම්" යනුවෙනි. එහි සිංහල භාෂා අර්ථය "වහලට නැගලා කුකුළා අල්ලන්නැති එකා අහසට නැගලා ස්වර්ගයට ගියාලු" යන්නයි.**

මැතිවරණ වියදම් පනතක් ගෙනවිත් පාර්ලිමේන්තුවේ අභිනව මහජන නියෝජිතයන් එක්ව එය සම්මත කරනු ඇතැයි සිතීම එක්තරා අන්දමක භයංකාර සිහිනයක් නොවනු ඇතැයි කියා සිතිය නොහැක්කේය. මෙතෙක් අපේ පාර්ලිමේන්තුව නියෝජනය කර ඇත්තේ කුකුළෙක් ඇල්ලීමට තබා වහලට හෝ නැඟිය හැකි අයවලුන් නොවේ. එළෙස නැඟිය හැකි එවුන් පවා අල්ලපු කුකුළෙක් නැත. එනයින් බලන කල මෙවැනි නියාමන පනතක් සඳහා වෙහෙසිය යුතුව ඇත්තේද පුරවැසියන්මය. පුරවැසියන්ගේ කරමතින් ස්වර්ගයට යෑමට මාන බලන යම් මහජන නියෝජිතයෙක් වේද ඔවුන් ස්වර්ගය වෙත නොව ඊට ප්‍රතිපක්ෂ වෙනත් වාසස්ථානයක් කරා යොමු කිරීමට ක්‍රියා කිරීම පුරවැසියන්ගේ සැබෑ වගකීම විය යුතුය. ●



# වැඩබිමක් වී තිබූ රට යහපාලන ආණ්ඩුව මුඩුබිමක් කළා

## අගමැති මහින්ද රාජපක්ෂ

දේශපාලන ඉතිහාසයේ පළවැනි වතාවට විපක්ෂයට ආණ්ඩුව එක්ක සටනක් නැහැ. ඒ අයට තියෙන්නේ සිරිකොත ඇල්ලීමේ සටන පමණයි. මොකටද සිරිකොත අල්ලන්න දඟලන අයට ඡන්දෙ දෙන්නේ? ඡන්දෙ දෙන්න ඕනෑ රට දියුණු කරන්න වැඩපිළිවෙළක් දියත් කිරීමටයි. මා හිතන්නේ, රට හදන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න හැකියාවක් තිබෙන ආණ්ඩුවක් තමයි අවශ්‍ය. ජනාධිපතිතුමාට 69 ලක්ෂයක් ඡන්දය දී පාරක් පෙන්නුවා. අන්න ඒ පාර දිගේ යන්න අප ලෑස්තියි. එසේ නම් රට ගොඩනඟන ඒ වැඩපිළිවෙළ පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක කරන්න, පාර්ලිමේන්තුවට 2/3 බලයක් සහිත මන්ත්‍රීවරු අපට ලබා දෙන්න. ව්‍යවස්ථාවේ වෙනස්කම් තියෙන ඒවා වෙනස්කම් කරන්න, රට ඒකීය රටක් බවට පත් කරන්න අප ජනතාවට පොරොන්දු වී තිබෙනවා. ආණ්ඩු බලය තියෙන්න ඕනෑ ජනාධිපතිවරයා නියෝජනය කරන දේශපාලන පක්ෂයට මිස, වෙනත් පක්ෂයකට නොවෙයි. සිරිසේන මහත්තයාගෙයි, රනිල් වික්‍රමසිංහ මහත්තයාගෙයි යුද්ධය අප දැක්කා. රනිල් මහත්තයා කියන දේ, සිරිසේන මහත්තයා කළේ




asia.nikkei.com

නැහැ. සිරිසේන මහත්තයා කියන දේ රනිල් මහත්තයා කළේ නැහැ. ඒ නිසා දෙන්නටම අසීරු තත්ත්වයක් ඇති වුණා. මේ තත්ත්වය වෙනස් විය යුතුයි.

දැන් ප්‍රේමදාස මහත්තයා එයාට පුළුවන්ය ගෝඨත් එක්ක වැඩ කරන්න කියනවා. මං කිව්වා මට ඊටත් වඩා හොඳට ගෝඨත් එක්ක වැඩ කරන්න පුළුවන් කියලා. මායි එයයි වැඩ කර තියෙනවා. මම ජනාධිපති කාලයේ ආරක්ෂක ලේකම් එයායි. දැන් එයා ජනාධිපති, මා අගමැති. රටේ අපි හදපු සංවර්ධන වැඩපිළිවෙළ පසුගිය වසර හතර හමාරක කාලයේදී නැවතුණා. වරායක් හැදුවා. ඒ වරාය විකුණා දැම්මා. ගුවන්තොටුපළක් හැදුවා. ඒක විකුණන්න හදන විට මා යන්තම් ඒක බේරගත්තා. මේ පාර ගිහින් ඉන්දීය අගමැතිවරයාට කිව්වා මේක ගන්න එපා කියා. ඒත් එතුමා අපට ඇහුම්කන් දුන්නා. මේ විදිහට ගිවිසුම් ගහලා තියෙනවා. රටේ තිබෙන සම්පත් ඔබේ. දරුවන්ගේ. ඉපදෙන්න ඉන්න දරුවාගේ. ඒ නිසා මේ පිළිබඳව ඔබ සිතන්න ඕනෑ. මේ සම්පත් විකුණන්න ඉඩ දෙන්න බැහැ. අප මේ සම්පත් අනාගතයේ උපදින්න ඉන්න දරුවන් වෙනුවෙන් සුරකින්න ඕනෑ. රට සංවර්ධනය කිරීමට අප කැප වෙලා ඉන්නවා.

යුද්ධය ඉවර කර, අප වේගයෙන් ඇති කරපු සංවර්ධනය නැවත රටේ ඇති කරන්න, ඔබ සියලුම දෙනාගේ සහාය අවශ්‍යයි. එදා වැඩ බිමක් වී තිබූ රට යහපාලන ආණ්ඩුව මුළුමනින්ම මුඩුබිමක් කළා. එදා යහපාලන ආණ්ඩුව රටට ජාතියට කරපු මහා විනාශයේ අනිසි ප්‍රතිඵල අද අප බුක්තිවිඳිමින් සිටිනවා. 2015 ආණ්ඩුව පෙරළා දමා යහපාලන ආණ්ඩුවක් ඇතිකරනවා කියල විධායක ජනාධිපතිගේ බලතල සියල්ලම අගමැති රනිල් යටතට පවර ගත්තේ මේ බහුබූත ව්‍යවස්ථාව නිසයි.

මෙන්න මේ බරපතළ ආගාධයෙන් රට ගොඩනැඟීමට නම් මෙවර මහමැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඉහළ ප්‍රතිශතයකින් ජයග්‍රහණය කළ යුතුයි. 19 ව්‍යවස්ථාව පැත්තකට දමල අපේ රටට හිතකර නව ව්‍යවස්ථාවක් සම්මත කරගත යුතුයි. එවිට ජනාධිපතිතුමාට මේ රට ඉදිරියට ගෙනියන්න ශක්තිමත් ආණ්ඩුවක් බිහිකරගත හැකි වෙනවා.

සමහරු කියනව මේ මාස තුන මොනවත් කළේ නෑ කියා. ජනාධිපතිතුමා නොවැම්බර් මාසෙදි පත් වුණත් මතක තියා ගන්න, අය-වැය ලේඛනයක් තාම ඉදිරිපත් කරල නෑ. අය-වැය ලේඛනයක් ඉදිරිපත් නොකර, ආණ්ඩුවක් පිහිටවන්නේ නැතිව, සාමාන්‍යයෙන් පත් කරගත්ත කැබිනට් මණ්ඩලයක් තියාගෙන තමයි අප මේ දැන් තියෙන වැඩ කටයුතු කරගෙන යන්නෙ. රටක ආණ්ඩුවක් පිහිටෙව්වට පස්සෙ තමයි රටක් විදිහට ඉදිරියට ගමන් කරන්න පුළුවන් කම ලැබෙන්නේ. රට ඉදිරියට ගෙනයන්න, පළාත් දියුණු කරන්න, පාරවල් ඕනෑ. අප පසුගිය කාලේ කාපට් පාරවල් හැමතැනම හැදුවා. විදුලිය හැමතැනටම දීල තියෙනවා. 100%ක් විදුලිය රටේ තියෙනවා. දැන් අපට ඕනෙ බීමට ජලය ලබා දෙන්නයි. 48කට තමයි නළ ජලය ලැබෙන්නෙ. ඒක 100%ක් කිරීම තමයි අපේ පරමාර්ථය ඒක අප ඉදිරියට කරනවා.

අප කියපු දේ කරනවා. කරපු දේ කියනවා. අප විදුලිය දෙනව කිව්ව, 100%ක් දුන්නා. දකුණු පළාතට විතරක් නෙමෙයි, උතුරු නැගෙනහිරටත් සම්පූර්ණයෙන් දුන්නා.

පානීය ජලය ලබාදීම සැලැස්මකට අනුව කරනවා. අතනින් මෙතනින් ටික ටික කරන්න නෙවෙයි. සැලැස්මක් අනුව වැඩ කරන්න තමයි ජනාධිපතිවරයා තීන්දු කර තියෙන්නෙ. ජනාධිපතිවරයාගේ ඒ තීන්දුව අනුව සැලසුම් සකස් කර රටම සංවර්ධනය කරන වැඩපිළිවෙළකට අප සූදානම් වෙලා ඉන්නවා.

(ජනහමුවලදී පළ කළ අදහස් ඇසුරිනි)




# අර්බුදයට මුහුණ දීමට හැකියාව ඇත්තේ එජාපයට පමණයි

එක්සත් ජාතික පක්ෂ නායක **රනිල් වික්‍රමසිංහ**

මෙරට තිබෙන ප්‍රධානතම ප්‍රශ්න දෙක වන්නේ කොරෝනා වසංගතය සහ ආර්ථික අර්බුදයයි. කොරෝනා වසංගතය තවමත් පාලනය කර නැහැ. වසංගතය පාලනය නොකර රට ඉදිරියට යන්න බැහැ.

ලෝක ආර්ථික අර්බුදය මේ වන විට ශ්‍රී ලංකාවට ද පැමිණ තිබෙනවා. නමුත් තවමත් ගොඩ එන්න මාර්ගය සකස් කරගන්න නොහැකිව ආණ්ඩුව අසරණ වෙලා. ආර්ථිකයට නව පනක් දී ගෙදර ආර්ථිකය ආරක්ෂා කරන්න ජනතාව අතට මුදල් දෙන වැඩසටහන අපි ඉදිරිපත් කළා. වැඩසටහන වන්නේ එක්සත් ජාතික පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශයයි.

දැන් බලයේ සිටින ආණ්ඩුව ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කළද කිසිවෙකුත් ඒවා පිළිගන්නේ නැහැ. ඔවුන් මාස නවයකට පෙර ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කර ආණ්ඩුව භාර ගත්තා. මේ කාලයේදී කොරෝනාව පාලනය කළායි ආණ්ඩුව ප්‍රකාශ කළද එවැනි දෙයක් සිදු වී නැහැ.

ආර්ථිකය වැටුණු මොහොතේ සිට ජනතාවට සහනයක් දුන්නේ නැහැ. ආර්ථිකය ගොඩනැංවීමට කටයුතු කළේ නැහැ. ලෝකයේ බොහෝ රටවල් සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරද්දී ශ්‍රී ලංකාවේ අප එවැනි දෙයක් කළේ නැහැ. අවසානයේ ආණ්ඩුවට ජාත්‍යන්තර විශ්වාසය දිනා ගන්නත් බැරිවුණා. රට අද ජාත්‍යන්තරයේ කොන් වෙලා.

දැනට බලයේ සිටින පක්ෂය හැර ආණ්ඩු බලය සඳහා තරග කරන එකම පක්ෂය වන්නේ එක්සත් ජාතික පක්ෂයයි. අප ඉදිරිපත් කළ ප්‍රතිපත්ති මාලාව සංවාදයට විවෘතයි. ඒ පිළිබඳව ඕනෑම වාද විවාදයකට මුහුණ දෙන්න අප සූදානම්.

විදුලිය සහ ජල බිල සඳහා සහනයක් දීමට අප කටයුතු කරනවා. කප්පාදු කරන ලද රාජ්‍ය සේවක දීමනා යළි දීමට අප කටයුතු කරනවා.

ජාත්‍යන්තර ආයතන සමග සාකච්ඡා කර ඩොලර් මිලියන 6000ක මුදල ගෙන, ඒ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ ස්ථාවර බව ඇති කර ගැනීමෙන් පසුව සුරැකුම්පත් සහ සෙසු ක්‍රම මගින් රුපියල් උපයා ගැනීමට ආණ්ඩුවට හැකියි.

මේ වසර අවසානය වන විට ලක්ෂ දහයකට පමණ රැකියා අහිමි වීමේ අවදානමක් පවතිනවා. මේ ගණන ඇතැම් විට තවත් වැඩි විය හැකියි. ඒ පිරිස සඳහා සහන දිය යුතුයි. එලෙස රැකියා අහිමි වන පුද්ගලයන් සඳහා මසකට රුපියල් දස දහසක් දෙන වැඩ පිළිවෙළ ද අප ඉදිරිපත් කළා.

රැකියා ආරක්ෂා කර ගන්න. මේ රැකියා දෙන ව්‍යාපාර වලටත් උපකාර කළ යුතුයි. මේ සඳහාත් අප වෙනම අරමුදල් යොදවනවා. පෞද්ගලික අංශයේ වැටුප් ගෙවන සමාගම්වලට මුදල් ආධාර දීමටත් අපනයන කර්මාන්ත සඳහා යළි වෙළෙඳපොළ ලබා ගැනීමට උපකාර කිරීමටත් සංචාරක ව්‍යාපාරය ආරක්ෂා කිරීමටත් පියවර ගන්නවා. කුඩා ව්‍යාපාර ද අමතක කර නැහැ.

ත්‍රිරෝද රථ ආර්ථිකය ආරක්ෂා කර ගැනීම සඳහා ලීසිං සමාගම් සමග වැඩසටහන සකස් කරනවා. ත්‍රිරෝද රථ බලහත්කාරයෙන් පවරා ගැනීම නතර කරනවා.

ඉදිකිරීම් කර්මාන්තයට පණක් දී ඉදිරියට ගෙන යෑමටත් කටයුතු කරනවා. මධ්‍යම පන්තියට සහ වැඩ කරන ජනතාවට නිවාස අයිතිය දීම සඳහා ණය පහසුකම් දෙනවා. නිවාස ඉදිකිරීම් කර්මාන්නය දියුණු කිරීම කිරීම සඳහා මා සැලසුම් සකස් කර අවසානයි.

සින්නක්කර ඉඩම් අයිතිය දෙන වැඩසටහනක් ඉදිරියට ගෙන යෑමට කටයුතු කරනවා. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය අනුව නව නීතිය ඉදිරිපත් කරමින් ඒ කටයුතු සිදු කරනවා.

එමෙන්ම කෘෂි සහ ධීවර ක්ෂේත්‍රයන් කෙරෙහි ද අපගේ අවධානය යොමුව තිබෙනවා. කෘෂි බෝගවලින් ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කර ගැනීම සඳහා ද අප වැඩසටහන් ඉදිරිපත් කරනවා.

***2050 වසර වන විට දකුණු අප්‍රිකාවේ සිට ඉන්දුනීසියාව දක්වා ඉන්දියන් සාගර කලාපයේ තිබෙන රටවල්වල ජනගහණය මිලියන 500කින් වැඩි වීමට නියමිතය. අද යුරෝපා සංගමයේ සහ බ්‍රිතාන්‍යයට ජනගහනයට සමාන තත්ත්වයට ඒ වන විට මේ කලාපයේ ජනගහනය වර්ධනය වෙනවා. එයින් වැඩි පිරිස මධ්‍යම ප්‍රාන්තිකයන් වේවි. ඔවුන්ට ජීවත් වීමට ආහාර අවශ්‍යයි. ඔවුන් සඳහා ආහාර සැපයීම අපේ ප්‍රධාන වැඩ කටයුත්තක් වෙනවා. ඒ වෙනුවෙන් අපනයන බෝග වගා කිරීමේ වැඩසටහන ආරම්භ කරනවා. ඒ සඳහා කුඩා පරිමාණ ගොවීන්ට ආධාර කරනවා. සමාගම්වලටත් ආධාර කරනවා. සශ්‍රික වගා සඳහා යොදා ගන්නේ නැති ඉඩම් අක්කර ලක්ෂ දහයක් ඒ වෙනුවෙන් යොදා ගැනීමට කටයුතු කරනවා. මේ වගා කටයුතු සඳහා ආණ්ඩුවෙන් ආධාර දෙනවා.***

රටේ කෘෂි හා ධීවර සැපයුම් ජාලය තවත් දියුණු කළ යුතුයි. එය නවීකරණය කරන අයටත් ආධාර කරනවා. මෙරට වී නිෂ්පාදනය වැඩි කිරීමට කටයුතු කරනවා. වී මිල තරගකාරී වීමත් සමග යම් කොටසක් අපනයනය කිරීමට අවස්ථාව ලැබෙනවා. ධීවර අපනයන ශක්තිමත් කිරීමට අප වැඩසටහනක් සකස් කරනවා. බිංගිරිය සහ රුහුණු වෙළඳකලාප තවත් ව්‍යාප්ත කිරීම සඳහා ජපානය, ඉන්දියාව, චීනය ආදී රටවල් සහයෝගය ගැනීමට හැකියි. ආයෝජන සඳහා හිතකර වන නීති සම්මත කර ගැනීමටත් අප කටයුතු කරනවා.

***කොරෝනා වසංගතයට සාර්ථකව මුහුණ දීම සඳහා පොදු සෞඛ්‍ය හදිසි විධිවිධාන කෙටුම්පත මේ වන විට අප සකස් කර අවසානයි. කොරෝනා රෝග ව්‍යාප්තිය නතර කිරීම සඳහා දිනකට පරීක්ෂණ පන්දහසක් කරනවා.***

කොරෝනා පැතිරීමට පරිසර දූෂණයද ඉවහල් වූ බව ලෝක සෞඛ්‍ය සංවිධානයට ප්‍රකාශ කරනවා. අක්කර භාගයේ සිට අක්කර 25 දක්වා වන කුඩා වන වගා සඳහා රජයෙන් ආධාර දෙනවා. සෑම තැනකම කුඩා වනාන්තර ඇති කිරීම එහි අරමුණයි. හරිත මුල්‍ය ක්‍රම මා ඇති කරනවා.

ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතාගේ ආධාර ඇතිව සුවසැරිය ගිලන් රථ සේවය ආරම්භ කරන්නට මට හැකි වුණා. දැනට ක්‍රියාත්මක වන්නේ එහි එක් අදියරක් පමණයි. කොළඹ වැනි ප්‍රදේශවල වාහන තදබදය පවතින විට වෛද්‍යවරයා කුඩා යතුරු පැදියකින් රෝගියා සිටින තැනට යැවීමේ වැඩ සටහන ගැන මගේ අවධානය යොමුව තිබෙනවා.

සුවසැරිය තුන්වන අදියර වන්නේ ගුවන් ශල්‍යාගාර සහ ගුවන් රෝහල් පිහිටුවීමයි. එනම් විශාල 'හෙළිකොප්ටර්' යානා ශල්‍යාගාර ඇතුළු රෝහල් පහසුකම් සහිතව නවීකරණය කර රෝගියා සිටින තැනට ගෙන යාමයි. රෝගියා හෙළිකොප්ටරයෙන් රෝහලට ගෙන යනවාට වඩා මේ ක්‍රමය පහසු බව හැඟී ගොස් තිබෙනවා.

පාසල් පද්ධතිය දියුණු කිරීම සම්බන්ධයෙනුත් අපගේ මූලික අවධානය යොමු වෙනවා. පරිගණක යන්ත්‍ර දීමට අප සැලසුම් කර තිබුණ ද විවිධ අකුල් හෙළීම් නිසා එය කරගන්නට බැරි වුණා. පාසල් දරුවන්ට ටැබ් පරිගණක දීම අපේ ප්‍රතිපත්තියයි. පාසල් වසා තිබෙන අවස්ථාවලදී ටැබ් පරිගණකයෙන් අධ්‍යාපන කටයුතු කිරීමට හැකියි. රාජ්‍ය නොවන පාසල් වල ගාස්තු ගෙවා ගැනීමට බොහෝ විට මව්පියන්ට අසීරුතා ඇති වෙනවා. ගාස්තු ගෙවන්නේ නැතිනම් ගුරුවරුන්ට වේතන ගෙවන්නට බැහැ. ඒ මවුපියන්ටත් සහනය දීමට මා කටයුතු කරනවා.

ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කරමින් ආධාර උපකාර ගැනීමට මට හැකියි. ඒ අපේ එක්සත් ජාතික පක්ෂයේ ශක්තියයි. අප ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ගොඩ නගනවා. ස්වාධීන කොමිෂන් සභා තවත් ශක්තිමත් කරනවා. මා කැප වී සිටින්නේ පාර්ලිමේන්තු බලය ආරක්ෂා කිරීමටයි.

***දේශපාලනය තිත්ත වී සිටින බව දැන් තරුණ පරපුර කියනවා. ඒ නිසා තරුණයන් දේශපාලනයෙන් ඉවත් වෙලා. තරුණයන්ගේ විශ්වාසය නැවත ගොඩ නැගිය යුතුයි. අපහාස දේශපාලනයට තරුණ පරපුර කැමැති නැහැ. දේශපාලනයේ දිගුකාලීන සහ මධ්‍යකාලීන ප්‍රතිපත්ති මාලා තරුණයන් බලාපොරොත්තු වෙනවා. යහපාලනය ගැනවත් ජාතික ආණ්ඩු ගැනවත් තරුණයන්ගේ විශ්වාසය නැහැ.***

මධ්‍ය කාලීන සහ දිගුකාලීන ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු ආරම්භ කළ යුතුයි. මේවා කළ යුත්තේ මාධ්‍යයෙන් නොවෙයි. පාර්ලිමේන්තුවේදී ඒ ප්‍රතිපත්ති සකස් කළ යුතුයි.

අප මේ ගමන යා යු ශ්‍රී ලාංකිකයන් ලෙස එක්සත්වයි. මෙරට ජනවාර්ගික ප්‍රශ්නයටද විසඳුමක් දිය යුතුයි. ප්‍රශ්න හමුවේ රට ගොඩ නැගීමට හැකි එකම සැලසුම ඇත්තේ එක්සත් ජාතික පක්ෂයටයි. ඒ සැලසුම් ක්‍රියාත්මක කළ හැක්කේ එක්සත් ජාතික පක්ෂයට පමණයි.



# ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සෑම යෝජනාවක්ම
# නියමිත කාලයේ දී ඉටු කරනවා

**සමගි ජනබල වේගයේ නායක**
**සජිත් ප්‍රේමදාස**

අප මාතෘභූමියේ ප්‍රජාතන්තුවාදී දේශපාලන ඉතිහාසයේ නව හැරවුම් ලක්ෂයක ආරම්භයක් ලෙසත් ජනතාවත් අපත් අතර ඇති කර ගන්නා වූ සමාජ ගිවිසුමක් ලෙසත් මෙම අවස්ථාව මා හඳුන්වන්නට කැමතියි. පක්ෂයක ප්‍රතිපත්ති ප්‍රකාශයකින් ගම්‍ය වන්නේ එම පක්ෂය අනුගමනය කරන්නට බලාපොලරාත්තු වින ප්‍රතිපත්ති මාලාවයි.

විශේෂයෙන්ම මෙම අවස්ථාවේ අපේ සමගි ජන බලවේගයේ ප්‍රනිපත්ති සහ අපේ ගමන ගැන මා පුංචි පැහැදිලි කිරීමක් කළ යුතු වෙනවා, ප්‍රජාතන්තුවාදී ඉතිහාසය පුරාවටම සෑම මැතිවරණ සමයකම අපි දැකලා තිබෙනවා විවිධ ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් වෙනවා. රාජ්‍ය බලය ලැබුණු අවස්ථාවකදී ඒ එළි දැක්වූ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වෙනවාද කියා සොයා බැලුවහොත් බොහෝ අවස්ථාවල අපට දක්නට ලැබෙන්නේ එලෙස රාජ්‍ය බලය ලැබුණු පසුව ක්‍රමිකව ප්‍රතිපත්ති අමතක කිරීමයි.
සමගි ජන බලවේගය ඉදිරිපත් කර තිබෙන සම්ප්‍රදාය සහ මෙම වැඩපිළිවෙළත් මෙතෙක් කල් ඉදිරිපත් වුණු මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනත් අතර වෙනස වන්නේ කුමිකව දින වකවානු සහිතව සැලැස්මක් අනුව අපි මේ ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රායෝගිකවම සක්‍රීය ලෙස ක්‍රියාත්මක කිරීමට සැදී පැහැදී සිටීමයි.

සමගි ජන බලවේගය අප රටේ නූතන අභියෝගවලට, ජනතා ප්‍රශ්නවලට විසඳුම් සපයන පිරිසක්. විවිධ නායකයන් රටේ විවිධ ප්‍රශ්නවලට තිරසර විසඳුම් ලබා දුන්නාද කියා ප්‍රශ්න කළ යුතුයි. අපි ඉදිරිපත් වී සිටින්නේ ජනතා ප්‍රශ්න විසඳන්නන් ලෙසයි. අපි ඉදිරිපත් වී සිටින්නේ රටේ අභ්‍යන්තර හෝ බාහිර න්‍යායන්ට අනුව විසඳුම් සලසන්න නොවෙයි. අපි ඉදිරිපත් වී සිටින්නේ අලුත් අදහස් තුළින් නූතන ක්‍රමවේද තුළින් ඉදිරිය දකින දර්ශනයක් තුළින් රටට උචිත දර්ශනය ක්‍රියාත්මක කිරීමයි.

අපේ පුතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් වූයේ ඉතාම පිරිසිදු ක්‍රමානුකූල ක්‍රමවේදයකටයි. සති ගණනාවක් මුළුල්ලේ විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයන්, වෘත්තිකයන්, වෘත්තීයවේදීන්, කුසලතා ඇති අය හමුවී හැම විටම සෑම විෂයක් පිළිබඳව බොහොම විද්‍යානුකූල විදිහට අපි ප්‍රශ්න දිහා බැලුවා. ඒ සෑම ප්‍රශ්නයක්ම විසඳන ආකාරය ගැන පුළුල් ලෙස සාකච්ඡා කළා. ඒ අනුවයි අපි මේ පුතිපත්ති මාලාව නිර්මාණය කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම කිව යුතුයි, වර්තමානයේ දී අපේ රට මුහුණ දෙන ප්‍රශ්නවලට විසඳුම් අපි ළඟ තිබෙනවා. කොවිඩ් වසංගතය නිසා සෑම ක්ෂේත්‍රයකම අභියෝග රැසක් නිර්මාණය වෙලා තිබෙනවා. ආර්ථිකමය, සමාජමය, ජාතික ආරක්ෂාමය ආදී මේ සෑම අංශයකින්ම නිර්මාණය වූ අලුත් පුශ්න ගැන හිතලා ඒවාට නිර්මාණශීලීව




පිළිතුරු ලබා දෙන්න අපි සූදානම්. ඒ අනුව අපි ප්‍රශස්ථ රාජ්‍ය පාලනයක්, පුබුද්ධ රාජ්‍ය ප්‍රගමනයක් ක්‍රියාත්මක කරන්න බලාපොලරොත්තු වෙනවා.

විවිධ අය මේ කොවිඩ් වසංගතය ගැන විවිධ ආකාරයට විග්‍රහ කරනවා. නමුත් අපි කියන්නේ මේ වසංගතය අපේ ආර්ථිකයට සිදුවුණු බරපතළම මරු පහරක්, එය අපිට දැවැන්ත අභියෝගයක්. සමහරක් ජාතික ආරක්ෂාව කියන එක. ඉතාම පටු ආකාරයට මිලිටරි ආරක්ෂාව ලෙස හඳුන්වන්න උත්සාහ කරනවා. නමුත් අපිට තිබෙන්නේ ජාතික ආරක්ෂාව පිළිබඳ පුළුල් දැක්මක්. මිලිටරි ආරක්ෂාව කියන්නේ එහි එක් පැතිකඩක් විතරයි.

වර්තමානයේ ආර්ථික ආරක්ෂාව, සෞඛ්‍යමය ආරක්ෂාව, සමාජමය ආරක්ෂාව සෑම අතින්ම ගැටලු සහගතයි. අද ජාතීන් අතර අසමගිය ඇතිවෙලා. පාලකයෝ විවිධ මති මතාන්තර හදා ඒවාට ගිනි කූරක් ගසා ජාතිවාදය ආගම්වාදය ඇනිකර අන්තවාදයට අවස්ථාව ඇති කරනවා, මේ කොවිඩ් නිසා ජාතික ආරක්ෂාවට බරපතළ ගැටලු ඇති කර තිබෙනවා.

මේ අභියෝගවලින් අපිට පැන යන්න බෑ. මේවාට ප්‍රායෝගික විසඳුම් ලබාදීමේ හැකියාව අපට තිබෙනවා. තිබුණාටත් වඩා ජව සම්පන්න, ශක්ති සම්පන්න, සද්දන්ත, තේජස් සහිත මාතෘභූමියක් නිර්මාණය කරන්න අපට හැකියාව තිබෙනවා.

කොවිඩ් පාලනය කිරීම අප විසින් කළ යුතු දෙයක්. දුර්වල පාලනයක් තුළ කොවිඩ් පාලනය කිරීමට නොහැකි තත්ත්වයක් අද නිර්මාණය වෙමින් තිබෙනවා. තුන් කල් දකින කණ්ඩායමක් ලෙස සමගි ජනබල වේගයේ අපි කොවිඩ් පිළිබඳව කතා කළේ අද ඊයේ නොවේ. පසුගිය ජනවාරි සහ පෙබරවාරි මාසයේ සිට ඒ භයංකාර තත්ත්වය ගැන අපි පාර්ලිමේන්තුවටත්, රජයටත් කරුණු ඉදිරිපත් කළා. ඒත් ඒවාට විසඳුම් ලබාදුන්නේ නෑ. ප්‍රමුඛතාව දිය යුතු තැන පැත්තකට දාලා වෙනත් පුද්ගලික දේශපාලන කටයුතු ඉහළට ගෙන ඒම නිසා අද සිදු වෙලා තිබෙන්නේ කොවිඩ් පරාජය කරන්නට බැරි දෙවැනි තුන් වැනි රැළිවලට මුහුණ දෙන රටක් බවට පත්වෙලා,

අපි කොහොමද මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ කියලා බලන්න වෙනවා. මිනිසා ජීවත් කරවමින් රටේ ජාතික ආදායම සියලුම ජනතාවට සමසේ බෙදී යායුතුයි. පුද්ගලික ව්‍යවසායට ප්‍රධානත්වය ලබාදෙමින් මානුෂික ධනවාදයත්, ප්‍රජාතන්ත්‍රවාදයත් එකට මුසු කර ගනිමින් ආර්ථික ප්‍රතිලාභ සැමට ලැබෙන ක්‍රමවේදයක් රට තුළ කියාත්මක කළ යුතු වෙනවා.

සංවර්ධනය පළාත් නවයේම ඇති සියලුම ගම්මාන වෙත ක්‍රියාත්මක කර රට තුළ ශීඝ්‍රගාමී සංවර්ධනයක් ඇති කර අපේ රට දියුණු ලෝකය කරා ගෙන යායුතු වෙනවා. ඒ සඳහා වන සමාජ ගිවිසුම අපි ඉදිරිපත් කරනවා.

රටක් පාලනය කළ යුත්තේ විනයානුකූලවයි. ඒ වගේම ඒ තුළ සොඳුරුභාවය තිබිය යුතුයි. මනුස්සකම තිබිය යුතුයි. හිතක් පපුවක් ඇති ආකාරයට රට පාලනය කළ යුතුයි. ජනතා ප්‍රශ්නවලට සංවේදී විය යුතුයි. මාධ්‍යය ඉදිරියේ විතරක් නොවෙයි ජනතා ප්‍රශ්නවලට සැබෑ විසඳුම් ලබාදෙන්න ඕනෑ.

මේ සමාජ ගිවිසුම ජනතාව පිළි අරගත්තොත් සමගි ජනබලවේග රජයක් තුළ නිරන්තරවම රට දියුණු කරන්න, ජනතා ප්‍රශ්නවලට සත්‍යවාදී විසඳුම් ලබාදෙන නොනිදන රජයක් ලෙස සංවේදී වෙමින් නව කළමනාකරණ ක්‍රමවේදයන් තුළ, ඉතාම කාර්යක්ෂම පුබුද්ධ රාජ්‍ය පාලනයක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

රාජ්‍ය පාලනයක් තුළ දුර දැක්මෙන් කියාත්මක විය යුතුයි, ඉදිරියේදී සිදුවිය හැකි අන්තරායන් පිළිබඳ අවබෝධයන් තිබිය යුතුයි. ඒවාට විසඳුම් ලබා දීමට නිතරම සූදානම් විය යුතුයි. එල්ල වෙන්නට පුළුවන් සහ එල්ල විය හැකි ප්‍රායෝගික විසඳුම් තිබෙනවා නම් අන්න ඒ පාලනය කාර්යක්ෂම පාලනයක් ලෙස හැඳින්විය හැකියි.

එක කණ්ඩායමකට සීමා වූ පාලනයකින් පමණක් රට හදන්න බෑ. ප්‍රතිඵල මත ගොඩනැගෙන රාජ්‍ය ප්‍රගමනයක් අවශ්‍යයි. රට තුළ අභ්‍යන්තරික ලෙස සමගිය අවශ්‍යයි. එය අපි ශක්තිමත් කළ යුතුයි. පාලකයාගේ වගකීම රට තුළ ගිනිකඳු නිර්මාණය කිරීම නොවෙයි. ඒවා නිවා දැමීමයි. පැහැදිලිවම ඒකීය ශ්‍රී ලංකාවක් අපි ක්‍රියාත්මක කරනවා. ඒ තුළ දහතුන් වෙනි සංශෝධනය හරහා බලය බෙදා දීම කළ යුතුයි. එතැන දී තර්ටීන් ප්ලස් හෝ තර්ටීන් මයිනස් නෑ. අපි එක හඬකින් ක්‍රියාත්මක වෙනවා. රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමනක දී ඒ රටේ දී ධන ලකුණු දාලා යළිත් මෙරටට ආ විට ඊට ඍණ ලකුණ දාන කුමවේදය ප්‍රශස්ත නෑ. අපි එක විදිහකට එක හඬකින් ඉදිරියට යන්න අවශයයි. විවිධ අයගේ රුචි අරුචිකම් අනුව වැනෙන රාජ්‍ය පාලනයක් සමගි ජන බලවේගයෙන් බලාපොලරොත්තු වෙන්න එපා. අපේ ගමන පැහැදිලි වැදගත් එකක්.

මේ රට සංවර්ධනය කිරීමේදී අපි කාලවකවානු සහිතව කාල සටහනක් අනුව රාජ්‍ය පාලනය සිදු කරනවා. සෑම දෙයක්ම නියමිත කාලවකවානු සහිතව ඉටුකරමින් ඉදිරියට යනවා. අපි ජනතා වගකීම ප්‍රශස්ත ලෙස ඉටු කරන්න කැමතියි.

(ප්‍රතිපත්ති ප්‍රකාශනය එළිදක්වමින් කළ කතාව ඇසුරෙනි.)



ජාතික ජන බලවේගයේ නායක
**අනුර කුමාර දිසානායක**

# ඕනෑම මොහොතක රට බාරගන්න සූදානම්

මාක්ස්වාදයේම ප්‍රතිපත්ති අද වෙන කොට යම්යම් වෙනස්කම්වලට භාජනය වෙලා තිබෙනවා. රටේ ලෝකයේ හා සමාජයේ ඇති වී තිබෙන වෙනස්කම් මත ඊට අනුරූපිව අපේ ප්‍රතිපත්තිවලත් යම්යම් වෙනස්කම් ඇති කර ගන්න අපිට සිදුව තිබෙනවා. සමාජවාදී මූලධර්ම මත පදනම්ව අපේ වැඩපිළිවෙළ, අපේ උපක්‍රම යනාදිය අපි යාවත්කාලීන කර තිබෙනවා.

අපි විටින්විට මතුවෙන දේශපාලන සමාජයීය ආර්ථික කරුණු ගැන විවිධ පාර්ශ්ව සමග සාකච්ඡා කර තිබෙනවා. අපි රනිල් එක්කත්, මහින්ද එක්කත්, එදා චන්ද්‍රිකා එක්කත් කතා කර තිබෙනවා. වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සමගත් අපට සාකච්ඡා කරන්නට යම් කරුණු මතු වුණොත් ඔහු සමගත් අපි සාකච්ඡා කරනවා. එහෙම නැත්නම් හෙට රටට යහපත් වැඩක් කරන්න ගෝඨාභය අපේ සහාය ඉල්ලුවොත් ඒ ගැනත් ඔහු එක්ක කතා කරන්න අපි ලෑස්තියි. ඒ හැරෙන්න අපට හෝ අපේ පක්ෂයට පෞද්ගලිකව කිසිවක් ලබා ගන්න අපි ඔය කා සමගවත් කතා කරලත් නෑ; කතා කරන්නෙත් නෑ. පිළිගත් දේශපාලන පක්ෂයක වගකීම තමයි රට යහපත් මාවතට යොමු කර ගැනීම සඳහා පවතින ඕනෑම පාලනයක් සමඟ අවශ්‍ය නම් සාකච්ඡා කර තීන්දු තීරණවලට එළැඹීම.

යහපාලන රජය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන සාකච්ඡා ආරම්භ කළා. ඒවාට අපි සම්බන්ධ වුණා. දහනව වතාවක් සංශෝධනය කර ඇති අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට අලුත් ව්‍යවස්ථාවක් සම්පාදනය කරන්න කවුරු හෝ හෙට සූදානම් වෙනවා නම් ඊට දායකත්වය දෙන්න අපි සූදානම්. අපට අවශ්‍යයි අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තව තවත් ප්‍රජාතන්ත්‍රවාදී ගති ලක්ෂණ වැඩි කරන්න. මානව අයිතිවාසිකම් පිළිබඳ ගති ලක්ෂණ වැඩි කරන්න. නීතිය හා සාධාරණය කාටත් සාධාරණ ලෙස බෙදී යන ප්‍රතිසංස්කරණ ඇති කරන්න අපි කැමතියි. ඒ අනුව ඕනෑම කෙනකු සමඟ හෙටත් අපි සාකච්ඡා කරන්න සූදානම්.

රනිල් සහ සජිත්ගේ පුපුරා යෑම ප්‍රතිපත්තිමය කරුණක් නොවෙයි. පක්ෂ අභ්‍යන්තර අර්බුදයක්. ඔවුනොවුන් අතර තනතුරු පිළිබඳ අර්බුදයක්. බල අරගලයක්. සජිත් තමන් සමඟ එන සියල්ල ගත්තා. රනිල් පක්ෂයේ ඉතිරි වූ සියල්ල ගත්තා. ප්‍රතිපත්තියක් මත මේ දෙපිරිස වෙන් වුණා නම් එවැන්නක් සිදු වෙන්න බෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණත් අතර ඇතිව තිබෙන එකතුවත් ඒ එකතුව අතරේ තිබෙන ප්‍රතිවිරෝධතාවනුත් බලය වෙනුවෙන් ඇති වී තිබෙන ඒවා මිස ප්‍රතිපත්ති කාරණා මත ඇතිව තිබෙන දේවල් නොවෙයි. මේ බෙදීම් හරහා අපිට හොඳ විභවයක් නිර්මාණය වී තිබෙනවා. එජාප බෙදීම නිසාත් ශ්‍රීලනිපය හා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ අතරේ ඇතිව තිබෙන ප්‍රතිවිරෝධතා නිසාත් ඔවුන් සමඟ සිටි විශාල පිරිසක් දැන් ඔවුන්ට එරෙහිව ඉදිරියට පැමිණ තිබෙනවා. නමුත් අපිට තවම බැරි වී තිබෙනවා මේ පිරිස අපේ කඳවුරට එකතු කර ගන්න. අපි දැන් කරන්නේ ඒ ජනතාව අපේ කඳවුර වටා ඒකරාශී කර ගැනීමේ කාර්යයයි.

දේශපාලන පක්ෂ ගණනාවක් පසුගිය පාර්ලිමේන්තුව නියෝජනය කළත් මැතිවරණයට තරග වැදුණේ පක්ෂ හයක් පමණයි. ඒ හයෙන් එක්සත් ජනතා නිදහස සන්ධානය හා එජාප එකඟතාවකින් ජාතික ආණ්ඩුවක් ගොඩ නැගුවා. හකීම් මන්ත්‍රීවරයත් ඔවුන්ට සහය දුන්නා. දෙමළ ජාතික සන්ධානයත්, ජනතා විමුක්ති පෙරමුණත්, ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීවරයාත් නිල විපක්ෂය විදියට පාර්ලිමේන්තුවේ විපක්ෂයට නියමිත අසුන්වල වාඩි වුණා. එහිදී විපක්ෂ නායක ධුරය ආර්. සම්පන්දන්ටත් විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරය අපටත් හිමි වුණා. ඒ සියල්ල සිද්ධ වුණේ ප්‍රජාතන්ත්‍රවාදයට එකඟවයි. එකසත් ජනතා නිදහස් සන්ධානයේ පිරිසක් ආණ්ඩුව සමඟ එකතු වී ආණ්ඩුවට එකතු වූ පිරිසට වඩා පිරිසක් විපක්ෂයේ වාඩි වුණා කියල ඒ දෙපිරිස පක්ෂ දෙකක පිරිසක් විදියට පිළිගැනෙන්නෙ නෑ.

අපි හිතමු කවුරු හරි ආසන 160ක් විතර දිනා ගෙන ආණ්ඩුවක් හැදුවා කියලා. එතකොට ඒ අයට පුළුවන් ආසන 113කින්

73 වැනි පිටුවට



# ජාතික රාජ්‍යය රැකීම අපේ ප්‍රතිපත්තියයි

ජාතික නිදහස් පෙරමුණේ නායක
**විමල් වීරවංශ**

ලෝකයේ ජාතික රාජ්‍ය සංකල්පය හොඳට නරකට දෙකටම බලපා තිබෙනවා. මේ ජාතික රාජ්‍ය සංකල්පය නිසා තමයි අදටත් අපට රැකෙන්න පුළුවන් වෙලා තිබෙන්නෙ. ජාතික නිදහස් පෙරමුණ හැටියට අපේ ප්‍රතිපත්තිය වෙන්නේ ජාතික රාජ්‍ය ක්‍රමය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීමයි. ඒ ජාතික රාජ්‍යය බෙලහීන කරන්න ගෙන එනු ලබන ඕනෑම පියවරක් විනාශ කරන්න මම ඉදිරිපත් වෙනවා.

අපි 19 වන සංශෝධනයට විරෙහිවීම එක උදාහරණයක් ලෙස පෙන්වන්න පුළුවන්. අනාගාමික කණ්ඩායම් වැඩිවීම, සමලිංගිකත්වය නීතිගත කරන්න උත්සාහ කිරීම වැනි ප්‍රහාර ව්‍යාර්ථ කරන්න මම ප්‍රතිපත්තියක් විදියට එකඟයි. අපේ සංස්කෘතියේ යහපත් ගතිලක්ෂණ සියල්ල විනාශ කර කෘත්‍රිම ලෝකයක් නිර්මාණය කිරීම තමයි නියෝලිබරල්වාදින් ගේ වුවමනාව. ඒ සඳහා විවිධ ස්වරූපයන්ගෙන් අපිට එල්ල වන බලපෑම් හඳුනාගෙන ඒවා පරාජය කිරීමට කටයුතු කිරීම තමයි මගේ ක්‍රමය.

ජනතාවාදී කියා ගෙන පිහිටුවා ගත් රනිල්-මෛත්‍රී ආණ්ඩුව නියෝලිබරල්වාදි ප්‍රතිපත්ති කරපින්නාගෙන කටයුතු කරන්න පටන් ගත්තා. අපේ සංස්කෘතික හර පද්ධතීන්ට පයින් ගහලා අනාගාමික රාජ්‍ය පාලනයක් ගෙන යන්න ඔවුන් උත්සාහ කළේ ඒ නිසයි. අපි නැවත ජාතික රාජ්‍ය සංකල්පයට ගරු කරන රාජපක්ෂ ආණ්ඩුවක් හදන්න අවශ්‍ය වටපිටාව හදා ගන්නෙ අන්න ඒ නිසයි.

ඊනියා යහපාලකයන් ජනතාවත් පාර්ලිමේන්තුවත් නොමඟ යවලා සම්මත කරගත්තු 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ විධායක ජනාධිපතිවරයා ගේ අතපය ගැටගහල තිබුණත් ඔහු සතුව දැනට ඇති අවම විධායක බලය පාවිච්චි කරල තමයි මේ වෙන කොට අපිට අපේ රටේ කොරෝනා වසංගතය අවම හානියක් සහිතව පාලනය කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නෙ. පාර්ලිමේන්තුවත් නැති වෙලාවක, පළාත් සභාත් නැති වෙලාවක මේ දරුණු ව්‍යසනය මැනවින් පාලනය කර ගත්තේ මේ විධායක ජනාධිපති ක්‍රමය නිසයි. ඇමරිකානු ජනාධිපතිවරයාට කොරෝනා පාලනය කර ගන්න බැරිව තිබෙන්නෙ ඔහු කියන දේ අහල වැඩ කරන්න ප්‍රාන්ත ආණ්ඩුකාරවරු අකමැති වීම නිසයි. ඉන්දියාවේ කොරෝනා පාලනය කරන්නත් අසීරු වී තිබෙන්නෙ මේ බලය මධ්‍යගත වීමේ ක්‍රමය තුළ තිබෙන යම්යම් අඩුපාඩු නිසයි. නමුත් අපිට විධායක ජනාධිපති ක්‍රමය තුළ එක නියෝගයකින් රටේම අවධානය ලබා ගන්න පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ නිසා තමයි අපි අද කොරෝනා පාලනය අතින් ජයග්‍රහණ ලබා ගෙන තිබෙන්නෙ. අපේ රටේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා නම් අනිවාර්යයෙන්ම අපේ ආණ්ඩුක්‍රම ව්‍යව-ස්ථාවෙ 13 වන සංශෝධනයත් ඉවත් කළ යුතුමයි. ඒ වගේම කොට්ඨාස ක්‍රමයට මැතිවරණය පැවැත්වෙන්න ඕන. එහෙම නැතිව ඒවා එහෙම තිබියදී විධායක ජනාධිපති ධුරය අහෝසි කළොත් අපේ මේ රාජ්‍යය තීරණ ගන්න බැරි අව්චාරුවක්, අස්ථාවර රාජ්‍යයක් වෙන්න පුළුවන්.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා 2015 පරාජයට පත්වීමෙන් පසුව ඔහු නැවත සක්‍රිය දේශපාලන ප්‍රවාහයට එක්කර ගන්න මහින්ද සුළඟ නුගේගොඩදී ආරම්භ වුණේ පෙබරවාරි 18 වැනිදා. ඊට පෙර ජනවාරි 10 හෝ 11 කොළඹදී පැවැත්වූ මාධ්‍ය හමුවකදී අපි මහින්ද නැවත දේශපාලනයේ සක්‍රිය කරන බවට ප්‍රතිඥා දුන්නා. ඒ වෙනකොට ජනතාව කාල්ටන් වලට යන්න පටන් අර ගෙන තිබුණෙත් නෑ. එවැනි පසුබිමක තමයි අපි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාට යෝජනා කළේ; නැවත ජනතාව සක්‍රිය දේශපාලනයට පෙළ ගස්වන්න ඕන කියල. එදා මට මහින්ද මහත්තයා කීවෙ ශ්‍රී ලංකාකාරයෝ පරාද වුණාම නැවත නැගිට්ටවන්න අවුරුදු පහක් වත් යනවා කියලා. ඒ තත්ත්වය එදා වෙනස් කියල අපි තේරුම් ගත්තේ සිංහල ඡන්දදායකයන් ගෙන් බහුතරය එදා ඡන්දය පාවිච්චි කරලා තිබුණේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට වීම නිසයි. ඒ නිසා තමයි නැවත මහින්ද රාජපක්ෂ සක්‍රිය දේශපාලනයට එකතු කර ගැනීමේ ශක්තියක් ඇති වුණේ. ඒ සමඟ ආරම්භ කළ මහින්ද සුළඟ සමඟ අපට නොයෙක් තාඩන පීඩන ඇති වුණා. හිර ගෙවල්වල ලගින්නත් වුණා. එහෙම වුණත් ඒ සටන අපි අත නොහැර දිගින් දිගටම අරගෙන ගිය නිසා තමයි ඊනියා යහපාලන ආණ්ඩුව වසර හතරකට සීමා කරන්න අපිට පුළුවන් වුණේ.

රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව ආරම්භයේ ඉඳලම මේ රටට හොඳ දෙයක් කරල නෑ. ඇක්ෂා ගිවිසුම අත්සන් කිරීමෙන් සිදු කළ හානිය තවමත් රටට දරා ගන්න බෑ. සහරාන්ලාගේ මිනීමැරුම්වලට ඒ රජය ඉඩ දුන්නෙ නිකං නොවෙයි. ඒ පිටුපස්සේ විශාල කතාවක් තියෙනවා. අද පොලිසියේ ඉහළ නිලධාරීන් කරන පාපොච්චාරණවලින් පැහැදිලි වෙනවා; එදා මේ පරීක්ෂණ යට

ගහන්න කටයුතු කළේ කොහොමද කියලා. මේ සියලු අනතුරු කල් තියාම අපි දැකල රටට ආදරේ කරන බහුතර ජනතාව දැනුමෙන් සන්නද්ධ කරලා අපි ජනාධිපතිවරණයට 2019 මුහුණ දුන්නාම මෙරටේ අන්තවාදී සියලු බලමුළු පෙරළා ගෙන දේශහිතෛෂී ජාතිකවාදී බලවේග ගෝඨාභය රාජපක්ෂ මෙරටේ විධායක ජනාධිපති ලෙස පත් කර ගන්න සමත් වෙනවා. ඒ විදියට තමයි අපි යහපාලන ආණ්ඩුව අවසන් කළේ.

ශ්‍රීලනිපයේ බලය මෛත්‍රීපාල සිරිසේන වෙත මාරු වීමත් සමඟ පසුගිය මහ මැතිවරණයේදී අපිට ජයග්‍රහණය කරන්න තිබුණ ඉඩ පිළිබඳව අපිට සැකයක් තිබුණා. ඒ නිසා තමයි මමත් උදය ගම්මන්පිලත් දෙන්නාම මහ මැතිවරණයට වෙනම තරග කරන්න යෝජනා කළේ. නමුත් වැඩි දෙනාගේ මතය වුණේ ශ්‍රීලනිපය නැතුව තරග කළොත් අපිට ජය ගන්න බැරි වෙයි කියලයි. ඒ නිසා අවසානයේදී අපිත් ඔවුන් එක්ක එකට තරග කරන්න තීරණය කළා. ඒ මහ මැතිවරණයේදී අපි ලොකු පාඩමක් ඉගෙන ගත්තා. ඒ පාඩම අනුව තමයි මෙරටේ අතරමං වූ ශ්‍රීලනිප පාක්ෂිකයන් ඇතුළු සියලු දේශ හිතෛෂීන්ට එකතු විය හැකි පරිදි බැසිල් රාජපක්ෂ විසින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නිර්මාණය කළේ. එසේ නොවන්නට අපට පළාත් පාලන මැතිවරණය හෝ ජනාධිපතිවරණය ජයග්‍රහණය කිරීම අභියෝගයක් වෙන්නට තිබුණා.

# ඕනෑම මොහොතක.....

71 වැනි පිටුවෙන්

ආණ්ඩුවක් හදා ගෙන ඉතිරි පිරිස විපක්ෂයේ වාඩිකරවලා විපක්ෂයේ බහුතරය පෙන්නලා ඒ අයට විපක්ෂ නායක හා විපක්ෂයේ සංවිධායක ධුරයත් ලබා දෙන්න පුළුවන්. එහෙම වුණොත් පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදයට මොකද වෙන්නෙ? ඒ නිසා අපි ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරල තිබෙනවා කියල ඕනෑම කෙනෙකුට අවබෝධ කර ගන්න පුළුවන්. නමුත් දින 51 ආණ්ඩුව පිහිටවූ වෙලාවෙ එතෙක් ආණ්ඩුව සමඟ සිටි එජනිස මන්ත්‍රීවරු විපක්ෂය නියෝජනය කරන්න ආවාම අපි අපේ විපක්ෂයේ තනතුරු අතහැරල ඒ අයට බාර දුන්නා. ඒ හැම මොහොතකම අපි පාර්ලිමේන්තු සම්ප්‍රදාය ආරක්ෂා කරලා පාර්ලිමේන්තුවේ ඇති විය හැකිව තිබූ විකෘතිය වළක්වා තිබෙනවා.

පාර්ලිමේන්තුවේ අපි ප්‍රශස්ත විපක්ෂය ලෙස කටයුතු කළා. ඒ වගේම පාර්ලිමේන්තුවේ ප්‍රබන්ධ විපක්ෂයක් ක්‍රියාත්මක වුණා. අපි *MCC* ගිවිසුමේ අන්තර්ගත ඇත්ත කාරණා සම්බන්ධයෙන් අපේ විරෝධය ප්‍රකාශ කරන විට ඒ අය *MCC* ගැන ප්‍රබන්ධයක් ගොඩනැඟුවා. සීගිරියට යන්න වීසා ගන්න වෙනවා කීවා; ජය ශ්‍රී බෝ සමිඳු වඳින්න වීසා ගන්න වෙනවා; ආර්ථික කොරිඩෝවක් හැදෙනවා; ඉඩම් අක්කර ලක්ෂ 12ක් රුපියල් 180 ගානේ ඇමරිකාවට දෙනවා වැනි බොරු කාරණා ප්‍රබන්ධ විපක්ෂය විසින් සමාජ ගත කළා. ඒ අනුව රාජපක්ෂ කඳවුර සමත් වුණා සත්‍ය එක් කාරණයක් වටා විශාල ප්‍රබන්ධයක් ගොඩනඟන්න. නමුත් අපි ප්‍රබන්ධයේ කොටස්කරුවන් වුණේ නෑ. ඒ නිසා විවිධ චෝදනා අපිට එල්ල වුණා.

ජව්පෙ නිරාගමික සමාජයක් ගොඩනගන්න පිඹුරුපත් සකස් කරනවා යැයි චෝදනා ගොනු කරන අය අද අපේ ආගම් පරිහානියට පත් වීමට බලපා ඇති ප්‍රධාන කාරණා ගැන අවධානය යොමු කර නෑ. ඇත්තටම අපේ ආගම්වල පරිහානියේ ප්‍රධාන සාධකය ආගම් දේශපාලනයට සම්බන්ධ කර ගැනීමයි. මමත් මගේ පක්ෂයත් කිසිවිටක ආගම දේශපාලන න්‍යාය පත්‍රයේ කොටසක් කර ගන්නෙ නෑ. ඒක තමයි ආගමට අපිට ලබා දෙන්න පුළුවන් උත්තරීතරභාවය හා ගෞරවය කියලයි අපි හිතන්නෙ. එහෙම වුණත් අපේ රටේ පරාජිත දේශපාලනඥයන් තර්කන නැති වූ විටක ඔවුන් හැංගෙන තැන තමයි ජාතිය හා ආගම කියන තැන්. අද සිදුව තිබෙන්නෙ එයයි.

අප ඉදිරිපත් කර තිබෙන්නේ ඉතාම සරල භාෂාවෙන් ලියන ලද ප්‍රතිපත්ති මාලාවක්. නමුත් අපේ රටේ තිබෙන තත්ත්වය තමයි අපි සහභාගී වන රූපවාහිනී වැඩ සටහන් මාධ්‍ය සාකච්ඡා ආදියේදී ඒ සඳහා ලැබෙන කාලයෙන් අඩකට වඩා වෙන් කෙරෙන්නේ අපේ සතුරන් විසින් ගොඩ නඟන ප්‍රබන්ධ නැවත නැවත මතු කර කතා කිරීමටයි. එයින් අපි හති වැටිල ඉන්නෙ. එකම ප්‍රශ්නයට මම මේ වන විට වාර කිහිපයක් උත්තර දීල තිබෙනවා.

ඉස්සෙල්ලාම අපි සම්මුතියක් ඇති කර ගන්න ඕන. ඒක තමයි වසර 72ක් තිස්සේ මෙරට පාලනය කළ අසාර්ථක පාලකයන් අපේ රට අසාර්ථකත්වයේ හිනි පෙත්තට ගෙන ගිය බව. ඒ ගැන අපි අතර විවාදයක් තිබෙන්නට ඕන. ඒ සමඟ මේකෙන් ගොඩ එන මාවත කුමක්ද කියලත් අපි අතරේ සංවාදයක් ඇති විය යුතුයි. ඒ සංවාදය මගින් අපිට සාධනීය කරුණු මතු කර ගන්න පුළුවන්. එසේ මතුකර ගත් කරුණු හතරක් අපි සතුව තිබෙනවා. එහි පළමුවැන්න තමයි ආණ්ඩුවක් විසින් පුරවැසියාට තිබෙන වගකීම. දෙවැන්න රජයක් විසින් සමාජයට තිබෙන වගකීම. තෙවැන්න රජයක් විසින් මව්බිමට තියෙන වගකීම. ඒ වාගේම රාජ්‍ය පාලනය කරන්නන්ගේ වගකීම යන කාරණා පදනම් කර ගෙන සංයුක්ත වැඩ පිළිවෙලක් අපි ඉදිරිපත් කරල තිබෙනවා.


ඒ අනුව පුද්ගලයන්ට ආදායම් මාර්ගයක්, නිවාසයක්, හොඳ අධ්‍යාපනයක්, නිරෝගී සම්පන්න ජීවිතයක් හා මානසික නිදහසක් යන කාරණා රජයක් විදියට පුද්ගලයාට දිය යුතුයි. ආණ්ඩුවට සමාජයට වගකීමක් තිබෙනවා; සමාජ ආරක්ෂාව, නීතියේ විධාන සාධාරණව ඉටු වීම, මත්ද්‍රව්‍ය, වාහන අනතුරු, මංකොල්ල කෑම් වැනි අපරාධ කාර්යයක්. ආණ්ඩුව මව්බිම ආරක්ෂා කළ යුතුයි. මව්බිම ආරක්ෂා වෙන්නට නම් හොඳ ශක්තිමත් ජාතික ආර්ථිකයක් ගොඩ නඟන්න ඕන. ලෝකයේ ඇතිව තිබෙන ප්‍රතිවිරෝධතා හොඳින් කළමනාකරණය කර අපි අපේ තැන හදා ගන්න ඕන. ඒ වාගේම පරිසර පද්ධතීන් ද අපි රැක ගන්න ඕන. අවසන් කාරණයේදී වංචාවෙන් නාස්තියෙන් දූෂණයෙන් තොර වැඩ පිළිවෙළක් සකස් විය යුතුයි.

පසු ගිය පාර්මේන්තුවේ සිටි සංඛ්‍යාවට වඩා වැඩියෙන් අපේ නියෝජිතයන් පිරිසක් පත් කර ගැනීමේ අපේක්ෂාවෙන් යුතුව අපි ජනතාව දැනුම්වත් කරමින් සිටිනවා. ඒ වාගේම අපේ රටේ ඇත්ත දේශපාලනය අගෝස්තු 5දායින් පසුව බලා ගන්නත් පුළුවන් කියල මම විශ්වාස කරනවා.

අපිට කැලෑ පොලිසියක හෝ කැලෑ අධිකරණයක ක්‍රියාවලියකට යන්න බෑ. එහෙම නම් ඒ චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණ කළයුතු වන්නේ ඒ සඳහා තිබෙන ආයතනයි. ඒ ආයතන සියල්ලත් දූෂිතයි. ඒ ආයතන මෙහෙයවන පාලකයාත් දූෂිතයි. මේ ක්‍රියාදාමය හරහා එක සරල සත්‍යයක් තිබෙනවා. ඒක තමයි දූෂිතයෙක් තවත් දූෂිතයකුට දඬුවම් දෙන්නෙ නෑ කියන එක.

අපිටත් ඉතා ඉක්මණින් මේ තත්ත්වය නිවැරදි කරන්න අවශ්‍යතාව තිබෙනවා. නමුත් ඒක අපේ කැමැත්තට පමණක් කරන්න බෑ. ඒ සඳහා මේ රටේ බහුතර ජනතාව සූදානම් විය යුතුයි. ජනතාව ගේ දායකත්වය ලැබෙන ඕනෑම මොහොතක අපි සූදානම් රට බාරගෙන නිවැරදි දිශානතියට ගමන් කරවන්න.

(පුවත්පත් සාකච්ඡාවක් ඇසුරෙනි)



twitter.com

# ආගම හෝ ජාතිය මුල් කරගෙන දේශපාලනය නොකළ යුතුයි

## ආචාර්ය **පූජ්‍ය බද්දේගම සමිත හිමි**

**පසුගිය ජනාධිපතිවරණය, ලාංකීය සමාජයේ කලක සිට පැවතුණු බෙදුම් රේඛා තවදුරටත් ප්‍රබලව සලකුණු කළ මැතිවරණයක්. සුළුතර ජනවර්ගවල විශ්වාසය දිනාගැනීම සඳහා රජය පාර්ශ්වයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු වී තිබෙනවාද?**

පසුගිය මැතිවරණයේ ප්‍රතිඵලය තේරුම් ගත යුත්තේ ඒ මොහොතේ පැවතුණු දේශපාලන සංධානගතවීම් අනුවයි. ඒ දිහා බලලා රටේ ජනවර්ග අනුව බරපතළ බෙදීමක් ඇති වුණා යැයි නිගමනය කරන්න බැහැ. ***ජනාධිපතිවරණය ජයග්‍රහණය කිරීමෙන් පසුව දිව්රුම් දීමේ අවස්ථාවේදී රුවන්වැලිසෑය ඉදිරිපිට ජනාධිපතිතුමා කළ කතාව සම්බන්ධයෙනුත් විවිධ විවේචන පළ වුණා. බොහෝ දෙනා එය දුටුවේ ජනවාර්ගික සංහිඳියාවට හානිකර, අසුබවාදී ප්‍රකාශයක් ලෙසයි. නමුත් මා දකින්නේ එය එතුමාට දැනුණ දේ අවංකව ප්‍රකාශ කිරීමක් හැටියටයි. එකක් හිතේ තියාගෙන එකක් නොකියා සැබැවින්ම මහ පොළොවේ යථාර්ථය ගැන කළ ප්‍රකාශයක්. මා දෙමළ හා මුස්ලිම් සුළුතර ප්‍රජාවන් සමග ඉතාම සමීපව කටයුතු කරන කෙනෙකු හැටියට ඔවුන් එය වටහාගත් ආකාරය ගැන අවබෝධයක් තිබෙනවා.*** මුලදී යම් සැක සංකාවක් ඇති වී තිබුණත් මේ වන විට ඔවුන් වටහාගෙන තිබෙනවා අවිශ්වාසය නිසා තමන් අතින් ඓතිහාසික වරදක් සිදු වූ

බව. මා තුළ විශ්වාසයක් තිබෙනවා මෙවර මැතිවරණයේදී ඔවුන්ගේ තීරණය බෙහෙවින්ම වෙනස් වන බව. මා එසේ කියන්නේ විශේෂයෙන්ම ගාල්ලේ මුස්ලිම් ජනතාව ඇසුරෙන් ලද අත්දැකීමෙන්. ඒ නිසා මා විශ්වාස කරන්නේ ඒ බෙදුම් රේඛාව තවදුරටත් ප්‍රබලව පවතින්නේ නැති බවයි.

**යුද්ධයෙන් දශකයකට වැඩි කාලයක් ගත වී ඇතත් ශ්‍රී ලංකාවේ දේශපාලනය තවමත් ඒ වටා එක තැන කැරකෙන ස්වභාවයක් දක්නට ලැබෙනවා. උතුරට මෙන්ම දකුණටද මේ තත්ත්වය පොදුයි. මින් ඔබ්බට යෑමට කවර මාවතක් ගත යුතුද?**

මා හිතන්නේ ඔය කියන තත්ත්වය දැනටමත් වෙනස් වෙමින් පවතින බවයි. ***දෙමළ ජනතාව තේරුම් අරන් තිබෙනවා කිසි දවසක ප්‍රචණ්ඩත්වයෙන් හා ත්‍රස්තවාදයෙන් නැවත විසඳුමක් ලබා ගත නොහැකි බව. එල්ටීටීඊයට නැවත කිසිදා හිස එසවිය නොහැකි බව. ඒ වගේම පවතින රජය සමග සහයෝගයෙන් ගැටලු විසඳාගත යුතුය යන අදහසත් ජනතාව අතරින් මතු වී තිබෙනවා.*** දේශපාලන පක්ෂ තුළත් එවැනි අභ්‍යන්තර සාකච්ඡාවක් ඇති වෙමින් තිබෙනවා. සුළු ජාතීන්ගේ ඡන්ද ඇතත් නැතත් ජනාධිපතිවරණයකින් ජය ගැනීමට හැකි බව පසුගිය ජනාධිපතිවරණයේදී පළමු වරට තහවුරු වුණා. අප කැමති වුණත් නැතත් එය යථාර්ථයක්. මා හිතන්නේ සුළුතර පක්ෂවල දේශපාලන න්‍යායපත්‍රයේ පැහැදිලි වෙනසකට මේ සාධකය හේතු වේවි. මා ඒ දෙස බලන්නේ සුබවාදී අර්ථයෙන්. ජනාධිපතිවරයකු පත් කර ගැනීමට හෝ පාර්ලිමේන්තුවක් පත් කර ගැනීමට ඔවුන්ගේ සහාය ඇතත් නැතත් හැකි බව ඔප්පු වී තිබෙන තත්වයක් තුළ පැරණි දරදඬු ස්ථාවරවල රැඳී සිටීමට නොහැකි වන බව පැහැදිලියි.

එල්ටීටීඊය හෝ උතුරේ දේශපාලන පක්ෂ දෙස විචාරශීලීව බලන්නට උතුරේ ජනතාවට අද හැකි වී තිබෙනවා. තවදුරටත් පැරණි අච්චුවේම පවතින්නට නොහැකි බව එම දේශපාලන පක්ෂවලටත් ඉක්මනින්ම අවබෝධ වේවි. ටීඑන්ඒ එක එල්ටීටීඊයේ උවමනාවන් අනුව කටයුතු කිරීම පිළිබඳව දැඩි විවේචනයක් තිබෙනවා. ආනන්ද සංගරී වැනි අය මේ මතය ප්‍රබලව දෙමළ සමාජය තුළ ගෙන යනවා. තරුණ පරපුර තුළත් තදබල මතයක් තිබෙනවා, ටීඑන්ඒ සංවිධානය ඔවුන් රැවටූ බවට. ඒ නිසා දකුණේ අප කළ යුත්තේ දෙමළ ජනතාව සමග වඩා සමීපව සම්බන්ධ වී ඔවුන්ගේ කැකෑරෙන ප්‍රශ්නවලට ස්ථිරසාර විසඳුම් ලබා දීමට කටයුතු කිරීමයි. ඔවුන්ට කිසිසේත්ම දෙවෙනි පුරවැසියන් ලෙස නොසලකන බවට සිංහල සමාජය ඔප්පු කිරීම තුළ අපට ක්‍රමානුකූලව විසඳුම් ඉදිරිපත් කිරීමෙන් සංහිඳියාව පිළිබඳ මතය වඩා ඉහළට ගතහැකි බව මා විශ්වාස කරන කාරණයයි. මතවාදීව මෙන්ම භාවිතයෙනුත් මා අනුගමනය කරන්නේ එම පිළිවෙතයි.


**ටීඑන්ඒ සංවිධානය ඔවුන් රැවටූ බවට. ඒ නිසා දකුණේ අප කළ යුත්තේ දෙමළ ජනතාව සමග වඩා සමීපව සම්බන්ධ වී ඔවුන්ගේ කැකෑරෙන ප්‍රශ්නවලට ස්ථිරසාර විසඳුම් ලබා දීමට කටයුතු කිරීමයි. ඔවුන්ට කිසිසේත්ම දෙවෙනි පුරවැසියන් ලෙස නොසලකන බවට සිංහල සමාජය ඔප්පු කිරීම තුළ අපට ක්‍රමානුකූලව විසඳුම් ඉදිරිපත් කිරීමෙන් සංහිඳියාව පිළිබඳ මතය වඩා ඉහළට ගතහැකි බව මා විශ්වාස කරන කාරණයයි.**


**ජාතීන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය හා සහජීවනය ගොඩනැංවීම උදෙසා ඉදිරියේදී පත් වන පාර්ලිමේන්තුවට පැවරෙන කාර්යභාරය කෙබඳුද?**

ඊළඟ පාර්ලිමේන්තුවේ ප්‍රමුඛ වගකීමක් විය යුත්තේ සහජීවනයෙන් සහ විශ්වාසයෙන් යුතු සමාජයක් ගොඩ නැගීමට අවශ්‍ය පසුබිම සැකසීමයි. එයට න්‍යාය පත්‍රයේ ප්‍රමුඛතාව ලබා දී සියලු ජනතාවට ඒකරාශී වී 'මේ මගේ රටයි' කියන හැඟීමෙන් කටයුතු කරන්නට දිරි දීම ඊළඟ පාර්ලිමේන්තුවේ වගකීම විය යුතුයි. විශේෂයෙන්ම 2050 වෙද්දී ලෝක බලවතා බවට පත්වෙන්නේ චීනය. ඉන්දියාව ඊළඟ බලවතා බවට පත්වෙනවා. ඒ සඳහා රට සූදානම් කරවීමේදී ජාතික සංහිඳියාව සහ ආගමික සහජීවනය වැදගත්ම කාරණාව බව අවබෝධ කර ගත යුතුයි. ඒ වගේම අන්තවාදය පිටුදැකීමත් අත්‍යවශ්‍ය කාරණයක්. වර්තමාන ජනාධිපතිවරයා මේ කාරණය ඉතාම බුද්ධිමත්ව වටහා ගෙන සිටිනවා. ඒ වගේම බංග්ලාදේශයෙන් ලබා දුන් උදාහරණය ඉතා වටිනා එකක්. හේතුව බංග්ලාදේශය ඉතාම පසුගාමී, දුප්පතුන්ගෙන් පිරී ගිය, අන්තවාදී මුස්ලිම් ආගමික චර්යා නීතිය අනුව පාලනය වන සමාජයක් බවට පත් වී තිබීමයි. දිළිඳුකමින් ඔවුන් දැඩි ලෙස බැට කෑ බව ප්‍රකට කරුණක්. ඒ නිසා අන්තවාදය ප්‍රතික්ෂේප කිරීම සංවර්ධනයේ අඩිතාලම බවට පත්වෙනවා. අරමුණ සංවර්ධනය නම් ජාතීන් අතර සහජීවනය සහ ආගමික සංහිඳියාව අපේ න්‍යාය පත්‍රයේ ප්‍රමුඛම කාරණය විය යුතුයි.

**පාර්ලිමේන්තුවේ භික්ෂු නියෝජනයේ ආරම්භය සලකුණු කළේ ඔබවහන්සේ. ඉන් පසුව එය රැල්ලක් බවට පත් වී ජනතාවගෙන් ප්‍රතික්ෂේප වුණා. මෙය ඔබවහන්සේ අර්ථදක්වන්නේ කොහොමද?**

පාර්ලිමේන්තුවේ භික්ෂු නියෝජනය ආරම්භ කළේ මා බව සත්‍යයක්. එහෙත් ඉන් පසුව ඇති වූ භික්ෂු දේශපාලන රැල්ල මා අනුගමනය කළ දේශපාලන ප්‍රතිපත්තිවලට හාත්පසින්ම වෙනස්, තාවකාලික එකක්. එය නොබෝ කලකින් ජනතාවගෙන් ප්‍රතික්ෂේප වුයේ එය කිසියම් පිරිසකගේ න්‍යායපත්‍රයකට භික්ෂූන්වහන්සේලා නතු වීමක් බව ජනතාවට හෙළිදරව් වූ නිසයි. ඔවුන් සිංහල ජාතිය සහ බුදු දහම වෙනුවෙන් පෙනී සිටින බව අඟවමින්, ආගමික අවස්ථා හා සංකේත භාවිත කරමින් බුදු දහමට සපුරා පටහැනි අන්තවාදී මත සමාජගත කළා. එම දේශපාලනයට අත් වූ ඉරණම, එවැනි අන්තවාදවලට දිගුකල් පැවැත්මක් නැති බව



පාර්ලිමේන්තු ආසන 9ක් දිනාගත් ජාතික හෙළ උරුමයේ භික්ෂු මන්ත්‍රීවරු

**පාර්ලිමේන්තුවේ භික්ෂු නියෝජනය ආරම්භ කළේ මා බව සත්‍යයක්. එහෙත් ඉන් පසුව ඇති වූ භික්ෂු දේශපාලන රැල්ල මා අනුගමනය කළ දේශපාලන ප්‍රතිපත්තිවලට හාත්පසින්ම වෙනස්, තාවකාලික එකක්. එය නොබෝ කලකින් ජනතාවගෙන් ප්‍රතික්ෂේප වූයේ එය කිසියම් පිරිසකගේ න්‍යායපත්‍රයකට භික්ෂූන්වහන්සේලා නතු වීමක් බව ජනතාවට හෙළිදරව් වූ නිසයි.**

තහවුරු කරන කදිම නිදර්ශනයක්.

මා දරන දේශපාලන මතය ඊට හාත්පසින්ම වෙනස් එකක්. මා දැඩිව විශ්වාස කරන්නේ අප ආගම හෝ ජාතිය හෝ මුල් කරගෙන දේශපාලනය නොකළ යුතු බවයි. ජාතිවාදය හෝ ආගම්වාදය මා කිසි දවසක දේශපාලන වාසි සඳහා යොදා ගත්තේ නැහැ. ඇත්තෙන්ම පෙර කී රැල්ල මතු වූ අවස්ථාවේ මගේ පාර්ලිමේන්තු නියෝජනය අහිමි වූයේත් මා රැල්ලට නොගොස් නිවැරදි ස්ථාවරයේ නොසැලී සිටි නිසයි. භික්ෂුවගේ කාර්යභාරය අනුව ආගමික සංහිඳියාව ජාතික සංහිඳියාව මුල්කරගෙන කටයුතු කළොත් එය හඳුන්වන නම දේශපාලනය හෝ අන් කුමක් හෝ වේවා, අනිවාර්යයෙන්ම එය ජනතාව ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ඒ වගේම යටත් විජිතවාදීන්ට එරෙහි විමුක්ති අරගලය මෙහෙයවීමේදී භික්ෂූන් වහන්සේ ගත් ක්‍රියාමාර්ගය නව අධිරාජ්‍යවාදයට එරෙහිවද ගත යුතු යැයි මා තදින්ම විශ්වාස කරනවා.

**ගැටුම් කළමනාකරණය පිළිබඳව බෞද්ධ දර්ශනය විශිෂ්ටාදර්ශ සපයනවා. පවතින තත්ත්වයන්ට එය ප්‍රායෝගිකව ආදේශ කර ගත හැක්කේ කෙසේද?**

බුදුන්වහන්සේ ලොව සියලු ආගමික නායකයන් අතර අසහාය තත්ත්වයකට පත් වන්නේ උන්වහන්සේ ක්‍රිස්තු පූර්ව 6වන සියවසේ සිට ලෝකය දෙස බලා දේශනා කළ කාරණා සර්වකාලීන අගයක් ගත් නිසයි. ලෝකය පුරාම බුදුදහම දැඩි ගෞරවයට පාත්‍ර වීමට එය හේතු වුණා. "නහි වේරේන වේරානී" යන්නෙන් උන්වහන්සේ ප්‍රචණ්ඩත්වය සහ වෛරය පැහැදිලිවම ප්‍රතික්ෂේප කළා. යුද්ධය කිසිසේත්ම විසඳුමක් හැටියට උන් වහන්සේ පිළිගෙන නැහැ. එමෙන්ම සියලු ආගමිකයන් අනුන්ගේ ආගම්වලට නිගරු කිරීම තම ආගමට නිගරු කිරීමක් හැටියට උන්වහන්සේ දේශනා කොට තිබෙනවා. ජලය බෙදා ගැනීමේදී ශාක්‍ය කෝලියයන් අතර ඇති වූ යුද්ධය වැළැක්වීමට උන්වහන්සේ ගත් ක්‍රියාමාර්ගය කොතරම් ප්‍රායෝගික උදාහරණයක්ද? එම නිසා බෞද්ධයකුට කිසිසේත්ම යුධමය විසඳුමකට එකඟ වීමට හැකි නොවන මානසිකත්වයක් බුදුන් වහන්සේ ගොඩ නගා තිබෙනවා. ප්‍රචණ්ඩත්වය කිසිදිනක අනුමත නොකරන උන් වහන්සේ තම ශ්‍රාවකයින්ට සාමකාමී විසඳුම සෙවීම සඳහා කැප වන ලෙසට අවවාද කර තිබෙනවා. සැබෑ බෞද්ධයන් කළ යුත්තේ මේ අනුව ලෝකය දෙස බලා ඒ දර්ශනය ක්‍රියාත්මක කිරීමට කැපවීමයි. භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය විය යුත්තේ බුදු දහමේ හරය ලෝකයට අවබෝධ කර දීම මිස ව්‍යාජ 'සිංහල බෞද්ධකමක්' පිළිබඳව පෙනී සිටීම නොවෙයි. වඩා පුළුල් ලෙස ලෝකය දැක, මේ තිබෙන ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිවිපාක ප්‍රායෝගිකව අවබෝධ කරගත් පිරිසක් හැටියට තම අනුගාමිකයන්ට බුදුන්ගේ සැබෑ පණිවිඩය අවබෝධ කර දීමට භික්ෂූන්වහන්සේලා කැප විය යුතුයි.

**නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි මහජන විශ්වාසය මෙතරම් පහත වැටුණු වකවානුවක් නැති තරම්. සමස්ත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය එයින් අභියෝගයට ලක්ව තිබෙනවා. මේ තත්ත්වයට පිළියම් වශයෙන් කුමක් කළ යුතුද?**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පරමාධිපත්‍ය බලය ජනතාව සතුයි. පාර්ලිමේන්තුවට නියෝජිතයන් පත් කරන ජනතාව බලාපොරොත්තු වන අරමුණ නම් තමන් වෙනුවෙන් ඔවුන් පෙනී සිටීමයි. එහෙත් මේ සැබෑ අරමුණ පසුගිය කාලයේ බලවත් ලෙස අභියෝගයට ලක් වුණා. මන්ත්‍රීවරයා ජනතාවගේ පරමාධිපත්‍යයේ බලය බොරු පොරොන්දු මඟින් ලබා ගත් පසු එය තමන්ට ඕනෑ හැටියට පරිහරණය කළ හැකි දේපළක් ලෙස සලකා ජනතා මතයට එරෙහිව තනතුරු මිල මුදල් සඳහා විකුණා දමන තත්වයක් උදා වුණා. මේ පිළිබඳව ජනතාව තුළ සැබෑ කලකිරීමක් ඇති බව අප පිළිගත යුතුයි. නැවත ඒ විශ්වාසය දිනා ගැනීමට හා සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය සමාජය තුළ පිහිටුවීමට නම් තම ජනතා නියෝජිතයා ජනතාවගේ විශ්වාසය කඩ නොකළ යුතුය. මහජන නියෝජිතයාගේ යුතුකම ජනතාවගේ මතය නියෝජනය කිරීම බව අවංකව පිළිගන්නා තෙක් ජනතා විශ්වාසය ඔවුන් කෙරෙහි දිනා ගන්න බැහැ. එම නිසා ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන මහජන නියෝජිතයන් මහජන මතය විකෘති කිරීමෙන් වැළකීම සිල් පදයක් ලෙස ආරක්ෂා කළ යුතුයි.

සංවාද සටහන:
**සමන් සී ලියනගේ**



dailynews.lk

# එදා නුගේගොඩ රැල්ල ආරම්භ කළේ ඒකීය රාජ්‍යය රැකගන්නයි

**මහජන එක්සත් පෙරමුණේ නායක**
**දිනේෂ් ගුණවර්ධන**

> **මේ යුගයේ ඉල්ලීම උගත් සමාජයක්. ජනතාවගේ විශ්වාසය උගතුන්, බුද්ධිමතුන්, වෘත්තිකයන් පාර්ලිමේන්තුව තුළ ජාතික කාර්යභාරයක් ඉටු කරනු ඇති බවයි.**

මහජන නියෝජිතයාගෙන් ජනතා අපේක්ෂා ඉටු නොවන්නට එක් හේතුවක් තමයි ශක්තිමත් ස්ථාවර ආණ්ඩු නොතිබීම, ඇත්තටම ශක්තිමත් ස්ථාවර ආණ්ඩු නොතිබීම නිසා විශ්වාසයෙන් දෙයක් කිරීමේ හැකියාවක් මහජන නියොජිතයාට නැතිව යනවා. එවන් තත්ත්වයක් තුළ ජනතාව වෙතින් පැමිණෙන කළකිරීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 වෙතම මුදාහැරෙන එක වළක්වාලීමට බැහැ.

කොට්ඨාස ඡන්ද ක්‍රමයෙන් තේරී පත් වූ පාර්ලිමේන්තුව සහ අනුපාත ඡන්ද ක්‍රමයෙන් තේරී පත් වූ පාර්ලිමේන්තුව යන දෙකෙහි එකම කාර්යභාරය ඉටු කළ හැකිද යන ප්‍රශ්නයකුත් තිබෙනවා. මම මේ කියන කාරණය ජනතාව ගැඹුරෙන් හිතන දෙයක් නොවුණත් එහි හිතන්න දෙයක් සහ සැබෑ ප්‍රශ්නයක් තිබෙනවා.

ඒ කෙසේ වෙතත් ජනතාව හිතන 225ම එපා කියන කාරණයේ දී දේශපාලනඥයන් ලෙස නිවැරදි කරගත යුතු බොහෝ දෑ තිබෙන බව මම ද සිතනවා. එහි දී සමාජය පිළිගනු ලබන උගතුන්, වියතුන් ව්‍යවස්ථාදායකය වෙත පැමිණිය යුතුයි.

මේ යුගයේ ඉල්ලීම උගත් සමාජයක්. ජනතාවගේ විශ්වාසය උගතුන්, බුද්ධිමතුන්, වෘත්තිකයන් පාර්ලිමේන්තුව තුළ ජාතික කාර්යභාරයක් ඉටු කරනු ඇති බවයි.

පාර්ලිමේන්තුව පවත්වාගෙන යෑමට කරනු ලබන අතිවිශාල වියදමට සමාන ඵලදායීතාවයක් ඒ තුළින් රටේ ජනතාව බලාපොරොත්තු වෙනවා.

මම සාමාන්‍යයෙන් අකැමතියි අපි කළ කී දෑ ගැන අපි විසින්ම වර්ණනා කර ගන්න. නොසැලෙන ඒකීය රාජ්‍යය ආරක්ෂා කර කරගැනීම වෙනුවෙන් නොසැලෙන හඬක් හා ක්‍රියාමාර්ග පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටතත් අඛණ්ඩව අරගෙන ඇති බව ජනතාව දන්නා කාරණයක්.

ඇත්තටම මෙම කාර්යභාරය වෙනුවෙන් අපි පහු කළේ ඉතාම අසීරු, කටුක කාල පරිච්ඡේදයන්, අප සමග මන්ත්‍රීවරුන් 8 දෙනකු පමණක් සිටියදී පවා අප නැගූ හඬ ආණ්ඩුවේ හඬ පරදා ගියා. දරුණු භීෂණයක් රට තුළ තිබිය දී පවා අපගේ තරුණ ජීවිත බේරා ගැනීමට කළ මැදිහත්වීම් අපගේ දේශපාලනය මුවහත් කළා. සම්බුද්ධ සාසනයට සහ බුදු දහමට එරෙහිව තිබූ තර්ජනයන්ට එරෙහිව අපි එදත් අදත් නැගී සිටියා, එය ඉදිරියටත් එසේමයි.

***මෙතැන දී මම තව දෙයක් කියන්න ඕනෑ. අපි වැඩ කළේ අපගේ ආසනය බලාගෙන නෙවෙයි. අපගේ ආසනයට අයිති නෑ කියලා අපි ඇස් කන් වහගෙන හිටියෙ නැහැ. අප ප්‍රශ්න හමුවේ පෙනී සිටියේ මුළු ජාතියම නියෝජනය කරමින්, මුළු රටම නියෝජනය කරමින්.***

මම, 1983 මැයි 18 මහරගම අතුරු මැතිවරණයෙන් ජයග්‍රහණය කර දළදා වහන්සේ ඉදිරිපිට ගොස් ප්‍රතිඥාවක් ලබා දුන්නා. ඒ, ඒකීය රාජ්‍යයත්, මාතෘ භූමියත් සම්බුද්ධ ශාසනයත් ආරක්ෂා කරන බවට. එම ප්‍රතිඥාව අදටත් මම ආරක්ෂා කරනවා.

ඇතැම් අසීරු කාල පරිච්ඡේද අප පහු කළා. මව්බිම සුරැකීමේ ව්‍යාපාරය, අභයාරාමයේ දී පැවැත්වූ මැයි දිනය එහි විශේෂ කඩයිම් වුණා.

රට ජාතිය ආගම බේරා ගැනීම සඳහා අප කිනම් සටන් පෙරමුණු ගොඩ නැගුවත් කිසිදා අපි අවි ආයුධ අරගත්තේ නැහැ. සිංහල උද්ඝෝෂණ, සත්‍යග්‍රහණ ඇතුළු අනේකවිධ ක්‍රියාමාර්ග අප ගනු ලැබුවේ අවිහිංසාවාදීවයි.

දේශපාලන පෙරළි රැසකට මුහුණ දුන්නු දේශපාලකයන් අපි. නමුත් අපි අපගේ අරමුණු කිසිම හේතුවකට පාවාදෙන්න තරම් දීන සහ නිවට වුණේ නැහැ.

දේශප්‍රේමී ජනතාව ඇතුළු සුවහසක් වූ ජනතාව තමයි අපගේ ප්‍රධාන සවිය වුණේ. බොහෝ දේශප්‍රේමී නායකයන් අප සමග අත්වැල් බැඳගෙන කටයුතු කළා.

මහින්ද රාජපක්ෂ මහතා පරාජයට පත්වුණේ දේශීයව සහ විදේශීයව කරන ලැබූ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් අනුවයි. කොටි ත්‍රස්තවාදය පරාජය කර රට එක්සේසත් කළ නිසා එම පාලනය ඉවත් කර නැවත පෙඩරල් වාදයට රට ගෙන යන්න කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වුණා. එහි කූටප්‍රාප්තිය තමයි මහින්ද රාජක්ෂ මහතා පරාජය කිරීම. ඇත්තටම "රෙජීම් චේන්ජ්" යනුවෙන් ක්‍රියාත්මක වුණේ ජාත්‍යන්තර සැලසුමක්.

රට එක්සේසත් කළ නායකයා පරාජය කළේ කිනම් කාරණයක් මත ද යන කරුණ අපි නිසි ලෙස අවබෝධ කරගත්තා. ඉදිරියේ දී රට හමුවේ මතුවන තත්ත්වය රටට ඉතාම අවාසිදායක බව අපට පෙනෙන්න තිබූ කාරණයක්. ඒ නිසා තමයි අප ජන බලය ගැන විශ්වාසය තබා එම සැලසුම් ආපස්සට හරවන්න පෙරමුණ ගත්තේ.

ඒ අනුව තමයි නුගේගොඩින් මහින්ද සුළඟ ආරම්භ කළේ. එදා බොහෝ අය යහපාලන ආණ්ඩුවට බය වී, මුළුගැන්වී සිටිය දී අතේ ඇඟිලිවලින් ගැණිය හැකි දේශපාලන නායකයන් පිරිසක් සමග තමයි මෙම සටන අප ආරම්භ කළේ. ඇත්තටම වසර 5කට ආසන්න කාලයක් තුළ අප අපගේ සටන ජයග්‍රහණයෙන් කෙළවර කළේ ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති ධූරයට පත් කරමින්, මහජන බලය යනු කුමක්ද යන්න අප රටට ද්‍රෝහී පිරිසට පෙන්වා දුන්නා.

ඒකාබද්ධ විපක්ෂයේ බලවත්කම නිසා යහපාලන රජය සැලසුම් කර තිබූ රටට එරෙහි බොහෝ සැලසුම් ව්‍යර්ථ වුණා. ඇත්තටම අපෙන් වෙන් වෙලා අනිත් පැත්තට ගිය අයත් අවසානයේ අපිත් එක්ක එකතු වුණා. රට හමුවට පැමිණෙන කුමන හෝ අභියෝගයකට මුහුණ දීමට අප කිසිදා බිය වූවන් නොවේ.

යහපාලන ආණ්ඩුව තුළින් රටට වෙන්න ගිය බොහෝ විනාශයන් අපි වළක්වා අපගේ ජනාධිපතිවරයෙක් පත් කරගෙන අවසන්. දැන් තියෙන්නේ මහින්ද රාජපක්ෂ මහතාගේ අගමැතිත්වයෙන් යුත් ශක්තිමත් ආණ්ඩුවක් බිහි කිරීමයි.

ගෝඨාභය රාජපක්ෂ මහතා ඉතා කාර්යශූර හා වගකීමක් සහිත ජනාධිපතිවරයකු බව ඔහු ඔප්පු කර තිබෙනවා. එතුමා ප්‍රශ්න කල් දමන්නේ නැහැ. ඔහු සතු අත්දැකීම් ඔහු ඉතාමත් හොඳින් භාවිත කරන බව මුළු රටම දන්නා කාරණයක්.

මේ වන විට විපක්ෂයත් දෙකට තුනට බෙදිගින්න වී තිබෙන තත්ත්වයක් තුළ තුනෙන් දෙකක ජයග්‍රහණයක් ලබා ගැනීම අසීරු කටයුත්තක් නොවන බව මගේ හැඟීමයි.

තුනෙන් දෙකක බලය ලබා නොගතහොත් මේ විලම්භීත ආණ්ඩුක්‍රමය තුළ රටට හොඳක් වන්නෙත් නැහැ. තුනෙන් දෙකක බලයක් නොදී රටක් එක තැන පල් වෙන එක හරි වෙන්න බැහැ.


/thinkworth.wordpress.com

# එම්.සී.සී. එදත් අදත් බිල්ලෙක්

**"අපිට එම්.සී.සී. ගිවිසුම එදත් බිල්ලෙක්. අදත් බිල්ලෙක්. අපේ ස්ථාවරය කවදාවත් වෙනස් වෙලා නැහැ. මේ ගිවිසුම අත්සන් කරන්න හදන බවට චෝදනා නගන විපක්ෂය එදා හොර රහසේ අත්සන් කරන්න ගියා. අපි මහ පොළොවේ කරගෙන ගිය දැවැන්ත අරගලය නිසා එය නතර වුණා. දැන් ආණ්ඩු බලය තිබෙන්නේ අපට. ඒ නිසා අපි කිසිසේත්ම එම්.සී.සී. ගිවිසුම අත්සන් කරන්නෙත් නැහැ. අත්සන් කරන්න කාටවත් ඉඩ තබන්නෙත් නැහැ.**

**පිවිතුරු හෙළ උරුමයේ නායක**
**උදය ගම්මන්පිල**

තුනෙන් දෙකේ බලයක් ජනතාව අපට ලබා දුන්නොත් 19 වැනි සංශෝධනය පමණක් නෙමෙයි මේ රටට අහිතකර සංශෝධන ගණනාවකින් පිරී වත්මන් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් අහෝසි කරන්න පුළුවන්. ඒ වෙනුවට ජනතා අභිලාෂයන් පිළිබිඹු වන නව ව්‍යවස්ථාවක් සම්මත කරගන්න පුළුවන්. එක අපේ ප්‍රධාන තේමාවක්. සමානුපාතික ක්‍රමය යටතේ ඉතිහාසයේ කවදාවත් තුනෙන් දෙකේ බලයක් ආණ්ඩුවකට ලැබී නැහැ. ඒක බොහොම අභියෝගාත්මකයි. ඒ අභියෝගය ජයගැනීමට ජනතාව කටයුතු කළොත් පමණාමයි මේ රට වෙනස් කිරීමට ගෝඨාභය ජනාධිපතිතුමාට හැකියාව ලැබෙන්නේ.

ඕනෑම කෙනෙකුට මේ මැතිවරණ ඉලක්කම් හදාගන්න පුළුවන්. ඕනෑම ජනාධිපතිවරණයක් පවත්වා ඒ ආසන්නයේ පවත්වන මහ මැතිවරණයකදී සෑමවිටම ජනාධිපතිවරණය ජයගත් පක්ෂයේ ඡන්ද ප්‍රතිශතය ඉහළ ගොස් තිබෙනවා. ඒක 1989 සිට දකින්න පුළුවන් සත්‍යයක්. පසුගිය ජනාධිපතිවරණයේදී අපි සියයට 52ක් ගත්තා. එහෙම නම් මේ මහ

මැතිවරණයේදී එය තවත් ඉහළ යෑමක් මිස පහළ යාමක් බලාපොරොත්තු වෙන්න බැහැ.

ගෙවුණු මාස පහට ම මෙරටින් හමුවුණේ කොරෝනා රෝගීනා දෙදහසයි. එහෙත්ඉන්දියාවේ දිනගට රෝගීන් 15,000ත් 20,000ත් අතර ගණනක් හමුවෙනවා. සමස්ත ලෝකයම මරණ බියෙන් වෙලී සිටිය දී ශ්‍රී ලාංකිකයන් සැනසුම් සුසුම් හෙළමින් සුපුරුදු දිවි පෙවෙත ගත කරනවා. එනිසා මුළු ලෝකයේ ම රාජ්‍ය නායකයන්ට කර ගැනීමට නොහැකි වූ දෙයක් ලංකාවේ ගෝඨාභය ජනපති කළ බව ලෝක මාධ්‍ය පවා වාර්තා කළා.

පසුගිය රජය අපට දුන්නේ පුස් පැටවකු අවුල් කළ නූල් බෝලයක් හා සමාන රටක්. අද අපි ඒ අවුල් එකිනෙක ලිහමින් සිටිනවා. වරාය අවුල හැදුවේ ගිය ආණ්ඩුවෙන්. අපි දැන් එක ලිහමින් සිටිනවා. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව අරමුදල් සම්පාදනය කරමින් නැගෙනහිර පර්යන්තය දියුණු කරමින් විශාලතම ආදායම් උපයන පර්යන්තය බවට පත්කරමින් සිටියා. ආණ්ඩු පෙරැළියෙන් පසු 2015 පත්වූ ජනපති ජපානයට ගොස් ඒ පර්යන්තය ජපානයට දීමට පොලරාන්දු වුණා. ඒ අතර අගමැති ඉන්දියාවට එය ලබාදීමට පොරොන්දු වුණා. ඒ අනුව ජපානය, ලංකාව සහ ඉන්දියාව හවුලේ සංවර්ධනය කිරීමට සහයෝගීතා ගිවිසුමක් අත්සන් කළා. මේ අතරේ ජයබහලු පර්යන්තය පුළුල් කරන්න යැයි කියමින් ශත පහක ආයෝජනයක් නොකර එහි සවි කිරීමට ඩොලර් මිලියන ගණනක් වැයකර චීනයෙන් දොඹකර ඇණවුම් කළා. එක කළෙත් 2018 වසරෙදීමයි. මෙවැන්නක අවශ්‍යතාවක් තිබී නැහැ. ඒ අනුව මේක කොමිස් ගනුදෙනුවක් බව අපට පේනවා. මේවාට සියලු මුදල් ගෙවලා. හැබැයි ඒ දොඹකර සවිකරන්න ජයබහලු පර්යන්තය පුළුල් කර නැහැ. ඒ නිසා ඒවා නැගෙනහිර පර්යන්තයට සවිකරන්න ආණ්ඩුව තීරණය කළා. එහෙත් ඉන්දියාව විරෝධය පළ කළා. ජාතික සම්පත් විකුණනවාට අපි විරුද්ධයි. මේ ගිවිසුම් සංශෝධනයට කටයුතු කරන අතරතුර දොඹකර ඇවිත් රාජතාන්ත්‍රික ප්‍රශ්නය ඇති වුණා. එහෙත් අපි දැන් ඒ ගැටලුව විසඳා තිබෙනවා.

අපිට එම්.සී.සී. ගිවිසුම එදත් බිල්ලෙක්. අදත් බිල්ලෙක්. අපේ ස්ථාවරය කවදාවත් වෙනස් වෙලා නැහැ. මේ ගිවිසුම අත්සන් කරන්න හදන බවට චෝදනා නගන විපක්ෂය එදා හොර රහසේ අත්සන් කරන්න ගියා. අපි මහ පොළොවේ කරගෙන ගිය දැවැන්ත අරගලය නිසා එය නතර වුණා. දැන් ආණ්ඩු බලය තිබෙන්නේ අපට. ඒ නිසා අපි කිසිසේත්ම එම්.සී.සී. ගිවිසුම අත්සන් කරන්නෙත් නැහැ. අත්සන් කරන්න කාටවත් ඉඩ තබන්නෙත් නැහැ.

මේ ගිවිසුම අත්සන් කරන්න අපට ඕන නම් එය සමාලෝචනය කරන්න ඇමෙරිකානු ඉත්තන්ගෙන් සහ ගැත්තන්ගෙන් සමන්විත කමිටුවක් පත්කරනවා මිස දේශප්‍රේමී සහ අවංක පුද්ගලයකු ලෙස සමාජයේ ගෞරවයට පාත්‍ර වී සිටින මහාචාර්ය ලලිතසිරි ගුණරුවන් ප්‍රමුඛ පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන්නේ නැහැ. ආණ්ඩුවේ අරමුණ කමිටුවෙන් පැහැදිලියි. "පානා හීය පානා අඬහැරෙන් දැනේ" කියනවනේ. එම්.සී.සී. අවලංගු කිරීමට මිස කරගෙන යෑමේ අදහසක ආණ්ඩුව නැති බව කමිටුවේ සාමාජිකයන්ගෙන්ම පැහැදිලියි.

19 වැනි සංශෝධනයෙන් පස්සේ ජනාධිපති සහ අගමැති අතර සමගිය ආණ්ඩුවකට බෙහෙවින්ම තීරණාත්මකයි. ඇමෙරිකාවේ ප්‍රධානතම බුද්ධි මණ්ඩලයක් වන හෙරිටේජ් පදනම ලංකාව සම්බන්ධව නිකුත් කළ වාර්තාවේ දැක්වෙන්නේ ගෙවුණු වසර පහේ ලංකාව එක තැන පල්වුණේ ජනපති සහ අගමැති අතර ගැටුම නිසා බවයි. 19 වැනි සංශෝධනය ගෙනාපු මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයා එක් අවස්ථාවක ප්‍රකාශයක් කර තිබුණා. තමන්ට රට කරන්න බැරි වුණේ අගමැති සමඟ ඇති වූ ගැටුම් නිසා බවත් අයියයි මල්ලියි වගේ කටයුතු කරන දෙදෙනකු මේ තනතුරු නොදැරුවොත් 19 වැනි සංශෝධනය යටතේ රට පාලනය දුෂ්කර බවත් ඔහු කියා තිබුණා. මෙවර මහ මැතිවරණයෙන් පසු මේ රටේ අගමැති වශයෙන් නම් කරන්නේ අයියයි මල්ලියි වාගේ වැඩකරන දෙදෙනකු පමණක් නෙමෙයි. සැබැවින්ම වසර හැත්තෑවකට වැඩි කාලයක් සැබෑ සමගියෙන් වැඩ කර පෙන්වා ඇති සැබැවින්ම අයියයි මල්ලියි වන දෙදෙනකු බව පැහැදිලිවම කියන්න ඕන.

***ගෝඨාභය ජනාධිපතිවරයා මේ රට දියුණු රටක් කරාවි යන විශ්වාසය සැමට ඇති වී තිබෙනවා. එතුමා මේ රටේ ජනාධිපති විය යුතු බව මීට වසර පහකට පෙර මම කිව්වා. මක්නිසාද සිංගප්පූරුවේ ලී ක්වාන් යූගේ දූරදර්ශීභාවයත් මැලේසියාවේ මහතීර් මොහොමඩ්ගේ කළමනාකරණ හැකියාවත් රුසියාවේ පුටින්ගේ නිර්භීතභාවයත් එකට මුසු කළාම බිහිවන්නේ ගෝඨාභය නිසයි. අද මුළු රටම ඒ කතාව විශ්වාස කරනවා. රට දියුණු කිරීම ජනාධිපතිතුමාට තනියම කරන්න බැහැ.***

එතුමාගේ සහයට කාණ්ඩායමක් අවශ්‍යයි. ජනාධිපතිතුමාට අවශ්‍ය එතුමා වගේ සිතන පතන, වැඩකරන පුංචි ගෝඨාභයලා කණ්ඩායමක්. හොඳ පපුවක්, හොඳ ඔළුවක්, හොඳ කොන්දක් තිබෙන හොරකම්, මැරකම්, සල්ලාලකම් නොකරන පිරිසක් පුංචි ගෝඨාභයලා ලෙස හඳුන්වන්න පුළුවන්. මෙවන් පිරිසක් පාර්ලිමේන්තුවට එව්වොත් මේ රට ඉතා කෙටිකලකදී සංවර්ධිත රටක් කරන බවට අපි ජනතාවට ප්‍රතිඥා දෙනවා.



# තුනෙන් දෙකක් ගන්න විප්ලවයක් කරන්න වෙනවා

**ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක**
**නීතිඥ වාසුදේව නානායක්කාර**

**මෙම ක්‍රමය වෙනස් කර කොට්ඨාස ක්‍රමයට නැවත යා යුතුයි. නමුත් අනුපාත ක්‍රමයටත් යම් ඉඩක් ලබාදිය යුතුයි. පැරණි ක්‍රමයට රත්නපුර දිස්ත්‍රික්කයේ ඡන්දය තිබ්බා නම් අපි කොට්ඨාස 8 ම දිනනවා. එ. ජා. ප. ය කොට්ඨාස 8 ම පරාජය වෙනවා.**

දිස්ත්‍රික්ක පදනම සහ මනාප තරගයයි නිසා මැතිවරණ ක්‍රමය විකෘති වෙලා තිබෙන්නේ. එම විකෘති ප්‍රජාතන්ත්‍රවාදය නැවත ප්‍රකෘතිය කරා ගෙන ඒමේ වුවමනාව ප්‍රබල ලෙස මම දකිනවා. මගේ ඡන්ද ව්‍යාපාරයේ ප්‍රධාන කාරණයක් බවට එය පත් වී තිබෙනවා. ඒ සඳහා 2/3 ක බලයක් දක්වා යා යුතුයි.

මෙම ඡන්ද ක්‍රමය තුළ ඡන්ද ආයතන බල රහිත කර තිබෙනවා. ඒ වගේම පත් වන මන්ත්‍රීවරයා ජනතාවගෙන් ඈත් කර තිබෙනවා. ඊළඟට මුදල් බලය ප්‍රධාන වෙලා තිබෙනවා. දැන් බලන්න දැන්වීම් දාන්න පුළුවන් රූපවාහිනියේ පමණයි. පෝස්ටර් ගහන්න බැහැ. ***රැස්වීමක් තබන ස්ථානයේ නම් පෝස්ටර් සහ කටවුට් ගහන්න පුළුවන්. ඒ වගේම ගෙවල්වලට 'කොළ බෙදන්න පුළුවන්. රූපවාහිනි මාධ්‍යයේ දැන්වීම් පළ කරන්න පුළුවන් වුවත් ඒ සඳහා විශාල වශයෙන් මුදල් වැය වෙනවා. මුදල් තිබෙන අය දැන්වීම් දානවා. බැරි අය නිකන් ඉන්නවා. ඒ විදිහට දැන්වීම් දාන්න මටත් මුදල් නෑ.***

වුවමනාම දේ තමයි මෙම ඡන්ද ක්‍රමයෙන් ගැලවෙන එක. එහෙම නැති නම් මෙම ඡන්දය මුදල් තිබෙන අය ඔවුන්ගේ බෑග් එකේ දාගෙන යනවා.

මෙම ඡන්ද ක්‍රමය තුළ තිබෙන නරකම දේ තමයි

දිස්ත්‍රික්කය පුරාම ගිහින් අලුත් පොරොන්දු ලබාදීලා ඡන්දය ලබා ගන්න පුළුවන් වීම. ඡන්ද අපේක්ෂකයාගේ පදනම් ප්‍රදේශයේ ඡන්ද දායකයන්ට ඔහුව එපා වුණත් සෙසු ප්‍රදේශවල ඡන්දවලින් පත්වීමේ හැකියාව මේම ක්‍රමය තුළ තිබෙනවා. අනෙක් අතට දිස්ත්‍රික්කයක් පුරා විසිරී සිටින ඡන්දදායකයන්ට සේවය කරන්නේ කෙසේද? මම දන්න ප්‍රදේශය තුළ මම දන්න හඳුනන අය සිටිනවා නම් මට සේවය කිරීමේ අපහසුවක් නෑ. ඡන්දදායකයන් ලක්ෂ 7ක් 8ක් අතරින් තමයි මම ඡන්ද 81000 ක් ලබා ගත්තේ. 81000 ක් ඡන්දය දුන්නත් පත් වුණාට පසුව නොයෙක් දේවල් කර ගැනීම සඳහා ඊට වඩා විශාල පිරිසක් එනවා. එම නිසා මෙම ක්‍රමය ප්‍රායෝගික නෑ. එම නිසා තමයි ජේ. ආර්. ජයවර්ධන මහතා කිව්වේ කොට්ඨාසයට යන්න ඕන නෑ කොළඹට වෙලා ඉන්න කියලා. ඡන්දයක් කිට්ටු වුණා නම් ගවයන් තණ බිමෙන් තණ බිමට යනවා වගේ වෙන ප්‍රදේශයකට ගිහින් ඡන්දය දිනා ගන්නවා. එම නිසා මෙම ක්‍රමය වෙනස් කර කොට්ඨාස ක්‍රමයට නැවත යා යුතුයි. නමුත් අනුපාත ක්‍රමයටත් යම් ඉඩක් ලබාදිය යුතුයි. පැරණි ක්‍රමයට රත්නපුර දිස්ත්‍රික්කයේ ඡන්දය තිබ්බා නම් අපි කොට්ඨාස 8ම දිනනවා. එ. ජා. ප. ය කොට්ඨාස 8ම පරාජය වෙනවා. නමුත් ඒ අයටත් ඡන්දය ලැබිලා තිබෙන නිසා ඒ සඳහා නියෝජනයක් ලබාදිය යුතුයි. එතකොට ඔවුන්ටත් මන්ත්‍රී ධුර දෙකක් හෝ තුනක් ලැබෙනවා.

1982 සම්මත කළ ව්‍යවස්ථාවට පෙර තිබුණ ඡන්ද ක්‍රමයට අනුව ජනප්‍රිය පක්ෂයකට පාර්ලිමේන්තුවේ 2/3ක බලයක් ගන්න පුළුවන්කම තිබුණා. එම නිසා අපි 1970 මැතිවරණයේදී 2/3ක බලයක් ලබා ගත්තා. ඉන් අනතුරුව 1977 පැවැති මැතිවරණයෙන් ජේ. ආර්. ජයවර්ධන මහතා 2/3ක බලයක් ලබා ගත්තා.

ජයවර්ධන මහතා පැරණි ක්‍රමයට 2/3ක් ලබාගෙන, යළිත් 2/3ක් ගන්න බැරි ක්‍රමයක් හැදුවා. දන් අපිව කාමරයකට දාලා අගුළු දාලා එයා යතුරත් අරන් වළපල්ලට ගිහිල්ලා. එම නිසා අපි දැන් මේ කාමරය කඩාගෙන යන්න ඕනි. මේ ක්‍රමය තුළ 2/3ක් නැතිව කඩාගෙන යන්න බැහැ. එම නිසා අපි දැන් මොකද්ද කරන්න ඕනි. අපි දන් විප්ලවකාරී පියවරක් ගත යුතුයි.

ඒ සඳහා එදා ජයවර්ධන මහතා ගත්ත ඡන්ද ප්‍රතිශතය අද අපි ගත්තොත් අපිටත් අයිතියක් තිබෙන්න ඕනි. එයා එදා කරපු දේවල් අද අපට කරන්න. ජයවර්ධන මහතාට අයිතියක් නෑ 2/3ක් ගන්න පුළුවන් ක්‍රමයකින් බලයට ඇවිත් 2/3ක් ගන්න බැරි ක්‍රමයක් නියම කරලා එම ක්‍රමය මගින් 2/3ක් ගන්න ඕන කියලා නියම කරන්න.

එම නිසා මීළඟ පාර්ලිමේන්තු මැතිවරණයෙන් තේරිපත් වන මහජන නියෝජිතයන් සහ පළාත් පාලන සහ පළාත් සභා නියෝජිතයනුත් පාර්ලිමේන්තුවෙන් පිටත රැස් වී අපි ව්‍යවස්ථා සභාවක් ලෙස ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කළ යුතුයි. ඒ තුළින් අපි නව ව්‍යවස්ථාවක් සම්පාදනය කළ යුතුයි. අපි ඒ ආකාරයේ විප්ලවකාරී පියවරකට යා යුතුයි.

***1972 ව්‍යවස්ථා සම්පාදනය කළෙත් ඒ ආකාරයට තමයි. 1970 මැතිවරණයෙන් අපිට 2/3ක බලයක් ලැබුණා. එසේ වුවත් අපි කිව්වා, එම පාර්ලිමේන්තුවේ 2/3න් නෙවෙයි නව ව්‍යවස්ථාව සම්මත කරන්නේ කියලා. අපි රැජනගේ ව්‍යවස්ථාව පිළිගන්නේ නැහැ කියලා කිව්වා. නමුත් එම් ව්‍යවස්ථාව පිළිගන්නේ නැතිව පාර්ලිමේන්තුවට යන්න බෑ. එම නිසා අපි එම පාර්ලිමේන්තුවට ගිහින් ව්‍යවස්ථා සභාවක් ලෙස නව රඟහලේදී රැස්වුවා. එම ව්‍යවස්ථා සභාවෙන් තමයි 1972 ව්‍යවස්ථාව සම්මත කළේ. එය විප්ලවකාරී පියවරක්. 1948 දී ඉන්දියාව කළෙත් ඒක තමයි.***

රජය වැඩකටයුතු කරන්නේ නිලධාරී යාන්ත්‍රණය තුළින්. එම නිලධාරී යාන්ත්‍රණය සහ මහජන නියෝජිතයන්ගේ සම්බන්ධය තහවුරු වන යාන්ත්‍රණයක් අපි සකස් කළ යුතුයි. එබඳු යාන්ත්‍රණයක් නොතිබුණහොත් නිලධාරී යාන්ත්‍රණය හරහා ක්‍රියාත්මක වන්නේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නොවෙයි. කොරෝනා ව්‍යසනය අවස්ථාවේදී මහජන නියෝජිතයන් සම්බන්ධව කළ නිසා තමයි රු. 5000/- ලබාදීමේ වැඩපිළිවෙළ හොඳින් පුළුල්ව ක්‍රියාත්මක වුණේ. එය නිලධාරී යාන්ත්‍රණයට පමණක් සීමා වූවානම් නොයෙක් ගැටලු මතුවෙනවා.

එම නිසා නිලධාරී යාන්ත්‍රණය සහ මහජන නියෝජිතයන් සම්බන්ධ වචන යාන්ත්‍රණයක් සකස් කළ යුතුයි. මහජන නියෝජිතයන් මහජනතාව නියෝජනය කරනවා. නිලධාරීන් මහජන අවශ්‍යතා ඉටුකරනවා. එම නිසා මෙම දෙපාර්ශ්වයට දෙපැත්තට වෙලා ඉන්න බෑ. එහි ප්‍රතිඵල නිසා තමයි ගෝඨාභය ජනාධිපතිතුමාට මහ බැංකුවේ නිලධාරීන්ට අර විදියට කතා කරන්න සිද්ධ වුණේ. එම ගැටලුවම බන්ධනාගාර දෙපාර්තමේන්තුව සම්බන්ධයෙනුත් ඇති වුණා. ඊට හේතුව තමයි නිලධාරී යාන්ත්‍රණය. ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම එම තත්ත්වය මගහැරීම සඳහා නව යාන්ත්‍රණයක් ගොඩනැඟිය යුතුයි.

ඒ වගේම සෑම රාජ්‍ය ආයතනයකම සේවකයන්ගේ සභා හදන්න ඕනි. එම සභා මගින් තමයි එම ආයතනවල පැවැත්ම. ජනතා සේවය මෙන්ම එම ආයතන වඩා දියුණු කළමනාකාරීත්වයකට ගෙනියන්න ඕනි කියන එක තීරණය කළ යුත්තේ. සේවක සභා පිහිටුවිය යුතු බවට අපි යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා.

ඒ වගේම අපි ඉඳුරාම විරුද්ධ දේ තමයි පෞද්ගලීකරණය. නමුත් විරුද්ධ පක්ෂයේ ප්‍රධාන ප්‍රතිපත්තිය බවට එය පත්වී තිබෙනවා. අපි කියන්නේ සමාජය ගැන රජය වගකිව යුතුයි. ඒකට තමයි රජයක් තිබෙන්නේ. නමුත් අපේ විරුද්ධවාදීන්ගේ අදහස තමයි සමාජය නිදහස් කළ යුතුයි කියන එක. අපි කියන්නේ රාජ්‍ය මැදිහත් වීමක් අවශ්‍යයි කියන එක.

ඒ වගේම අපේ රටේ මහජනයාට නිදහස ලබාදෙන්න නම් පළමුවෙන්ම කප්පම්කාරයන්, ප්‍රචණ්ඩ පාතාලය, ප්‍රචණ්ඩත්වයෙන් සමාජය යටකර ගන්න පුළුවන්කම වහාම අවසන් කළ යුතුයි. ඒ සඳහා නීත්‍යනුකූලව කටයුතු කරන වෙනම බළකායක් අවශ්‍යයි.




# යහපාලන ආණ්ඩුව පැවතුණේ දින 100යි

නීතිඥ ශිරාල් ලක්තිලක

**ඔබ පැවති යහපාලන ආණ්ඩුවේ ප්‍රබල භූමිකාවක් ඉසිලූ කෙනෙක්. එම ආණ්ඩුව බිහි කර ගැනීම සඳහා පෙළ ගැසුණු ජන බලවේගයේ අභිලාෂයන් ඉටු කිරීමට සමත් වූ ප්‍රමාණය ගැන ඔබේ තක්සේරුව කුමක්ද?**

මගේ තක්සේරුව තමයි, ඒ අභිලාෂයන්ගෙන් සීයට 25ක් විතර ඉටු වුණා, සීයට 75ක් විතර ඉටු වුණේ නෑ කියන එක. ඔබ සඳහන් කළ දේශපාලන බලවේගය කියල කියන්නෙ, මාදුළුවාවේ සෝභිත හිමියන් එක්ක ගොඩනැඟුණු පර්යාලෝකමය දේශපාලන ව්‍යාපාරයක්. එතන මිනිස්සු හිටියෙ නෑ, එතන තිබුණෙ අදහස්. ඒ අදහස් ඇතුළෙ තිබුණෙ සාධාරණ සමාජයක් ගොඩනැගීම සහ ඒ සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් ගොඩනැගීමයි. එම පර්යාලෝකමය නැත්නම් 'අදහස්' බලවේගය රඳා පැවතුණේ ප්‍රධාන වශයෙන් එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ දේශපාලන බලවේග මත. එහිදී එක්සත් ජාතික පක්ෂයට තිබුණු ගැටලුව තමයි ජනාධිපතිවරණයක් වැනි ද්වන්ධ්ව සටනකට ඉදිරිපත් කිරීමට ජනප්‍රිය නායකයකු නොමැති වීම. එතැනදි කව්ද ඉදිරියට ගේන්නෙ කියන ප්‍රශ්නය මතු වුණා. රනිල් වෙනුවට එජාපයෙන් තිබුණු විකල්පය තමයි කරු ජයසූරිය. නමුත් ඔහු ඒ තැන ගන්නවාට රනිල් වික්‍රමසිංහ මහත්තයා එකඟ වුණේ නෑ. ඒ අවස්ථාවේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය තමයි මෛත්‍රීපාල සිරිසේන මහතා ඒ තැනට යෝජනා කරන්නේ. එතන ඉඳලම තමයි අර පර්යාලෝකමය අදහස දරන දේශපාලන බලවේගයක් ගොඩනැඟුණාද කියන ප්‍රශ්නය එන්නෙ.

***කෙසේ හෝ මෙම බලය ගත්තාට පසුව පළමු දින සියය ඇතුළත තමයි මා කලින් කියපු සීයට විසිපහේ සාර්ථකත්වය අත් කර ගන්න හැකි වෙන්නේ. එය හොඳින් සිදු වුණු බව තමයි මගේ අදහස. ව්‍යුහාත්මක වෙනස්කම්වලට අවශ්‍ය මූල බීජ ඒ වකවානුව තුළ ඇති වුණා. මේ ආණ්ඩුව එක්ක සැසඳුවොත් ගෝඨාභය රාජපක්ෂ මහත්තය ගෙනා අදහස පැළ කරන්නට අවශ්‍ය මූල බීජ අද වෙනකල් දාල නෑ. නමුත් යහපාලන ආණ්ඩුව***

***පළමු දින සීය තුළ විවිධාකාරයෙන් මූල බීජ ඇති කළා. එයින් ප්‍රධානම එක තමයි 19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. තොරතුරු ලබාගැනීමේ නිදහසට අදාළ කෙටුම්පත වැනි තවත් බොහෝ ක්ෂේත්‍රවලට අයත් ප්‍රතිසංස්කරණවල මූලික කටයුතු සිදු වුණා. නමුත් එය කඩා වැටෙන්නේ දින සීය අවසානයේ මහබැංකු කොල්ලයත් එක්ක. එතනින් පස්සෙ ඒ ප්‍රොජෙක්ට් එක ඉවර වුණා. ඒකට තවදුරටත් පැවැත්මක් නැති වුණා.***

**යහපාලන ආණ්ඩුවේ පාලන කාලය, ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් මෑත ඉතිහාසයේ උතුරේත් දකුණේත් දේශපාලන බලවේග අතර පුළුල්ම සම්මුතියක් පැවති වකවානුවක් ලෙස හඳුන්වන්න පුළුවන්. එය ඉදිරියට ගෙන යෑමට නොහැකි වුණේ ඇයි?**

ඕනම දේශපාලන න්‍යායපත්‍රයකට බලය අවශ්‍යයිනේ. දේශපාලන බලය ගොඩනැගෙන්නෙ මිනිස්සුන්ගෙන්, නැත්නම් ඡන්දදායකයන්ගෙන්. නමුත් සෝභිත හාමුදුරුවන්ගෙ ව්‍යාපාරය විසින් දුන්න බැටින් එක අරන් ඉදිරියට යෑමේ ජවයක්, ඒ සඳහා ජන බලය ගොඩනැගීමේ හැකියාවක් රනිල් වික්‍රමසිංහ සහ මෛත්‍රීපාල සිරිසේන කියන දේශපාලන බලවේග දෙකටම තිබුණෙ නෑ. ඒ නිසා දිනෙන් දින ඒ න්‍යායපත්‍රය දුර්වල වුණා. ආණ්ඩුව එදිනෙදා කරන වැරදිත් එක්ක එයට තිබුණු පිළිගැනීම අහිමි වුණා. නොවැම්බර් 16 වැනිදා පරාජය වුණේ රනිල් වික්‍රමසිංහ හෝ මෛත්‍රීපාල සිරිසේන නොව අප හැදූ න්‍යායපත්‍රයයි.

**2015 ජනාධිපතිවරණය පාලන ක්‍රමය වඩාත් ප්‍රජාතන්ත්‍රකරණය සඳහා පුළුල් පෙළගැස්මක් වුවත් 2020 ජනාධිපතිවරණය එය ආපසු හැරවීමේ රැල්ලක් බවට පත් වුණා. මෙය ඔබ දකින්නේ කොහොමද?**

ඒක හරිම භයංකරයි, විනාශකාරීයි. නමුත් එය අප විසින්ම කරගත් දෙයක්. අද මොකක්ද වෙලා තියෙන්නෙ? සමාජය ඉල්ලනවා ඒකාධිපතියෙක්, සමාජය ඉල්ලනවා මිලිටරි පාලනයක්. සමාජය කියනවා පාර්ලිමේන්තුවක් එපා කියලා. මතයක් තියනවානේ සිංහල සමාජය විසින් බුද්ධාගම ආරක්ෂා කරගෙන ආවා කියලා. ඒ වගේම පොදුවේ ලාංකීය සමාජය විසින් පසුගිය වසර 70ක කාලය පුරාම ආරක්ෂා කරගෙ ආ උතුම් දෙයක් තමයි ප්‍රජාතන්ත්‍රවාදය. ඒකත් අපටම අනන්‍ය වූ ලක්ෂණයක්. දකුණු ආසියාවේ ඉන්දියාව හැරුණු විට අපි ප්‍රජාතන්ත්‍රවාදය ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන ගිය රටක්. ඒක අපට ආඩම්බරයට කරුණක්නේ. නමුත් අවාසනාවකට පසුගිය අවුරුදු 5ක කාලයේ සිදු වූ, අපද වගකිව යුතු ඇතැම් ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයක් විදියට ජන සමාජය අද කියනවා අපට ඕව ඕන නෑ, පාර්ලිමේන්තුවෙ 225ම එපා කියලා. මොකක්ද මේ වෙලා තියෙන්නෙ? ලෙනින් කිව්වනේ ධනවාදයේ උච්චතම අවධිය අධිරාජ්‍යවාදයයි කියලා. ඒ වගේ රාජපක්ෂවාදයේ උච්චතම අවධිය අපි උදා කරල දුන්නා. ඒක තමයි අපට ඉදිරි අවුරුදු පහේ ගත කරන්න වෙන්නෙ. රාජපක්ෂවාදය හෙජමොනික් වෙලා තියෙන්නෙ. ඒකට අවශ්‍ය න්‍යායාත්මක ඔටුන්න අප විසින් හදල දුන්නා.

**යහපාලන රජය නියෝජනය කළ බලවේගය 2020 ජනාධිපතිවරණයේදීත් යම් තාක් දුරකට එකට සිටියත් ජනාධිපතිවරණයෙන් පසුව බරපතළ බිඳීමකට ලක් වුණා. ප්‍රධාන කණ්ඩායම වූ එජාපය පවා දෙකට කැඩුණා. එහෙම වුණේ ඇයි?**

***දැන් අපි 2015 මුලට ආපහු ගියොත්, සෝභිත හාමුදුරුවන්ගේ ව්‍යාපාරය අදහස් විප්ලවයක්. චරිත හේරත් කියන විදියට ටෝක් ෂොප් එකක්. අදහස් සාප්පුවක්. නමුත් මේ ටෝක් ෂොප් එකට අපි හයි මෝරල් ග්‍රවුන්ඩ් එක අරන් දුන්නා. හරිනම් ඊට පසුව රනිල්ගේ එක්සත් ජාතික පක්ෂය කළ යුතුව තිබුණේ එය දේශපාලනිකව සංකල්පගත කිරීමයි. නමුත් එය සිදු වුණේ නැහැ. ඔවුන්ට මෙය හුදු බලය අරන් දුන් මෙවලමක් පමණයි. පැවති අශුද්ධ සන්ධානය නොවැම්බර් 16 දක්වා ඉදිරියට ගියේ පුද්ගලයො හැටියට මිස චින්තන ධාරාවක් ලෙස නෙවෙයි. ඒකෙන් අවසානයේදී වුණේ රනිල්ලා, මෛත්‍රීලා දේශපාලන වශයෙන් විනාශ වී යෑමයි. මේක අද තිබෙන රාජපක්ෂවාදය ආශ්‍රයෙන් තේරුම් ගන්න පුළුවන්. අද වෙනකොට ඇත්තටම තියෙන්නෙ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නෙවෙයි. අද තියෙන්නෙ දෙරණ. එතනින් තමයි චින්තනය හදන්නෙ. නමුත් යූඇන්පී දේශපාලන බලවේගයට මේ චින්තනය හදන උපකරණ හඳාගන්න බැරි වුණා ඒ අවුරුදු පහේදී. සරලවම ගත්තොත්, ටෙලිවිෂන් ස්ටේෂන් එකක් වත් හදාගන්න බැරි වුණා.***

ජනාධිපතිවරණයෙන් පස්සෙ යූඇන්පිය ඉතාමත් නගින බල අරගලයකට කොටු වුණා. එතනදි සියයට අනූපහක්ම හිතුවා රනිල් වික්‍රමසිංහත් එක්ක තවදුරටත් යන්න බෑ කියලා. කිරිඇල්ල, මංගල, මලික් සමරවික්‍රම වැනි අය පවා එහෙම හිතුවා. නමුත් රනිල් ඒකට ඔළුව නැමුවෙම නෑ. ඒක ඔහුගේ පුද්ගලික දුර්වලකමක් නෙවෙයි. ඒකට ආර්ථික හේතු තියෙනවා. රනිල් වික්‍රමසිංහ නියෝජනය කරන කොම්ප්‍රොදෝරු ධනපති පන්තිය මේ දේශපාලනය ඇතුළෙ ලබාගන්නා ප්‍රයෝජන තිබෙනවා. ඒව ගන්නේ රනිල් නෙවෙයි, විජේවර්ධන පරම්පරාව. ඒ උවමනාවන් වෙනුවෙන් අවසානය දක්වා අල්ලාගෙන ඉන්න රනිල්ට සිද්ධවුණා. ඒක තමයි මේ බෙදීමට හේතු වෙන්නෙ. ඇත්තෙන්ම යූඇන්පියේ බෙදීමයි අපි කලින් කතා කළ දේශපාලන න්‍යායපත්‍රයයි අතර සම්බන්ධයක් නෑ.

**එජාපයේ නායකත්ව අර්බුදයේ ඵලයක් යන්නට වැඩි අර්ථයක් සමගි ජන බලවේගයට තිබෙනවාද? ඇත්තෙන්ම තවමත් එය තේරුම්ගන්න වෙන්නෙ එජාපය ඇසුරෙනුයි. ඒ දෙකෙහි මූලික ප්‍රතිපත්තිමය වෙනස්කම් තිබෙනවාද?**

අනිවාර්යයෙන්ම තියෙනවා. 2015 මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව ඒ බැටින් එක අරගෙන යන්න බැරි වුණ බව මං මුලදි කිව්වනේ. එතැනදි අහන්න ඕන ප්‍රශ්නය තමයි ඒ ඇයි කියන එක. එක්සත් ජාතික පක්ෂය පිළිබඳව තිබෙන ප්‍රකට විවේචන තමයි එය දේශ ද්‍රෝහීයි, ජාත්‍යන්තරයට ගැතියි, දේශීය සම්පත් පිටරටට විකුණනවා යනාදී කාරණා. ඒ ලේබලයේ අනිත් පැත්තෙන් ඇඟවෙන්නෙ අපි දේශප්‍රේමීයි, ජාත්‍යන්තරයට ගැති වෙන්නෙ නෑ, දේශීය සම්පත් ආරක්ෂා කරනවා, අපි වාමාංශිකයි, ජාතිකවාදීයි වගේ කාරණා. ඇත්තටම ලංකාව දියුණු කරන්න පුළුවන් කාටද? මොන ක්‍රමයටද කියන ප්‍රශ්නය මෙතැනදී මතු වෙනවා. මා දකින විදියට, පසුගිය වසර 70 පුරාම, මේ දෙක ලංකාවේ දේශපාලනයේ රේල් පීලි දෙකක් වගේ යන්නේ. වැඩි බර තිබෙන්නේ දෙවනුව සඳහන් කළ, දැන් බලය දරන කණ්ඩායමේ මතයට. ඇත්තටම ලංකාව දියුණු කරන්න නම් අවශ්‍ය වෙන්නේ ග්ලෝලීයකරණයේත්-දේශීයකරණයේත් මිශ්‍රණයක්. ඒකට අපි කියනවා ග්ලෝකලයිසේෂන්

(*Glocalization*) කියලා. මෙතනදී සිද්ධවෙන්නෙ ගෝලීයකරණය ඔස්සේ එන දේ එලෙසින්ම බාරගන්නේ නැතිව අපේ අවශ්‍යතා අනුව ගළපා ගැනීමක්. බාගයක් ගන්න වෙනවා බාගයක් අතහරින්න වෙනවා. ඊළඟ කාරණය තමයි ධනය උත්පාදනය කිරීම හා ධනය සාධාරණ ලෙස බෙදීම. ඇත්තටම ධනය නැතිව ධනය සාධාරණව බෙදන්න බෑ. මේ දෙක අතරත් තුලනයක් අවශ්‍යයි. රාජපක්ෂවාදීන් ධනය උත්පාදනය ගැන කතා කරන්නෙ නෑ, ධනය බෙදීම ගැන කතා කරනවා, ඒත් ඒගොල්ලන්ට වැඩපිළිවෙළක් නෑ. නමුත් අපේ කඳවුරට තියෙනවා ධනය උත්පාදනය කිරීම පිළිබඳ තර්කයක්. එතැනදිත් මේ මිශ්‍රණය අවශ්‍ය වෙනවා.

තුන්වැනි කාරණය හැටියට විදේශ ප්‍රතිපත්තිය දිහා බැලුවොත් අපේ අපනයන යන්නෙ එක තැනකට. ඒත් අපි හේත්තු වෙන්නෙ තව තැනකට. අපේ අපනයන බොහොමයක් යන්නෙ කැනඩාවට සහ ඇමරිකාවටයි. නමුත් අපි සම්බන්ධවෙලා ඉන්නෙ චීනය එක්ක. ඒ වගේම ඉන්දියානු විරෝධී ප්‍රතිපත්තියක ඉන්නවා. නමුත් විදේශ ප්‍රතිපත්තිය සකස් විය යුත්තේ අපගේ සාපේක්ෂ වාසිය පදනම් කර ගෙනයි. සිංහල සමාජයේ කැමැත්ත තියෙන්නෙ රුසියාව, චීනය වගේ රටවලට වුණත් ඇත්තටම ඒවයින් අපට කිසිම ප්‍රයෝජනයක් නෑ. අපි විරුද්ධ වෙන්නෙ ඇමරිකාවටයි ඉන්දියාවටයි ජපානෙටයි. මේක මිථ්‍යාවක්. අපි කියන්නෙ මෙතනදිත් මිශ්‍රණයක් අවශ්‍යයි. හතරවෙනුව අපේ සංස්කෘතික ප්‍රතිපත්තිය. එක පැත්තකින් අපි අපේ සංස්කෘතිය ආරක්ෂා කරන ගමන් ඩිජිටල් රෙවලූෂන් එකකට යා යුතුයි.

මේ කරුණු හතර සම්බන්ධයෙන් බැලුවොත් රනිල් වික්‍රමසිංහගේ දේශපාලන ව්‍යාපෘතිය නිතරම ගත්තේ එක අන්තයක්. සමගි ජන බලවේගයේ ප්‍රතිපත්තිය තමයි මේ කරුණු හතර, රටට අවශ්‍ය මැද තැනක පිහිටුවීම. මෙය හදිසියේ මැතිවරණය සඳහා සකස් කරගත් දැක්මක් නෙවෙයි. මේ පිළිබඳ දැවැන්ත අභ්‍යන්තර සංවාදයක් තිබුණා. මෙවර මැතිවරණය සඳහා අප ඉදිරිපත් කරන ප්‍රකාශනය මේ වන විට ඇති කරගත් එකඟතා මත පදනම් වූ එකක්. 2025 රාජ්‍ය පාලනය ඉලක්ක කරගත් දැවැන්ත වැඩපිළිවෙළක් බවට ඉදිරියේදී එය පත් වීමට නියමිතයි.

**ඒත් එජාපයේ අර්බුදය නිරන්තරයෙන්ම ඉස්මතු වුණේ හුදු නායකත්වය පිළිබඳ අරගලයක් හැටියටයි. ඔය කියන ප්‍රතිපත්තිමය සංවාදය ප්‍රකට වුණේ නැහැ. ඒ ඇයි?**

ප්‍රතිපත්ති මත තමයි විසංවාදය ඇති වුණේ. අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කාරණයත් එතැනදී ප්‍රබලව මතු වුණා. 2010දී පළමු වරට කරු ජයසූරිය මහතා නායකත්වය සඳහා තරගයට ඉදිරිපත් කිරීමෙන් ප්‍රකාශයට පත් වුණේ ඒ ප්‍රතිපත්තිමය අරගලයයි. අපි රනිල් වික්‍රමසිංහ මහත්තයට කිව්වේ, ඔබේ ඔය නියෝ ලිබරල් ප්‍රතිපත්තියට ජනතා සහායක් ලැබෙන්නෙ නෑ, ඒ නිසා බලයට එන්න බෑ කියලා. අවුරුද්දක් පමණ තිස්සේ ඒ අරගලය පැවතිලා, ඉන් පසුව තමයි නායකත්වයට තරගකරුවකු ඉදිරිපත් කරන්නේ. කුරුඳු පොලු, සිරිකොතට ගල් ගැසීම එන්නෙ ඊට පස්සෙ. ඔබ කියනව නම් ඒ අරගලය ප්‍රකට නොවුණා කියලා, මම කියන්නම් ඒ ඇයි කියන කාරණය. මේ රටේ ලිබරල් සහ මාක්ස්වාදී බමුණු කුලයක් ඉන්නවා. ඔවුන් තමයි දේවල් ගැන සමාජයට අර්ථකථන සපයන්නේ. එක් අවස්ථාවක මේ පිරිස හා රනිල් වික්‍රමසිංහ මහතා අතර සංවාදයක් ගොඩනඟන්න මා මැදිහත් වුණා. එසේ ඇති වූ සම්බන්ධය මත, මේ පිරිස කියන්න ගත්තා රනිල් වික්‍රමසිංහ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු බව. මොකද ජාතික ප්‍රශ්නය පිළිබඳ අදහස මත. ඒ අනුව රනිල්ට විකල්ප වශයෙන් ඉදිරිපත් වන මතය සහ ඒ අරගලකරුවන් නිකම් පාදඩ කැරලිකරුවන් පිරිසක් හැටියටයි ඔවුන් දැක්කේ. ඇයි විරුද්ධ වෙන්නෙ කියන කාරණය ඔවුන්ට වැදගත් වුණේ නෑ. මම ඒ දිනවල මේ කාරණය ගැන රාවය පත්තරේට ලියල තියෙනවා.

**යහපාලන රජයේ දේශපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ කතිකාව මේ වන විට පියකු නැති දරුවකුගේ තත්ත්වයට පත් ව තිබෙනවා. සමගි ජන බලවේගය එහි වගකීම් බාරගන්නේ කවර ප්‍රමාණයකටද?**

***පැහැදිලිවම අපි ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. අපේ මූලික ප්‍රතිපත්තියක් තමයි සෝභිත හාමුදුරුවන්ගේ සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරයේ පදනම් ප්‍රතිපත්ති අංශු මාත්‍රයක හෝ වෙනසකින් තොරව පිළිගන්නා බව. එතනදී අපි යහපාලන ප්‍රතිපත්ති යළි රාමුගත කළා. උදාහරණක් හැටියට යහපාලන රජය විසින් ගත්තේ නැති ජාතික ප්‍රශ්නය පිළිබඳ කාරණය අපි රී ෆ්‍රේම් කරල තියෙනවා. අපි ඒකට දාල තියන නම තමයි සද්ජාතිකත්වය. අපි කතාකරන්නෙ බහුවාර්ගික සමාජයක් නෙවෙයි අන්තර් වාර්ගික සමාජයක් පිළිබඳවයි. ගුහාගත වෙන් වෙන් ජාතික්වයන් වෙනුවට එක් ජාතියක් අනෙක් ජාතිය මත යැපෙන අන්තර් වාර්ගික සහජීවනයක් ගැනයි. ඒ අතර එක් එක් ජාතියේ අනන්‍යතාව, අභිමානය ආරක්ෂා විය යුතුයි. එවිටයි ශ්‍රී ලාංකික ජාතියක් හදන්න පුළුවන්.***

**කොවිඩ් 19 නිසා ලෝකයේම න්‍යායපත්‍රය වෙනස් වී තිබෙනවා. ඔබේ පක්ෂය මේ තත්ත්වය සැලකිල්ලට ගන්නෙ කොහොමද?**

ඔය කතාවත් මතවාදී තලයේ තිබෙන්නක් මිස ඇත්තක් නෙවෙයි. ධනේශ්වර ක්‍රමය මේකෙන් දැඩි අභියෝග යකට ලක් වී නැහැ. නමුත් ප්‍රධාන වශයෙන් ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වන අර්බුද ගැන අප අවධානය යොමු කර තිබෙනවා. ලෝකයට හෙම්බිරිස්සාව හැදුණාම අපට නිව්මෝනියාව හැදෙන තත්ත්වයක් අද තියෙන්නෙ. ප්‍රධාන හේතුව තමයි දිගින් දිගටම පවත්වාගෙන යන ණය ආර්ථිකය. එය මේ වන විට ට්‍රිලියන 13ක් වෙනවා. මේ වසර පහ තුළ ට්‍රිලියන 18 දක්වා වර්ධනය වීමට නියමිතයි. අනිත් කාරණය තමයි අපේ නිෂ්පාදන ආර්ථිකය කඩාවැටීම. ඔක්තෝබර් මාසය පමණ වන විට මේ සියල්ලෙහි බලපෑම අපේ ඇඟට දැනේවි. මුදු රළක් වගේ මේක වදින්නට නියමිතයි. සාමාන්‍ය ජනයාට පමණක් නෙවෙයි ධනේශ්වර පන්තියටත් එය දැනේවි. මේ තත්ත්වය මත ආණ්ඩුවට අධිකාරීවාදී ක්‍රියාමාර්ගවලට යන්න වේවි. මේ සියලු තත්වයන්ට මුහුණ දීමට සුපර් ටීම් එකක් අවශ්‍යයි. තනි තනි නායකයින්ට තවදුරටත් කළ හැක්කක් නැහැ. ඊට ගැළපෙන නිර්මාණශීලී සුපිරි නායකත්ව කණ්ඩායමක් අපි ගොඩනඟනවා. 2025 වන විට රටට අවශ්‍ය වන්නේ 2050 ලෝකයට ගැළපෙන රටක් ගොඩනැගිය හැකි නායකත්වයක්. ඒ සඳහා වැඩපිළිවෙළක් තිබෙන්නේ සමගි ජන බලවේගයට පමණයි.

සංවාද සටහන
***ජයසිරි ජයසේකර***




# පවුල් පාලනය සහ රාජ්‍ය මර්දනය යොදවා අපව පරාජය කළ නොහැකියි

ජාතික හෙළ උරුමයේ නායක
**පාඨලී චම්පික රණවක**

මගේ දේශපාලන ගමන දෙස ආපසු හැරී බලන විට මම සතුටු වෙනවා. මම පළමුවරට මහමැතිවරණයට තරග කළේ සිහළ උරුමයෙන්. බොහෝ දෙනෙක් ප්‍රභාකරන්ගේ කාලතුවක්කු සැහැසිකම් ඉදිරියේ දණ නමද්දී අපි කුඩා කණ්ඩායමක් ලෙස එයට එරෙහිව සටන් කළා. ජාතික හෙළ උරුමය ආරම්භ කර ත්‍රස්තවාදය පරාජය කිරීමේ සිට මේ දක්වා රටේ ඇති වූ ආර්ථික ක්‍රියාදාම, දූෂණ විරෝධී හඬ සමග ක්‍රියාකාරීව කටයුතු කළා. සාමාන්‍ය ඉංජිනේරුවකු හෝ විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයෙකු නොවී රටේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට දායක වීමට හැකි වීම සම්බන්ධයෙන් මා සතුටු වෙනවා. ඒ ක්‍රියාවලියට මා බලගතු මැදිහත්වීම් සිදු කළා. ඉන් පළමුවැන්න වන 2009 දී ගෙන ආ හරිත ලංකා වැඩසටහන එක්සත් ජාතීන් පවා පිළිගත්තා.

මට 2013 දී මහින්ද රාජපක්ෂ මහතාගේ රජයේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සිට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශයට දඬුවම් මාරුවක් ලැබුණා. අමාත්‍යාංශයේදී හමු වූ වෘත්තීයවේදීන් හා විද්වතුන් සමග එක් වී නිර්මාණය කළ නවෝත්පාදන ආර්ථික සැලසුමේ අග්‍රඵලය අද හෝමාගම ඉදිවෙමින් ඇති තාක්ෂණ නගරයයි. ඒ අපේ සිලිකන්වැලියයි. බැංගලෝරය මෙන්ම ෂෙන්ෂෙන් ආර්ථික කලාපයයි. එය නිවැරදිව ඉදිරියට ගියොත් නවමු ආර්ථික කලාපයක් වන බව නොඅනුමානයි. ජේම්ස් ටේලර් මේ රටට පළමු තේ පැළය ගෙන ගෙනෙද්දී, මේ රටේ ප්‍රධාන අපනයනය බවට සිලෝන් ටී පත් වේ යැයි කියා හෝ ජේ.ආර්. ජයවර්ධන ලලිත් ඇතුලත්මුදලි සමග එක්ව කටුනායක නිදහස් වෙළඳ කලාප ආරම්භ කරන විට තේ පොල් රබර්වලින් පසු රටට ආදායම් උපදවන ක්ෂේත්‍රය බවට පත් වේ යැයි නොසිතන්න ඇති. දේශපාලන ඊර්ෂ්‍යාවකින් තොරව මේ තාක්ෂණ නගරය ඉදිරියට ගෙන ගියොත් රටේ ආර්ථිකය, ඉතිහාසය වෙනස් වන බවට සැකයක් නැහැ.

මේ රටේ බලශක්ති ක්ෂේත්‍රයේ සිදුවිය යුතු වෙනස්කම් සම්බන්ධ බලගතු සැලසුමක් අපි 2015දී ජනගත කළා. අද බල ලෝභී ධන ලෝභී පිරිස් ඉන් බාහිරව කටයුතු කරනවා. ජාතික භෞතික සැලසුම සහ ජාතික මහා නගර සැලසුම සකස් කිරීමටත්, ප්‍රවාහන, පාරිසරික, ජල කළමනාකරණ, තාක්ෂණික ආදී සෑම ක්ෂේත්‍රයකම මුල් පිටපත සකස් කිරීමටත් අපට හැකි වුණා. ඒවා ක්‍රියාත්මක නොකර අපට ණය බරෙන්, අයහපත් නාගරීකරණ ප්‍රතිඵලවලින් ගැලවෙන්න බැහැ

අපි බාධක මැද ඉදිරියට ගියා. වරාය නගරයට අමතරව බේරේ වැව අවට සියලු පැල්පත්වාසීන් නීත්‍යානුකූලව ඉවත් කර සංවර්ධන මාවත සකස් කළා. බස් ප්‍රමුඛතා මංතීරු හඳුන්වා දුන්නා. මාකුඹුරේ ඉදිකළ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සහ කඩවත ඉදිවෙමින් පවතින ප්‍රවාහන මධ්‍යස්ථානය මෙරට ප්‍රවාහන ක්ෂේත්‍රය වෙනස්කම්. සැහැල්ලු දුම්රිය පද්ධති හතරක් සඳහා සැලසුම් යෝජනා කර ඉන් එක් එක් ව්‍යාපෘතියක් ආරම්භ කළත් ඊර්ෂ්‍යා පරවශ දේශපාලනය එම ව්‍යාපෘති නතර කර තිබෙනවා. අනාගතයේ දී බිහි වන සමගි ජන බලවේග ආණ්ඩුවකින් අපි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා. මේ සියල්ල කළේ දූෂණයෙන් තොරවයි. රටේ හොඳම මූල්‍ය විනය සහිත අමාත්‍යංශය බවට පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාව අපේ අමාත්‍යංශය නම් කළා

අද චම්පික රණවක පරාජය කිරීම සඳහා සමහරු දස ලක්ෂ 50ක් වියදම් කරන බව කියනවා. චම්පික රණවක සිරගත කරන්න මර්දන යන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙනවා. අපව දේශපාලන වශයෙන් අනාථ කිරීමට ප්‍රචාරණ යුද්ධයක් ආරම්භ කරලා. අපි හිත්වලින් බිඳවන්න පවුලේ අය සහ හිතවතුන් ඉලක්ක කර යම් යම් දේ සිදුවෙනවා. ඒ ක්‍රියාදාමවලින් අපව නතර කරන්න ගෝඨාභය රාජපක්ෂ, මහින්ද රාජපක්ෂ මහත්වරුන්ට බෑ. ප්‍රභාකරන්ලා ඉදිරියේ දණ නොගහපු, මාවිල්ලාරු සිදුවීම වෙලාවේ ඔවුන් අරලියගහ මන්දිරයට වී සිටිද්දී සටන් කරමු කිව්ව අපි ඒ මාවතේ ඉදිරියට යනවා. අපිව පරාජය කරන්න නම් අපට වඩා හොඳින් අපේ අමාත්‍යාංශ කර පෙන්වන්න. අපි 2024දී අවසන් කිරීමට තිබූ සැහැල්ලු දුම්රිය සේවය 2003දී හදා පෙන්වා චම්පිකට වඩා හොඳට වැඩ කරනවා කියන්න. ඒ වගේම අපි හදපු රාජ්‍ය ආයතන මගින් අපට වඩා ආදායම් ලාභ උපයා, අපට වඩා කාර්යක්ෂමව කර පෙන්වන්න. එතකොට අපිව පරාජය කරන්න පුළුවන්.එසේ නැතිව පවුල් පාලනය සහ රාජ්‍ය මර්දනය යොදවා අපව පරාජය කළ නොහැකි බව ඔවුන් මතක තබා ගත යුතුයි.

(සිය මැතිවරණ ප්‍රකාශය එළිදැක්වීමේ උත්සවයේදී කළ කතාවෙන්)


http://subitchamnews.com/

# 19වන සංශෝධනය අනිවාර්යයෙන් ඉවත් විය යුතුයි

**ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්**
**නීතිඥ දයාසිරි ජයසේකර**


අද වෙනකොට මහජනතාව ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඉදිරි වසර පහ තුළ ගෙන යෑමට සැලැසුම් කර තිබෙන වැඩපිළිවෙළට සහයෝගය දෙන්න පෙළගැහිලා ඉන්නවා. වත්මන් ජනාධිපතිවරයා බොහෝ කාලයකට පස්සේ මේ රටේ බිහි වුණ විශිෂ්ට නායකයෙක්. ඊළඟට අග්‍රාමාත්‍යවරයා කියන්නේ මේ රටට නිදහස රැගෙන ආපු නායකයෙක් විතරක් නෙවෙයි රට පුරා ම සංවර්ධනයක් ඇති කළ නායකයෙක්. ඒ කළ මෙහෙවරට එතුමාට ජනතා ගෞරවය නො අඩුව තිබෙනවා. ඒ නිසා මේ රටේ අනාගතය වෙනුවෙන් ශක්තිමත් ආණ්ඩුවක් හදන්න මුළු රටේම ජනතාව පෙළ ගැහෙනවා කියන විශ්වාසය අපට තිබෙනවා. වත්මන් ජනපතිවරයාගේ සෞභාගයේ දැක්ම මේ මහ පොළොවේ යථාර්ථයක් කරන්නයි අප කටයුතු කරන්නේ.

ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිධුරයට ගේන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගාමක බලවේගය විදිහට කටයුතු කළා. අපේ ශක්තියත් වත්මන් ජනපතිතුමාට තිබුණා. එසේ නොවුණා නම්, ඇතැම් විට රටේ අභ්‍යන්තර පාලනය වෙනස් වෙන්න තිබුණා. නමුත්, අපි නිවැරැදි වෙලාවට නිවැරැදි තීන්දුවක් ගත්තා. මේ රටට ගැළපෙන නායකයා වෙනුවෙන් අපි කැප වුණා. අපේ පක්ෂයේ ක්‍රියාවලිය මේ රටේ ප්‍රගතිශීලී ජනතාව අගය කරනවා. අනාගතයේදීත් මේ රටේ අනාගතය තීරණය කරන, බලඅධිකාරිය තීරණය කරන සාධකය බවට පත් වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි.

***මේ මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණට තුනෙන් දෙකක බලයක් ලබාගැනීම වෙනුවෙන් අපි කැප වෙනවා. අනිවාර්යයෙන්ම 19වන සංශෝධනය ඉවත් විය යුතුයි. මේකෙන් වෙන්නේ දිනෙන් දින රට අස්ථාවර වෙන එක විතරයි. සම්පූර්ණයෙන්ම හෝ මේක ඉවත් කරලා පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් එන්න ඕනෑ. එහෙම නැත්නම් තිබුණ ජනාධිපති බලතල යම් යම් කාරණා ඉවත් කරලා නැවත ලැබෙන්න ඕනෑ. ඒක සිදු නොවනතාක් මේ බෙදීම නවත්වන්නත් බැහැ. රට අස්ථාවර වෙන එක නවත්වන්නත් බැහැ. ඒ නිසා ස්ථාවරභාවයක් රට තුළ ගොඩනඟන්න නම් 19 වැනි සංශෝධනය නැවත සංශෝධනය කළ යුතුයි කියලයි අපි කියන්නේ.***

දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම ඉදිරියේදී පත් වන රජයේ ප්‍රමුඛ ප්‍රතිපත්තියක්. එය බණ්ඩාරනායක මැතිනියගේත් ප්‍රධාන ප්‍රතිපත්තිය වුණා. වත්මනේ ඇති වෙලා තිබෙන ව්‍යසන තත්ත්වයත් එක්ක අපි අපේ දේවල් නිෂ්පාදනය කරගත යුතුයි කියන කාරණය කවදාටත් වඩා ජේන්න අරගෙන තිබෙනවා. එහෙම නොවුණොත් විශාල විදේශ විනිමය අර්බුදයකට රට තල්ලු වෙනවා. දැනටමත් ඇඟලුම් කර්මාන්තයේ ගැටලුව ජේන්න තිබෙනවා. ලැබෙන්න තිබුණ විදේශ විනිමය අඩු වෙලා, අපේ ශ්‍රමිකයන් විදේශවල සේවය කරලා එවන මුදල් අඩු වෙලා, සංචාරක කර්මාන්තයෙන් ලැබුණ ආදායම අඩු වෙලා. මේ බලපෑම් එක්ක රට විශාල ආර්ථික අර්බුදයකට ගමන් කරමින් තිබෙනවා. මෙතැනින් ගොඩ එන්න කරන්න පුළුවන් එකම දේ තමයි ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් ගොඩනඟන එක. වත්මන් ජනාධිපතිවරයා ජාතිකවාදී ප්‍රතිපත්තියක ඉන්නවාය කියන එක බොහෝම පැහැදිලියි. රට ආරක්ෂා කරන, සිංහල බෞද්ධයන් ආරක්ෂා කරන නායකයකු ලැබීම මේ රට ලද භාග්‍යයක් ලෙසයි මම දකින්නේ.

අද තරුණයන්ට වෙලා තියෙන්නේ ඉලක්කයක් නොමැති වීමයි. අපේ රටේ දරුවෙකුගෙන් අද ඇහුවත් කියන්නේ වෛද්‍යවරයෙක්, නීතිඥවරයෙක්, ඉංජිනේරුවරයෙක් වෙනවා කියන එක. කවදාවත් ඔහු හෝ ඇය හොඳ ව්‍යාපාරිකයෙක් වෙනවා කියලා කියන්නේ නැහැ. එතකොට ජේනවා අපේ රටේ දරුවන්ට පොඩි කාලේ ඉඳලා තියෙන මානසික ප්‍රශ්නයක් මෙතැන තියෙනවා කියලා. එතැනින් ගොඩගන්න නම්, අප අපේ රටේ දරුවන් කුඩා කාලයේ ඉඳලා පෙළගස්වන වැඩපිළිවෙළකට යා යුතුයි.


http://telo.org/

# ජාත්‍යන්තර මැදිහත්වීමක් හැර වෙන විකල්පයක් නැහැ

දෙමළ ජනතා ජාතික සන්ධාන නායක
**සී. වී. විග්නේෂ්වරන්**

1. නීත්‍යානුකූලව දෙමළ ජනතාව ජාතියක් *(Nation)* වන්නේ ය. උතුරු නැගෙනහිර පළාත් ඔවුන්ගේ නිජබිමයි. *(Traditional Homeland)* ජාත්‍යන්තර නීතිය අනුව ඔවුන්ට ස්වයං තීරණ අයිතිවාසිකම් තිබේ. *(Right of Self Determination)* ඒකාබද්ධ වූ උතුරු නැගෙනහිර පළාත්වල ජනතා පරමාධිපත්‍යයෙන් යුක්ත ඉහළ මට්ටමේ ස්වයං තීරණ අයිතිය සන්ධීය මූල ධර්ම මත දිනාගැනීම දෙමළ ජනතා ජාතික සන්ධානයේ අරමුණ වේ. එහෙත් ශ්‍රී ලංකාවේ

සාමාන්‍ය පෙළ, උසස් පෙළ පසු කළාට පස්සේ එතැනින් ඉදිරියට ඔවුන් ගෙනියන්න වැඩපිළිවෙළක් ඕනෑ. අනෙක් කාරණය තමයි හැම තරුණයෙක්ම ආණ්ඩුවේ රැකියා බලාගෙන ඉන්නවා. තමන්ට ස්වාධීනව නැගිටින්න පුළුවන් වැඩපිළිවෙළක් මේ රටේ තියෙනවා කියලා තරුණයින් විශ්වාස කරන්නේ රැකියාවක් නොමැතිව ඉන්න කාලේ. ඒ කාලය වෙනකොට ආරම්භ කරන කුමන හෝ රැකියාවක දක්ෂයෙක්, ප්‍රවීණයෙක් කාලයත් එක්ක ගොඩනැගෙනවා. ඒ නිසා තරුණ ප්‍රශ්නයට උත්තරය හොයන්න මුල ඉඳලම නිවැරැදි වැඩපිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

තරුණ අසහනය මතු වෙලා තිබෙන්නේ අධ්‍යාපන ප්‍රතිපත්තියේ ප්‍රශ්නයක් නිසා. අධ්‍යාපන ප්‍රතිපත්තිය නිවැරැදිව රැකියා ඉල්ලුමට සරිලන මිනිසුන් ගොඩනගන්න ක්‍රියාත්මක වෙනවා නම්, ඉගෙන ගන්නවා වගේම මේ ප්‍රශ්නයට විසඳුම් හොයන්නත් පුළුවන්.

දේශපාලඥයින්ගේ දූෂිත බව හැම මැතිවරණයකදීම කරළියට එන මාතෘකාවක්. දූෂණ චෝදනා තියෙන අය වුණත් පත් කරලා එවන්නේ ජනතාව. මේක තමයි මෙතැන තියෙන ප්‍රශ්නය. ඒ නිසා මේ මැතිවරණයේදීවත් ජනතාව ටිකක් කල්පනා කරන්නට ඕනෑ දේශපාලනයෙන් හම්බ කරපු දේශපාලකයෝ ගෙදර නවත්වන්න. එක පැත්තකින් ජනතාව පක්ෂයට ඡන්දෙ දෙනවා. ඒ වගේ චෝදනා එල්ලවෙන අය ඉන්නවා නම් ඔවුන් ලැයිස්තුවෙන් ඉවත් කිරීමේ අයිතිය තිබෙන්නෙ පක්ෂයට. එක පැත්තකින් ජනතාව තෝරලා එවන්නේ පක්ෂය දීපු අපේක්ෂකයා. මේ ප්‍රශ්නය හැම තැනම තියෙනවා. ඒ නිසා අනාගතයේදී මේ ප්‍රශ්නයට අප නිවැරැදිව මුහුණ දිය යුතුයි.

(පුවත්පත් සාකච්ඡාවක් ඇසුරිනි)

---

ජනවාර්ගික ප්‍රශ්නයක් නොමැති බවත් ආර්ථික ප්‍රශ්නයක් පමණක් පවතින බවත් වර්තමාන ජනාධිපතිවරයා නිශ්චිතව ප්‍රකාශ කර ඇත. මෙවැනි තත්වයක් යටතේ ජනවාර්ගික ප්‍රශ්නයට දිගුකල් පවත්නා විසඳුමක් ලබාගැනීමට ජාත්‍යන්තර මැදිහත් වීමකින් ජනමත විචාරණයක් පවත්වන ලෙස ජාත්‍යන්තර ප්‍රජාවටත් එක්සත් ජාතීන්ගේ සංවිධානයටත් බල කිරීම හැර අපට වෙනත් විකල්පයක් නැත. අවසාන විසඳුමක් වෙත ළඟා වන තෙක් යුද්ධයෙන් හානියට පත් උතුරු නැගෙනහිර පළාත් නැවත ගොඩනැගීමට අන්තර් කාලීන විසඳුමක් ජාත්‍යන්තර ප්‍රජාවගේ මැදිහත් වීමකින් ඇතිකිරීමට ඉන්දියාව සහ වෙනත් ජාත්‍යන්තර රටවල් සමග අපි සාකච්ඡාවක් දිගින් දිගටම පවත්වන්නෙමු.

2. ජනවාර්ගික සංහාරය සිදුවී දස අවුරුද්දකට ආසන්න කාලයක් ගෙවී ගොස් ඇතත් යුද අපරාධ, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ යනාදිය පිළිබඳව යුක්තිය ඉෂ්ට වී නැත. එමෙන්ම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී ශ්‍රී ලංකාව අනුග්‍රහය දැක්වූ 30/1 දරණ යෝජනාවෙන්, ශ්‍රී ලංකාව දැන් ඉවත් වන බවට නිල වශයෙන් දන්වා ඇති නිසා ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් කිසිඳු යුක්තියක් හෝ සාධාරණත්වයක් අපේක්ෂා කළ නොහැකිය. එම නිසා, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර අපරාධ අධිකරණය වෙත යොමු කරන ලෙස ජාත්‍යන්තර ප්‍රජාවට බල කිරීම අපට තියෙන එකම විකල්ප මාර්ගය වී ඇත.
3. උතුරු නැගෙනහිර ජීවත් වන 90,000 කට ආසන්න වැන්දඹුවන්ගේ ජීවිතය නගා සිටුවී සඳහා ජීවනෝපාය සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමු.
4. දෙමළ ජන සංහාරයට අදාළ ස්වාධීන ජාත්‍යන්තර විමර්ශනයත් කෙරෙන අවස්ථාවේදී අතුරුදහන් කරන ලද අය සම්බන්ධයෙන් විසඳුමක් ලැබේ යැයි අපේක්ෂා කරමු. එතෙක් ඩයස්පෝරාවේ වාසය කරන දෙමළ ජනතාවගේ මෙන්ම ජාත්‍යන්තර සංවිධාන වල සහයෝගයෙන් මෙම ගැටලුවට විසඳුම් ලබාගැනීමට අපේක්ෂා කරමු.
5. දෙමළ දේශපාලන සිරකරුවන් නිදහස් කරගැනීමටත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරගැනීමටත් ජාතික සහ ජාත්‍යන්තර තලයේ කටයුතු කරන්නෙමු.
6. ලෝකයේ ඉතා ඉහළ මට්ටමින් හමුදාකරණය කරන ලද ප්‍රදේශ අතරින් ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත ද එකකි. පුද්ගලික ඉඩම්වලින් පමණක් නොව උතුරු නැගෙනහිර පළාත්වලින් හමුදාව ඉවත් කළ යුතුය යන්න අපේ ස්ථාවරය වේ.
7. ජාත්‍යන්තර නීතිය අනුව ශ්‍රී ලංකාවේ සිදුවන ඉඩම් පැහැරගැනීම් සහ සිංහල බෞද්ධකරණය මහ පරිමාණයෙන් මානව හිමිකම් උල්ලංඝණය කිරීමකි. එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන ඇතුළු සිවිල් සමාජ සංවිධානවල මෙකී ප්‍රශ්නය කෙරෙහි අවධානය යොමු කරමු. මේ පිළිබඳව එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයෙකු පත්කරන ලෙසද අපි ඉල්ලා සිටිමු.
8. දෙමළ ජනතාවගේ ආර්ථික සංවර්ධනය, අධ්‍යාපනය, ක්‍රීඩා සහ සංස්කෘතික අභිවෘද්ධිය සඳහා දැඩි උනන්දුවකින් ක්‍රියාත්මක වන්නේ ය.
9. 1958 සිට 2009 දක්වා දෙමළ ජනතාවට එරෙහිව ක්‍රියාත්මක කරන ලද ජනවාර්ගික සංහාර ක්‍රියාකාරිත්වයට අදාළ තොරතුරු වලින් උතුරු නැගෙනහිර පළාත්වල කෞතුකාගාර සහ සිහිවටන වශයෙන් ඉදිකිරීමට කටයුතු කරන්නෙමු.
10. ජාත්‍යන්තර මට්ටමේ සියලුම රටවල් සමඟ දෙමළ ජනතාවගේ ආරක්ෂාව සහතික කිරීමටත් දේශපාලන ආර්ථික සමාජ සංස්කෘතික අභිවෘද්ධිය ස්ථාපනය කිරීම සඳහා කටයුතු කරන්නෙමු.

දෙමළ ජනතා ජාතික සන්ධානය
මැතිවරණ ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලදි.




# දෙමළ ජනතාවට මේ ආණ්ඩුව විශ්වාසයි

ඊ.පී.ඩී.පී. නායක
**ඩග්ලස් දේවානන්දා**

අප මුලින්ම ඊ.පී.ආර්.එල්.එෆ් සංවිධානය හැටියට ආයුධ සන්නද්ධව දේශපාලනයේ යෙදුණ කාලයේත් වාමාංශික නැඹුරුව තමයි කටයුතු කළේ. පසුගිය කාලයේ පැවති ආණ්ඩුවලින් අපට සිදුවුණු අක්‍රමිකතා සහ යම් යම් අඩුපාඩුකම්, කුඩම්මාගේ සැලකිලි නිසා තමයි අපට මේ වගේ දෙයකට යොමු වීමට සිදු වුණේ. උසස් අධ්‍යාපනයේ ප්‍රමිතිකරණ සහ අපේ ප්‍රදේශවල සංවර්ධනය පිළිබඳව කිසිවෙක් සොයා බැලුවෙ නැහැ. ජාතිවාදී අරගල ආරම්භ වුණා. මෙවැනි කරුණු තමයි අපට එවැනි ගමනක් යාමට ප්‍රධාන හේතුවක් වුණේ. නමුත් අප ඉදිරියට ගියේ වාමාංශික ව්‍යාපාරයක් ලෙසිනුයි. මෙය කොටි සංවිධානය වැනි ව්‍යාපාරයක් නොවේ. ***දකුණේ කිසියම් සමාජමය අඩුපාඩුකම් නිසා 1971 සහ 1988, 89 කාලයේ දී ජනතා විමුක්ති පෙරමුණ කැරලි ඇති කළා. එවැනි අඩුපාඩුකම් අපටත් සිදු වුණා. අප එක්සත් ශ්‍රී ලංකාවක් තුළ සාමදානයෙන් සහ සහජීවනයෙන් ගමනක් යාමටයි අපේ අරමුණ තිබුණේ. ඒ නිසා අප සමඟ එකතුවීමට කැමති සිංහල වාමාංශික බලවේග සොයාගෙන ගියා. එවැනි බලවේග විශාල වශයෙන් අපට හමුවුණේ නැති නමුත් ඒ කාලයේ විකල්ප කණ්ඩායම නමින් දකුණේ ක්‍රියාත්මක වුණු කුඩා කණ්ඩායමක් අප සමඟ එකතු වුණා. අප ඒ අය සමඟ ඉදිරියට ගියා. ඉන්දු ලංකා ගිවිසුම දක්වා අප එම ගමන යන විට අපට තේරුණා ඉන්දු ලංකා ගිවිසුම ඉතා හොඳ බව. ඒ නිසා අප ආයුධ පැත්තකට දාලා ප්‍රජාතන්ත්‍රවාදී ගමනක් යායුතුයි යන නිගමනයට එළැඹුණා. ඒ කාලයේ ඊරෝස් සංවිධානය හෝ ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධානය හෝ ජාතිවාදී හැඟීමකින් කටයුතු කළේ නැහැ.***

කොල්වින් ආර්.ද.සිල්වා මහතා සහ වාමාංශික පැත්තේ අය ඒ කාලයේ කිව්වේ එක භාෂාවයි රටවල් දෙකයි. එසේ නොමැති නම් භාෂා දෙකයි එක රටයි කියා. නමුත් ඉන්පසු එයාලගෙ ස්ථාවරය කිසිදෙයක් එළියට ආවේ නැහැ. ඔවුන් මගහැර ගියා. එම තත්වය මත තමයි අපට *EPDP* වැනි පක්ෂයක් හදා ගැනීමට සිදු වුණේ. අප ආයුධ සන්නද්ධව සටන් කළ අවදියේ දකුණේ ප්‍රගතිශීලි බලවේග සමඟ මේ ගමන යායුතු බව අපගේ අරමුණ වුණා. නමුත්

එවැනි බලගතු ප්‍රගතිශීලී බලවේගවල සහාය අපට ලැබුණේ නැහැ. ඒ නිසා අප ඉදිරියට ආවේ විකල්ප කණ්ඩායම් සමඟයි.

අප කොටි සංවිධානයට විරුද්ධව කටයුතු කළ බව කිව නොහැකියි. අප හැමදාම බැලුවේ ජාතික සංහිඳියාව සහ අනෙකුත් ජාතීන් සමඟ එක්සත්භාවයෙන් යුතුව කටයුතු කිරීමටයි. එසේ කටයුතු කිරීමෙන් අපගේ ප්‍රශ්න විසඳා ගත හැකි යැයි අප විශ්වාස කළා. එයට විරුද්ධව ඔවුන් වැඩ කළ නිසයි අපට ඔවුන් සමඟ යම් යම් විවේචන ස්වභාවයන් ඇති වුණේ. අප ඒ කාලෙම කිව්වේ කොටි සංවිධානය යන ගමන අපගේ ජනතාවත් විනාශ කරගෙන කොටි සංවිධානයත් විනාශ කරගෙන යන ගමනක් කියලා. අද සිදුව තිබෙන්නේ එයයි. ඒ නිසා අපගේ ස්ථාවරය අප කියන විට ඔවුන් අපව ඝාතනය කරන්න නොයෙක් අවස්ථාවල උත්සාහ කළා.

ඉන්දු ලංකා ගිවිසුමෙන් පසුව අපට වැටහීමක් සහ විශ්වාසයක් ඇති වුණා ජාතික ව්‍යුහයට පැමිණ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයක් තුළින් අපේ ගැටලු විසඳා ගැනීමට හැකි බව. ඒ නිසා අප ප්‍රජාතන්ත්‍රවාදය තෝරා ගත්තා.

පවතින රජය පිළිබඳව විශ්වාසයක් සහ හොඳ අවබෝධයක් අපට තිබෙනවා. මේ රජය අපේ ප්‍රදේශවල ජනතාවගේ ප්‍රශ්න ටික විසඳන බවට අපට ලොකු විශ්වාසයක් තිබෙනවා. නමුත් ඒ සඳහා අපට දෙමළ ජනතාවගේ සහයෝගය අවශ්‍යයි. දෙමළ ජනතාවගේ සහයෝගය ප්‍රමාණවත්ව ලැබෙනවා නම් මේ රජයෙන් තව තවත් විසඳුම් ලබා ගත හැකියි. අනෙක් අය දේශපාලන විසඳුමක් පිළිබඳව කියද්දී අප කියන්නේ පළාත් සභා ක්‍රමය තිබෙන බව. 13 වන සංශෝධනය මඟින් පළාත් සභා ක්‍රමය නිසියාකාරව ක්‍රියාත්මක කළ හොත් ජනතාවගේ ගැටලු විශාල වශයෙන් විසඳා ගත හැකියි මට හැඟී යන්නේ පළාත් සභා ක්‍රමය යනු අපගේ දේශපාලනික සහ අනෙකුත් ප්‍රශ්නවලට විසඳුමක මූලාරම්භය වන බවයි. එතනින් පටන්ගෙන අපට ඉදිරියට යා හැකියි. උතුරු නැගෙනහිර ප්‍රශ්නය විසඳීම සඳහා පළාත් සභා ක්‍රමය ගෙන ආවත් එය ලංකාව පුරාම ක්‍රියාත්මක වී දැනට දකුණේ හා අනෙකුත් ප්‍රදේශවල ජනතාව එම පළාත් සභා ක්‍රමය භුක්ති විඳිමින් සිටිනවා.

ජනවාර්ගික ප්‍රශ්නයක් දැන් තිබේ යැයි කිව නොහැකියි. මුල් කාලයේ දී දකුණු ප්‍රදේශයෙන් තමයි ජාතිවාදී ප්‍රශ්න මතු වුණේ. අපේ දෙමළ ජනතාව එය ලොකුවට මවාපෑමට පටන් ගත්තා. දැන් එය අවසන් වෙමින් පවතිනවා. 2009 යුද්ධය නිම වූ පසු ජනතාවට කිසිදු ප්‍රශ්නයක් නැහැ. දකුණේ අයට උතුරට යන්නත් උතුරේ අයට දකුණට යන්නත් පුළුවන් වගේම ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට ඕනෑම කෙනකුට යා හැකියි. නමුත් යම් යම් ආණ්ඩුවලින් සැලසුම් සහගතව කරනු ලබන යම් යම් දේවලට අප විරුද්ධව විවේචන ඉදිරිපත් කරනවා.

***දෙමළ දේශපාලන පාර්ශ්වය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පත්වීමට පෙර දෙමළ ජනතාව අතර ප්‍රචලිත කළේ මෙය මහජාතිවාදී ආණ්ඩුවක් වන බව සහ එතුමන්ලාගේ ක්‍රියාකලාපය එවැනි තත්වයකට යා හැකි බවයි. නමුත් ජනාධිපති තුමාගේ පදවි ප්‍රාප්තිය අනුරාධපුරයේ දී සිදුවුණ මොහොතේදී එතුමා පැහැදිලි ප්‍රකාශයක් කළා, "මට මෙම ජනාධිපතිවරණයේ දී බහුතර ඡන්ද ලැබුණේ මේ රටේ බහුතරය නියෝජනය කරන ජනතාවගෙන්. දෙමළ හා මුස්ලිම් ජනතාව මා ගැන විශ්වාසය තබා ඒ අයගේ ඡන්දය මට ලබා දුන්නේ නැහැ. නමුත් මම මේ රටේ සියලු දෙනාගේම ජනාධිපතියි. බහුතර ජාතීන් හෝ වේවා සුළුතර ජාතීන් හෝ වේවා මම සියලු දෙනාගේම ජනාධිපතියි" කියා. අප එය විශ්වාස කරනවා.***

අප සහ රජය අතර පැහැදිලි අවබෝධයක් තිබෙන නිසා දෙමළ ජනතාව අපට ප්‍රමාණවත් ඡන්දය ලබා දී ප්‍රමාණවත් ආසන සංඛ්‍යාවක් ලබා දුන හොත් අපට උතුරේ ජනතාවගේ ප්‍රශ්න ඉතා පහසුවෙන් විසඳා ගත හැකියි. උපාධිධාරීන්ගේ ප්‍රශ්න තිබෙනවා. නමුත් එය රටේ සියලුම පළාත්වල තිබෙන ප්‍රශ්නයක්. සියලු දෙනාටම රජයේ රැකියා ලබා දිය නොහැකියි. ඒත් අපට උතුරේ රැකියා අවස්ථාවන් බිහි කළ හැකියි. කර්මාන්ත ශාලා, කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය වැනි අංශ සහ ස්වයං රැකියා උත්පාදනය කළ හැකියි. එමෙන්ම එම ප්‍රදේශවල පැවති කර්මාන්ත ශාලා නැවත ක්‍රියාත්මක කිරී මෙන් සහ නව කර්මාන්ත ශාලා බිහි කිරීමෙන් රැකියා විශාල සංඛ්‍යාවක් මේ ප්‍රදේශවල ජනතාවට ලබා දිය හැකියි. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශ ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා, ඒවා හරහාත් අපට ජනතාවට රැකියා ලබා දිය හැකියි. දැන් තිබෙන්නේ භාරකාර ආණ්ඩුවක්. ඒ නිසා වැඩිපුර දේවල් කර ගැනීමට හැකියාවක් නැහැ. නමුත් ධීවර ප්‍රජාව තුළ විශ්වාසයක් ඇති කිරීමට මෙම කාලසීමාවේ දී අපට හැකියාව ලැබුණා. ඉදිරියේදී ධීවර ප්‍රජාවගේ ගැටලු සහ යටිතල පහසුකම් නැංවීමට වැඩපිළිවෙළක් සැකසීමට අප බලාපොරොත්තු වෙනවා. කරදිය සහ මිරිදිය අංශ දෙකේම ස්වයංපෝෂිත තත්වයක් ඇති කිරීමට සහ එම මත්ස්‍ය අස්වැන්න අපනයනය කිරීමට කටයුතු කරන අතර ඒ හරහා විදේශ විනිමය විශාල වශයෙන් ලංකාවට ගෙන ඒමට හැකි වේ යැයි අප විශ්වාස කරනවා. ඒ සමඟම ව්‍යවසායකයන් සහ රැකියා අවස්ථා බොහොමයක්ද බිහි කළ හැකියි.

කොවිඩ් - 19 ගෝලීය සහ දේශීය වශයෙන් ක්‍රියාත්මක වූ ප්‍රශ්නයක්. මේ අවස්ථාවේ දී අප රජය විසින් ගත් සියලු ක්‍රියාමාර්ග ඉතාම ප්‍රශංසනීයයි. ඒ පිළිබඳව අප ඉතා ආඩම්බර විය යුතුයි. මැතිවරණයෙන් පසු අපට කවර මට්ටමේ වගකීම් පැවරේදැයි ඉතා ඉවසීමෙන් බලාපොරොත්තු විය යුතු දෙයක්. යෝජනා ගණනාවක් තිබෙනවා. ඒවා උතුරු නැගෙනහිරට පමණක් නොවෙයි ලංකාව පුරාම ඕනෑම අමාත්‍යාංශයක් මඟින් ක්‍රියාත්මක කළ හැකි යෝජනායි. ඒත් ජනතාවගේ අභිලාෂයන් සහ පත් වන තත්වය බලා ඉදිරි තීරණ ගන්නවා.

මම දේශපාලනය කිරීමට බලාපොරොත්තු වන්නේ තව වසර පහක් පමණයි. ඉන් පසු පක්ෂය විසින් ඉදිරි පියවර අරගෙන ඊළඟ නායකයා පත් කර ගනීවි. පක්ෂයක් කියන්නේ දුම්රියක් වගෙයි. ඇතැම් විට පිරිසක් කොටුවෙන් දුම්රියට ගොඩ වී කන්කසන්තුරෙයි දක්වාම යනවා. තව පිරිසක් කොටුවෙන් නැඟ අතරමඟ බහිනවා. දිගටම යන අය රැඳී සිටීවි. අනෙක් පක්ෂවල මෙන් අප පක්ෂයේ නායකත්ව අර්බුද ඇතිවන්නේ නැහැ.

(පුවත්පත් සම්මුඛ සාකච්ඡාවක් ඇසුරිනි)




# ජාතීන් දෙකක් එක් රටක්

**ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම්**
**දෙමළ ජාතික ජනතා පෙරමුණ**

දෙමළ ජනතාවගේ අයිතීන් දිනා ගැනීමේ සන්නද්ධ අරගලය පසුගිය 2009 මැයි මාසයේ සිදු කරන ලද ජන සංහාරය හමුවේ නිහඬ කළා. එකී මොහොතේ පටන් 'ජාතීන් දෙකක් - එක රටක්' නමැති දේශපාලනමය අරමුණ සහිතව දෙමළ ජාතික ජනතා පෙරමුණ නමැති දේශපාලන පක්ෂය නියෝජනය කරන අපි පසුගිය වසර 10ක් තිස්සේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයේ අරගලයක යෙදී සිටිනවා.

අපගේ දෙමළ ජනතාව ඝාතනය කර, වහල්භාවයට පත් කරනු ලැබ අධ්‍යාපනය විනාශ කර, භාෂාව හා සදාචාරය විනාශ මුඛයකට ඇද දමා, අපගේ දේශයේ ආර්ථිකය කඩා බිඳ මංකොල්ල කා අප ජනතතාවගේ ජීවිත සහ ඔවුන්ගේ සිහිනයන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ ජාතිවාදී ගිනි ජාලාවට හසු කොට සුනු විසුනු කර තිබෙනවා.

නිමාවක් නොමැති දුක් වේදනාවන් හා අඛණ්ඩව සිදු කරනු ලබන විනාශවලට තිත තැබිය යුතු නම් ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ දී ශ්‍රී ලංකා රජය හා අන්තර්ජාතික ප්‍රජාව සමඟ කේවල් කිරීමේ සුදුසුකම් හා එඩිතරභාවයක් සහිත අවංක පුද්ගලයින් ජනතා නියෝජිතයින් ලෙස පත් කර යැවිය යුතුයි. එම නිසා අපගේ ජාතියේ දේශපාලන නිදහස වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය හමුවේ මෙම පාර්ලිමේන්තු මැතිවරණය දෙමළ ජනතාව මුහුණ දීමට නියමිත ප්‍රජාතාන්ත්‍රවාදී අරගලයක්.

අපගේ පක්ෂය හැර ශ්‍රී ලංකා රජය හා අනෙකුත් දෙමළ දේශපාලන පක්ෂ දෙමළ

ජනතාවගේ දීර්ඝකාලීන ජාතික ප්‍රශ්නයට විසඳුමක් ලෙස දෙමළ ජනතාවට ලබා දීමට යෝජනා කර සිටින්නේ, බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දෙන ස්වෛරීභාවය බෙදා වෙන් කළ නොහැකි සහ ස්වෛරීභාවය අන්සතු කළ නොහැකි ඒකීය රාජ්‍ය සංකල්පය පදනම් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්.

මෛත්‍රී - රනිල් ආණ්ඩුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හරහා සකසා ඇති ඉහත ඒකීය රාජ්‍ය සංකල්පය සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ අතුරු වාර්තාව පාර්ලිමේන්තුවේ සිටින දෙමළ ජනතා නියෝජිතයින්ගේ සහය ඇතිව අපගේ ජනතාව මත පැටවීමේ රැවටිලිසහගත උත්සාහය හෙළි කර එය කිසිවිටෙක දෙමළ ජනතාවට ලබා දෙන විසඳුමක් නොවන බව අපගේ ජනතාව හමුවේ අප පැහැදිලි කරමින් සිටිනවා.

දෙමළ ජාතික ජනතා පෙරමුණ පාර්ලිමේන්තුවට තේරී පත් වීමෙන් අනතුරුව මෙකී ඉලක්ක කරා ළඟා වීම වෙනුවෙන් ඒඩිතරව හා කැපවීමෙන් ක්‍රියා කරනවා.

## තිරසාර දේශපාලන විසඳුම්

අලුතින් සකසනු ලබන ඒකීය රාජ්‍යයට අදාල අතුරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කොට දෙමළ ජනතා සන්සදය විසින් සකසනු ලැබ ඇති විසඳුම් යෝජනාව අනුව ඒකාබද්ධ කරන ලද උතුරු නැගෙනහිර මව්රට දෙමළ ජනතාවගේ අනන්‍යතාව සහිත ස්වෛරී රාජ්‍යයක් වශයෙන් පිළිගෙන ඊට අනන්‍ය වූ ස්වෛරීභාවය හා ජාත්‍යන්තර නීතිවලට අනුව දෙමළ ජනතාවගේ ස්වයං නිර්ණය අයිතීන් අනුව දෙමළ ජාතික ප්‍රශ්නයට විසඳුම් සෙවීමට අපි දිගටම සටන් කරනවා.

## ජන සංහාරයන්ට අදාළ ජාත්‍යන්තර යුක්තිය

දෙමළ දේශයේ සිදු කරන ලද යුධ අපරාධ, මිනිස් සංහතියට එරෙහිව සිදු කරන ලද අපරාධ, ජන සංහාර අපරාධ පිළිබඳව ජාත්‍යන්තර අපරාධ අධිකරණ හරහා හෝ විශේෂ අපරාධ අධිකරණය හරහා පරීක්ෂණයක් දියත් කිරීමට ජාත්‍යන්තර ප්‍රජාවගේ සහය ලබා ගන්නවා.

## දේශපාලන සිරකරුවන්ගේ නිදහස

සියලුම දෙමළ දේශපාලන සිරකරුවන් කොන්දේසි විරහිතව නිදහස් කළ යුතු යැයි බල කර ජාත්‍යන්තර වශයෙන් හඬක් නගන අතර කේවල් කිරීම සඳහා ලැබෙන අවස්ථාවන්වල ඔවුන්ගේ නිදහස වෙනුවෙන් අපි කේවල් කරනවා.

## ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම

දීර්ඝ කාලයක් තිස්සේ දෙමළ ජනතාව තළා පෙළීමට හේතුවක් වී තිබෙන කෲරතවයෙන් යුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීමට අවශ්‍ය දේශපාලනමය ක්‍රියා පිළිවෙතක් ජාත්‍යන්තරව සහ දේශීයව දියත් කරන්නෙමු.

## බලහත්කාරයෙන් අතුරුදහන් කළ පුද්ගලයින්

බලහත්කාරයෙන් අතුරුදහන් කළ පුද්ගලයින් සම්බන්ධයෙන් ජාත්‍යන්තර පරීක්ෂණ යාන්ත්‍රණ යටතේ යුක්තිය ලබා දිය යුතු යැයි ජාත්‍යන්තර මට්ටමින් හඬ නගන්නෙමු.

## නිජබිමෙන් හමුදාව පිටමන් කිරීම

ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවට එරෙහි යුධ අපරාධ, මනුෂ්‍යත්වයට එරෙහිව සිදු කරන ලද අපරාධ, ජන සංහාර අපරාධ පිළිබඳව ජාත්‍යන්තර පරීක්ෂණයන් හරහා යුක්තිය ඉටුවන තෙක් හමුදාව උතුරු නැගෙනහිර දෙමළ නිජබිමෙන් පිට විය යුතු යැයි හඬ නගන්නෙමු.

රජයේ හා පුද්ගලික ඉඩම් නිදහස් කර ගැනීම

උතුරු නැගෙනහිර දෙමළ නිජබිමේ පිහිටි රජයේ සහ පුද්ගලික ඉඩම්වල කඳවුරු ලා සිටින රජයේ හමුදාව එම ප්‍රදේශවලින් ඉවත් කර එකී ඉඩම්වල නැවත පදිංචි කිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා හඬ නගන්නෙමු.

## සිංහල බෞද්ධකරණයට එරෙහි වීම

උතුරු නනැගෙනහිර දෙමළ නිජබිමේ රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදුවෙමින් තිබෙන සිංහල බෞද්ධකරණය හා සිංහල පවුල් පදිංචි කරවීම් නැවැත්වීමට පියවර ගන්නෙමු.

## තිරසාර සංවර්ධනය

උතුරු නැගෙනහිර යුද්ධයෙන් පීඩාවට පත් කලාපයක් ලෙස ප්‍රකාශ කොට එම කලාපය නැවත ගොඩනැගීම (ආර්ථික හා මානව සම්පත්) සහ තිරසාර සංවර්ධනය, තරුණ තරුණියන්ට රැකියා අවස්ථාවන් ලබා දීමට අවශ්‍ය මුදල් මෙහෙයවීම පිණිස උතුරු නැගෙනහිර පළාත්වල තෝරා පත් කරනු ලබන ජනතා නියෝජිතයින්ගෙන් සැදුම් ලත් පොදු ව්‍යුහයක් පිහිටුවා ඊට අවශ්‍ය මුදල් ඍජුවම ලබා දීම ජාත්‍යන්තර ප්‍රජාව විසින් සහතික කළ යුතු යැයි අඛණ්ඩව ජාත්‍යන්තර මට්ටමින් හඬ නගන්නෙමු.

තරුණයින්ගේ රැකියා අවස්ථාවන්, ප්‍රචණ්ඩත්වය හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තරුණයින් ඉන් මුදවා ගැනීමට පියවර ගන්නෙමු. සිය දිවි නසා ගැනීම වැලැක්වීමේ යාන්ත්‍රණ වැනි දේ අපි ඉලක්ක කොට ගෙන ඇත්තෙමු.



http://www.ft.lk/opinion

# අපේ ඉලක්කය දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් සුරකින සිංහල ජනතාව පිළිගන්නා විසඳුමක්


**එම්.ඒ. සුමන්දිරන්**

**දෙමළ ජාතික සන්ධානය**


අපේ ඉලක්කය එක රටක් තුළ සිංහල ජනතාව පිළිගන්නා ආකාරයෙන් දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් සහතික කෙරෙන දේශපාලන විසඳුමක් කරා යෑමයි. අපේ දේශපාලන ඉලක්කය කොයි ආකාරයෙන් සැකසිය යුතු ද යන්න පිළිබඳව අපි පැහැදිලිව ප්‍රකාශ කර තියෙනවා. රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සාකච්ඡා තුළින් සිංහල ජනතාව පිළිගන්නා ආකාරයටයි අප දේශපාලන විසඳුම සැකසෙන්නේ. සිංහල ජනතාවට නොදන්වා අප අපගේ කිසිවක් කිරීමට සූදානම් නැති බවත්, ඔවුන් ජනමත විචාරණයකින් අපගේ අභිලාෂයන්ට අනුව ඡන්දය ලබාදිය යුතු බවත් අපේ පිළිගැනීමයි. එවැනි විසඳුමක් ශක්තිමත් දේශපාලන විසඳුමක් වන්නේ යැයි අපි අවස්ථා කිහිපයක දී ම පැහැදිලි කර තිබෙනවා. ඇතැමුන් අපි ගමන් කරන දිශානතිය පිළිබඳව ජනතාව අතර අවුල් සහගත තත්ත්වයන් ඇති කරනවා. මා සහ සම්බන්ධන් එක් වී රට බෙදන්න යන බවයි ඔවුන් කියන්නේ. එහෙත්, අපි කිසිදාක රට බෙදන්න උත්සාහ කරන්නේ නෑ.

දෙමළ ජාතික සන්ධානය මෙතෙක් දෙමළ ජනතාව වෙනුවෙන් කර ඇති ක්‍රියාකාරකම් කිරා මැන බලා දෙමළ ජනතාව විසඳුමක් ගතයුතුයි. අපේ අදහස් අන්තර් කාලීන වාර්තාව මගින් ඉදිරිපත් කර තිබෙනවා. එහි අන්තර් ගත කරුණු

සියලුදෙනාම දැනගත යුතුයි. සන්ධීය (ෆෙඩරල්) ආණ්ඩුක්‍රමයේ ඒකක අප කොයි ආකාරයෙන් ගොඩනැගීමට අදහස් කරන්නේ ද යන්න එකී වාර්තාවේ පැහැදිලිව ප්‍රකාශ කොට තිබෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කරන මෙහෙයුම් කමිටුවේ දෙමළ ජාතික සන්ධානය වෙනුවෙන් දෙදෙනෙක් පමණක් නියෝජනය කළා. එපමණක් නොව දකුණු පළාත් වල සිංහල මහ අමාත්‍යවරු සත්දෙනෙකුගේ යෝජනා ද අපි එහි අන්තර්ගත කළා. එහෙත් මෙහිදී උතුරු - නැගෙනහිර පළාත්වල මහා අමාත්‍යවරු දායක වූයේ නැහැ. දකුණු පළාත්වල මහ ඇමතිවරු හත් දෙනාම බලය බෙදීම අත්‍යවශ්‍ය බව සනාථ කළ අතර ආණ්ඩුකාරවරුන් එසේ බලය බෙදීම අවශ්‍ය නොවන බවටත් අදහස් ප්‍රකාශ කළා.

කෙසේ වුවත් අප විසින් සම්පාදනය කළ අතුරු වාර්තාවට බාධා පැමිණවීම පිණිස එදා පාලනය අතර මගදී බිඳ දැමුවා. කෙටුම්පත ක්‍රියාත්මක වුවහොත් රට බෙදෙනු ඇත යනුවෙන් සිංහල නායකයින් අපට චෝදනා කරනවා. ඒ සමඟම දෙමළ පාර්ශ්වයන් ද අපට චෝදනා කරනවා. මේ රටේ ඒකීය රාජ්‍යයක් තුළ පමණක් අප කොටුකරන ලද බවයි අපේ පාර්ශවය විසින් චෝදනා කරන්නේ. ප්‍රථමයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත මැනවින් කියවා බලන ලෙස අපි ඉල්ලා සිටිමු.

දෙමළ ජනතාව තම දේශපාලන ඉලක්කය සහ ස්ථාවරය කෙරෙහි ස්ථාවරව සිටින බව පැහැදිලි කළ යුතුයි. පාර්ලිමේන්තු ආසන විස්සක් සමඟ අපි පාර්ලිමේන්තුවට තුළට ප්‍රවේශ වීමේ දී එය ඔවුනට ආසන සියයක් ලෙස ප්‍රදර්ශනය වේවි. එම බලය අපට ප්‍රදානය කිරීම පිළිබඳව දෙමළ ජනතාව තීන්දු කළ යුතුයි. අපේ දේශපාලන බලය ගොඩනැගීම ජනතාවගේ වගකීමක්. අපි බලය ඉල්ලන්නේ අප සඳහා නොව, දෙමළ ජනතාව වෙනුවෙන්.

නැවතත් අපේ අනන්‍යතාව පෙන්නුම් කළයුතු අවශ්‍යතාව මතුවී තිබෙනවා. 2015 බිහි වූ යහපාලනය නිසා දෙමළ ජනතාවට නිදහසේ හුස්ම ගැනීමේ වාතාවරණයක් ගෙ ාඩනැගුණ මර්දනකාරී පාලනයක සිට අපේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ප්‍රදර්ශනය කළහැකි පරිසරයක් ගොඩනැගුණා. හමුදාව විසින් අත්පත් කරගන්නා ලද අපේ ඉඩකඩන් බොහොමයක් නිදහස් කළා. එහෙත් තව බොහෝ ඉඩකඩම් නිදහස් කරගැනීමට තිබෙනවා. අද නැවත වරක් ඉඩම් පැහැර ග ැනීම සිදුවෙමින් පවතිනවා. එහෙත් එදා අධි ආරක්ෂිත කලාප වශයෙන් පැවති 80%ක් පමණ ඉඩම් නිදහස් කර තිබෙනවා.

## අපගේ ජයග්‍රහණ

2009 මැයි මාසයේ යුද්ධය අවසන් වන වකවානුවේ දී අපි දේශපාලන වශයෙන් සහ ආර්ථික වශයෙන් බිඳවැටී සිටියා. එදා තත්වය සමඟ සැසඳීමේ දී පසුගිය දස වසර තුළ අප සෑහෙන ප්‍රගතියක් ලබා තිබෙනවා. මෙහිදී දෙමළ ජාතික සන්ධානයේ කාර්යභාරය ඉතා වැදගත්. විශේෂයෙන් :

- යාපනය අර්ධද්වීපයේ ශ්‍රී ලංකා හමුදාව අත්පත් කරගෙන සිටි දෙමළ ජනතාවගේ පුද්ගලික ඉඩම් සහ රජයේ ඉඩම්වලින් 70% ක් එනම් අක්කර 75,000 කට ආසන්න ප්‍රමාණයක් නිදහස් කරගන්නා ලදි.
- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටි දෙමළ දේශපාලන සිරකරුවන් 219 දෙනෙකුගෙන්, 109ක් දෙමළ ජාතික සන්ධානයේ රජය සමඟ පවත්වන ලද සාකච්ඡාවල ප්‍රතිඵල වශයෙන් 2015 නොවැම්බර් මාසයේ සිට ක්‍රමානුකූලව මාස කිහිපයක් තුළ නිදහස් කරන ලදි. ඉතිරි දේශපාලන සිරකරුවන් සම්බන්ධයෙන් වර්තමාන පාලකයින් සමඟ ද අපි සාකච්ඡා කර ඇත්තෙමු. ඒ අයගේ තොරතුරු දැනටමත් රජයට ලබාදී ඇත. ඉන් 84 දෙනෙකුගේ නම් නීතිපති වෙත යොමු කර ඇති බවට තොරතුරු ප්‍රකාශයට පත් කොට ඇත. ඔවුන් නිදහස් කරගැනීමේ උත්සාහය අපි අඛණ්ඩව ඉදිරියට ගෙන යමු.
- 2015 සිට උතුරු නැගෙනහිර පළාත්වල හමුදාවේ මර්දනකාරී ක්‍රියාමාර්ග සහ පීඩනයන් බොහෝ දුරට අවම කරන ලදි.
- දෙමළ විමුක්ති කොටි සංවිධානය (එල්.ටී.ටී.ඊ) ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ජාත්‍යන්තර ප්‍රජාව විසින් කලින් ප්‍රකාශයට පත් කරන ලදි. දැන් දෙමළ ජනතාවගේ දේශපාලන ප්‍රශ්නයේ සාධාරණත්වය පිළිගෙන, ශ්‍රී ලංකාවේ රජය වෙත විවිධ මාර්ග වලින් බලපෑම් ඇති කරනු ලැබේ.

"

**දෙමළ ජනතාව තම දේශපාලන ඉලක්කය සහ ස්ථාවරය කෙරෙහි ස්ථාවරව සිටින බව පැහැදිලි කළ යුතුයි. පාර්ලිමේන්තු ආසන විස්සක් සමඟ අපි පාර්ලිමේන්තුවට තුළට ගියොත් එය ඔවුන්ට ආසන සියයක් ලෙස පෙනේවි. එම බලය අපට ප්‍රදානය කිරීම පිළිබඳව දෙමළ ජනතාව තීන්දු කළ යුතුයි. අපේ දේශපාලන බලය ගොඩනැගීම ජනතාවගේ වගකීම. අපි බලය ඉල්ලන්නේ අප සඳහා නොව දෙමළ ජනතාව වෙනුවෙන්.**

- ශ්‍රී ලංකාවේ වාසය කරන දෙමළ ජනතාව සමාන අයිතිවාසිකම් සහිතව ජීවත්වීමට සම අයිතිවාසිකම් පිළිබඳ සිතුවිලි සිංහල ජනතාව තුළ රෝපණය කළ යුතුය. මෙය පදනම් කරගෙන දෙමළ ජාතික සන්ධානය, දකුණේ සිංහල ජනතාව අතර දෙමළ පාර්ශ්වයේ සාධාරණත්වය පැහැදිලි කිරීමට උත්සාහ දරන ලද අතර ඉන් යම් සාර්ථකත්වයක් ද ලබා තිබේ. සිංහල ග්‍රාමීය මට්ටමේ කුඩා රැස්වීම් පවත්වන ලද අතර විශේෂයෙන්ම සිංහල ජනමාධ්‍යවල සම්මුඛ සාකච්ඡා සහ වාද විවාද වලට සහභාගි වුණෙමු.
- පසුගිය වසර 05 තුළ විශේෂ ආර්ථික සැලසුම් උතුරු නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක කරන ලදි. විශේෂයෙන්ම උතුරේ ක්‍රියා විරහිතව පැවති සමුපකාර සමිතිවලට නව ජීවයක් ලබා දෙන ලදි.
- උතුරු මුහුදු සීමාව තුළ තමිල්නාඩු ධීවරයින්ගේ අත පෙවීම් නිසා අපේ ධීවර ජනතාවගේ ජීවනෝපාය බෙහෙවින් හානියට ලක්ව තිබුණි. දෙමළ ජාතික සන්ධානය නයිලොන් දැල් ක්‍රමය තහනම් කරන නීතිය කෙටුම්පත් කොට පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලදී. ඒ සමගම ඉන්දියානු පාර්ශවයට දිගින් දිගටම කරන ලද බලපෑම් නිසා මෙම ගැටලුව ජයග්‍රාහී ලෙස විසඳීමට වාතාවරණයක් උදාවී ඇත.
- ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රයේ ඉතා වැදගත් මර්මස්ථානයක් වන 'මයිලිඩ්ඩි' ධීවර වරාය නිදහස් කරගන්නා ලදි. ධීවර බෝට්ටු 500ක් පමණ නවතා තැබිය හැකි ආකාරයෙන් පේදුරු තුඩුව වරාය සංවර්ධනය කරන ලදී. ඉන්දියාව සමග නැව් ග මනාගමනය ඇරඹීමට හැකිවන පරිදි කංකසන්තුරේ වරාය නවී කරණය කරනු ලැබේ.
- යාපනය ගුවන් තොටුපළ ජාත්‍යන්තර ගුවන්තොටුපලක් ලෙස සංවර්ධනය කර චෙන්නායි නගරය අතර ගුවන් ගමන් සේවය නැවත ස්ථාපිත කරන ලදි. අනාගතයේ දී උතුරුකරයේ ආර්ථිකයට මෙය ඉමහත් සාධනීය කාර්යභාරයක් ඉෂ්ට කරනු ඇත.
- අපේ ජනතාවට තමන්ගේ සැබෑ අරගල බයකින් තොරව ඉදිරියට ගෙන යෑමටත්, යුද්ධයේ දී මිය ගිය අය අනුස්මරණය කිරීමටත් ප්‍රමාණවත් ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයක් ගොඩනැගී ඇත.
- දේශපාලන විසඳුම සම්බන්ධයෙන් අපි අපේක්ෂා කළ ආකාරයට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කළ නොහැකි විය. එහෙත් සියලු පක්ෂවල එකඟත්වය මත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. විශේෂයෙන්ම දෙමළ ජනතාවගේ පාර්ශ්වයට අදාළ ඉඩම් සහ පොලිස් බලතල පළාත් වලට බෙදාහැරිය යුතුයි යන්න පිළිබඳ ඇති වී ඇති එකඟතාවය ඉතා වැදගත් ය. නව පාර්ලිමේන්තුවේ දී මෙම කාර්යභාරය සම්පූර්ණ කිරීමට අපි අධිෂ්ඨාන කර ගෙන සිටිමු.

## අද අප මුහුණ දෙන නව අභියෝග

- අපේ විමුක්තිකාමී ගමනේ නව පරිච්ඡේදයකට අප ප්‍රවේශ වී සිටිමු. මීට අදාළව තුන් ආකාර වූ අභියෝග අප ඉදිරියේ පවතී.
- ජාතික වශයෙන් සහ විශේෂයෙන් දෙමළ ජනතාව ජීවත්වන ප්‍රදේශවල උපරිම මට්ටමේ හමුදාකරණයක් අපේෂා කරනු ලැබේ. සති කිහිපයකට පෙර ශ්‍රී ලංකාවේ නිෂ්චිත සමහර ප්‍රදේශවල ක්‍රියාත්මක වන්නා වූ සමාජ විරෝධී බලවේග බිඳ දැමීම සඳහා ගොඩනගා ඇති ජනාධිපති කාර්ය සාධක බලකාය මීට හොඳ නිදසුනකි.
- මෙම කාර්යසාධක බලකාය නියෝජනය කරනු ලබන්නේ හිටපු සහ වර්තමාන හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් පමණි. මෙම කාර්ය සාධන බලකායට ආණ්ඩක්‍රම ව්‍යවස්ථාව යටතේ නීතිමය සීමාවන් සහිතව ක්‍රියාත්මක වන රාජ්‍ය පරිපාලන ව්‍යුහයන් සහ සිවිල් නිලධාරීන් විමර්ශනය කිරීමටත් ඒ සම්බන්ධ විමර්ශනයන් සහ නියෝග නිකුත් කිරීමටත් බලය පවරා ඇත.
- 2010 -2015 කාල සීමාව තුළ දෙමළ ජනතාවගේ ඉඩම් කඩම් අත්පත් කර දෙන අපේ පැවැත්ම ප්‍රශ්නාර්ථයක් කරන ලදි. එම තත්වය නැවතත් ඇති වීමට ඉඩකඩ තිබේ. මෑතකදි නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක ආරක්ෂාව පිණිස පිහිටවන ලද කාර්යසාධන බලකායේ දෙමළ හෝ මුස්ලිම් නියෝජනයත් අන්තර්ගත නොකරන ලදි. එය සම්පූර්ණයෙන්ම සිංහල බෞද්ධයන්ගෙන් සමන්විත ය. පුරා විද්‍යාත්මක වස්තූන්ගෙන් ආරක්ෂාව පිණිස ඉඩම් අත්පත් කරගැනීමේ බලයත් මෙම බලකායට ලබාදී ඇත. මෙම පක්ෂග්‍රාහි ක්‍රියාකාරීත්වය පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව ශීඝ්‍ර විය හැකිය.
- ශ්‍රී ලංකාව ඉතා දරුණු ආර්ථික පරිහානියක් හරහා ගමන් කරමින් සිටින බවට ආර්ථික විද්‍යාඥයින් අනාවැකි පළ කර ඇත. මෙම තත්වය දැනටමත් යුද්ධය නිසා බරපතළ හානියට පත් වූ උතුරු නැගෙනහිර පළාත්වල බරපතළ ලෙස බලපෑමක් ඇති කරනු ලබයි.
- එම නිසා අපේ පැවැත්මට හානි කරන ආණ්ඩුවක් ආර්ථික සහ ප්‍රජාතන්ත්‍රවාදි අවකාශය තුළ මුණගැසීමට අපේක්ෂිතය. අනාගතයේ දී සිදු විය හැකි අනතුරු පිළිබඳව අවදානම් සහිතව එහෙත් මනා විස්වාසයකින් මෙවර මැතිවරණයේ දී අපි ඡන්දය භාවිත කළ යුතුය. අධිෂ්ඨානශීලීව අපට මග පෙන්විය හැකි නායකත්වයක් අප තෝරාගත යුතු වේ.



# උතුරු නැගෙනහිර පළාත්වලින් පරිබාහිරව ජීවත් වන දෙමළ ජනතාවගේ **දේශපාලනමය අභිලාශයන් ළගා කර ගැනීම**

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී
**මයිල්වාහනම් තිලකරාජා**

දෙමළ ජනතාව මුහුණ පාන ගැටලුව පිළිබඳව අද මුලු ලෝකයම දැනුවත්. එසේ දැනුවත් වුණේ දශක තුනක් තිස්සේ රට තුළ පැවති අභ්‍යන්තර යුද්ධය හේතුවෙන්. නමුත් දෙමළ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේ කේන්ද්‍රස්ථානය වන්නේ ශ්‍රී ලංකාවයි. වෙනම රාජ්‍යයක් යන සංකල්පයෙන් ආරම්භ කරන ලද එකී අරගලය වර්තමානය වන විට ෆෙඩරල් රාජ්‍යයක් ලබා ගැනීමේ ඉල්ලීමක් බවට පත්ව තිබෙනවා. අතර මැදි කාලය තුළ ඇති කර ගන්නා ලද පළාත් සභා ක්‍රමය ආරක්ෂා කර ගැනීමෙන් සෑහීමකට පත් වීමේ යථාර්ථවාදී දේශපාලනික ප්‍රවණතාවයකට එය සිරවී තිබෙනවා.

මෙවන් වාතාවරණයක් තුළ අඩුම තරමේ ශ්‍රී ලාංකික දෙමළ ජනතාවගේ පාර්ශ්වයෙන් ඉදිරිපත් කරනු ලබන ෆෙඩරල් ඉල්ලීම හෝ ආරක්ෂා කර ගැනීමෙන් සෑහීමකට පත්විය යුතු බව ඇතැම් අයගේ අදහසයි. පළාත් සභා ක්‍රමය තුළ උතුරු නැගෙනහිරට පරිබාහිරව බහුල වශයෙන් ජීවත් වන දෙමළ ජනතාවගේ ගැටලු සහ ඒ සඳහා වන විසඳුම් තිබේ දැයි ප්‍රශ්න කළ විට ඊට ලැබෙන පිළිතුර වනුයේ නැත යන්නයි.

## උතුරු නැගෙනහිර හා කඳුකර දෙමළ අභිලාශයන්ගේ වෙනස

මක් නිසාද යත්, උතුරු නැගෙනහිර පළාත්වල ජීවත් වන දෙමළ ජනතාවගේ දේශපාලනමය අභිලාශයන් හා උතුරු නැගෙනහිර පළාත්වලින් පරිභාහිරව පිහිටි නුවරඑළිය, බදුල්ල, මහනුවර, රත්නපුර, කෑගල්ල, මාතලේ, කළුතර, මාතර, මොණරාගල, කුරුණෑගල, පුත්තලම, ගම්පහ සහ

කොළඹ යන දිස්ත්‍රික්ක දාහතරක් පුරා විසිරී ජීවත් වන ජනතාව සමාජීය වශයෙන් එකිනෙකාට වෙනස් වූ විවිධ වූ සමානාත්මක අනන්‍යතා සහිතව ජීවත් වීමයි. මෙකී ප්‍රදේශවලම සුළු වශයෙන් උතුරු නැගෙ නහිර සම්භවයක් සහිත ජනතාව ජීවත් වන නමුත් ඔවුන් "ශ්‍රී ලාංකික දෙමළ" නමැති පොදු අනන්‍යතාව සහිත ඉහත කී "දෙමළ ජනතා ප්‍රශ්නය" නමැති සංකල්පය තුළට ගැනෙන අයයි.

***එසේම "දෙමළ ජනතා ප්‍රශ්න නමැති සංකල්පය" තුළට නොගැනෙන උතුරු නැගෙනහිර පළාත්වලින් බැහැරව ජීවත් වන දෙමළ ජනතාවගේ අනන්‍යතා සහ ඔවුන් මුහුණ පාන ගැටලු ඔවුන් රට පුරා විසිරී ජීවත් වීම හා සමානව විසිරී පවතී. ඔවුන් මුහුණ පාන ගැටලු ඔවුන් නියෝජනය කරන කුලය අනුව, රැකියාව අනුව සහ තමන් ජීවත් වන දිස්ත්‍රික්ක අනුව වෙනස් ය. නමුත් මූලික වශයෙන් ඔවුන් ඒකරාශී කරනුයේ "ඉන්දියානු ද්‍රවිඩ" නමැති ජාතික අනන්‍යතාවය යටතේ ශ්‍රී ලංකාවේ ජන සංගණනය සිදු කර තිබීමයි. තවද, ඔවුන් නිදහස් ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අයිතීන් අහිමි කරනු ලැබ කාලයෙන් කාලෙට එය උරුම කරන ලද ජාතියකි.***

මෙකී ජාතිය පදනම් කරගත් අනන්‍යතාවය සහ අහිමි කරන ලද ප්‍රජා අයිතීන් නැවත ලබා ගැනීම යන කරුණු දෙක උතුරු නැගෙනහිර පළාත්වලට පරිබාහිරව ජීවත් වන දෙමළ ජනතාවගේ දේශපාලනමය අභිලාශයන් තීරණය කෙරෙන මූලික පොදු මිනුම්දණ්ඩ ලෙස සැලකේ.

## කඳුකර දෙමළ

මෙහි සිටින බහුතර ජනතාව "කඳුකර දෙමළ" නමැති සංස්කෘතිකමය අනන්‍යතාවය යන සංකල්පය තුළට තමන්ව පත් කොට ඇති නමුත් ඊට තවමත් දේශපාලනික මුහුණුවරක් ලැබී නොමැත. එම නිසා ශ්‍රී ලංකාවේ සිදු කරනු ලබන ජන සංගණනවලදී ඉන්දිය දෙමළ හා ශ්‍රී ලංකා ද්‍රවිඩ යන ජන කොට්ඨාශයන් ලෙස ඔවුන් ලියාපදිංචි කරනු ලැබීම හේතුවෙන් සමස්තයක් වශයෙන් දිස්ත්‍රික්ක දාහතරක් පුරා විසිරී ජීවත් වන ලක්ෂ පහළොවක් පමණ වූ ජනගහනය සැබෑ ජනගහනය ලෙස පෙන්නුම් නොකරයි. සියයට 7.5ක් ලෙස සමස්ත ජනගහන සංයුතියේ තිබිය යුතු ජන සංඛ්‍යාව පෙන්නුම් කරනු ලබන්නේ සියයට 4.2ක් ලෙසිනි.

මෙලෙස ජාතිය පදනම් කර ගත් අනන්‍යතාවයේ පමණක් නොව විවිධ කාලවකවානුවල දී විවිධ නීති රීතීන් යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසි අයිතිවාසිකම් ලබා ගත් අය ලෙස තමන් බුක්ති විඳින අයිතීන් සම්බන්ධයෙන් විවිධ ගැටලුවලට ඔවුහු මුහුණ දී සිටිති. නමුත් ඉන්දිය සම්භවයක් සහිත ජාතික අනන්‍යතාවයෙන් යුත් අය අතරේ බහුතරයක් වතුකරය ආශ්‍රිතව බිහිවූ සමාජයක් වශයෙන් පුරවැසි අයිතිවාසිකම් *(citizenship)* මූලික කොට ගෙන ඡන්ද අයිතිය (*voting rights*) ලබා ගත් අය ලෙස සලකනු ලබන නමුත් ඔවුහු රටක පුරවැසියන්ට හිමි අයිතීන් බුක්ති විඳින අය ලෙස සලකනු නොලබති. මූලික අයිතීන් වන ඉඩම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහන මාර්ග වැනි අයිතීන් හා රාජ්‍ය පරිපාලනය හා දේශපාලනමය සහභාගීත්වය යන කාරණාවලදී ශ්‍රී ලංකා ආණ්ඩුව සමග සම්බන්ධ වීමේදී නිශ්චිත ඉලක්ක වෙත ළඟා නොවන අය ලෙස ඔවුහු ජීවත් වෙති.

උතුරු නැගෙනහිර ජීවත් වන ශ්‍රී ලංකා දෙමළ ජනතාව තමන්ට ලබා දිය යුතු විසඳුමක් ලෙස ෆෙඩරල් විසඳුම ඉල්ලා සිටින තත්ත්වයක් තුළ, උතුරු නැගෙනහිර පළාත්වලින් පරිබාහිරව ජීවත් වන, ඉන්දිය සම්භවයක් සහිත කඳුකර දෙමළ ජනතාවට කලින් පිහිටුවන ලද පළාත් සභාවල කෙසේ වෙතත් පළාත් පාලන ආයතනවල පවා ඔවුන්ට හිමි විය යුතු නිසි තැන ලබා නොදීමේ වාතාවරණයක් පවතී. එම නිසා තමන්ට හිමි විය යුතු "දේශපාලනමය බලය බෙදාහැරීම" යනු කුමක්ද යන්න තීරණය කිරීමේ තත්ත්වයක වතුකර ජනතාව සිටිති. "වතුකරයට වෙනමම ඒකකයක්" වැනි කරුණු මීට පෙර ප්‍රතිපත්තියක් වශයෙන් ඉදිරිපත් වී ඇති නමුත් එය ළඟා කර ගැනීමේ දේශපාලනික යාන්ත්‍රණයන් නිර්මාණය නොකරන ලදි. එබැවින් එවන් බලය බෙදාහැරීම් නිශ්චිත දිස්ත්‍රික්කයකට පමණක් සීමා නොවිය යුතුය. එම නිසා බලය බෙදාහැරීම් පිළිබඳ යාවත්කාලීන කිරීමක් අවශ්‍ය කෙරේ. තවත් අතකින් "රාජ්‍ය පරිපාලනය" සම්පූර්ණයෙන් ළඟා නොවී තවමත් පුද්ගලික අංශය යටතේ සිරවී තිබෙන සමාජ පරිපාලනය ප්‍රවේශමෙන් ඉන් ගලවා ගැනීමේ අවශ්‍යතාවයක් පවතී. මෙම ජනතාවගේ අවම දේශපාලනමය අභිලාෂයන් වන්නේ, පළාත් පාලන ආයතන මට්ටමින් දේශපාලනමය බලය බෙදාහැරීම හා ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ පරිපාලනමය බලය බෙදාහැරීමයි. එතැන් සිට ඊළඟ පියවරේ සංවර්ධනයට අදාළ අඩිතාලම ලෙස ඔවුන්ගේ දේශපාලනමය උපාය මාර්ගික සැලසුම සැකසිය යුතුයි.

## අපගේ අභියෝග

මෙකී පසුබිම ඉලක්ක කර ගනිමින් පසුගිය 2015 දී පිහිටුවන ලද දෙමළ ප්‍රගතිශීලී සන්ධානය පහත සඳහන් අනන්‍යතා සහිතව කටයුතු කරයි.

- ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම
- ප්‍රාදේශීය සභාවල සංඛ්‍යාව වැඩි කිරීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව වැඩි කිරීම
- කඳුකර අධිකාරිය පිහිටුවීම
- කඳුකරයේ නව ගම්මාන පිහිටුවීම, ඊට පෙරගමන්කරුවන්ගේ නම් යෙදීම
- එකී දිස්ත්‍රික්කවල දෙමළ භාෂාව ක්‍රියාවට නැංවීම
- වතු පාසල්වලට අවශ්‍ය ඉඩම් සහ ගොඩනැගිලි සංවර්ධනය සමග විද්‍යා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම
- වතු ප්‍රදේශවල සෞඛ්‍ය සේවාව ජාතික සේවාවක් බවට පත්කිරීම
- වැවිලි ක්ෂේත්‍රයේ පවතින වතු කුඩා වතු ලෙස බෙදා වෙන් කර ජනතාවට බෙදා දීම

යන කරුණු පාර්ලිමේන්තුවේ සහ ඉන් පිටත දී දේශපාලනමය මිනුම්දණ්ඩයක් පෙන්නුම් කර තිබේ. ඉදිරියේ දී එය වඩාත් පුළුල් කොට මෙකී ඉලක්කයන් වෙත ළඟා වීමට අවශ්‍ය දේශපාලනමය බලඇණියක් ලෙස හැඳින් විය හැකි සමගි ජන බලවේග යේ කොටස්කාර පක්ෂයක් ලෙස 2020 මහා මැතිවරයට තරග කරයි.




# මුස්ලිම් නියෝජනය අවම කිරීමට කුලී හමුදාවට කොන්ත්‍රාත් දී තිබේ

**රාවුෆ් හකීම්**
**මුස්ලිම් කොන්ග්‍රසයේ නායක**

2015 වර්ෂයේ විශාල බලාපොරොත්තු සහිතව ජනාධිපතිවරණයේ දී මහා වෙනසක් ඇති කළා. ඒ වෙනසේ ගාමක බලවේගය වූයේ මුස්ලිම්වරුන් සහ සුළු ජාතීන් ය. එවැනි වෙනසක් ඇති. වීමට ප්‍රධාන හේතුව වූයේ අලුත්ගම ප්‍රදේශයේ සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන් ය. මේ නිසා ජනතාව අතර ඇති වූ බලපෑම සාමාන්‍ය එකක් නොවේ.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ යුද්ධය ජයග්‍රහණය කළ බව පවසමින් සදාකාලිකව ජනාධිපති වශයෙන් සිටිය හැකිය යන උද්දච්ඡකම නිසා තම පාලන කාලය අවසන් වීමට දෑවරුද්දක් තිබිය දී ජනාධිපතිවරණය සඳහා තරඟ කළේය. ඉහත කී ප්‍රචණ්ඩ ක්‍රියා අප සමාජයේ සමාජගත වීම ඔහුගේ පරාජයට ද හේතු විය.

2019 දී සිදු වූ පාස්කු ප්‍රහාරයට පසුව මුස්ලිම් ප්‍රජාව දැඩි මතදාරීන් ලෙස චිත්‍රණය කරන ලදි. මෙම ප්‍රහාරයට මුස්ලිම් ඇමතිවරයෙක් සහ ආණ්ඩුකාරවරු දෙදෙනෙක් වගකිව යුතුයැයි පවසමින්, පැය 48ක් ඇතුළත මොවුන් තම තනතුරුවලින් ඉල්ලා අස්විය යුතුයැයි උද්ඝෝෂනයක් සංවිධානය කර මෙරට බහුතර ජනතාව පොදි පිටින් උපවාස කුටියට ඒකරාසී කරන ලදි. පෞද්ගලික රූපවාහිනී නාලිකා දෙකක් මෙම සිදුවීම සජීවී ලෙස ජනතාව අතර ප්‍රචාරය කරන ලදි.

## එක් ප්‍රජාවක් ලෙස මුස්ලිම් ජනතාව

මෙම ප්‍රශ්නය පිළිබඳව විසඳුමක් ලබාගැනීමට එවකට අගමැතිවරයා වෙත අප යොමු වූ නමුත් ඒ සඳහා නිවැරදි ප්‍රතිචාරයක් අපට නොලැබුණි. කිසිවක් කර කියාගත නොහැකි තත්වයක් යටතේ මුස්ලිම්

ඇමතිවරු හැටියට අප සියලුදෙනාම ඉල්ලා අස්වීමට තීරණය කළෙමු. එදා පැවති සන්දර්භය අනුව එකී තීරණය ජනතාවට විශාල අස්වැසිල්ලක් විය. මුස්ලිම් ජනතාවගේ ආරක්ෂාව පතා සියලුම මුස්ලිම් නායකවරු තම ධුරවලින් ඉල්ලා අස් වී මෙවැනි බලපෑමක් ඇතිකළ නිසා ජනතාව අතර මුස්ලිම් නායකත්වය කෙරෙහි විශ්වාසයක් වර්ධනය විය. එදා එකී සිදුවීම සමාජයට යම් අස්වැසිල්ලක් ලබාදුනි. එහෙත් අද විරුද්ධ පාර්ශ්වයක වෙනස් වූ බලපෑමක් ඇති කර තිබෙන බව අපට නිරීක්ෂණය කළ හැකි වේ.

බහුතර ජනතාව අතර මෙම ප්‍රශ්නය වෙනත් දෘෂ්ටි කෝණයකින් අලෙවි කෙරිණි. වැරදිකරුවන් ඉල්ලා අස්විය යුතුයැයි ඉල්ලා සිටි විට නිවැරදිකරුවන් ද එක් වී තම තනතුරුවලින් ඉල්ලා අස්වූයේ ඇයි? වැරදිකරුවන් ආරක්ෂා කිරීම සඳහා සියලු දෙනාම එක් වූහ. යනුවෙන් පසුගිය ජනාධිපතිවරණයේ දී පූජනීය ස්ථාන ඇතුළත් ව තම ප්‍රචාරක කටයුතු ඇරඹූහ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බහුතර ඡන්ද එදා විරුද්ධ පක්ෂයට ලැබුණි. මෙය අපට හොඳ පාඩමක් වේ.

අනාගතයේ දී අපේ ප්‍රවේශයන් කෙසේ සැකසිය යුතු ද යන්න පිළිබඳව ගැඹුරින් කල්පනා කළයුතුය. අප කුමක් කළ ද? එහි අඩුපාඩුකම් දකින කණ්ඩායමක් පාලන බලයේ සිටී. නැවතත් පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව ජනාධිපති කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු අරඹා ඇත. එහිදී ඉදිරිපත් කරනු ලබන සාක්ෂි රූපවාහිනී මාධ්‍ය හරහා ප්‍රසිද්ධියේ ප්‍රචාරය කරනු ලැබේ. මේ තුළින් ජනතාව අතර භීතියක් ඇතිකරනු ලබයි.

මේ හරහා බහුතර ජනතාවගේ ඡන්ද පැහැරගැනීමේ සැළැස්ම ක්‍රියාත්මක කරනු ලැබේ. මේ අවස්ථාවේදී මුස්ලිම් ප්‍රජාව ඉතා ප්‍රවේශමෙන් කල්පනාකාරීව කටයුතු කළයුතු වේ.

අලුත් අයිතිවාසිකම් දිනාගැනීම වෙනුවට දැනට තිබෙන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මැතිවරණයේ දී ඉත්තන් එහා මෙහා කරනු ලැබේ. ඒ සඳහා සැලසුම් සහගතව අලුත් පාර්ලිමේන්තුවේ දී මුස්ලිම්වරුන්ගේ නියෝජනය කෙතෙක් අඩු කළ හැකි ද එලෙස අඩු කිරීම සඳහා කුලී හමුදාවක් වශයෙන් යම් යම් කණ්ඩායම්වලට කොන්තරාත්තුවක් ලබාදී තිබේ.

එළෙඹෙන මහ මැතිවරණයේ දී අපේ නියෝජනය අඩු කිරීමට විවිධ පැතිකඩවලින් සැලසුම් සම්පාදනය කොට ක්‍රියාත්මක කරනු ලැබේ. මුස්ලිම්වරුන් සතුටු කිරීම සඳහා විවිධ කපටි නාට්‍ය රඟ දක්වනු ලැබේ. ඒවා අප විසින් පරාජය කළ යුතු වේ.

## කොරෝනා සහ මුස්ලිම් ප්‍රජාව

කොරෝනා ගැටලුවේ දී මුස්ලිම් මෘතදේහ භූමිදාන කිරීම සඳහා අවසර ඉල්ලන ලදී. බලහත්කාරයෙන් ඒවා පිළිස්සිය යුතු යැයි රජය නියෝග කොට ඒ අනුව කටයුතු කළේ ය. ලෝකයේ කොරෝනා රෝගය වැළඳී මිය ගිය අයගේ මෘත ශරීර භූමිදාන කිරීමට හෝ ආදාහන කටයුතු කිරීමට ලෝක සෞඛ්‍ය සංවිධානය රටවල් 180කට වැඩි ප්‍රමාණයකට අවසර ලබාදී තිබුණි. එය පිළිගැනීමට වර්තමාන පාලකයෝ සූදානම් නොවූහ. ඒ මන්දයත් ජාතිවාදීන් අතෘප්ත කිරීමට රජය අකමැති විය. මුස්ලිම්වරුන් සම්බන්ධයෙන් එසේ භූමිදාන නොකළයුතුයැයි ඉතා පහත් ආකාරයෙන් රජය විසින් මර්දනය දියත්කරන ලදි.

කොරෝනා නිසා මියගිය මුස්ලිම්වරුන්ගේ සිරුරු පිළිස්සීම මුස්ලිම් ප්‍රජාවගේ සිත් දරුණු ලෙස පාරන ක්‍රියාවක් විය. මෙම කාරණය නැවත සලකා බලන ලෙස අපි රජයෙන් ඉල්ලා සිටියෙමු. එවැනි නම්‍යශීලීත්වයක් දැක්වූවා නම්, මුස්ලිම්වරු අතර මේ පාලකයින්ට පිළිබඳ යම් තෘප්තියක් ඇති කළ හැකියැයි මම ප්‍රකාශ කළෙමි.

මුස්ලිම්වරුන්ගේ මෘත ශරීර භූමිදාන කිරීමට අවසර ලබාදීමෙන් අප සමාජය කෙරෙහි යම් නම්‍යශීලිත්වයක් රජය දක්වා තිබුණේ නම් ඔවුන්ගේ බහුතර ඡන්ද බැංකුවේ යම් අඩුවීමක් සිදුවේ යැයි ඔවුහු භීතියට පත්වූහ. බහුතර ජාතිවාදීන්ට එරෙහි වීමට පාලකයින් කැමති වූයේ නැත. මෙලෙස ඉතා දරුණු අරාජක තත්වයකට මේ රජය ගමන්කරමින් සිටියි.

ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කිරීම නිසා. පාර්ලිමේන්තු මැතිවරණයේදී ද තුනෙන් දෙකක බහුතරයක් ලැබේවියැයි සිතිය යුතු නැත. මේ අතර දැන් එක්සත් ජාතික පක්ෂය කැඩී බිඳී ගොස් ඇතැයි සමහරු කල්පනා කරති. එසේ නොවේ. රනිල් වික්‍රමසිංහ සමඟ කුඩා කණ්ඩායමක් සිටියි. එහෙත් එක්සත් ජාතික පක්ෂයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් 95%ක් මන්ත්‍රීවරු සහ පක්ෂ පහේ නායකවරු අප සමඟ සමගි ජන බලවේගයේ සිටිති. මේ බලවේගය විකල්ප ආණ්ඩුවක් ලෙස කටයුතු කිරීමට නියමිතයි.

## මුස්ලිම් නියෝජනය වැඩි කර ගැනීමේ අභියෝගය

මෙම විකල්ප ආණ්ඩුව එළෙඹෙන මැතිවරණයේ දී ප්‍රමාණවත් ආසන සංඛ්‍යාවක් දිනාගැනීමේ උත්සාහයක නිරත වී සිටියි. විශේෂයෙන් රජයට එරෙහිව තරග කරන මුස්ලිම් අපේක්ෂකයින්ගේ ඡන්ද බැංකුව කඩාකප්පල් කිරීම සඳහා තැනින් තැන කුලී හමුදාවක් ක්‍රියාත්මක වේ. ඒ අය ස්වාධීන සංකේත හරහා මැතිවරණ තරඟයට සහභාගී වෙති.

කෙසේ වුවත් මෙම කටයුතුවල පසුබිමත් එහි කුමන්ත්‍රණකාරී ස්වභාවයත් මුස්ලිම් ප්‍රජාව හොඳින් තේරුම්ගනිමින් සිටියි. මුස්ලිම් නියෝජනය වැඩි කරගත යුතුය. මේ කුමන්ත්‍රණවලට හසු වී තවදුරටත් මුස්ලිම් නායකත්වය අපට බිලිදිය නොහැකිය යන අවබෝදය ජනතාව අතර පවතී. එහෙත් අපි ඉතා ප්‍රවේශමෙන් කටයුතු කළ යුතුය.

වර්තමාන පාලකයින්ගේ ප්‍රවණතාවයෙහි කිසිඳු වෙනසක් නැත. සමස්ත කලාපයේ ක්‍රියාත්මක වන බලවේග පිළිබඳව අපි සැලකිලිමත් විය යුතුය. අපේ ක්‍රියාකාරීත්වය බිඳ දැමීමට බොහෝ දේ සිදුවෙමින් පවතී. නොසන්සුන්තාවයක් ඇති කරමින් ඒ තුළින් දේශපාලනය කිරීමට මේ කල්ලි කණ්ඩායම් උත්සාහ කරති. ඒ සඳහා ඕනෑම පහත් ක්‍රියාවක් කිරීමට ඔවුන් පසුබට වන්නේ නැත. එහෙත් මේ කරුණු පිළිබඳව ඉතාමත් සැළැකිල්ලෙන් අපි ක්‍රියා කළ යුතු වන්නේ ද අපේ කටවල් වැසෙන්නට පරණ පාර්ලිමේන්තුව කඩිමුඩියෙන් ම වසා දමන ලදි.

එළෙඹෙන මැතිවරණයේ දී පාර්ලිමේන්තුවේ අපේ නියෝජනය වැඩි කිරීම අප මුහුණදෙන ප්‍රධාන අභියෝගය වේ. අපට සහයෝගය දැක්වීමට ඔබ සියලුදෙනාම සූදානම් විය යුතුය.

# පිරිසිදු
# දේශපාලන සංස්කෘතියක් උදෙසා
# මැතිවරණ ප්‍රචාරක
# පිරිවැය නියාමනයට
# බල කරමු.




## මෙරටේ පළමු වරට
## මැතිවරණ සඳහා වැයකරන මුදල් පිළිබඳ
## පුළුල් නිරීක්ෂණාත්මක වැඩසටහනක්
## ක්‍රියාත්මක බව ඔබ දන්නවා ද?

දේශපාලන පක්ෂ/අපේක්ෂකයන් ස්වකීය පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රචාරණය උදෙසා වැය කරන වියදම් පිළිබඳව ඔබ දන්නේ නම්, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) මගින් පිහිටුවා ඇති

**"මැතිවරණ ප්‍රචාරණ පිරිවැය පිළිබඳ නිරීක්ෂණ ඒකකය"**
**(ECCM Unit) අමතන්න.**

දුරකථන අංක : 011-4749376
ෆැක්ස් : 011-2826146
WhatsApp : 077-9600762/078-6134790
විද්‍යුත් තැපැල : cmevcampaignfinances@gmail.com
වැඩිදුර තොරතුරු සඳහා www.cmev.org

තොරතුරු ලබාදෙන ඔබගේ අනන්‍යතාවය සුරකින්නෙමු.


තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සම්බන්ධයෙන් ඔබට අවශ්‍ය ඕනෑම තොරතුරක් පිළිබඳව සහය වීමට අප සූදානම්!

ක්ෂණික ඇමතුම්

# තොරතුරු සහය මධ්‍යස්ථානය

**0113-030 463**

**(සතියේ දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා)**




**தகவல் அறியும் உரிமை பற்றி உங்களுக்குத் தேவையான அனைத்து தகவல்கள் தொடர்பாகவும் ஒத்துழைப்பு வழங்குவதற்கு நாங்கள் தயார் !**

உடனடித் தொடர்புகளுக்கு

# தகவலுக்கான உதவிப் பணியகம்

**0113-030 463**

**(வாரநாட்களில் மு.ப. 9.00 மணி தொடக்கம் பி.ப. 5.00 மணி வரை)**

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

ISSN 955-1800-0061